විමලකීර්ති ග්‍රන්ථමාලා (4)

(ඓතිහාසික විමර්ශන සහිත)

# සිංහල ගොවිතැන

කර්තෘ :

පණ්ඩිත

මැදඋයන්ගොඩ විමලකීර්ති

ස්ථවිරයන් වහන්සේ.

ප්‍රකාශක :

දිද්දෙනිපොත සදිංචි

ඩී. ජේ. හෙට්ටිගේ මහත්මයා.

2495

මුද්‍රණය : සීමාසහිත මාතර වෙළෙන්දෝ

බ්‍රෝඩ්වේ පාර — — මාතර.

4103

මිල රු. 2/50

# (චෛතිගාථිකා විමශීත සහිත)

# සිංහල ගොවිතැන

කතෘ

සරන්නාමුල්ලේ සිරිනන්දන පරිවෙණාධිවාසී

පණ්ඩිත මැදලසන්ගොඩ විමලකීර්ති

ස්ථවිරයන් වහන්සේ.

ප්‍රකාශක

දිද්දෙනිපොත පදිංචි

සී. ජේ. හෙට්ටිගේ මහත්මයා.

මුද්‍රණකරුවෝ

සීමාසහිත 'මාතර වෙළෙන්දෝ'

බ්‍රෝඩ්වේ පාර – මාතර.

4103

මිල රු. 2/50

2495

# පටුන

පිට


| | | | |
|---|---|---|---|
| 1. | සිංහල ගොවිතැන | ... | 1 |
| 2. | කුඹුරු ශබ්දය සහ කුඹුරු වර්ගයෝ | ... | 2 |
| 3. | කුඹුරු කොටස් | ... | 21 |
| 4. | කුඹුරු කිරීමේ ක්‍රම සහ වැව් අමුණු | ... | 25 |
| 5. | වැවේ අවයව | ... | 26 |
| 6. | වැව් මාලු | ... | 31 |
| 7. | කුඹුරු පෝරකිරීම | ... | 31 |
| 8. | කුඹුරු කම්පස්කිරීම සහ වී සකස් කිරීම | ... | 33 |
| 9. | නගුල සහ එහි අවයව | ... | 35 |
| 10. | වී සකස් කිරීම | ... | 43 |
| 11. | ගොයමේ සතුරන් සහ තෙම් විදි | ... | 46 |
| 12. | පැල්කවි | ... | 52 |
| 13. | අස්වැන්න නෙළීමේ නැටුම | ... | 55 |
| 14. | කමත් සිරිත් | ... | 56 |
| 15. | බදු සහ වෙනත් දීමනා | ... | 70 |
| 16. | වී අටු නැංවීම | ... | 80 |
| 17. | කුඹුරු කරන කාල | ... | 83 |
| 18. | වී වර්ග | ... | 87 |
| 19. | කෘෂිකර්ම නිලධාරීන් සහ සේවකයෝ | ... | 93 |
| 20. | ධාන්‍යමානවිධි | ... | 101 |
| 21. | මානභාජන | ... | 105 |
| 22. | ගොඩ ගොවිතැන | ... | 106 |
| 23. | ගොවිබස | ... | 111 |
| 24. | ගොවි ශිෂ්ටාචාරය | ... | 120 |

# ශුද්ධි පත්‍රය

| පිට | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|
| 5. | විජයසිංෂ | විජයසිංහ |
| 5. | වැදගක් | වැදගත් |
| 15. | බඩ | බඹ |
| 20. | ගම්වැසියන් | ගම්වැසියන්ගෙන් |
| 26. | මහානාමක් | මහාසේනක් |
| 28. | ෙ බජුන් | බොජුන් |
| 28 | බොජුන්ගල | බොජුන්හල |
| 29. | 34 32 | 34 – 32 |
| 32. | ජලයක් | ජලයත් |
| 45. | කෝරලේ | කෝරළු |
| 71. | ආදීය | අදය |
| 82. | ඇඩයෙන් | ඇටයෙන් |
| 84. | ආකාශ | අකාල |
| 90. | මගඇටි | සිහිකැටි |
| 92. | සාදූශ්‍යය | සාදෘශ්‍යය |
| 100. | පණ්ඩුමෙට | පණ්ඩුමෙඩ |
| 100. | අනිසපිර | අසපිර් |
| 113. | වැඩුණු | මැඩුණු |
| 114. | කොළුබෙරිය | හොළුබෙරිය |
| 115. | ගෙසිරිත්කා | ගෙඹිරිත්කා |

# මේ පොත

සිංහල ගොවිතැන නමින් හැඳින්වෙන මේ පොත සුංව වකාශ් සිංහල ගොවිතැන සම්බන්ධයෙන් අප කළ දීර්ඝ පරීක්ෂණයක ප්‍රතිඵලය මෙන්ම, මේ මයිමේ අප දන්නා ප්‍රථම කෘතියක් වන්නේය. ශත වර්ෂ හතර හමාරක් පමණ දීර්ඝ කාලයක් මුළුල්ලේ බල සම්පන්න විදේශීය සතුරු ජාතීන් තුනක් විසින් අයෝමය හස්තයකින් මෙන් මිරිකාගන්නා ලදුව, අප්‍රකාශයට ගොස් තිබුණු සිංහල සංස්කෘතිය පිළිබඳ ආලෝකයක් උදාවෙමින් පවත්නා මේ කාලයෙහි, හැකි පමණින් එයට රුකුල් දෙනු උගත් සිංහලයන්ගේ ජාතික යුතුකමක් බැව් මෙහිදී පළමුකොටම මතක් කරනු කැමැත්තෙමු. අපේ මේ ස්වල්ප උත්සාහයත් ඒ සඳහා මැයි.

ගොවිතැනේ සාරයත් බුදුදහමේ මිහිරත් උකාගෙන ජාතියක් හැටියට පැන නැගුණු සිංහලයන් විසින් බිහි කරන ලද සිංහල සංස්කෘතිය වූ කලී, ලෝකයෙහි පහළ වුණු ඉතා ප්‍රණීත සංස්කෘතීන් කීපය අතුරෙනුත් ප්‍රමුඛ ස්ථානය ගන්නකි. එය එසේ වූයේ බුද්ධාගමේ දැඩි ආශ්‍රය නිසාය. ගැමි ගොවියකු තුළ පවත්නා දයාව කරුණාව ආදී ගුණ සමුදාය අන් මිනිසකු තුළ දක්නා ලැබෙන්නේ ඉතා කලාතුරෙකිනි. ඔවුන් සමග ගැටීමෙන් ඒ බව දතහැකිය. කරුණු මෙසේ හෙයින් මේ අගනා දායාදය රැක ගැනීමට ගිහි පැවිදි ශ්‍රද්ධාශය සහයෝගයෙන් එකමුතු විය යුතුය.

නිදහස් සිංහල ආණ්ඩුවෙන් හෝ – විශේෂයෙන් අධ්‍යාපන කාර්යාංශයෙන් හෝ සිංහලත්වය නගා සිටුවීමට පිහිටක් නොලැබෙන බව දත් සිද්ධාන්තවී ඉවර දෙයකි. සිංහලයන්ගේම මුදලින් මුද්‍රණ කරනු ලබන සිංහල අතීතය සම්බන්ධ ඉතා සුළු දෙයක තොරතුරු පවා සිංහල බසින් නොදෙන පුරාවිද්‍යා කාර්යාංශයක් ඇති රටක, මෙවැනි දේ සිදුවනු

පුදුමයක් නොවේ. සිංහල ආණ්ඩුවේ උසස්ම සිංහල උගතුන්ගේ භාෂාඥයන් ඉතිහාසඥයන් පිළිබිඹු කෙරෙමින් මේ ලඟදී නිකුත් කළ සිංහල රටේ ජනලේඛනය බැලූ අපට, ආණ්ඩුවේ ඇත්තන් සිංහලයට රචාබැලීමේ හේතුව හොඳින් වැටහුනේය. සිංහල සංස්කෘතිය පිළිබඳ තොරතුරු අවුලා ගත හැකි මේ වාර්තාව හෙළ බසින් පළ වූනා දූක්ම අපට බලවත් ප්‍රීතියෙකි. නමුත් මෙවැනි වාර්තාවන් පළ කිරීමේදී, මේ රටේ සිංහල භාෂාව සාවමක් අන්තර ඉදමලයක් බවට නොපත්විණැයි ඉහත කී උගතුන් විසින් සිතාගත යුතුව තිබුණු බව අනාමැත්තෙන් වුවත් නොකියාම බැරිය.

ජන ලේඛන සම්පාදකයන්ගේ පුදුම ඉතිහාසඥතාය හඳුන් වන නිදසුනුත් එහි බොහෝය. උන්නැහෙලා කියන හැටියට නම් අරමණය (රාමඤ්ඤ රට) තිබුනේ අරමණයටත් සියමටත් අතරේය. සස කතාවක් නොවූ, යමක් නාමක් දන්නා ගොඩේ උපාසිකාවන් පවා හිනැස්සෙන මෙවැනි කථාවෝ ජනලේඛනයෙහි සුලභයහ. ඒවා කෙසේ වෙතත් ආණ්ඩුවේ වාර්තාවකට සිංහල ස්වරූපය ගැන්වීමෙන් ජනලේඛන සම්පාදකයන් කළ උසස් ජාතික මෙහෙය සිංහල භාෂා ප්‍රේමීන්ට අමතක නොවන්නේය. පසුගියදා ලං ලංවැ ඇසුණු ඔවුන්ගේ උද්ඝෝෂණවල ප්‍රතිඵල අතුරෙන් සිංහල ජනලේඛනයත් එකකැයි කියැයුතුය.

කව තවත් මෙබඳු දේ කීහිවන්නට වුවහොත් සිංහල සංස්කෘතිය සොයන්නන්ට එයින් මහදුවයක් කැලෑසෙන්නට පුළුවන. එහෙයින් සිංහල සංස්කෘතියේ ඇති විවිධ අවස්ථාවෝ අපේ උගතුන්ගේ මනසට හැඟී ඉන් ස්වරූපය ගනිත්වා,යි අපි එක්වන් ප්‍රාර්ථනා කරමහ. සිංහල සංස්කෘතිය නැමැති මන්දිරය උසුලා සිටින මුල් අත්තිවාරම කුමක්දැයි සොයා බැලූ අපේ සිත් සතන් එකවරටම සිංහල ගොවිතැන කරා ඇදී ගියේය. එහි ප්‍රතිඵලය මේය. මෙහි නොයෙක් අඩුපාඩුත් වැරැදීත් ඇති වන්නට පුළුවන.

ඒවා හේතු යුක්ති සහිතව අපට දක්වාලීම මෙවැනි දේට අනුබල දෙන සුරීන්ගේ යුතුකමය. සිංහල ගොවිතැන ගැන කරුණු සෙවීමේදී අපට වැටහී ගියේ බුද්ධාගම නැතිවුණදාට මෙන්මැ සිංහල ගොවිතැන නැතිවුණදාට සිංහල ජාතියක් නැතිවන බවය.

ජාතියේ ශික්ෂා ගුණධර්ම වගාවත් ජාතික සංස්කෘතියේ විධිමත් සංස්කරණයක් බුද්ධාගම නිසා ඇතිවූ බව සැබෑය. නමුත් ජාතික ජීවිතයේ කොඳු ඇටය වන ආර්ථික තත්ත්වය රඳා ඇත්තේ සිංහල ගොවිතැන උඩ බැවි අමතක නොකළ යුතුය. මේ සත්‍යය තේරුම් ගත් කීප දෙනෙකුන් නමුත් අපේ පාලන පක්ෂය අතර සිටිනු දැක්ම භාග්‍යයෙකි. අධ්‍යාපනයේත් පරිසරයේත් වරද නිසා සිදුවන ඇතැම් වැරදි ඇතත් ආණ්ඩුවේ කෘෂිකර්ම ව්‍යාපාරය හෙලා දකිය යුත්තක් නොවේ. ඒ ව්‍යාපාරය මෙහෙයවන ඇමැතිතුමා සම්බන්ධයෙනුත් මෙසේම කිය යුතුය. රට සුභිසාධ කරනු පිණිස අපේ කෘෂිකර්ම ඇමැති තුමා දක්වන විශිෂ්ට උත්සාහයට අපි කාවුරුත් උපකාර කළ යුත්තෝ වෙමු. ඒ උපකාරය නන් අයුරින් කළ හැකිය.

කාව්‍යකරණයෙහි දක්ෂ උගත් ධනවතකු ඉදිරිපත් වුවහොත් මුළු ගොවි ජීවිතය අළලා අතිශයින් ජනප්‍රිය කාව්‍යයක් නිපදවිය හැකිය. එයින් සිංහල තරුණයන් තුළ ගොවිතැන කෙරෙහි ආශාවක් නිතැතින්ම ඇතිවනු නොඅනුමානය. ඒ ආශාව දියුණුවී යත්ම ගොවිතැන සමාජයෙන් ඈත්වන්නට හේතුවුණු කරුණු සොයා බලා ඒවාට අවධාන පිළියම් යෙදිය යුතුය. එසේ වන්නාහාම සිංහලයන් වැඩිහරියක් ගොවිතැන නැවතත් ප්‍රධාන ජාතික ජීවනෝපාය බවට පෙරළා ගනු නිසැකය. එයින් හොඳ ආහාරයක් නීරෝගත්වයක් සුවයක් විනෝදයක් නොඅඩුව ලැබේ. ආගම ශික්ෂාචාරය සංස්කෘතිය බුද්ධිය යනාදී සෑම දෙයකමේ සංවර්ධනය හොඳ ජීවන තත්ත්වය උඩම පිහිටා තිබෙන බව නුවණින් සලකා ගොවිතැනෙන් මාර්ගයෙන් හොඳ ජීවන

තත්ත්වයක් ඇති කරන්නට උත්සාහවත් වන මෙන් සියලු ජාති හිතෛෂීන් මෙහෑ අත්‍යන්ත ගෞරවයෙන් යෙදී දන්වා සිටුමු.

තරුණ ජීවිතයන් නොමඟට හෙළන - නොසැබෑ බසින් ලියැවුණු - ලියැවෙන ප්‍රබන්ධයන් කෙරෙහිම කාලයක් තිස්සේ යොමුවූ පැමැති සිංහල තරුණයන්ගේ සිත් සතන් මෙබඳු පොත් පත් වෙත ඇදී යන්නේ සැදිසියෙන් බවත් එහෙයින්ම මෙබඳු පොත්පත් වලට මේ රට ක්ෂෙත්‍රයක් නොමැති බවත් ප්‍රසිද්ධ කාරණයෙකි. එසේ තිබියදීත් පරමාර්ථකාමී උසස් බෞද්ධ ප්‍රභූවරයකු හැටියටත් වැවිලි කාමියෙකු ප්‍රවීන සිංහලයන් විතකදෙනා අතුරෙන් ප්‍රමුඛයකු හැටියටත් කීර්තියක් උසුලන ඩී. ජේ. ගෙහෙම්පිටිගේ මහත්මයා මේ පොත මුද්‍රණය කරවන්නට ඉදිරිපත්වීම අපට ලැබූ ප්‍රීතියෙකි. ඒ මහත්මයා අපේ ස්තූතිය ප්‍රාර්ථනා නොකෙරෙයි. එහෙයින් අපි ඒ මහත්මයාට ආයුරාරෝග්‍ය සැප ප්‍රාර්ථනා කරමු.

ස්වල්ප වූවත් මේ පොත සැපැයීමේදී අපේ පිරිවෙනේ උප-ප්‍රධානාචාර්ය ධුරය දරන කිරිඳේ ඤාණරතන පණ්ඩිත ස්ථවිර තැන ගත් උත්සාහය අපේ උත්සාහයට ලංවූ සිටියේය. මෙකී පෙළෙහි යම් යම් වචන සම්බන්ධයෙන් පණ්ඩිත ගිනිපැල්ලේ ඤාණවංශ ස්ථවිරයන් සමග කළ සාකච්ඡාවෝත් ඵලදායක වූහ. ත්‍රිපිටකාචාර්ය පයාගල සිරිවිමලවංශ මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේත් කළුතර කුමරි-කාන්දේ ශ්‍රී සුදර්ශන පිරිවෙන් වැසි උගත් නැඟින්නේ සෝමිඤ ස්ථවිරයන් වහන්සේත් ඇතැම් කරුණු සපයා දීමෙන් අපට සහාය වූහ. අපේ අනවධානතාවයෙන් ඇතිවූ වරද සාවද්‍ය මෙහි ශේෂව තිබෙන්නට පුළුවන. තල්ලර ඔලගම් පුරන් කුඹුරු, පැලැසි, අටවරල යනාදී ශබ්ද කීපයක නිෂ්පත්තිය මෙන්ම අභිප්‍රායයත් තම තමන් කල්පනා කළ යුතුය. අනාගතයේ පිහිටීම සම්බන්ධයෙනුත් නියම තීරණයක් නොදිය හැකිය. නෑකා සහිතව මලනකොත් ගාල්ලජ් (=පතිරව එක්කරං

පෙදෙසක වීසූ පහි මගීයට අයත් මිහිප් වෙසෙසකි) ජාතික-යන් විසූ කුඹා ඉඹම කල්ලර ඔලගම් නමැයිද, පුරාණ ශබ්දය කෙළිනයකි පුරන පුරඳ පුරන් යන තුන් රූපයන්ම සිටින හෙයින් පුරන් යනු පුරාණ ශබ්දයම ප්‍රකට කොට ඇත්තේ-යයිද, කුඹාමල මැලැණි වූවාසේම කුඹාපැල පැලැණි, සී ගෙනැ කුඹාපැල ඇති ස්ථානයටත් අභෙදෝපචාර වශයෙන් ඒ නම වහරන ලදැයිද, දෙමළ බසෙහි කුඹුරුවාචක "වාරඹම්" ශබ්දයක් පෙනෙන හෙයින් (ආර්ද්‍ර (පාළි අද්ද) මඩ ඇති කුඹුර අට වරල නමැයිද යනාදියය. විනය අටුවාව රසවාහිනිය ආදී පොත් කීපයකත් අභාසරගංගය ගැන සටහන්වේ. ඒ සියල්ල හොඳ කොට සලකන විට පෙනෙනු-යේ එය නාගානනාම සමීපයෙහි තිබුනු බවය.

නාගානාම වනාහි දිඹුලාගලට කිට්ටුව මගවැලිගෙහි තිබුනු කොටුපලකැයි සලකති. කිරිමාතළ කුඹුරු සම්බන්ධ-යෙන් අනුමානයෙන්වත් යමක් සිතාගත නොහැකිය. නමුත් මේ ගැන සිතා බලන ආධුනිකයන්ට ප්‍රයෝජනවත් වියැ හැකි තැන් කීපයක් පමණක් මෙහි බහා ලම්හ. එනම්:-

1. දූසසක් කිරි කුඹුරු ඇති හැලි කොතකින් එක් කරලක් ගත්තලැ (ධර්ම ප්‍රදීපිකා චතුර්ථ සංස්කරණය 48 පිට)
2. මහ මෙහෙර ඇත්වෙහෙරට කැරැණු සහැ කිරි අඹුණුබාදී බලසැණුකොට (ගොත්නැව දේවාල ලිපිය ඇ. ශෙ. 4 – 188)
3. කිරි අඹුණ්බා දෙනැබැලි ලදුවන් (ඇ. ශෙ. 1 – 116)
4. කජිහම්ණේ යභක (මෝලා හිටිය වෙහෙලන් සොයාගත් අප්‍රසිඩ ලිපියක් ඇ. ශෙ. 4 – 190 යනුයි.)

මේ කාරුණු අනුව සලකන විට කිරිමා තළ කුඹුරු යන පාඨයට වඩා කිරිබාතළ කුඹුරු යන පාඨය මැනවැයි සිතේ. එදින් ඒ පාඨය මැනවි නම් කිරිය බැඳින් සහ කිරි බාගය

බැගින් කළු කුඹුරු යන අම්බල එසින් ගත හැකිය. (ගාග-බත - බය* - බා) තෙම අතුරෙහි දැක්වුණු කුක්ක දූතය දෙක සැපියක් පසුව දැනගන්නට ලැබිණි. ඒ මෙසේය:-

නොතනාට ගොඩමෙවලුන් වැනුවිට ගොමියා මතුර කා පිරිමට යැදෑ මච්චාල තරමල හෝ හෙලිමංලු මලින් වැංජනයකුත් බතකුත් උයා හොඳින් අනා මිසා තබයි. ඉක්බිති කෞමාර බ්‍රහ්මචරියාව ඇති බාලකුක්කෙන් සිදෙනකු (සුදුපාට දුඹුරුපාට කලඑලලුපාට ඇතියන් වියැ යුතුයි) සොයා සුදු බල්ලා මැදට සිටිනසේ ඇඳ මන්ත්‍රයක් කියමින් ඉහත කී තරමල හෝ හෙලි මංලුමලින් කකාගත් කුඹකින් දුම් දෙමින් කෙවිටක් බල්ලන් කුඹුර වටා ඇවිද්දවයි. දිමිමෙන් වෙහෙස වූ බල්ලන්ට පලමුව මතුරක් ඊට පසු බතුත් දෙයි. මෙයට වේගන්ගොඩ හුඹුජියාමේ ගොවියෝ කුක්කුරු දූතයයි කියත්ලූ.

කඩබැදිසමරන් සම්බන්ධ යොම විශෙෂයක් ඇතැයිද එය සිදු කිරීමේදී ප්‍රථමයෙන්ම මැස්සියෑ පැමිණි තැනකාවකගේ ගොටහළුවක් විශෙෂයෙන් උවමනා කෙරේ යයිද අසනු ලැබේ. පළමු කී යේ පිරිසිදුවූ ගොවියා ඒ තොටහළුව (කිහින් යමට යදින මසප්‍රාය තොටහෙයින් මේ නම යෙදූනාවනැයි සලකන්නට පුළුවන) කුඹුන් කොළ තැම්බූ දියෙන් සෝදා වියලා ගත යුතුය. ඉක්බිති එය හැබෙලි මලට ඉරා පුළුස්සමින් ගොබවෙලුන් වැනු කුඹුරට දුම් දෙයි. මේ තොම් කිරීමෙන් බලා සිටියදීම ගොඩමෙවලුන් කුඹුර හැර යන බව ගොවියෝ කියති.

මේ කාලයෙහි මෙමැනී දේ නොසලකා හැර. සිඩුකස් යොදා පරීක්ෂණයෙන් පැමැක්වූමගොන් මට්නා ශාස්ත්‍රීය තරුණු රැසක් මතුයර ගන්නට මාගීය පැමෙදනවා ඇත. මෙහි දැක්වූ කඟුල් අතරම පළුෂක් කඟුල ඇතුලක් කරන්නට කොකුකී

වූයේ ප්‍රමාදයකිනි. සිංහල සංස්කෘත ග්‍රන්ථමාලාවේ දෙවැන්න "සිංහල ක්‍රම බිම" නම්. එය ආධුනිකයන් අතට දියැ හැක්කේ මේ පොත නිමැවීමෙන් දක්වන සැලැකිල්ල අනුවය.

පරක්කාමූල්ලේ, සිරිනැඳන පිරිවෙන් වැසි
මැදඋයන්ගොඩ විමලකීර්ති ස්ථවිර.

2496. පොසොන් අව 6.

# සිංහල ගොවිතැන් තතුව

ගොවිතැන වනාහී පෙරදිග ලෝකයේ ප්‍රධාන ජීවනෝපාය වන්නේය. බුඩකාලයේ පැවැති ඉන්දියානු ගොවිතැනේ තත්ත්වය බෞඩ සාහිත්‍යයෙන් බොහෝදුරට දැනගත හැකිය. ද්‍රවිඩ සාහිත්‍යය කියවන විට ගොවියාට අමුතු පණක් උපදනේය. ද්‍රවිඩ ගොවියා සැම විටෙක ද්‍රවිඩ ග්‍රන්ථකාරයාගේ පැසසුමට පාත්‍රවිය. එහෙයින් ද්‍රවිඩ ගොවියාට ද්‍රවිඩ ග්‍රන්ථ කර්තෘවරයාගෙන් ලැබුනු අනුබලය ඉතා විශාලය. සිංහල ගත්කරුවාගේ පන්හිඳ පණපෙවුනේ බණ පොත් ලිවීම පිණිස මැයි. සිංහල සාහිත්‍යයේ සිංහල ගොවිතැනට සැලකියයුතු තැනක් නොලැබුනේ විශේෂයෙන් සිංහල ග්‍රන්ථ රචනාව පූජක පක්ෂය අතේ පැවැතුනු නිසාය. ඒ කෙසේ වෙතත් සිංහල ගොවිතැනේ අතීතය ඉතා විසිතුරු සිද්ධීන්ගෙන් ගහණය. ඒ පිළිබඳ බිඳුමාත්‍ර විස්තරයක්වත් මෙබඳු ලිපියකින් නොදිය හැකිය. නමුත් මේ පොත කියවන්නන්ගේ විනෝදය පිණිස අපේ අතීත ගොවිතැන සම්බන්ධයෙන් ලුහුඬු හැඳින්වීමක් මෙතැන් සිට ආධුනිකයන් ඉදිරියෙහි තබන්නට වෑයම් කරමිහ.

"කසිවිකි ගොහිබූවනි තපපගෙඳුමබනානං" (සුත්තනිපාතට්ඨකථා හේ. වි. මුද්‍රණය 382) යි කී හෙයින් පොළොවත් එකී ප්‍රයෝද සංඛ්‍යාත ගොවිජනයාලත් දෙකම ගෝ ශබ්දයෙන් කියැවෙන බැව් පෙනේ. ගෝ සංඛ්‍යාත ගොවිපොළේ ප්‍රධානයා ගෝපයාය. ගොවි ශබ්දය ඒ ගෝප ශබ්දය හෝ ගෝපති ශබ්දය ප්‍රභවකොට ඇත්තේය. ගහපති, සේනාපති, මහාපති යන ශබ්දයන්ගෙන් ගැහැවි සෙනෙවි මැහැවි යන ශබ්දයන් සිදුවුණු සැටිය සලකනු. ගොවියාගේ ප්‍රධාන කාර්ය්‍යය ගොවිතැන නම්. මේ දිවයිනේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ජීවත්වුණු රාක්ෂස, අසුර, නාග, යක්ෂ යන ගෝත්‍රිකයනුත් ගොවියන්වූ නමුත් ඔවුන්ගේ ගොවිතැනේ තත්ත්වය තේරුම් ගත හැකි කිසිම ලකුණක් අද අපට නැත්තේය විජය කුමරුන් මෙහි එන්නට පූර්වයෙන් මේ රට පාලනය කළ ඔවුන්ගේ නායකයෝ ෂරූමක ගම්ණි යන නම්වලින් හඳුන්වනු ලැබූහ. කුවේණියත් එවැනි ගම්ණි කෙනෙකුගේ දුවකැයි සිතනු යුක්ති සහිතය. විජය සහිත හත්සියයකට හිටි හැටියේ නැම බීම සපයන්නට වී සහල් තිබුණේ නිකම්ම නොවන බව අපට සිතාගත හැකිය. මේවා මෙසේ වෙතත් ලංකාවේ ගොවිතැන පිළිබඳ ක්‍රමික දියුණුවේ අභිනාලම වැටුණේ විජයාගමනයෙන් පසුව බවට ඇති සිදසුන් බොහෝය.

සිංහල ගොවිතැන අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, මෑත යුගය යන ප්‍රධාන අවස්ථා තුනකින් යුක්තය. එයින් අනුරාධපුර යුගය, අනෙක් බොහෝ කරුණු සම්බන්ධයෙන් මෙන්ම ගොවිතැන සම්බන්ධයෙනුත් ස්වර්ණ යුගය වශයෙන් ගණන්ගනු ලැබේ. දුටුගැමුණු, සැදැහැතිස්, මහසෙන්, දාසෙන්කැලි යන මේ රජදරුවෝ මේ යුගයෙහි ගොවිතැනට ලය දී ක්‍රියා කළහ. දකුණු දඹදිව වැසියන් නිසා පැමිණි විපත් රටට ජාතිය ඔරොත්තු දුන්නේ ගොවිතැනේ සමෘද්ධිය නිසාමය. මේ කාලයෙහි සිංහල ගොවිතැනට උතුරු දකුණු දෙභාරතයේ ගොවිතැන් ක්‍රමත් මිශ්‍රවීය. ඒ මිශ්‍රණය සිංහල ගොවිතැනේ දියුණුවට මිස යුරෝපීය ක්‍රම මිශ්‍රණය මෙන් හානියට හේතු නොවීය. අනුරාධපුරයට සමකාලයෙහි ලංකාවේ දියුණුව පැවැති අනෙක් පෙදෙස නම් අමරණීය රෝහණයයි. වීරයන් සහ උගතුන් අතින් බලතත් අනුරාධපුරය රෝහණයට වඩා හැමදාම දුප්පත්ය. සවිසාර කමින් සහ ජනමොහන දර්ශනය අතිනුත් මේ කාරණය මෙසේමය. රුහුණේ උපන් ශ්‍රේෂ්ඨ පුරුෂයන් අනුරාධපුරයට ඇදීගිය හෙයින් රෝහණය පසු කාලයක සාරමක් වැටී ගිය නමුත් ගොවිතැන් බත් අතින් කවදත් රෝහණයම ප්‍රධාන ස්ථානය ගත්තේය. අනුරාධ-

පුරය මෙන්ම රෝහණයත් කුඩා මහත් වැව් සමූහයකින් සමන්විත වේ.

ගොවිතැන සම්බන්ධයෙන් නම් දරූ "කොමුසර" (වෙල්ලස්ස) වනාහී රෝහණයෙහිම එක්තරා කොටසකි. දීගාවැව ගොවි ජනපදය වැනි නොසැඩුනු වෙල් යායවල් අනුරාධපුරයෙහි සුලභ නොවූහ. මෙසේ ගොවිතැනින් සමෘද්ධවූණු රෝහණය නිසාම අනුරාධපුර යුගය ගොවිතැනේ ස්වර්ණ යුගය හැටියට නහවුරු විය. රුහුණේ අතීතය තවමත් වැසී ඇත්තේ අපේ පුරාවිද්‍යාඥයන්ගේ බලවත් නොසැලකිල්ලත් නිදහස් ආණ්ඩුවේ අවිචාරවත් ක්‍රියාකලාප යත් නිසාය. විජයගෙන් ඇරඹි පස්වන මිහිඳුගෙන් ඉවර වුණු අනුරාධපුර සමය ඉක්මවා අපවෙත පැමිණියේ පොළොන්නරු යුගයයි. මෙයත් ගොවිතැන සම්බන්ධයෙන් ඉතා වැදගත් යුගයෙකි. මේ යුගයෙහි උපන් ශ්‍රේෂ්ඨ වීරයා නම් මහලු පැරකුම් රජ තුමාය. විජය කුමාරයා මෙන්ම මෙතුමාත් ලොකු විප්ලව කාරයෙකි. විජය රජු ගැන සිහිපත් කළ මේ අවස්ථායෙහි එතුමා ඉන්දියාවේදී කළ විප්ලවය සම්බන්ධයෙනුත් අමුතු මතයක් ඉදිරිපත් කරන්නට අපට සිදුවී තිබේ. විජය කුමරුවා සහිත පිරිස දාමරිකයන් හැටියට අපේ ඉතිහාසය අපට උගන්වතත් ඒ දාමරිකකම මොනවාදැයි අපට නොකියයි. බලවතුන්ගේ අයුතු ක්‍රියා වන්ට විරුද්ධවූ පැහැනගිනා දූර්ජයෝ දාමරික නාමය ලබති. නමුත් විජය කුමරුවා සිය පියාට විරුඩව එවැන්නක් නොකොළේය. එතුමා සහිත පිරිස කොළේ බමුණු මතයන්ට පිටුපා බුඩමතයට හිත දීමය. විජය කුමරුගේ යෞවන කාලය වනාහී බෞඩ භික්ෂූන්වහන්සේ බුඩ මතය පැහැදිලි කොරෙමින් ඉන්දියාවේ සැරිසැරූ වකාවනුව විය. විජය සහිත පිරිස මේ බණ අසා ඇත්ත තේරුම්ගෙන බමුණන්ට පටහැනි විය. බමුණෝ මහාජනයා කුලප්පු කළහ. රජුට මහජන මතය ඉවත ලන්නට නොහැකි විය. විජය සහිත පිරිස ලක්දිවට තල්ලුවූයේ එහෙයිනි. ඔවුන්ට උපුල්වන්

දෙව්රජු පිරිත් නූල් බැන්දේත් ඔවුන්ගේ ගමන බුදුරදුන් විසින් දක්නාලද්-දින් නිසාම්ම නොවේ. ඔවුහු අංගබෞද්ධයෝ මුහු නම් පිරිත් නූල් බැඳීම මෙන්ම පිරිත් පැන් දීමත් සිදු වියැ හැකිදැයි සිතා බලත්වා. විජය ප්‍රමුඛ පිරිසගේ විප්ලව කාරිත්වයෙන් මේ දිවයිනට සෙතක් සැලැසුණු නමුත් පැරකුම් කුමරුගේ විප්ලවය නිසා රෝහණ රාජවංශය සම්පූර්ණයෙන්ම වාගේ නැතිවිය.

සිංහල රාජ්‍යය මෙතරම් ඉක්මනින් අරාජකවූයේ මේ දරුණු ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙතුමා සිංහල රාජකුලයේ සතුරා වුවත් සිංහල ගොවිතැනේ අනූපම මිතුරා විය. සිංහල ගොවි ජීවිතය නගා ලන්නට මෙතරම් මහන්සියෙන් ක්‍රියා කළ අන් රජකු ගැන අපි නොදනුම්හ. වැව් බැඳීම්, මාතෘකා නිර්මිත කිරීම්, පොළොව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම් ශෂ්‍ය වර්ධන තනතුරු ඇති කිරීම ආදී නොයෙක් උපක්‍රමයන් යොදා මෙතුමා ලංකාව සශ්‍රීක කළේය. කීයුම අනුව මැත්තොත් නිශ්ශංකමල්ල රජුත් ගොවි වීරයෙකි. තමුන් පූවානම් කාරයකුවූ ඔහුගේ කියුම් කෙරෙහි විශ්වාසය නොතැබියැ හැකිය. සිසඹුරුවන හැකිඅඳශ ආදී ඇතැම් බදු නොගැනීමෙන්ද ගොවීන්ට නොම්ලයේ කෘෂි භාණ්ඩ සහ ගවයන් සැපයීමාදියෙන්ද මඩරන් වීබදු ආදිය අඩු කිරීමෙන්ද ගොවිතැන හුවාලූ බව නිශ්ශංකමල්ල උස්ගඩින් කියනත් ඒවා ඔහු විසින්ම ඇති කළ අමුතු දේ නොවේ. ගොවියාට නොම්ලයේ පහසුකම් සලසාදීම ඉපැදියා ලංකා දෙරටේ පැවැති ඉතා පැරණි උතුම් සිරිතකි. මහා විජිත රජුගේ චරිතය කියවා බැලීමෙන් මේ කාරණය තේරුම් ගත හැකිය.

ලංකාවේ පැවැත්තේත් ඒ ඉපැදියානු ක්‍රමය මැයි. මෙසේ මුල් කාලයේ පටන් අඛණ්ඩව පැවැති මේ දීමනාවන් තමා අමුතුවෙන් ඇතිකළ දේ හැටියට හඟවන්නට යැම නිශ්ශංකමල්ල රජුගේ කපටි උපායකි. පොළොන්නරු යුගය කාලක් අල්ලා නොසිටි හෙයින් සිංහල රාජ්‍යය

දඹදෙණිය කරා සංක්‍රමණය විය. දඹදෙණිය හෝ එයට පසුව රාජධානි බවට පැමිණි කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර යනාදී පෙදෙස්, රුහුණ අනුරාධපුරය පොළොන්නරුව යන පෙදෙස් පමණ ගොවිතැනට සුදුසු නොවේ. එසේම ඒ පෙදෙස් කඳුවලින් ගහන හෙයින් විශාල වෙල්යායවලුත් එහි නොලැබේ. මේ අනුව සිතන විට සිංහල ගොවිතැනේ පිරිහීම ඇරඹුනේ දොළොස්වන සියවසේදීයයි සිතනු යුක්ති සහිත සේ පෙනේ. ගොවිතැන සම්බන්ධයෙන් ඇතිවූ මේ පිරිහිල්ල නවතාලන්නට සමත් සිංහලයකු සිංහල ජාතියේ නූපන් හෙයින් පෘතුගීසි ආදී විදෙශීන්ගේ ආක්‍රමණය දක්වාම එය දියුණු වෙමින් පැවැත්තේය. විදෙශීහු එය වඩාත් වේගවත් කළහ. පෘතුගීසි ඕලන්ද සමයයන්හිදී ඔවුන් සතු පෙදෙස්වල කුරුඳු සහ පුවක් වැනි වැඩි වැඩියෙන් වවන ලදී. නමුත් ඔවුහු විශේෂයෙන් ඕලන්දයෝ ධාන්‍ය ගොවිතැනක් ලාභ ඉපදවිය හැකි ව්‍යාපාරයක් වශයෙන් දියුණු කරන්නට මහන්සි ගත්හ. එහෙයින් ඕලන්ද යුගයට අයත් ඇතැම් වකවානුවලදී වී කුරුණි 25 ක් රු. දෙකකට කිට්ටු මුදලක් දී ගත හැකිව තිබුණේය. සේරු 48 කින් යුත් හාල් කුල්ලක් තංගමකට විකුණුනේ යයි නොක්ස් කියන හෙයින් එකල උඩරට හාල් තත්ත්වය ගැනත් යමක් සිතාගත හැකිය. අවුරුදු තුන් සියයකටත් වැඩිතරම්වූ දීර්ඝ කාලයක් තිස්සේ ඇඳි මතට පවා ආලය නොකොට, නිදහසම නිවන කොට ගෙන, එය ලබා ගනු පිණිසම සටන් කළ සිංහල ජාතියේ එද ආර්ථික තත්ත්වය එසේය. අද තත්ත්වය ගැන සිතා බැලීම මෙය කියවන්නාට භාරය. අද අපේ ආහාර තත්ත්වය වනාහී කපටි ඉංග්‍රීසීන් විසින් බොහෝදුර කල්පනාකොට යොදන ලද විෂම ක්‍රියා කලාපයක ප්‍රතිඵලයක් විනා අනෙකක් නොවේ.

ගොවිතැන නිසාම සුරක්ෂිතවූ ගොවිතැන නිසාම ශ්‍රේෂ්ඨවූ ගොවිතැන නිසාම අදම්‍යවූ විසූ සිංහල ජාතිය සැමදම පාගාගෙන සිටින්නට නම් ගොවිතැන වනාහී

ලීෂෑ යුතු බව ඔවුන්ට වැටහුණේය. එහෙයින් ඔවුහු ගොවිතැන මරාදැමීමට කළහැකි හැම දෙයක් නොඅඩුව කළහ. මුඩුබිම් පනතින් ගොවියා අඩපණ කළහ. කුරුණෑගල කෑරල්ල ආදී ජාතික ආපදාවන්හිදී සිංහල ගොවීන්ට ඔවුන් කළ දේ ජාතිය තිබෙන තුරු නොමැකී පවත්නේය. ගොවීන් ගොවිතැනේ කළ ඉඩකඩම් ටික උදුරා ස්වකීයයන්ට දුන්හ. එහෙයින් ගොවීන්ට ගොවිතැන් කරන්නට තැනක් නැති විය. ගමක් පාසා තිබුනු කණබිම් නැති කොට ගම සම්පත මේ රජින් තුරන් කරන්නට තැත් කළහ. ගොවියාට ගොවිතැන් කරන්නට කාය ශක්තියත් නුවණත් ගෙනදුන් පස්ගෝරසයත් සමග ගොවියාගේ ප්‍රධාන සහාය කාරයා එසින් නැතිවිය. ඉක්බිතිවැ කියැයුත්තේ ජලසම්පත්තිය ගැනය. ගොවිරටක ඇති උතුම් සම්පත්තිය ජලය බැව් අපි දනිමු. ලක්බිමට වැටෙන වතුර බිඳකුදු නිකරුනේ මුහුදට ගලායනු දැකීම සිංහල ගොවියාගේ බලවත් සංවෙගයට හෙතුවිය. එහෙයින් හෙතෙම හැම දියබිඳකින්ම ප්‍රයෝජන ගත හැකි පරිදි ජලය ආරක්ෂා කෙළේය. ඉංග්‍රීසිහු ඒ සියලු ජලකර්මාන්තයන්ගේ අභාවය ප්‍රීතියෙන් ප්‍රාර්ථනා කෙරෙමින් එයට රුකුල් දුන්හ. වැව් ඉස්මත්තේ ඇති කැලෑ සුඩ කිරීමෙන් වැව් ගොඩවන බැව් අවබොධ කරගැනීමට අමුතු නුවණක් නුවමනාය. නමුත් ඉංග්‍රීසි ආණ්ඩුව මේ සියල්ල සිදුවෙද්දී තුෂ්ණීම්භූතවිය. යුරෝපීයයන්ගේ වැවිලි පක්ෂයෙහි ගැණෙන තේ රබර් ආදී වගාවන්ගේ දියුණුවට ඉතාහිතින් අනුබල දෙමින් පරීක්ෂණ පැවැත්වූ ආණ්ඩුව ශස්‍ය වර්ධනය සඳහා කිසි වෙහෙසක් නොගත්තේය. තරමක වෙහෙසක් ගත්තාක් මෙන් අපට පෙනෙන්නේ එංගලන්තයෙහි සාදන උදලු ආදී උපකරණ විකුණා ගැනීමට යෙදූ උපායක ඡායාවකි. මෙසේ සිංහල ජාතිය සතු අනෙක් සෑම දෙයකට මෙන්ම ගොවිතැනටත් සතුරුව සිටියේ ඉංග්‍රීසි ආණ්ඩුව බැව් දැන්වත් පැහැදිලි වියැයුතුය.

පෙරදිග මහරජුන් විසිනුත් සම්භාෂිතවූ ගොවිතැනේ අනුසස් සිංහල ගොවියා හොඳින් දනී. ලොකයෙහි රජකම ඇරැඹුණේත් ගොවිතැන නිසා යයි හේ නිතර ප්‍රීතියෙන් සිහිකෙරෙයි. නමුත් ගොවිතැනට ඔහු දක්වන අසන්තෝෂය සූදුම සහිතය. අතිශයින් විෂම ඉංග්‍රීසි අධ්‍යාපනයේ උෂ්ණය වැදීමත්, ගොවිතැනට බැසීමෙන් හිඟන ජීවිතයක් ගතකරන්නට සිදුවන බව පෙනීයැමත් මේ අසන්තෝෂයේ හේතුව වන්නේය. ලංකාවේ අධ්‍යාපනය මේ රටට ගැලපෙන්නක් සේ සකස් කොට ගොවියාටත් සමාජයේ තැනක් ලැබෙන සේ ගොවි ජීවිතය නගාලුවහොත් මේ අසන්තෝෂය ගොවියා තුළින් බැහැර කළ හැකිය. මේ විශෙෂ කාර්‍යය සඳහා කළයුතු දේ බොහෝය. එයින් සමහරක් අපේ දැනීම අනුව මෙහි පහත සඳහන් කරනු ලැබේ.

ඉස්සර මේ දිවයිනේ භූමිය රජය සතු පොදු වස්තුවක් විය. දැනට එය පුද්ගලයන් සතුය. භූමිය පෞද්ගලිකව තිබීම ගොවිතැනේ දියුණුවට බාධාකරය. පොළොව භූමිය පුද්ගලයන් කීප දෙනෙකුන් බෙදාගත්විට සාමාන්‍ය ගොවි ජනතාවට වගාකරනු පිණිස ඉඩම් නැතිවෙයි. දැනට මේ ප්‍රශ්නය උග්‍ර තත්ත්වයකට මුහුණ දී සිටී. වර්තමාන දුර්භික්ෂයට මෙයින් ලැබී තිබෙන අනුබලය නොකරම්දැයි අපේ මැති ඇමැති වරුන් විසිනුත් අවබෝධකළ යුතුය. පොදු මුදලින් පවත්නා පාරවල් ධනවත් බස්කාරයන් කීප දෙනෙකුට ඉර හඳ පවතිනා තුරු අඩුලක් උදාහරණයක් නැතිව බුක්ති විඳීමට පාවාදීම නිසා සාමාන්‍ය ජනයා දැනට පත්කළාක් මෙන්ම ඉඩකඩම් ටිකත් කෲර ධනවතුන් සතු කිරීමෙන් ගොවියා දැනට පත්කිරීම නිදහස් ආණ්ඩුවේ යුතුකම නොවන බැව් කියනු කැමැත්තෙමු.

ගොවීන්ට නොමිලයේ උපකරණ සපයා සුදුසු පරදි ධාන්‍ය කොටසක් ගැනීම පෙරළ පැවැති සිරිත විය. මේ සිරිත නැතිව ගියේ විදෙශීයයන්ගේ ගොවි උපකරණ පාලන යුගයේදීය. නිදහස් ආණ්ඩුව මේ කාරණය ගැන සොයා බැලුවොත් මැනවි. මූලාදෑනීන් ලවා ගොවි උපකරණ බෙදා දෙන්නට

ගියහොත් ගොවියා තම තමන් කලකිරෙනු නොඅනුමානය. පසුගියදා මුලාදෑනීන් පෝර වගී බෙදූ සැටි මෙහිදී සිහියට නැගියැ යුතුය. සමහර මුලාදෑනීන් පෝර විකුණා මුදල් ගත් සැටිත් ගොවීන්ට පෝර කඳුලකුත් නොදී ඔවුන්ගෙන් වී අයකරගත් සැටිත් රටවැසියාට තවමත් මතකය. නැවත නැවත ගොවිතැන් කළ යුතුවාක් මෙන්ම ගොවීන් දුකට පත්කොට ඔවුන්ගේ ශ්‍රමය නොමඟින් පැහැර ගන්නා මුලාදෑනීන් සම්බන්ධයෙනුත් නිතර නිතර පරීක්ෂණ පැවැත් වියැ යුතුය. හොඳ ගොවි උපකරණ නොමිලයේ සපයා සාධාරණ පොලියට බිත්තර වී ආදියත් දුනහොත් යළිත් සිංහල ගොවියා ධෛර්යවත් වනු නිසැකය.

**සමූපකාරය**

මේ රටේ නියම සමූපකාරය තිබුණේ ගොවියා ළඟය. සමූපකාරයෙන් තොරව ගොවිතැන් ව්‍යාපාරය පවත්වාලියැ නොහේ. අප කුඩා කාලයෙහි පවා ගොවි සමූපකාරය නැත් කරන ලද්දේ ඔවුනොවුන්ගේ සහාය යෙනි. ඒ සඳහා ගමේ වැඩි පිරිස ගොවියන් වියැ යුතුය. සල්ලි කාරයන් මෙන්ම ගොවීන් නොවන කුලී කාරයන් වැඩිවීමත් දුප්පත් ගොවියාට අවහිරයෙකි. සල්ලි කාරයන් ගොවිතැන් කොළේ මුදල් වැපිරීමෙනි. එයට රැවටුනු සමහර ගොවියෝ පවා ගොවිතැන අතහැර කුලී වැඩට බටුවෝය. ගොවිතැන පමණ ගමේ ජනයා එකට බැඳ තැබූ අනෙක් රස්සාවක් නැති තරම්ය. කුලී වැඩ බහුල වීමෙන් මේ බන්ධනය කැඩී ගියේය. හොඳහිතත් සමගියත් ගොවිතැන් ආදියත් රැකදුන් ගොවීන්ගේ සමූපකාරය යළිත් උදවුවේවායි පතමු.

**කුඹුරු වෙනස් කිරීම**

පැරණි සිංහල ගොවි නීතියේ හැටියට වරක් බාරදුන් කුඹුරක් ගොවියාගේ කැමැත්තක් නැතිව ගම්කාරයාට වෙනස් කළ නොහැකිය. ගොවියා මළත් ගොවියාගේ පරපුරේ කුඹුර වගාකළ හැකි අය සිටින තුරු පවා ගම්කාරයාගේ පමණක් කැමැත්ත අනුව ගොවිපල වෙනස් කරනු ගොවි නීතියට විරුද්ධ හෙයිනි. දැන් පවත්නා ක්‍රමය

අනුව තීමරුද්දේ පවා ගම්කාරයාට ගොවියා වෙනස් කළ හැකිය. මා කුඩා කාලයෙහි රාළහාමි කෙනෙකුගේ කුඹුරක් වගාකළ ගොවියෙක් සිටියේය. හේ එක් දිනක් දානයක් දෙනු සඳහා අන්නාසි ගෙඩි දෙකක් රැගෙන ගෙදර එන ගමන් රාළහාමිගේ ගෙදර පාරේ ආයේය. අන්නාසි ගෙඩි දෙක දුටු රාළහාමිගේ කටට කෙළ උනීය. එය රාළහාමිට ඕනෑවිය. අන්නාසි ගෙඩි දෙක සංඝයා දානයට සොයාගත් බවත් වෙන දෙකක් සොයා රාළහාමිට දෙන බවත් ගොවියා කීය. ඊළඟ වාරයෙහි කුඹුර අනෙක් කෙනෙකුන් කරා යෑමටත් ගොවියාට ගම අතහැර යෑමටත් එයම හේතුවිය. කුඹුර උදුරා ගැනීමෙන් තෘප්ත නොවූ රාළහාමි ගොවියාගේ ඉනේ තිබුනු අඟල් දෙක කූඩක් දිගැති පිහියා කොටය ගෙන ගොස් ලොකු කිරිච්චියක් පොලීසියට පෙන්නා අසරණ ගොවියාට දඩ ගැස්වීය. ගොවියා තමා ළඟ සිටි වැඩි-කෑම්බිය රු. 22 කට විකුණා දඩය ගෙවා බේරුනේය. රාළහාමිගේ ඉඟැන්වීම නිසා බේබදු දාමරිකයන්ගෙනුත් දුගැම් ගොවියාට කරදර විය. හේ ගමත් අතහැර ගියේය. ගොවි පවුල් අනතුරු කරගන්නට ගොස් සිය අදහස් වැළලී ගිය කල්හිත් ඇතැම් ගම්කාරයෝ ගොවීන් වෙහෙසති. පැරණියන් භූමිය පොදු වස්තුවක් කරන ලද්දේ මේ ආදීනව හොඳින් දැන සිටිය නිසාය. නිතර නිතර ඔවුනොවුන් අතර යෑමෙන් කුඹුරත් නිසරු වන්නේය. කරුණු මෙසේ හෙයින් වත්මන ක්‍රමය වහාම වෙනස් කොට භූමිය පොදු වස්තුවක් කළයුතු බවත් කුඹුරක් වෙනස් කිරීමේදී විභාගයක් පැවැත්විය යුතු බවත් කියමු.

ණයකරුවන් වෙමින් අනන්ත දුක් විඳිමින් ගොවියකු ගොවිතැනක් කරන්නේ කුමටදැයි නොදන්නෝ නැත. ගොවියාට ලැබෙන ධාන්‍ය කොටස ඇට ගොවියාගේ වශයෙන් ගණන් කළ හොත් ඔහුගේ අසීතිය ඇහෙන් වැගිරුණු දහඩිය බිඳු සමූහය ඒ වී ඇට සංඛ්‍යාව ඉක්මවා සිටී. මෙවැනි මහන්සියක් ගන්නා ගොවියාගේ ශ්‍රමශක්තිය ඔහු

බඩ ගින්නෙන් පෙළෙද්දී ඉඩම්කාරයාටත් මූලාදෑනියාටත් අත්කර ගැනීමට ඉඩ තැබීම තරම් ජාතික විපතක් තවත් නැත්තේය. එබැවින් ගොවියාට ගොවියාගේ සාධාරණ අයිතිය ලබා දෙන්නට ආණ්ඩුව ඉදිරිපත් විය යුතුය. ගොවියාගේ තවත් සතුරෙක් නම් ගම්බාරේය. හේ වනාහි ගොවියාත් ගම්බාරයාත් අතරේ සිට ගෙන ගොවියා පෙළන්නෙකි. ගොවියාත් ඉඩම් හිමියාත් ලංවන අතර මේ මැද්-දස්සා වහාම ඉවත්විය යුතුය. නැත්නම් ඉවත් කළ යුතුය.

මේ කාලයෙහි ගොවියාට මුහුණ දෙන්නට වී තිබෙන තවත් අතෝරයක් නම් භාෂා ප්‍රශ්නයයි. සාමාන්‍යයෙන් සිංහල ගොවියා ඉංග්‍රීසි නොදන්නා බව නිදහස් ආණ්ඩුව මැනවින් දනී. නමුත් ගොවිතැන් සම්බන්ධයෙන් මුද්‍රණය කර තිබෙන හැම ලියවිල්ලකම වාගේ පෙනෙනුයේ ඉංග්‍රීසි භාෂාවය. ගොවියා එය තේරුම් කරගැනීමට සමහර විට හෑ. තිහ හතළිහක් ඇවිද අතේ තිබෙන මුදලත් වියදම් කරගෙන–හිස් අතින් ගෙදර එයි. කුඹුරු වපුරන කිසිම ඉංග්‍රීසිකාරයකු නැතිවෑ සිටියදීත් අපේ ආණ්ඩුව කරන මේ වැඩ නුවණැත්තන්ගේ හසර හිනාවට හේතුය. අපි පසුගියදා හිඟුරක්ගොඩ ආදී ගොවිජනපද කීපයක් බලන්නට ගියෙමු. එහි දක්නා ලැබෙන්නාහු සියයට සියයක්ම ඉංග්‍රීසි නොදත් සිංහලයෝය. නමුත් සෑම තැනක වාගේ අපට පෙනීගියේ ඉංග්‍රීසි දැන්වීම් මිස සිංහලයෙන් ලියැවුණු දැන්වීම් නොවේ. එහෙයින් එහි නැත්තේ සිංහලය පමණකැයි කියයුතු තරම්ය. නාන තොටුපල් ආදී නොයෙක් තැන්වල සිංහලයන්ගේ දැනගැනීම පිණිස සවිකර තිබෙන ඉංග්‍රීසි දැන්වීම් සමහර නිලධාරීන් විසිනුත් තේරුම් ගත නොහැකිය. එසේම මේ විශාල ගොවි ව්‍යාපාරයත් භාරව සිටින බොහෝ නිලධාරීහු ඉංග්‍රීසි පොඩ්ඩක් හැර ගොවිතැනේ මාශමක්වත් නොදන්නෝය. ඉංග්‍රීසි ස්වල්ප-යක් දැනීම ලෝකත්‍රයයෙහි ඇති සමස්ත විෂය දැනීමකැයි

සිතා සිටින හෙයින්ද කලිසමක් ඇඳ සිටින හෙයින්ද ගොවිතැන ඉගනගන්නා කබා සිංහල ගොවියකු සමග සිංහල බසින් කථාකරන්නවක් ඔවුහු මැලිවෙති.

එහෙත් ආංඩුවේ ගොවිතැන් ව්‍යාපාරය නිසා සැප විඳින්නෝ ඔවුහුය. නමයන්නේත් ඔවුන්ගේමය. එහෙයින්ම ගොවීන් තමන්ගේ දාසයන් සේද තුඹු ගොවීන්ගේ ස්වාමීන් සේද ඔවුහු කල්පනා කෙරෙති. පොළොන්නරුව ආදී ගොවි ජනපදයන්හි නිතර නිතරම නොසන්සුන්කම් ඇති වන්නේ මේ පරකරය නිසාය. මේ දිවයිනේ ගොවිතැන් දියුණු කරනු පිණිස විදෙසීය විශෙෂඥයන් ගෙන්වීමද දුරදිග නොබලා කරන ක්‍රියාවක්සේ අපට පෙනේ. සිංහල ගොවිතැන පිළිබඳ විශෙෂඥයෝ නම් පළපුරුදු සිංහල ගොවියෝමය. මේකාක් ගොවිතැන සම්බන්ධයෙන් හොඳ පටිකල්පන කළාහුත් ඔවුහුය. ඔවුන්ගේ උපදෙස් අපේ ආංඩුව නොපිළිගන්නේ ඔවුන් කලිසන් නොහඳින නිසාත් සිංහලය ව්‍යවහාර කරන නිසාත් වන්නට පුළුවන. ඇත්ත නම් මේ එන විශෙෂඥයන්ටත් ගුරුකම් දියැ හැකි විශෙෂ-ඥයන් සිංහල ගොවීන් අතර සුලභ බවය. හිඟුරක්ගොඩ මුලින් පැමැති මාරිමාගී ක්‍රමය දැනට නිෂ්පලවී තිබෙන බවත් තවත් අභිනව ක්‍රමයක් යෝජනාකර තිබෙන නමුත් එයිනුත් මැඩක් නොවන බවත් හිඟුරක්ගොඩ ගොවියෙක් නොබෝද එහිදී කීය. එසේ කියූ ඒ ගොවියා නියම සාර්ථක ක්‍රමයක් විස්තර කොළේය. කියන දෙය සාර්ථක නම් කියන්නා ගොවියකුවීමත් කියන බස සිංහල බසවීමත් එයට නිගාදීමට හේතුවක් නොවේ. මේ කාරණය අපේ කෘෂිකර්ම නිලධාරීන් විසින් විශෙෂයෙන් සලකා බැලියැ යුතුය.

## ගොවිතැනේ ශාස්ත්‍රීය ක්‍රමය.

හමර ක්‍රියාවකට වුවත් නියම ශාස්ත්‍රීය ක්‍රමයක් ඇත්තේය. දැනට සයෙන්ස් නමින් ව්‍යවහාරයට ගෙනස් තිබෙන්නේ ඒ ශාස්ත්‍රීය ක්‍රමය වේ. එය පොතෙන් උගෙනැ

අත්හදා බැලූ තැනැත්තෝම නියම ශාස්ත්‍රඥයා නම් වන්නේය. සිංහල ගොවීන් අතරත් එබඳු ශාස්ත්‍රඥයෝ පූර්වයෙහි විසූහ. පැරැණි ගඩොල්තැට පවා ඒ බව අප ඉදිරියෙහි කියාපාති. සිංහල ගොවිතැන පිළිබඳ පාරම්පරික ශාස්ත්‍රීය කරුණු ලියා තිබුනු පොත් පතුත් අපට තිබුනේය. රජරට ගොවි කන්නය එබඳු පොතකැයි හඟිමි. නමුත් ඒ පොතේ නාමමාත්‍රයත් දැන් අභාවිතය. වැව්වංශය නමිනුත් එවැනිම පොතක් තිබුනු බව මේ ලඟදී අනුරාධපුරයේදී අපට අසන්නට ලැබුණේය. මේ කථාවන් කොතරම් දුරට සත්‍ය ඒවාදැයි අපි නොදනිමු. නමුත් මේ නම් පරපුරෙන් පරපුරට මහජනයා විසින් ගෙන එන ලද්දේ නිකම්ම නොවන බව නම් අපටත් හිතාගත හැකිය මේ පොත් වැඩි වශයෙන් භාවිතකරන ලද්දේ ගිහියන් විසිනි. දැනට සිංහල ජාතිය සතුව පවත්නා හැම උතුම් දෙයක්ම රැකදුන් නියම ජාති හිතෛෂියා නම් බෞද්ධ භික්ෂූන් වහන්සේය. උන්වහන්සේ අසරණවූ නමුත් බෞද්ධ මැති ඇමතිවරුන්ගේ සරදම් ලැබීමට තරම් තවමත් පසක් නොවූහ.

ඒකී පොත පතක් භික්ෂූන්ගේ භාවිතයෙහි පැවැත්තේ නම් එසේ විනාශභාගී නොවන්නේය. නොයෙක් හේතූන් නිසා එවැනි පොත් පත් නැතිවී ගිය නමුත් ඒ පොත් පත්වල ගැබ්වැ තිබුනු සමහර සිද්ධාන්තයෝ ගොවීන්ගේ සිත්වල නොමැකෙන සේ ඇඳීගොස් තිබුනාහ. ඒවා ඔවුන් විසින් පරපුරෙන් පරපුරට ගෙන එන ලද්දේය. සෘතු ගුණයත් පසත් ඒ ඒ වගාවන් කෙරෙහි බලපවත්වන හැටි පිටිසර පලපුරුදු ගොවියෝ අදත් මැනවින් දනිති. සිංහල ගොවියා භාවිත කළ මේඝ පටල ශාස්ත්‍රයේ සමහර ඥායාමින් ගොවීන් අතර අදත් පවත්නා බව අපි දනිමු. අසුමල් පසේ අසුමල් පළාතේ අසුමල් හොගයන් සශ්‍රීකාවැ වැවෙනැයිද, අසුමල් කාලයට අසුමල් ගස් වැල්වල මල්පල ගටගනිතැයිද ඒ පලතුරු මෙබඳු රසගුණ ඇත්තාහ, යිද, ඒවායේ ගුණ ගුණ ගම් මේ යයිද," ඔවුන් පවසන්නේ දිවසින් දැක්කක් සේය.

සිංහලයන් වැඩියක් විශේෂඥවූයේ ධාන්‍ය ගොවිතැන සම්බන්ධයෙනි. අඹු මිනෝරි ආදිය හැර වී වර්ග පමණක් 310 ක් පමණ මේ පොතේ පෙනේ. ඒවා පිළිබඳ සිංහල ගොවියාගේ විශිෂ්ට අවබෝධය ඉතාමත් තියුණු විය. කුඹුරක් දිහාව බලා මේ කුඹුරෙන් මෙතරම් ප්‍රමාණයක් ධාන්‍ය ලැබෙනැයි පැවැසීමේ ශක්තියකුත් ඔහුට තිබුණේය. ගොවිතැනට සුදුසු පෝර වර්ග තෝරාගැනීම, ඒවා යෙදීම ගොවිතැනට පැමිණෙන විපත්, ඒවා පැමිණෙන වකවානු, එයට කළයුතු ප්‍රතිකර්ම, යනාදී නොයෙක් දේ සම්බන්ධයෙනුත් සිංහල ගොවීන් දැනැ සිටිය ශාස්ත්‍රීය ක්‍රම ඉතා අගනේය.

අලවර්ග සහ ගස්වැල් වර්ග සම්බන්ධයෙනුත් එවැනිම ශාස්ත්‍රීය ක්‍රම සිංහල ගොවීහු පරපුරෙන් පරපුරට පවත්වා ගෙන ආහ. මෙහිලා ඒවා පිළිබඳ විස්තරයක් නොදැක්විය හැකිය. ඒ ඒ වගාවන් ඇරඹිය යුතු නියමිත කාලයන්හිදී ඒවා නො ඇරඹුව හොත් ප්‍රතිඵල ලාභය කෙරෙහි විශ්වාසය නොතැබිය හැකි බැව් අපිත් පුරුද්දෙන් දනුම්හ. සිංහල ශාස්ත්‍රීය ක්‍රමයේ හැටියට හඳ වැඩෙන පක්ෂයේ වගා කරන ඇතැම් භෝග ජාතීහු ඵල නොදරති. පසුගියදා ගොවි ජනපදයක අක්කර අටලොස්සක බණ්ඩක්කා වත්තක් අණ්ඩුවේ වියදමින් වැවී වේලූ, හඳ වැඩෙමින් පවත්නා වකවානුවක එහි පැලසිටුවනු දුටු පිටිසර ගොවියෙක් පැල සිටුවීමට එය නුසුදුසු කාලය බැව් අවධාරණයෙන් කියා පෑවෝලූ. ඉංගිරිසියෙන් සිංහල ගොවිතැන් කරන ආණ්ඩුවේ ඇත්තන් ගොවීන්ගේ කථාවට සමච්චල් කෙරෙමින් පැල සිටුවා වතුර වත්කෙරෙමින් සාත්තු සප්පායම් කළ නමුත් ඒ සියලු වියදමුත් උත්සාහයනුත් සම්පූර්ණයෙන්ම ව්‍යර්ථවූ බැව් ඇසීමු. කරුණු මෙසේ හෙයින් මේ රටේ සෘතු ගුණයටත් මේ රටේ පසටත් අනුව මේ රටේම සකස්වුණු විශේෂ ශාස්ත්‍රීය ක්‍රමයක් ඇති බැව් සලකා ඊට අනුව ගොවිතැන් කරන්නට උත්සාහවත් වන සේ අපේ කෘෂිකර්ම නිලධාරීන් මෙක කරුණාවෙන් දන්වමු. අඹුදරණය, මක්කිඹමර්ග,

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

වප්මාසය, පුබ්බණ්ණ, අපරණ්ණ යනාදී ව්‍යවහාරයන් ඇතිවන්නට හේතුවක් නියමයක් ඇතිවූ ගොවිතැන් කිරීම මෙසී.

ගොවිතැන සම්බන්ධයෙන් සම්මතව පවත්නා මේ කාල නියමය ප්‍රදේශ අනුව තරමක් වෙනස්වන බවද සැලැකිය යුතුය. ඒ ඒ පෙදෙස් වැසියෝ සිය පෙදෙසේ ගොවිතැනට සුදුසු කාලය පුරුද්දෙන් දනිති. අත්හද බැලීම් පවත්වමින් කාලය අපතේ යවනුවට වඩා දහස්වර අත්හද බලා ඇතිකර ගත් ගොවිසිද්ධාන්තයන් ක්‍රියාවත් කරනු නොමරදින සුලු උපාය බැව් සිතිය යුතුය. යන්ත්‍ර සූත්‍ර මගින් ගොවිතැන් කිරීම මෙන්ම දියුණු රටවල පවත්නා නවීන ක්‍රම උපයෝග කර ගැනීමත් නිදොස්ය. සමුත් ඒ ක්‍රම ක්‍රියාවත් කිරීමෙහි මේ රටේ තත්ත්වය ගැනත් සිතිකළ යුතුය. මේ රටේ තත්ත්වයට නොගැළපෙන ගොවිතැන් ක්‍රම මේ රටේ දියුණු කළ නොහැකි හෙයිනි. කෘෂිකර්ම ශිෂ්‍යත්ව දීමේදීත් දැන් පවත්නා ක්‍රමය වෙනස් කළ යුතුය. කෘෂිකර්ම ශිෂ්‍යත්වයක් දී පිටරට යැවියයුත්තේ කෘෂිකර්මය සම්බන්ධයෙන් සැලැකිය යුතු හුහුණුවක් මේ රටේදීත් ලැබූවෙකි. ඉංග්‍රීසි සවල්පයක් දැනීම නිසා තමා දේවත්වයෙහිත් අනුන් කරපණ්ණ තත්ත්වයෙහිත් ලා සලකන තරුණයන්ගෙන් කෘෂිකර්මයට වැඩක් නොවේ. කෘෂිකර්මය උගන්වන උසස් ආයතනයක් ඇතිකිරීමත් කෘෂිකර්මාන්තය දැනැ උගත් හාලතුනා ආචාර්යවරයන්ට එහි පාලනය පැවැරීමත් ඉක්මනින් සිදුවිය යුතු බැව් කියමු.

මීට-

කිරීන්දේ ඥාණරතන (පණ්ඩිත) ස්ථවිර

සරික්කාමුල්ලේ,
සිරිනන්දන පිරිවෙන.
2496 පොසොන් අව. 5.

# ප්‍රකාශක නිවේදනය

සරල සිංහල භාෂාවෙන් ලියැවුණු "සිංහල ගොවිතැන" නැමැති මෙම ග්‍රන්ථය අපේ සිංහල ගොවිතැන පිළිබඳ අතීත තොරතුරු විදහාපාන කැටපතක් බඳුය. සිංහල ජාතියේ අති ශ්‍රේෂ්ඨ ජීවනෝපාය වශයෙන් පමණක් නොව, සිංහල ශිෂ්ටාචාරයේ උල්පත වශයෙනුත් සැලකෙන ගොවිතැන වනාහී බුද්ධාදී උතුමන් විසිනුත් වර්ණනා කරන ලදී. සිංහල සංස්කෘතියේ හැම අංගයක් ගොවිතැන සමග බැඳී පවත්නා හෙයින් ඒ පිළිබඳ තොරතුරු දැන සිටීම සියලු සිංහලයන් ගේම යුතුකමක් බැව් අමුතුවෙන් කියයුත්තේ නොවේ. නමුත් මෙවැනි සිංහල පොත් සුලභ නොවූ හෙයින්ම ඒ පිළිබඳ ඔවුන්ගේ දැනීම ඉතා ස්වල්ප විය. මේ නොදැනීමත් සිංහල ගොවිතැනේ පිරිහීම ඉක්මන් කෙළේය. පණ්ඩිත මැදඋයන්ගොඩ විමලකීර්ති ස්ථවිරයන් වහන්සේ මේ ග්‍රන්ථයෙන් සිංහල ගොවි ජනතාව ඉදිරියෙහි තබන ගොවිතැන් විස්තරය සිංහල ගොවීන්ගේ සිත් අදනාසුලුය. එහෙයින් සිය උරුමයට ආදරය දක්වන සියලු සිංහල සත්පුරුෂයන් විසින්ම මේ පොත කියවා බැලිය යුතුය. පොත මුද්‍රණය කරවීමේ බලය පොතේ කර්තෘභූත ස්වාමීන් වහන්සේ විසින් මෙහි පහත අත්සන් කරන අපහට පැවරූ හෙයින් අපේ අවසරයක් නැතිව මේ පොත මුද්‍රණය කරවීම තහනම් බවද මෙහිදී මතක් කරමිහ. පොතේ මුද්‍රණ කටයුතු හොඳිනුත් කාලට වේලාවට ඉටුකර දුන් මාතර වෙළෙන්දෝ අපේ ස්තුතියට නිමිකාරයෝය.

**H. DON JAMES**

*Superintandent Kiruwanaganga Estate,*

***KOTAPOLA.***

## 1. මූල්වග

# සිංහල ගොවිතැන

මේ දිවයිනේ ගොවිතැන ඇරඹුනේ විජය කුමරුගේ පැමිණීමටත් බොහෝ කාලයකට ඉස්සරය. නමුත් එය ක්‍රමවත්වූයේ විජයාගමනයෙන් පසුව බැව් පෙනේ. ඉතිහාසයේ පෙනෙන පරිදි ආර්යයන්ගේ ගොඩබෑසීමත් සමගම උතුරු ඉන්දියානු ගොවිතැන් ක්‍රමයක් මේ රටේ පැතිරෙන්නට පටන් ගත්තේය. පසුව ඒ ක්‍රමය මේ රටට සුදුසු පරිදි සකස් විය. ලංකාවේ ශාස්ත්‍රානුකූලව වැව් බැඳීම, පණ්ඩුකාභය රජුගේ කාලයෙහි ඇරඹුනු බවට අනුරාධපුරේ අභයවැව සාක්ෂ්‍ය කියයි. සිංහල මනුෂ්‍යයා අවුරුදු දෙදහස-කටත් වැඩි කාලයක් තිස්සේ මේ දිවයින ලෝකයෙහි අතිශයින් සමෘද්ධවූත් ශ්‍රේෂ්ඨවූත් රටක් බවට පරිවර්තනය කරන ලද්දේ වැව් අමුණු පිහිට කොට ගත් ගොවිතැනේ බලයෙනැයි කිය යුතුය. කලා ශිල්පය, සාහිත්‍යය, සංස්කෘතිය, ආගමය ආදී සිංහලයා සතු සෑම දෙයක් ඔහුගේ ගොවිතැන නිසාම ප්‍රභාවත් විය. මෙසේ සිංහල ජාතියේ සමාරම්භයත් සමගම ඒ හා බැඳී පැවැතෙමින් සිංහලයා ජාතියක් වශයෙනුත් සිංහලය රටක් වශයෙනුත් උන්නතියෙන් උන්නතියට පත්කළ සිංහල ගොවිතැන සම්බන්ධයෙන් ස්වල්ප විස්තරයක්වත් දැනගැනීම නිදහස් සිංහල ජාතියට බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය. අපේ දුප්පත් උත්සාහය එහෙයිනි. සිංහල ගොවිතැන ගොඩ මඩ විසින් දෙපරිදි වුවත් මඩ ගොවිතැනම වඩාලාත් සම්භාවිත හෙයින් අපි පළමුකොටම මඩ ගොවිතැන සම්බන්ධයෙන් කරුණු කියම්හ. ගෙද අහස් දියෙන් කරන

ගොවිතැනය වැව් අමුණු දියෙන් කරන ගොවිතැන යැයි දෙපරිදි විය. මුලදී අහස් දියෙන් ගොවිතැන් කළ සිංහලයාට කල් යත් යත් එහි අස්ථිර භාවය වැටහී ගියේය.

ලංකාවේ ගමක් පාසාම ලොකු කුඩා වැව් දහස් ගණනින් ඇතිවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ වැව්වල අල්ලන වතුර ප්‍රමාණයත් ඒ දියෙන් අස්වැද්දිය හැකි බිම් ප්‍රමාණයත් සිංහලයෝ මැනවින් දැන සිටියෝය. යම් රජෙක් ගොවිතැන් දියුණුවට ක්‍රියා කෙළේ නම් ඔහුගේ පෞද්ගලික චරිතය හෝ කෲරකම් සිංහලයෝ ගණනකට නොගත්හ. මහසෙන් රජු දෙවියකු කොට සලකන ලද්දේ එහෙයිනි. අනුරාධපුරය, රෝහණය වැනි වියලි ප්‍රදේශයන් මුල් රාජධානි බවට පත්වූයේත් ඒ රටවල් ගොවිතැනට වඩාත් යෝග්‍යවූ හෙයිනැයි සිතේ. සාමාන්‍යයෙන් කඳු හෙල් රහිත සමතලා භූමින්ගෙන් ගැවැසී ගත් ඒ රටවල කුඹුරුවල සරු පස දියෙන් සෝදා නොයයි. කුඹුරුවලම සරු පස (පෝර) නවතී. එහෙයින්ම කුඹුරු සශ්‍රීක වෙති. සුළු වැස්සකින් පවා වෙඩරු පිඩක් සේ මොලොක් බවට පැමිණෙන – දැඟිය තැනෙන මෙන් රතු පසින් ගැවසීගත් මේ දෙපළාතේ කුඹුරු අදත් ඉතා සවිසාරය. පැරණියන් සාරය අනුව කුඹුරු කොටස්වලට බෙදා තිබුන බවටද නිදසුන් ඇත්තේය. එබැවින් මෙතැන් සිට කුඹුරු වර්ග සම්බන්ධයෙන් ස්වල්ප විවරණයක් ආධුනිකයන් ඉදිරියෙහි තබන්නට වෑයම් කරම්හ.

## කුඹුරු ශබ්දය හා කුඹුරු වර්ගයෝ

ගෛගර මහතා කුඹුරු ශබ්දය ගම්භීර ශබ්දයෙන් බිඳීයි. අපි කෙදාර ශබ්දයෙන් ආයේයැයි කියමු. කෙදාර > කුවුරු > කුඹුරු) යනු ආ ක්‍රමය වේයයි සිතමු. කෙදාර ශබ්දය පිළිබඳ පැරණිම රූපය කුඹුර යනුයි. මධ්‍ය කාලීන රූපය කුම්බුරු යනු වේ. වර්තමාන කුඹුරු ශබ්දය මේ කුම්බුරු ශබ්දය ප්‍රභවකොට ඇත්තේය. කුඹුර එකක් වුවද නොයෙක්

හේතූන් නිසා එය නොයෙක් ප්‍රදේශයන්හි නොයෙක් නම් වලින් හඳුන්වනු ලැබේ. මෙතැන් සිට දැක්වෙන්නේ එබඳු නම් සමූහයක් පිළිබඳ විවරණයෙකි.

1. අකරහ කුඹුරු — (උ. මැ. පළාතේ ව්‍යවහාර වෙයි) වගා නොකළ හැකි අසාර මුඩු බිම් මේ නාමයෙන් හැඳින් වෙන්නේය. අකරහ යනු අකෘෂ්‍ය ශබ්දයෙන් ආ හැකිය. කෘෂිකර්මයට අයොග්‍ය යනු අර්ථයි.

2. අගාර කුඹුරු — මාතර පළාතේ නම් ජල බහුල- එරෙන කුඹුරුද තවත් සමහර පළාත්වල දෙනිකඩද මේ නමින් හැඳින්වෙයි.

3. අගම්පඩි කුඹුරු — යුධ සේවය සඳහාම වෙන්ව සිටි අභ්‍යන්තර භටයන්ට දුන් කුඹුරු අගම්පඩි කුඹුරු නම් වෙති.

4. අග්‍රහාර — බ්‍රහ්මචාරීන්ට දුන් කෙත්වත් අග්‍රහාර නමැයි සංස්කෘත කෝෂ ග්‍රන්ථයන්හි කියතලදී. බුදුන් කල පොක්ඛරසාති බමුණාට ලැබුනු අග්‍රහාරය හේ ස්වෛරීව පාලනය කෙළේය. මරණීය දඬුවම් පවා ඔහු විසින්ම නියම කළ බැව් පෙනේ. විභඞ්ග අටුවාහි එන දීඝරාෂ් වංසනුවද සැලකියැ යුත්තකි. මේ කථායෙහි මුල් අවස්ථාව සම්බන්ධයෙන් යමක් සඳහන් කළ නොහැකිය. එහෙත් ශාසන ඉතිහාසයෙහි පෙනෙන කථාවක් ඒ හා තරමක් දුරට ගළපන්නට පුළුවන. එක්තරා කාලයෙහි දකුණු ඉන්දියාවේ තොණ්ඩනාඩුවෙන් මෙහි පැමිණි කාවිවීර රාඝව නම් කවියෙකුට මානම්බ නැමැති පූජාභිධානයක් ඇති ශාසනය බ්‍රහ්මදෙය වශයෙන් පරිත්‍යාග කළ බවත් ශාසන රාජ්‍යයෙහි මූලාරම්භය ඔහුගෙන් ඇතිවූ බවත් ඒ කථා පුවතෙහි දැක්වෙන නිසාය. වලස්මුල්ල සමීපයෙහි දැනුදු අග්‍රහැරයක් තිබේ. කුඩුමිරිස්ස ශිලා ලිපියෙහි අග්‍රහාර සමූහයක් ගැන සටහන් වෙතත් ඒවා විශාල ගම් නොව කෝවිල්වල සේවය කළ බමුණන්ට දුන් ලොකු කුඩා ගම් කැබෙලි බැව් සැලැකියැ

යුතුය. දකුණු දඹදිවත් මෙබඳු අග්‍රහාර බොහෝය. එබැවින් බමුණු පූජකයන් හා ආචාර්යවරයන්ට සිංහල රජය විසින් ප්‍රදානය කළ ඉඩම් විශේෂය බෙහෙවින් අග්‍රහාර නමින් ප්‍රසිඩවූ බැව් පෙනේ. ඒවා අතර හොඩ මඩ ඉඩම් දෙවර්ගයම තිබුණේය. උතුම් ඉඩම යනු අග්‍රහාර ශබ්දයෙහි අර්ථය වේ. "ආහාර" යනු ඉඩමට නම්.

**5. අට වරල**—කුරුණෑගල පළාතේ ලිස්සා යන මඩවත් වන්නියේ ලිස්සා යන මඩ ඇති කුඹුරටත් අටවරලයයි කියති. මොරවක්කෝරළේ මාවරල නම් ග්‍රාමයක් දනුත් තිබේ. ඉටි සේ ඇලෙන කද මැටි ඇති කුඹුරු අටවරල නමින, සි සිං. ශබ්දකෝෂය කියයි. (වරල ස. ර. වලිඟ, අඩාරමෙලි, සදෘණප්‍රකාශර්ගේ ශබ්දකොෂය 55 පිට.)

**6. අඳකුඹුරු**— අඳයට වගා කරන කුඹුරු අඳ කුඹුරු නම්. අඳ ශබ්දය අඩ ශබ්දයෙන් ආ හෙයින් දෙකෙන් පංගුවට වැඩකරන කුඹුරු අඳ කුඹුරු නමැයි සලකති. එහෙත් අඩ ශබ්දය දෙකෙන් කොටස පමණක් නොව සාමාන්‍ය කොටසද කියන හෙයින් ඒ අදහස නොමැනවි. දෙකෙන් අඳේ තුනෙන් අඳේ හතරෙන් අඳේ යනාදිය පෙනෙන හෙයින් මුලින් කරගත් කතිකාවකට අනුව ධාන්‍යයෙන් කොටසක් ලබාගනු පිණිස ගම්කාරයකුගෙන් හැරගෙන වගා කරන කුඹුරත් අඳකුඹුර නම්වේ. මාතර පළාතේ විශේෂ අඳ කුඹුරු වගයකුදු වෙයි. එනම් ආණ්ඩුවට අයත් ඉඩමකින් ගොවියකු කපා හදාගත් කුඹුරුය. කපා හදාගත් ගොවියාට වගාකිරීමේ ශක්තිය තිබෙනතුරු එය අන් කෙනෙකුට පවරාදීමේ බලයක් ආණ්ඩුවට නැත්තේය. එසේම එය ආණ්ඩුවේ විකිණීමකින් වෙන කෙනෙකුත් ගත්විට ඒ කුඹුර මුල් ගොවියාගෙන් වෙනස් කරන්නට ගැනුම්කාරයාටත් බලයක් නැත. ඉදින් මුල් ගොවියා තමාට කුඹුර වගා කිරීමට නොහැකියයි කියා සිටියොත් කුඹුර අනෙකෙකුට පවරා දී එතැන් සිට කුඹුරේ අස්වනුවලින් දහයෙන් කොටසක් මුල් ගොවියාට දිය යුතුය.

7. අනුබු—"ශෂ්‍ය ඵල කැමැත්තාහු දෙණද් ගොඩද් අනුබුයෙහිද් බිජු වපුරෙති" යනු අමාවතුරැ පාඨයි. (4. පරිච්ඡේදය) මේ අනුබු ශබ්දය ජල බහුල පෙදෙස මෙන්ම ගස් ගල් බහුල පෙදෙසක් කියයි. එහෙත් මෙහිලා ජල බහුල පෙදෙස අදහස් කරනු ලැබේ. (අනූප > අනුපු > අනුබු)

8. ආත්තාජ්ජසබුඹුඤුඩම්— මුලින් තමා සතුව තිබී පසුව අනුන් සන්තක වූණු ගොඩබිම ඉඩම්වලට මේ නාමය ව්‍යවහාර වෙයි. "අන්‍යප්‍රාප්ත" ශබ්දයම ගැමි වහරෙහි මෙසේ උච්චාරණය කරන්නට ඇතැයි සිතේ.

9. අස්වැද්දුම්—කුඹුරක් හෝ කුඹුරු යායක් සමීපයෙහි ඇති ගොඩබිමක් සාපා හදා කුඹුරක් කළ විට ගොවියෝ එය අස්වැද්දුම් නාමයෙන් හඳුන්වති. අමුතුවෙන් අස්වද්දන ලද්ද යන අර්ථය සලකාගතයුතුය.

10. ඉරඹලු—මෙද නොයෙක් පළාත්වල දක්නා ලැබෙන කුඹුරු විශේෂයකි. ශ්‍රීපාද ලේකම් මිටියෙහි මේ කුඹුරු ගැන නොයෙක්විට සටහන් වන්නේය. පළලින් අඩු දිගින් වැඩි කුඹුරුවලට මේ නාමය යෙදී තිබෙන බැව් පෙනේ. ඒවා බැලූ බැල්මට ඉරි මෙන් පෙනෙන හෙයින් ඒ නම අන්වර්ථ වෙයි. මාතර පළාතේ ඉරිකොඩු නමිනුත් මීට සමාන කුඹුරු විශේෂයක් තිබේ.

11. උතුකුඹුරු—උත්තේකුඹුරු යනුත් මේවාටම නම්, පසුකාලයක මේ උතු ශබ්දය ඔතු බවට පෙරළුණු බැව් පෙනේ. ඔතු ඉඩම් යනු නිදසුනි.

ක්‍රි. වර්ෂයෙන් දෙවන තෙවන සියවස් වලදී පමණ හෙළ බසට වැදගත් උත හෝ උතු ශබ්දය නොයෙක් විපර්‍යාස යන්ට මුහුණ පාමින් තව දක්වාත් නොනැසී පවත්නේය. කලින් කල අර්ථ පක්ෂයෙහිත් වෙනස්කම් ඇතිවිය. නිඳ මුත්තෙට්ටුවලින් ඒවා අයිතිකාරයන්ට දෙනු ලබන කොටසට ඔතුව යයිද, ඔතුව මැන වෙන් කිරීමට ඔතු මැනීම යයිද,

ඔතුව් වෙනුවෙන් දෙන කාසිවලට ඔතු කාසියයිද, අඳයට අඳ ඔතුවයයිද උඩරට ජනයා අදත් ව්‍යවහාර කෙරෙති. මෙයින් පෙනෙනුයේ ගම්කාරයාට දියැ යුතු කොටස ඔතු නමින් හැඳින්වූ බවය. දැන් සෙවියැ යුත්තේ උතු ශබ්දයාගේ අර්ථ පක්ෂයයි. වෙල් යායක ඉහත්තාවේ වැවක් ළඟ තිබෙන – ඒ යායේ අනෙක් කුඹුරුවලට වඩා සාරවත් කුඹුරු 'උතු කුඹුරු නමැ'යි සමහරු කියති. ඒ කථාව ඇත්තක් නම් ගොඩ ඉඩම්වලටත් වැවක් අද්දර නොපිහිටි කුඹුරුවලටත් ඒ නාමය නොයෙදෙන්නේය. නමුත් ව්‍යවහාර යෙහි එසේ යෙදුන තැන් බෙහෙවි. එබැවින් ඒ මතය ආදරණීය නොවේ. පුරාණ කාලයෙහි මේ දිවයිනෙහි පැවැති හැම වෙල්යායක්ම සාරත්වය අනුව තෙකොටසකට බෙදා තිබුණේය. අයබදු ගැනීමාදී පාලන ක්‍රම පහසු කරනු සඳහා ය. ඇතියාගෙන් වැඩියත් නැතියාගෙන් අඩුවක් බදු ගැනීම සාධාරණ වන්නාක් මෙන්ම කුඹුරු වලිනුත් සාරත්වය අනුව බදු ගැනීම සුදුසු ක්‍රමය වෙයි. මෙසේ වෙල්යායක් තෙ-කොටසකට බෙදූනු පසු එහි ප්‍රධාන කොටස උත්තේ තරම නමිනුත් ඒ උත්තේ තරමට අයත් කුඹුරු උත්තේ කුඹුරු නමිනුත් ප්‍රසිද්ධ විය. රූපසිද්ධි සන්නයෙහි 'උකකටවුකකටවං" යනුවට උත්තෙන් උත්ත කියාත් ජාතක ගැටපදයෙහි ධුරම"ගගං" යනුවට උතු තඩ කියාත් අර්ථ කී හෙයින් උත හෝ උතු ශබ්දය ප්‍රධානාර්ථයෙහි වැටෙන බව පෙනේ. උත යනු උච්ච ශබ්දයෙන් ආ හැකිය. (උච්ච > උච > උත > උතු) උත්තේ යනු උතු ශබ්දය සප්තමී විබත් ගත් තැනි. (උතුවේ > උත්වේ > උත්තේ) උත්තේ හෙවත් උතු තරමෙහිවූ කුඹුරු උතුකුඹුරු නම්හ.

**12.** **ඌරුබිම්**— මුහුදු සමීපයෙහි තිබෙන ලවණරසය නිසා වගා නොකළ හැකි ලුණු සාර බිම් ඌරුබිම් නම්. ඌරු ශබ්දය ඌෂර ශබ්දයෙන් ආවා විය හැකිය.

**13.** **ඔලගම්**— මෙද අපට තේරුම් ගත නොහැකි ශබ්දයෙකි, කල්ලර ඔලුගම්, දියනැමුනු අත ඔලගම්, වැව

ඉහල ඔලගම් හෙවත් වැවට දියහැලුනු අත ඔලගම්, සී ඔලගම් කීප වර්ගයක් තිබූන බව පෙනේ. ලොකු කුඹුරුවලට අයත් කුඩා කුඹුරු විශේෂයක් විය හැකි යයි ආර්. ඇල්. බ්‍රොහියර් මහතා කියයි. ඔලගම් යනුව මහගම් යන්නට මුලින් බොහෝවිට යෙදී තිබේ. ඔලගම් මහගම් යනු විසිනි. කුඩාගම් සහ ලොකුගම් යනු එහි අර්ථය වේ. මුද්‍රිත පූජාවලි යෙහි "හොළුගම් මහණගම්" යන පාඨයක් පෙනේ. (රතනසාර සංස්කරණය 684) එහි මහණ යනු මහ වූවිට "හොලගම් මහගම්" යන පාඨය ලැබේ. මෙයින් පෙනෙනුයේ ඔල යනුව ඇතැම්විට හොල කියාත් සිටි බවය. ඒ හොල යනුව "සුලු" ශබ්දයෙන් ආවකැයි සිතේ. තවත් සෙවිය යුතුයි. (සුලු – සොල – හොල)

**14.** ඔබිලාන්— කැරන් ආදි පැලෑටිවලින් ගැවසීගත් ජලාශ්‍රය ඇති කුඹුරු විශේෂයට මේ නමි. විලාන් යනු වලාන ශබ්දයෙන් ආවක්ද නැතහොත් විල ශබ්දයම විබත් ගෙන සිටි හැකක්දැයි සෙවියැ යුතුය.

**15.** ඔහොර කුඹුරු— මේවා බෙහෙවින් ගං හෝ අද්දර පිහිටා තිබේ. ගගේ හෝ ඔයේ ජලය අඩු වැඩිවීම අනුව මේ කුඹුරුවලත් ජලය අඩු වැඩි වන්නේය.

**16.** කට්ටකාඩුව— කුඹුරු යායක් සාරත්වය අනුව තුනට බෙදූවිට සාරත්වයෙන් අඩුම කොටස පැස්සේ තරම නම්ද ඒ තරමට අයත් කුඹුරු පැසි කුඹුරු නම්ද වෙත්. කට්ටකාඩු යනුත් ඒ පැසි කුඹුරු වලටම ව්‍යවහෘත නමෙකැයි කියත්.

**17.** කන්දැති කුඹුරු— කාඩුගන්නාව වැනි කඳු පාමුල තිබෙන ඉතා කුඩා ලියදිවලින් යුත් කුඹුරු මේ නමින් හඳුන්වනු ලැබේ. අඳුඅද්දර පිහිටි කුඹුර යන අර්ථය වියැ හැකිය. පිදුරු සහ කරල් ගොඩ ගැසූ තැනටත් කන්දැත්ත යයි කොත්මලේ කියත්ලු. වැව්දැත්ත යනාදිය සමගත් සමකර බලනු.

**18. කරමාරු කුඹුරු** — මේවා මාතර පළාතේ බෙහෙවින් ඇත්තේය. අතින් අත මාරුවන කුඹුරු යනු අර්ථයි. වැඩි වශයෙන් මේ ගණයට වැටෙන්නේ හවුල් කුඹුරු බැව් සැලැකියැ යුතුය. එනම් කුඹුරක එක කොටසක් සශ්‍රීකත් අනෙක් කොටස නිශ්‍රීකත් වූවහොත් කුඹුරු දෙකට බෙදා එක පක්ෂයක් සශ්‍රීක කොටසත් අනෙක් පක්ෂය නිශ්‍රීක කොටසත් කලින් කල වගා කෙරෙති. තට්ටුමාරු යනුත් මේ කුඹුරුවලටම සමහර ප්‍රාන්තවල වහරන නාමයෙකි. කුඹුර දෙකොටසකට හෝ තෙකොටසකට බෙදූ කල ඒ කොටස් තට්ටු නමින් හැඳින්නෙයි. උඩ තට්ටුව මැද තට්ටුව පසු තට්ටුව හෝ පහත තට්ටුව කියාය. හවුල්කාරයන් අතර කලින් කල මේ තට්ටුමාරු වන හෙයින් තට්ටුමාරු නාමය යෙදී තිබේ.

**19. කැලෑළි කුඹුරු** — මේ වනාහි සිව්වන මිහිඳුගේ යයි සැලැකෙන දළදා මාලිගා ලිපියෙහි පෙනෙන වචනයෙකි. කැලෑ ලියූ හෙවත් කැලෑ ශුද්ධ කළ කුඹුරු කැලෑළි කුඹුරු හැටියට ගණන් ගත හැකිය. (ලියූ > ලිය් > ලී > ළි)

**20. කිණිගම්** — මේ වචනය ශිලා ලිපි කීපයක මෙන්ම ව්‍යවහාරයෙහිත් දක්නා ලැබෙනත් සැඟවුණු අර්ථ ඇතියෙකි. කිණි ශබ්දය කෙණි ශබ්දයට බෙහෙවින් සමාන හෙයින් රජුට බදු දී හැරගෙන සඟ සතු කළ ඉඩම් එයින් කියැවෙන්නේයයි අනුමාන කළ හැකිය. "කෙණී"ති රඤ්ඤො දාතබ්බා ආයො" යි විනයටීකාදියෙහි කී හෙයින් රජුට දියැයුතු බද්ද කෙණිය නම්. සමහරුන් රජුට බදු ගෙවා ඉඩම් ගෙන සඞ්ඝභොගය සඳහා යෙදවූ බව නොයෙක්විට දක්නා ලැබේ. තවත් සෙවියැ යුතුය.

**21. කිරිමා කළ කුඹුරු** — පැපිලියාන පිළිබඳ පැරණි ලේඛනයක "පල්ලෙවෙල බඩින් කිරිමා කළ කුඹුරු එකකට උත්තේ තරමින් එක්මුණු එක් පැළ එක් ලාස්සෙක්........." යිද, සඞ්ඝාලඞ්කාරයෙහි "තුමූ මාගම හිඳ කුඹුරු කිරිතකමා බොහෝ ගොයම් කැනවූහ" යිද (සිරි ඤාණිස්සර සංස්කරණය

460) පෙනෙන හෙයින් කිරිමං කළ කුඹුරු නමින් ඉඩම් විශේෂයක් පැවති බව පැහැදිලි වෙයි. සද්ධර්මාලංකාරයෙහි එන කිරි තැනැවීමත් මේ කිරිමං කිරීමත් අතර කරමක සම්බන්ධයක් පෙනෙතත් දෙශබ්දයේම අර්ථය නොපැහැදිලිය. කිරිමව්නම් කිරීමට කිරිමං නම් කිරීමයයි සද්ධර්මරත්නාවලි-යෙහි පෙනේ. "කුඹුරු කිරිකනවා" යන්නෙන් කිරිගණින් කුඹුරු තනවා යන අර්ථයත් ගත හැකිදැයි සොයත්වා.

**22.** කුසලාන්— දූන් කොහොලන් (කොහොලාන්) නමින් ප්‍රසිද්ධ කුසලාන් වනාහි කුසල් පිණිස දුන් ඉඩකඩම් ය.

**23.** කොන්කමැරවැගිය කුඹුරු— මුලදී තමා සතුව තිබී පසුව අන් සතුවූ ඉඩම් මේ නාමයෙන් අදහස් කරනු ලැබේ. ඉහත දැක්වූ ආන්තපපට්ටු ඉඩමුත් මෙවා මැයි.

**24.** කොළවෙලි— (අ. වතුර 139) මුලින් කී කට්ටකඩු වලටම මේ නාමය ව්‍යවහාර කරතැයි සමහරු කියති. ගලපාත පැපිලියාන යන ලේඛනයන්හි කොළවෙලි නමිනුත් අඹගමු ලිපියෙහි කොටවෙලි නමිනුත් සබරගමු ලක්ෂ්මණ දෙවාලය ලිපියෙහි කොළුවෙණී නමිනුත් හඳුන්වන ලද්දේ එකම ඉඩම් විශේෂයකැයි සලකන්නට ඉඩ තිබේ. කොළ ශබ්දය අර්ථ කීපයකම වැටෙතත් මෙහිලා එයින් ශස්‍යාර්ථය ගනු වඩාත් සුදුසු සේ පෙනේ.

ගලපාත ලිපියෙහි කොළවෙලි ශබ්දය සාමාන්‍ය වගාව යන අර්ථයෙහිත් යොදා ඇත්තේය. මේ කොයි නිදසුන් වලිනුත් අපට පෙනී යන්නේ වගා කළ ගොඩ ඉඩම් කොළවෙලි නමින් හැඳින්වූ බවය. ගොඩ සහ වෙල යන අර්ථය වුවත් එයට දිය හැකිය. කොළවෙල් වලින් අයකළ බද්දට කොළවෙල් අය කියාද කොළවෙලිවල වැඩකළවුන්ට කොළවෙල්ලු කියාද ව්‍යවහාර කෙරෙත්. "කාණුවක් කොළ" සි. ව. විසිය 45, "කොළ බිජු කෙනෙක්" අ. වතුර 93 (සොරත) යනාදියක් සලකනු.

**25.** ගණේකුඹුරු— භික්ෂූන්වහන්සේත් උන්වහන්සේගේ වාසස්ථානයත් ගණ ශබ්දයෙන් අදහස් කරනු ලැබේ. එබැවින් විහාරස්ථානයකට හෝ භික්ෂූන්වහන්සේලාට හෝ පූජාකළ කුඹුරු ගණේ කුඹුරු නමැයි සලකම්හ.

**26.** ගම්කොටුව— ගම් ශබ්දය ගමක් මෙන්ම ගමකින් කොටසක්වූ ඉඩමත් කියයි. වැටකින් හෝ අගල් ආදියකින් වෙන් කළ කුඩා ඉඩම ගම්කොටුව නමැයි සැලැකිය හැකිය.

**27.** ගම්පංගුව— විහාර දෙවලයාදියක හෝ මාළිගාවෙහි හෝ සේවය කරන පහත් සේවකයන්ට එක ගමක් බෙදූ දුන් විට ඒ එක්කෙනෙකුට ලැබෙන පංගුව ගම්පංගුව නම්.

**28.** ගම්පැලැස්ස (පාළුවූ තැන්)— කුඩා කුඹුරු කීපයකින් යුත් ප්‍රදේශයට මේ නම්. පිලැස්ස ශබ්දයෙහිත් මේ පැලැස්ස ශබ්දයෙහිත් සම්බන්ධයක් පෙනේ. උඩසි, යටසි, මැලැසි යනාදිය සමගත් සමකර බලනු.

**29.** ගම්මුදල— තුදුස්වන සියවසේ සිට ලියැවුණු ලිපි සමූහයකම මේ වචනය දක්නා ලැබේ. ලංකාතිලක විහාර ලිපියෙහි තිබෙන "ගම්මුදල" යන්න වෙනුවට එහිම ඇති දෙමළ ලිපියෙහි පෙනෙන්නේ "ඌර්නාක්කම්" කියාය. දක්ෂිණ භාරතීය ලිපිවලත් මේ ඌර්නාක්කම් ශබ්දය බෙහෙවින් පෙනේ. වෙල් යායක් මැද තිබෙන කුඩාගම, ගමක තිබෙන ගෙවල් යාය, ගෘම් ගෙවල්වලට යටවී තිබෙන බිම් කට්ටිය, යනාදී අර්ථයන්හි එය වැටෙයි. මෙහිලා ගෙවල්වලට යටවූ බිම්හරිය එයින් කියැවෙන්නේ යයි සිතිය හැකිය.

**30.** ගෑනුබින්නාඬම්— අපේ රටේ විවාහ ක්‍රමය දීග, බින්න වශයෙන් දෙපරිදි වෙයි. දීග ගිය දූවකුත්, බින්න විවාහයට පත්වූ දූවකුත් ඇති පියකු කාලක්‍රියා කළහොත් ඒ පියාගේ ආසතිය (වස්තුව) බින්න විවාහයට ගිය දූවට හිස

දීඝ විවාහයට ගිය දූවට අයත් නොවේ. මේ නීතිය අනුව ගෑනුන්ට අයත්වූ ඉඩම් ගෑනු බින්න ඉඩම් නමැයි සලකම්හ. මේ පිළිබඳ විස්තරය නීති නිඝණ්ඩුවේ 68 වන පිටේ සිට පළවී ඇත.

**31.** තරඹි කොත— තරඹි නම් හොඳ වී හෝ මා වී ආදී දූඹි වීය. ඒ තරඹි ඔපුරන කොත තරඹි කොත නමැයි සල-කම්හ. සොයන්වා. "තරඹියෙහි බොල්ලා" යනු දශ ජාතක යෙහි (51 පිට) පෙනේ.

**32** කාඩළු— කුරුණෑගල පළාතේ ජල බහුල කුඹුරුවලට මේ නාමය යෙදේ. කා (තොය) යන්නෙන් ජලයත් වළු යන්නෙන් ආවාටයත් ගත්විට එයින් දියවළ යන අර්ථය ගෙන දෙයි. ගලවළව (=බෙල්ලේවළ) යනාදිය සමගත් සසඳනු.

**33.** තොය— උයන්තොය, මහතෙල්තොය යනාදී තන්හි තොය ශබ්දය පෙනේ. එයින් විලක් කියැවෙතත් ඒ විල ජලාශයක්ද නැතහොත් කුඹුරක් දැයි සිතාගන්නට තරම් නිදසුන් තවමත් නොලැබුණේය. තොය යනු තෝය ශබ්දයට සමානය.

**34.** දන්වරුපෙත්— භික්ෂූන්ගේ දානය පිණිස පූජාකළ කුඹුරු දන්වරුපෙත් නම්හ. "සොලොන්කරු දන්වරු-පෙතින්" යනාදිය නිදසුනි.

**35.** දරාඹු— මේ කුඹුරු විශෙෂය විස්තර කරන්නට පෙරාතුව දරාඹු ශබ්දය යෙදී තිබෙන තැන් කීපයක් දක්වාලීම ආධුනිකයන්ට ප්‍රයෝජනවත් විය හැකිය. 1. සඳහාබඹුරෙ, ගැල්දරණ්ඩෙයි (ධම්පියාසන්නය 175 පිට) 2. කුඹුරුලිඟ දිලෝ දැලින් ඔසා කුඹුරු …ණ්ඩෙයි සිය දහස් ලක්‍ෂ ගණන් මහ සැළ පිළිවෙළින් තබා (පූ. වලිය රත්නසාර සංස්කරණය 533) 3. ලොකශාසන නැමැති මහා ශාලි ක්ෂෙත්‍රයෙහි දරහඩ බඳනාලේය. (එම 575) 4. දරණ්ඩකුඹුර බිජුදෙපෑළද (නිලමල සන්නස) 5. බලවිනිමුක්කොබ්බූවේ

දණ්ඩින් දෙව්ගොඩ බින්වාසිය ගෙලමුණෙන් සහිය (මැද්දේගම සන්නස) 6. බෙතකපස මාණගහ ණඩාය, නොක්වක්හි පමණ ගන්නට දණ්ඩලෙකම් ගන්නට යුතුසේසි. (කාමජාතක ගැටපද) යනු එසේ යෙදී තිබෙන තැනි කීපයෙකි. එයින් "ගැල්දරාණ්ඩ" ශබ්දයත්, "ශාලික්ෂෙත්‍රයෙහි දරහඩ බඳනා ලස්ස" යනුත් දරාඩ ශබ්දයෙහි අර්ථය තේරුම් ගැනීමට ඉතා ප්‍රයෝජනවත්ය. ගැලෙහි ඉදිරි පැත්තත් කුඹුරට පිවිසෙන ප්‍රධාන මාර්ගයත් එයින් කියැවෙන හෙයිනි. කුඹුරෙහි ප්‍රධාන ඉදිරි පැත්තට සහ වැකණ්ඩියේ ඉස්මත්තට අදත් දරාණ්ඩයයි කියති. හතරකෝරළේ පහළ ලියද්ද දරාණ්ඩ ශබ්දයෙන් හඳුන්වති.(ධුරබණ්ඩ > දරහඩ > දරාඩ) යනු නිෂ්පාදන ක්‍රමයයි.

36. **දිවෙල්**— ජීවිතයත් ජීවිතය ගෙනයැමට උපමනා-දේත් දිවෙල් ශබ්දය කියයි. ආණ්ඩුවේ හෝ විහාර දෙවාලය-වල සේවය කරන්නන්ට පරිත්‍යාග කළ ඉඩ කඩම් මෙහිදී එයින් අදහස් කරනු ලැබේ. (ජීවිත > දිවෙල > දිවෙල්)

37. **දුක්ගන්නා කුඹුරු**— සාමාන්‍යයෙන් රජුට සේවය කිරීම දුක්ගැනීම නමින් හැඳින්වෙතුදු දුක්ගන්නා රාජකාරිය නමින් විශේෂ රාජකාරියකුත් සිංහල රජුන් කල තිබුණේය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම එහි යෙදුනාහ. ඒ දුග්ගන්නා රාජකාරිය කළවුන්ට දුන් කුඹුරු දුක්ගන්නා කුඹුරු නම්. ඒවා සම්බන්ධයෙන් යම්කිසි ආරාවුලක් ඇතිවූවිට එය විනිශ්චයකොට සමථයට පැමිණවීමේ බලය රජුට මිස අන්‍ය මූලාදෑනියෙකුට නොතිබුනේයයි ඩොයිලි මහතා කියයි.

38. **දුඹුරුබිම්**— මෙයින් සීසෑම් ආදියෙන් මඩකළ බිම් අදහස් කරන ලදැයි සිතේ. වර්තමාන ව්‍යවහාරයෙහි ගොහොරු බිම් යනුත් මේ අර්ථයෙහිම යෙදේ.

39. **දෙදුරු**— (ද්‍රු. වංශය 147) මෙය නුවර පළාතේ ව්‍යවහාරයෙකි. ගහලගස් මීමත ආදියෙන් ගැවසීගත් නිතර දිය සීරාව ඇති පහත් බිම් දෙදුරු නම්හ. දෑදුරුඔය යන තැන තිබෙන දෑදුරු යනුත් සලකා බැලියැ යුතුය.

40. දෙනි— කඳු දෙකක් අතර පිහිටි – දිගටියට හුරු කුඹුරු විශේෂයට අපි දෙනි නාමය දෙන්නෙමු. සාමාන්‍යයෙන් දෙනියක් දොනියක (ඔරුවක) හැඩය ගන්නා හෙයින් ඒ නාමය සාර්ථක වෙයි.

41. දෙමළ කැබෙලි— මධ්‍යකාලීන බොහෝ රජදරුවන් විසින් දෙමළ සොල්දාදුවෝ මෙහි කැඳවන ලදහ. ඔවුන්ට දුන් ඉඩම් කැබැලි දෙමළ කැබැලි නම්වේ.

42. දෙගෙලාන්— විහාරස්ථානවලට කුසල් පිණිස දුන් ඉඩම් කුසලාන් වූවාක් මෙන්ම දෙවියන් නමට දේවාලයවලට දුන් ඉඩම් දෙගෙලාන් නම් විය. කුසලාන් ශබ්දය බලාගෙන නිපදවාගත් ශබ්දයක් සේ සැලැකිය හැකිය. අසූ ශබ්දය බලාගෙන අනූ ශබ්දය නිපදවා ගත්තාක් මෙනි. ද්වීපත යනුත් දෙනියටම කියන නමකැයි අසනු ලැබේ.

43. නිලපංගු— නිලය නැතිව යැමෙන් පාලුවන ඉඩම් නිලපාලු නම්. යමෙකුට සැලැකිය යුතු නිලයක් පවරනවිට නිලයේ ගරුත්වයත් ජීවිතයත් රැකගනු පිණිස ඉඩම් දෙනුත් සිංහල රජුන්ගේ සිරිත විය. නිලය නැතිවන්නාහාම ඉඩමුත් නැතිව යෙයි. නිලධාරියාගේ මරණය ස්වාභාවිකව සිදුවුවොත් ඔහුගේ පවුල ගැන විශේෂ සැලකිලි දක්වනු ලැබේ. ඉදින් නිලධාරියා වරදක් නිසා රාජදණ්ඩනයට යටත්ව මෙලෙක්හම් ඔහු සතු ඉඩකඩම් ආණ්ඩුවට ගැනීමේදී ඔහුගේ ගෑනු දරුවන්-(විශේෂයෙන් අවිවාහක අය) වෙනුවෙන් කොටසක් හරිනු සිරිති.

44. නින්දඉඩම්— අන්‍යයෙකුට අයිතිවාසිකමක් නැති තනි උරුමයෙන් යුත් ඉඩම් නිඳඉඩම් නමුත් ඒවායේ අයිතිකාරයෝ "නිඳකාන්" නමුත් වෙති. "ඔරුවකුක්කොළුකි ගෙමොයාකාඉඩම්" (එක්කෙනෙකුටම උරුම ඉඩම) යි මදුරාසි විශ්වවිද්‍යාලයෙන් නිකුත් කළ දෙමළ කෝෂයෙහි කීයේ එහෙයිනි. රාජකීය නිඳඉඩම්වලට ගබඩාගම් යනුත් නම්. නිඳ වශයෙන් ලැබෙන ගම්පංගුව "නිඳපංගු" නමින්

ප්‍රසිද්ධය. "නිඳ" ශබ්දය "නිජ" යන්නෙහිම දෙමළයට හුරු උච්චාරණය වේ.

**45. පමුණු—** යම්කිසි ක්‍රියාවකින් සතුටුවූ රජෙකු හෝ වෙන අධිපතියකු විසින් ලබන්නාගේ පරම්පරාව විසිනුත් භුක්ති විඳිනා හැටියට බලය ලා දෙන ඉඩම් පමුණු නම්. ඒවා රජතුමාටත් තිබුණේය. (පවෙණි > පවුණු > පමුණු)

**46. පැස්සේ කුඹුරු—** සාරත්වය අනුව කුඹුර තෙ-කොටසකට බෙදූවිට එයින් අධම කොටස පැස්සේ තරම වේ. ඒ පැස්සේ තරමට අයත් කුඹුරු පැස්සේ කුඹුරු නම්හ.

**47. පිදුම්—** පුදනලද ඉඩම යනු මෙහි අර්ථයයි. පිදීම දේවාලයකට හෝ විහාරයකට විය හැකිය.

**48. පිසඹුරු කුඹුරු—** පිසඹුරු ශබ්දය සෙවෙල් විශෙෂයක් කියයි. (බු. සරණ 265, පූ. වලිය 434, සිඛවළඳවිනිස 45, 46 – යොගාර්ණවය 163) යන තැන් බලනු. එහෙත් නාම් විභාගය නැමැති පැරණි සිංහල පොතක එක පායක් පිසඹුරු තේරුම් ගැනීමෙහිලා අතිශයින් ප්‍රයොජනවත් වන්නේය. එනම්:– "දියෙහි හිඳුනා සෙවෙල් සේ ඉවරලොමූදු හටගනී. පිසඹුරු සේ හිසකෙහෙඳු හටගනී" යනුයි. මෙයින් පෙනෙනුයේ පිසඹුරු සෙවෙල්ම නොව එවැනි හීන් පැලෑටි විශෙෂයක් බවය. සමහර කුඹුරු තෘණාදීන්ගෙන් විරහිතව මේ කුඩා පැලෑටිවලින් ගැවසීගෙන තිබෙනු නොයෙක්විට දක්නා ලැබේ. කුඩුමැටියා පවුලට අයත් මේ කුඩා පැලෑටි විශෙෂයෙන් යුත් අසාර කුඹුරු පිසඹුරු කුඹුරු නමැයි සලකම්හ.

**49. පිලැස්ස—** පැලැස්ස යන්නට ලියූ විස්තරය බලනු. පිලැසි යනු ප්‍රකෘතිය වේ. සී සෑ කුඹුරක නොසෑ වී ඉතිරිවූ හරියට පිලැස්ස යයි කොත්මලේ කියත් ලු. වගාකළ කුඹුරු කට්ටියක තැනින් තැන තිබෙන වගා නොකළ කුඩා ඉඩම් කැබැලි පිලැසි වන්නට පුළුවන. කැලෑවක ගස් වැල් නැති කුඩා පැලෑටි ඇති හරියක් පැලැස්සකි.

**50.** පුරඳ කුඹුරු—"සොහොන් කාලෙකක් අස්සොවක් පුරඳුව තිබෙන ගෙදණ්ඩක් කියන්නවුන් මෙන්" යනු සබඹ රත්නාවලි පාඨයි. (ජයතිලක 113 පිට) වතුර නැතිවීම් ආදිය නිසා වගා නොකළ හැකි පුරන්ව තිබෙන කුඹුරු මෙනමින් හඳුන්වනු ලැබේ. පුරන් යනු මේ පුරඳ ශබ්දය ප්‍රභවකොට ඇත්තේය.

**51.** පෙරමාස් කුඹුරු— මාස් මෝසම වනාහි මහමාස පෙරමාස මාස්පස්ස යයි නොපරිදිකොට සමහරු දනිති. සාමාන්‍යයෙන් මහමාස වපුරන ලද්දේ වප් මාසයෙහිය. පෙර මාස එයට දින කීපයකට ප්‍රථමයෙන් වපුරන ලදී. මෙසේ යම් යම් හේතූන් නිසා මහමාස වැපිරීමට ටික දිනකට ප්‍රථමයෙන් වැපිරූ කුඹුරු පෙරමාස් කුඹුරු නමින් ව්‍යවහාර විය. මේ කුඹුරු වර්ගය රයිගම් කෝරළයේ අදත් තිබේ.

**52.** බඩවැඩිලි — පහත් සේවකයන්ට දෙන දිවෙල් මේ නමින් අදහස් කරනු ලැබේ. ආහාරය සපයා ගැනීම පිණිස දෙන මුදල් ආදිය මෙන්ම ඉඩමුත් මේ නමින් හඳුන්වන ලද්දේ බඩ පවත්වා ගැනීමට ඒවා උපකාර වන හෙයිනි. (වඩ්ඪන > වැඩිති > වැඩිලි)

**53.** බත්ගම්— බත් පිණිස දුන් ගම් බත්ගම් නම්. ගොඩ මඩ ඉඩම් කොයිවත් මේ ගණයට අයත් විය හැකිය. මෙය යම්කිසි සේවයක් සඳහා දෙනු ලබන දිවෙලටම නමෙකි.

**54.** බදුකුඹුරු— මෙහි බදු ශබ්දය බඩ ශබ්දයෙන් ආයේය. අයිතිකාරුට බදු ගෙවා වගාකර ගත් කුඹුරු බදු කුඹුරු නම්.

**55.** බිසෝ පත්තු— "එකලට එම මහරජහට අග මෙහෙසුන් තැන්පත් ශිරිවසා සුනෙත්‍රා මහා දෙවි යන රාජමහිෂිකාවන්ට බිසෝපත්තුවට තුබූ මායා රජයෙන් ඒ අවධියේ පද්දුමෙල නම්වූ දැන් මේ අලුත්නුවර ගමක්" යනු පැරණි ලිපියක එන වාක්‍යයෙකි. (විසුද්ධිමග්ග සන්නය 2වන

කාණ්ඩයේ මූල) මෙයින් පෙනෙනුයේ නිසොංවට අයත් වත්ත නිසෝප්පත්තුව බවය. ගත්කතු උපන්නෝත් නිසෝප්පත්තුවක වේ.

**56.** භොගගම්— කේරලභොග යනාදී තන්හි විශාල රාජ්‍යයකුත් භොග ශබ්දයෙන් කියැවෙත්තෝය. එහෙත් මෙහිදී මහා සඞ්ඝයා වහන්සේට සිව්පස පරිභොග කරනු පිණිස පරිත්‍යාග කළ ගොඩ මඩ ඉඩම්වලට භොගගම් යයි කියත්.

**57.** මළපාලු— මළහූමි, නිසරුබිම්, මලපලා යනුත් මේවාටම නම්. අයිතිකාරයාගේ මරණයෙන් පාලුවන ඉඩම් යනු අර්ථයි. අයිතිකරුවා මළ පසු ඔහුගේ ඉඩකඩම්වලට අයිතිවාසිකම් කියන්නට පාරම්පරිකයෙක් නැත්නම් එවා රාජසන්තක වනු නීතිය වෙයි. සිංහල ආණ්ඩුව විසින් විහාරස්ථානවලට පූජාකළ ඉඩම් අතුරෙන් බොහොවක්ම මේ මළපාලු බැව් පෙනේ. පුරප්පාඩු ඉඩම් යනුත් මේවා මැයි.

**58.** මැද්දේ කුඹුරු— ඉහතකී පරිදි සාරත්වය අනුව වෙල්යායක් තුනට බෙදූ විට සාරයෙන් මධ්‍යම ප්‍රමාණයට ගැණෙන කොටස මැද්දේ කරම නමුත් එහිවූ කුඹුරු මැද්දේ කුඹුරු නමුත් වෙති. උතු, මැදි, පැසි යන තෙශබ්දය සප්තමී විබත් ගත්විට උතුයේ, මැදියේ, පැසියේ යි සිටී. පසුව මධ්‍ය ස්වර ලොප් කොට පෙරරූකළ කල්හි උත්තේත්, මැද්දේ, පැස්සේ, යි සිටියි.

**59.** මූගසින්— නාකොලගාන ලිපියෙහි (බැල් මහතාගේ කෑගලු වාර්තාව බලනු) "නාගලව වටනා පසයට සිදූ මූගසිනායි" යනාදිය පෙනෙන හෙයින් මෙනම්නුත් කුඹුරු විශෙෂයක් තිබුන බව පැහැදිලි වන්නේය. සමහර කුඹුරුවල හීනැටි මිසැ මූංඇට නොවපුරණ සේ නීති පණවා තිබුන බව ඉසුරුමුනි සන්නසින් දක්ක හැකිය. අනුරාධපුරය සමීපයෙහි මූගායතන නමින් ප්‍රදෙශයක් පැවැති බව රසවාහිනියෙන් පෙනේ. මූගසින යනු සිංහල වචනය එසේ පාලි කළා විනා

සිංහල වචනය පාළියෙන් ආවා නොවේ. දෙවන සේන රජු ප්‍රමුඛ කීපදෙනෙකුටම මුගයින් යනුව උපාධියක් වශයෙන් ලැබුණේ එහි උපන් හෙයින් හෝ අනෙක් සැලකියයුතු වැදගත් කාරණයක් නිසා හෝ විය හැකිය. මුගයින යන්නු අමූයන යනුවක් සමග සසඳනු.

**60.** මුක්තැස් කුඹුරු— (ගොයම් කපාගත් කුඹුරු) මේ මුක්තැස් ශබ්දය වටරක්ගොඩ කොබුල්ගම යන ලිපිවල 'මුක්ගස' යි පෙනේ. එය මුද්‍රගස යන්නෙන් ආ හැකි බවත් රාජකීය අත්සන පිහිටවූ ලිපිය (සන්නස) එයින් කියවෙන බැවින් සන්නස් පිට ප්‍රදානය කළ ඉඩම් මුත්තැස් ඉඩම් බවත් සමහරු කියති. එහෙත් මුත්තැස් ගොවිතැන නමින් දන්නා ගොවිතැනක් කුරුණෑගල පළාතේ අදත් තිබෙන හෙයින්ද මහමුත්තැස් සුළුමුත්තැස්, මුත්තැස්, මුත්තැස් මෑ යන ධාන්‍ය වර්ගයන් හා මෑ වර්ගයන් ඇති හෙයින්ද ඒ කීම කෙරෙහි විශ්වාසය නොතැබිය හැකිය. ජදනාශ්‍රය කියන මුක්තැස් ශබ්දයක් සබම්රතනාවලියෙහි එයි. කොබුල්ගම ලිපියේ පෙනෙන "ගමට නුමුක්ගසේ පමන්" යන වාක්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ මේ පරිත්‍යාගය බලපවත්වන කාල පරිච්ඡේදය වේ. ගොයම් කපාගෙන ඉවරවූ කුඹුරු මුක්තැස් කුඹුරු බවට මේ වාක්‍යය නිදසුන් කරන්නට පුළුවන. එය එසේම නම් මුතුසස් (-ශස්‍යයෙන් මිදුනු) කුඹුරු මුක්තැස් කුඹුරු වියයි ගණන් ගත හැකිය.

**61.** මුක්තෙට්ටු— ඉඩම් අයිතිකාරයාගේ සේවකයන් විසින් කුලී නොගෙන වගාකරනු ලබන ඉඩම් විශේෂය මුත්තෙට්ටු නමින් හඳුන්වනු ලැබේ. "සණ්මෙණියාරුක්කුජ් සණ්මෙණියාඩිගල් කුලිසින්රිජ් පසිරිඩුම්නිලම්" යි එහෙයින් කියනලදී. ගබඩා මුත්තෙට්ටු, දේවාලය මුත්තෙට්ටු, දළදා මුත්තෙට්ටු, අද මුත්තෙට්ටු, විදාන මුත්තෙට්ටු, නින්ද මුත්තෙට්ටු, සාරමාරු නින්ද මුත්තෙට්ටු යි මුක්තෙට්ටු බොහෝ ගණනක් තිබුන බැව් පෙනේ. රාජකීය මුත්තෙට්ටු ගබඩා මුත්තෙට්ටු නම් වේ. අනෙක් මුක්තෙට්ටුත් මේ

නසින්ම සැලැකිය යුතුයි. ගබඩා මුත්තෙට්ටු වැඩ කරන්නෝ ඒ මුත්තෙට්ටුවලින් ලැබෙන ධාන්‍ය සහල් කොට නියමිත පරිදි මහ ගබඩාවට ගෙන ගොස් දෙති. මුත්තෙට්ටු වැඩ කරන්නන්ට ඒ සඳහා වෙනම ඉඩකඩම් ලැබුන හෙයින් මුත්තෙට්ටුවෙන් ලැබෙන ධාන්‍ය ඔවුන්ට අයත් නොවේ. සමහර සාරමාරු මුත්තෙට්ටු අස්වැද්දීමේදී සිව්මෝසමග අස්වනු රාජකීය ගබඩාවටත් එතැන් සිට දිගා වලව්වටත් දෙන සේ නීති පණවා තිබුන බවත් පෙනේ. දෙවාලයවල සිදුකළ අලුත් සහල් මඞගලයේදී දෙවාලය මුත්තෙට්ටුවෙන් කරල් කපා ඇතු පිටින් ගෙන එනුත් සිරිති. සියලු අස්වැන්න ඉඩම් හිමියාට දෙන කුඹුරු නිඳ මුත්තෙට්ටු නමුත් අස්වනු වලින් අඩියක් දෙන මුත්තෙට්ටු අඳ මුත්තෙට්ටු නමුත් මුත්තෙට්ටුව ආරක්ෂා කරන්නා වෙනුවෙන් වෙන් කළ ඉඩම් කොටස විදානෙ මුත්තෙට්ටු නමුත් වන්නාහ.

**62. මුලන්**— හේනක් ගිනි තැබූ පසු උගුලා දමනු ලබන මුල්වලට මුලන් යයි සිව් කෝරළ වාසීහු කියති. මාතර පළාතේ එනමින් හැඳින්වෙන කුඹුරු විශෙෂයකුත් වෙයි. ඒවාට ඒ නම යෙදුනේ කුඹුරු යායේ ගොඩට නාවැදී ගිය මුල්ලක තිබෙන නිසා විය හැකිය.

**62. මුල්බිජු කුඹුරු**— පසුව විටින්විට අවටින් ඇදගත් කැබෙලි හැර මුල් ලියවිල්ලේ සතර මායිමට ඇතුළත් – මුල් ලියවිල්ලේ සඳහන් බිජ ප්‍රමාණය වැපිරෙන කුඹුරු මෙයින් අදහස් කළා විය හැකිය. මුල් බිජු නම් කුඹුර අයිතිකාරයාට ලැබෙන කාලයෙහි එහි වැපිරිය හැකිව තිබුන බීජ ප්‍රමාණය වේ.

**64. රත්මාසර කුඹුරු**— විශෙෂයෙන් ගං හෝ ඇලවගේ දක්නා ලැබෙන – තෘණාදියෙන් ගැවසීගත් – පාලුවට හැර තිබෙන කුඹුරු මේ නමින් අදහස් කරනු ලැබේ. ගාලු පළාතේ රත්තැහැර නාමයෙන් හැඳින්වෙන්නේත් මේ ඉඩම් විශෙෂය මැයි. වගා නොකළ රජය සතු ගොඩ ඉඩමුත් මේ නාමය ලබයි.

65. වරුපෙත්— මෙහි වරු ශබ්දය ධාන්‍යයත් පෙත් ශබ්දය ඉඩමත් කියයි. එහෙයින් ධාන්‍ය වපුරන කුඹුරු වරු පෙත් ශබ්දයෙන් ව්‍යවහෘත බැව් සැලැකිය යුතුයි. ධාන්‍ය වපුරන ඉඩම් කොටස යනු අර්ථයි.

66. වැහැර — මෙද දඹුලු සිරිත ආදී පැරණි ලියවිලිවල දක්නා ලැබෙන වචනයෙකි. විහාරයට අයත් ඉඩම් යනු අර්ථය මෙන් පෙනේ. බැහැර යනුත් වැහැර කියා සිටිය හැකිය. එසේනම් මුල් ඉඩමට අයත්ව බැහැරින් තිබෙන ඉඩම් වැහැර ඉඩම් වන්නට පුළුවන.

67. වැව්ගම්— වැවක ආශ්‍රයෙන් ගො කරනු ලබන කුඹුරු මේ නමින් ව්‍යවහාරයට ගියේයයි සලකනු ලැබේ.

68. සාරමාරු ඉඩම්— මේත් අවිනිශ්චිත ඉඩම් විශෙෂ-යක් හෙයින් ශබ්දය යෙදී තිබෙන තැන් කීපයක් පළමුවලා දක්වීම යෙහෙකැයි සිතේ. 1. රණබාහුගම මන්නට සාර මාරුවක් රාජකාරියක් නැතිව නිරවුල් ලෙස ප්‍රයෝජන ගැනීමට ..........පූජාකර වදාළේය. (ස. පැරණි ලිපි 84 පිට) 2. එහි බද ගෙවතු ගහ කොළ ගොඩ මඩ ඇතුළුව සාරමාරු නැතිව ප්‍රවේණි සැලැස්මට මේ සන්නස දෙවා වදාළ පණතක් (එම 113 පිට) 3..............මෙකුන්ගේ දරු මුනුබුරු වගී පරම්පරාවට නිරවුල්ව ආරාමාරු නැතිව ප්‍රවේණි සැලැස්මට භුක්ති විඳිනාරගට ................ (උඩවේ පැරණි ලිපි 150) 4............මඩිගක්කාරයෝද කරමාරු නැතිව මින්මතු මෙම විදානේ කිසාල වැඩ රාජකාරිය හොඳින් මට්ටු පඩුත්තු ඇතිව කර කියා ඔප්පු දෙනවාය. 5. සාරාමාරුවේ සම්බාපතිවිඩි. 6. සාරාමාරුවේ කට්ටුපුල්ලෙ. 7. සාරාමාරුවට ඇරුනු අය කැර යනාදිය නුවණින් විමසනවිට අස්ථිර - තාවකාලික යන අර්ථය දෙනු සඳහා සාරමාරු තාරමාරු ආරමාරු ශබ්ද-යන් භාවිත කළ බැව් පෙනේ. සාරමාරුවල තිබුන ගබඩා මුත්තෙට්ටු ඉඩම් වගාකොට ධාන්‍යයෙන් කොටසක් මහා ගබඩාවටත් කොටසක් දිශා වලව්වටත් දෙනු සිරිත විය.

සාරමාරු ඉඩම්වල වීසූ සමහරු බද්ද වෙනුවට පැණි හකුරු සැපයීමද සමහරු දිශා වලව්වෙහි මෙහෙකිරීමද සමහරු දිශාවගේ ඇල්ලාව ගෙන යෑමද සමහරු මුලුතැනට උවමනා දේ සැපයීමද සමහරු විශ්‍රාම ශාලාවන් (ඉඩම්) වලදී ඒවා ඉවීමද කළහ. මෙසේ හෙයින් සාරමාරු ඉඩමුත් එහි වැසියා-නුත් සම්බන්ධයෙන් දිශාවේ විසින් පැවැත්වූ බලය ඉතා විශාල බැව් පෙනේ. බොහෝ දිශාවේවරුන්ට සාරමාරු නින්ද විදාන නම් තනතුරකුත් තිබුණේය. සාරුමාරු නින්ද ගම්වල විධායකයා යනු එහි අර්ථය වේ. සාරමාරු නින්ද ගම්වැසියන් නියමිත පමණට වඩා වැඩ ගත්තොත් ඒ වෙනුවට දිශාවේ විසින් ඔවුන්ට නියමිත ප්‍රමාණ වේතනයක් ගෙවිය යුතුය. සිරිවිකුම් රජසිහ සමයෙහි ගංගොඩමාලියද්ද, තලවෙල, දිඹුල්ගමුව, මැටියගනෙ, ගෙවිලිපිටිය, බටුවත්ත, පිළංගමුල්ල, ඇඳුරාපොත යන මේවා සාරමාරු ඉඩම් හැටියට සලකනු ලදී. ගමක් හෝ ගම් කැබෙල්ලක් ලබාගැනීම පිණිස ඉඩම් හිමියාට දෙන දීමනාවටත් සාරමාරු දීම යයි උඩරට වැසියෝ කියති.

69. සම්භොග ගම්— විහාරස්ථානවලට පරිත්‍යාග සම්භොග ගම්වලට මේද නමෙකි. ධම්පියා අටුවා ගැටපදයෙහි දිවෙල් යයි කියනලදී.

70. සංගත්තාර්— මේ ඉඩම් වර්ගය යාපනය ආදී ද්‍රවිඩ ජනයා වසන ගම්වල තිබේ. පුරාණයේදී සබඳයාට දුන් ඉඩම් අද දක්වාත් එනමින් ව්‍යවහාර වන බවට මේවා නිදසුන් කළ හැකිය. මෙවැනි කුඹුරු සමූහයක් එක්වූවිට එය යාය නමින් හැඳින්වේ. "යාය" යනු සමූහ වාචක "ජාත" ශබ්දයෙන් ආවා වන්නට පුළුවන. දෙණියට එරුම කියාත් දෙණිතඩට එරුම් තඩ කියාත් ඇලබඩ කුඹුරුවලට "ඔහොය්" කියාත් පළාත් අනුව ව්‍යවහාර කෙරෙති. දූහිමිය (පියා පරපුරෙන් ලැබෙන ඉඩම්) මදූහිමිය (මව් පරපුරෙන් ලැබෙන ඉඩම්) ලත්හිමිය (තමාම සපයාගනු ලැබූ ඉඩම්) පතන් (තණවලින් ගැවැසීගත් තැනිතලා ඉඩම්) ලඳු

(කුඹා පැලැටිත්ගෙන් ගැවසීගත් හේන් වැනි – කඳු බෑවුම්වල තිබෙන ඉඩම්) රාජකාරි ඉඩම් (රාජකාරිය වෙනුවෙන් දුන් ඉඩම්) යනාදී විසින් තවත් නොයෙක් විධියේ ඉඩම් තිබුණේය. එහෙත් ඒවා පිළිබඳ විස්තරයක් ලියන්නට අපි කල්පනා නොකරමු. ඉන්දියාවේ අභිමානය නමින් හැඳින්වනු ඉඩම් විශේෂයකුත් තිබුණේය. ඒ නාම යෙදුනේ නියමිත ඉඩම් බද්දෙන් භාගයක් අය කළ හෙයින්ය. ලංකාවෙහිත් මෙවැනි ඉඩම් තිබුන නමුත් ඒවා ඒ නමින් හැඳින්වූ බවට නිදසුන් නැත්තේය. තවත් ගොඩමඩ ඉඩම් සමහරක් දියහුන්නත නමිනුත් හඳුන්වනු ලැබේ. ඔහොංදපොල විහාරයෙහි වැඩ වෙසෙමින් බාලාවතාර ලියන සන්නය සකස්කළ ධම්මජෝති හෙරණුමෝත් දියහුන්නත නම් ගමෙක උපන්හ. වැවකට ළඟින් – වැවට වතුර ගලා එන ඔයක් හෝ ඇළක් සමීපයෙහි තිබෙන ඉඩම්වලට වැඩි වශයෙන් මේ නාම යෙදුනු සේ පෙනේ. දිය පතිතවන පැත්තේ පිහිටි ඉඩම යනු අර්ථයි. (දියහුනු + අත–දියහුන්නත)

ඉහත දක්වූ නාමයන් අතුරෙන් සමහර ඒවා ගොඩමඩ ඉඩම් සොයිමත් කියන නමුත් වැඩියක් නාමයෝ කුඹුරු පමණක් කියති. වෙල, වියල, කොත, දඩ යනාදී තවත් කුඹුරු වාචක නාමයෝ වෙති. එයින් දඩ යනුව වනය, ගම, ගම් කොටස, ස්ථානභූමිය යන අර්ථයන්හි වැටේ. පැරණියන් පණිවිඩ පණත්වලට කකුල්දඩ කියාත් ගෘහස්ථානයනට ගෙයිදඩ කියාත් කියන ලද්දේ ස්ථානාර්ථය මුල්කරගෙන විය යුතුය. මෙසේ මෙකී නාමයන්ගෙන් හැඳින්වූ කුඹුරු තවත් අනු කොටස් සමූහයකට බෙදී ගියේය. මෙතැන් සිට ඒවා පිළිබඳ කෙටි විස්තරයක් පහළවෙයි.

## කුඹුරු කොටස්

1. අඩුබෙට්ටිය—"කුඹුරෙන් අඩුබෙට්ටියක් පමණ දුනම බඩවලෑ" (සිං. ශබ්දකෝෂය) යනාදී ව්‍යවහාරයන්හි ඒ

ශබ්දය පෙනේ. දෙකොන් කොටස හෙවත් අඬිය යනු මෙහි අර්ථය සේ සැලැකෙයි. අඬු යනු අඬි ශබ්දයෙන් ආයේය. බිරි යනු පේරු ශබ්දය මැයි. අඬිභාගය යනු අර්ථයි.

**2. අංශය**— කුඹුරකින් ගොඩම තොරාගිය හරියක් මුළු නැරයක පිහිටි හරියක් අංගය නම්. "මීගහඅංශය" යනාදිය නිදසුනි.

**3. ඇලපත**— අංශය යනු මෙහි අර්ථය වෙයි. කුඹුරක කුරුලු පාලු දෙක හැරුනුවිට ඒ එක්සාම ඇතුළු කුඹුරේ තිබෙන ලියදිවලට ඇලපත්යයි කියති. සිවුරක මැද අත්තට දෙපැත්තේ තිබෙන අතු දෙකට ද ඇලපත් අතුයයි කියන්නේ මේ ව්‍යවහාරය බලාගෙන විය හැකිය ඉහළ ඇලපත පහළ ඇලපත විසින් ඇලපත් දෙකකි.

**4. කට්ටි** — කුඹුරක් කොටස්වලට බෙදූවිට එක කොටසක් කට්ටිය නමින් හැඳිනෙයි. භාග යනුත් එයටම නම්. උඩබාග මැදබාග පසුබාග යයි එහිත් ප්‍රභේද තිබුණේය.

**5. කනවිය**— යායේ කොනක තිබෙන කුඩා තිසරු කුඹුරක් හෝ කුඹුරක කොනක තිබෙන කුඩා ලියද්දක් හෝ මෙයින් ගැනේ. කුඹුරු කනවිය – ලියදි කනවිය යන ව්‍යවහාරයත් එයින් ඇතිවිය. (කනාති > කනාවි)

**6. කමත**— කුඹුරේම හෝ කුඹුර අසිනේ ගොඩබිම හෝ තැනක් ගොයම් පෑගීමාදිය පිණිස සකස් කරනු ලැබේ. කමත නම් ඒය. කම්මන්ත ශබ්දයෙන් ආ කමත ශබ්දය අභෙදෝපචාර වශයෙන් කර්මාන්ත පවත්නා ස්ථානයත් කියයි. කලවිට ධාන්‍ය කරණ ස්ථාන යනාදී නාමයෝත් මේ අර්ථයෙහිම යෙදෙත්.

**7. කුඹුරුපාමිට**— කුඹුරේ පහත් ප්‍රදේශය මෙයින් හැඳින්වේ.

**8. කුරප්පය**— කුඹුරේ ප්‍රධාන වක්කඩ ළඟින් කපන ඇළ කුරප්පය නම්. කුඹුරේ වතුර බැස යෑම මේ කුරප්පය මගින් සිදුවෙයි. සමහර පළාත්හි අඩ සඳ සේ රවුන්ව සාදන හෙයින් ඒ නාම යෙදුනා විය හැකිය.

**9. කුරුළුපාළු**— යම් කුඹුරක් දෙපැත්තෙහි තිබෙන ගොඩබිම් දෙකකට අතර පිහිටියේ නම් ඒ කුඹුරේ ගොඩබිම් අද්දර තිබෙන ලියදි දෙක සාමාන්‍යයෙන් කුරුළු ආදීන්ගෙන් සිදුවන අලාපාලුවලට පාත්‍රවෙයි. එබැවින් ඒ ලියදි දෙක කුරුළුපාලු හැටියට සලකා අත්හරිනු ලැබේ. ඒ ලියදි දෙකින් ලැබෙන ධාන්‍ය ප්‍රමාණය ගැන හිතා බලා සුදුසු ප්‍රමාණ වී කොටසක් ගොවියාට දෙනු සිරිති. හැම කුඹුරකම කුරුළුපාලු නොලැබෙන බවද සැලැකිය යුතුය.

**10. දළුපත්**— ගොඩබිම සීමාකොට පවත්නා සමහර කුඹුරුවල ගොඩට නෙරාගිය කැබැලි තිබේ. සමහරවිට ඒවා පසුව කපා හදා අස්වැද්දූ ඒවාත් විය හැකිය. මෙසේ කුඹුරකින් ගොඩට නෙරාගිය කැබෙල්ල දළුපත නම්. කුඹුරේ අගින් නෙරාගිය කැබෙල්ල අගුදළුපත නමුත් මැදින් නෙරාගිය කැබෙල්ල මැද දළුපත නමුත් වන්නේය. දළුව නමින් අවසන්වන ඉඩම් නාම ලංකාවේ බෙහෙවි. තම්බා දළුව යනාදිය නිදසුනි. දළුපත ලියද්දක් සේ සකස් කළුවිට ඊට දළුපත් ලියද්දයයි කියත්. (දරුපෙත - දලුපත)

**11. දෙපාඇළ**— දෙපැත්තෙහි ඇළවේලි දෙකක් ඇති කුඹුරු මැදින් පිහිදී යන ඇළ දෙපා ඇළ නම්. දෙපානම යනුත් සමහර පළාත්වල ව්‍යවහාරය වෙයි.

**12. පිටවාන**— ගොඩ අද්දර පිහිටි කුඹුරුවල - කුඹුරට පිටින් ගොඩ අද්දර දිගේ කැනූ ඇළක් ඇත. පිටවාන නම් ඒය. වැවේ පිටවාන ගැන පසුව කියැවේ. රැකුළ ඇළ යනුත් පිටවානටම නම්. පාවිට (කුඹුරේ පහත් පෙදෙස) පවාව (මිටියාවත) යනාදිය ගැනත් සිතනු.

13. පිල්ලෑව— සමහර කුඹුරු මධ්‍යයෙහි ඇති-පැලෑටි වලින් හැවසීගත් කුඩා දූ කුට්ටිවලට මේ නාම වහරති.

14. පොලිවිඩෙ— කුඹුරක දිග ඉම වශයෙන් දමනු ලබන වේලිවලට හතර කෝරළ වාසීහු මේ නාම කියති.

15. ලියදි— තෙ නියරක් හෝ සිව් නියරක් ඇතුළත තිබෙන කුඹුරු කොටස ලියද්ද නමි. සමහරවිට සම්පූර්ණ කුඹුරකටත් ඒ නාමය ව්‍යවහාර කර තිබේ. විල්මබලියද්ද යනාදී තන්හි මෙනි. (කොවුල්ගම ලිපිය බලනු) ලියද්දේ උඩ කොටස උඩාවත්ත නමි.

16. වනාත— කුඹුරක් අද්දර තිබෙන බඩවැටිය වනාත නමි. එය ශුද්ධ නොකොළොත් සතා සතුන්ගෙන් කුඹුරේ වගාවට හානි සිද්ධවෙයි. බොහෝ ගොවියෝ කුඹුරේම අවයවයක් සේ සැලකෙන ඒ වනාත ගොඩ ගොවිතැන සඳහා උපයොග කර ගනිති. "අත්මඟ" යනුත් එයටම නමි. සමහරු පිල්ලෑව යයිද කියත්.

17. වතුරාන— කුඹුරක නිතරම වාගේ ජලයෙන් යටවී තිබෙන හරිය වතුරාන නමි.

18. වල්පිට— "ගල්බෑං සතරට ඇතුළත් කුඹුර හා මිනිසුන් ගසකොළ හා වල්පිපි හා සමුණු නොවා........" යනු කොවුල්ගම ලිපියේ පෙනෙන පාඨයෙකි. මෙයින් හැඟෙනුයේ සමහර කුඹුරුවලට වල්පිටකුත් අයත් බවය. මිරිසගල කන්දෙ වල්පිට, ගොඩ වල්පිට, ගොඩ වල්පිටි කාරයො යනාදිය ගැනත් සිතා බැලීයැ යුතුය. කුඹුරට සාව හෝ සාමාන්‍ය ගොඩබිම හෝ පිහිටි ගේන වල්පිට නාමින් අදහස් කළ බව මෙයින් සිතාගත හැකිය. කුඹුර හාත්පස හෝ පැත්තක තිබෙන කුඩා පැලෑටිවලට අහබඩ කියාද, එය කැපීමට අහබඩ කැපීම කියාද, කුඹුරේ මුදුන් ලියද්දට දණ්ඩආරෑව කියාද, කුඩා ලියද්දට දරෑකනපි කියාද, වේල්ලට දැක්ක කියාද, මායිමේ වේල්ලට ආං වෙල්ල කියාද,

ලොකුවක්කබට දෙකාවක්කඩ කියාද, වතුර ගලා එන තැනට දියමාන්න කියාද, වතුර බදින ස්ථානයට නාවක කියාද, පහල ලියැදි පේලියට සහන්වතාව කියාද තොක්මලේ පළාතේ ව්‍යවහාර කෙරෙත්ලු. තවත් නොයෙක් පළාත්වල නොයෙක් අමුතු ව්‍යවහාරයන් ඇතිවන්නට පුළුවන.

**19.** හැල්සක්— එක තැනක් සෙලවූවිට හැමතැනම සෙලවී යන සේ වැවී ගිය තණ ඇති වගුරු කුඹුරු හැල්පත් නම්හ. මෙහි පත් යී යෙදුණෙන් වරුපෙත් යනාදී තන්හි තිබුණු පෙස් ශබ්දය මැයි. ඉඩම යනු අර්ථයි.

---

## 2. දෙවනවග

# කුඹුරු කිරීමේ ක්‍රම සහ වැව් අමුණු

ලංකාවේ කුඹුරු කිරීමේ ක්‍රම කීපයක් තිබුණේය. එයින් එක් ක්‍රමයක් නම් වැසි දියෙන් කුඹුරු කිරීම වේ. එහෙත් ඒ ක්‍රමය කෙරෙහි එතරම් විශ්වාසයක් නොතැබිය හැකිය. සෘතු ගුණය වෙනස්වීමෙන් වැසි එල අඩු වැඩි වන හෙයිනි. අතිශයින් සඵලවූත් නොවරදින සුලුවූත් ක්‍රමය නම් වැව් දියෙන් කුඹුරු කිරීම වන්නේය. රොහණයත් අනුරාධපුර පළාතත් වැව් රාජ්‍යයන් වූයේ ඒ නිසාය. සිංහලයා ජල කර්මාන්තයෙහි ශූරයා වූයේත් ඒ සඳහා උපදෙස් දෙනු පිණිස ඉන්දියාවේ කාශ්මීරය ආදී පෙදෙස්වලට ගියේත් ලංකාව වැව් රාජ්‍යයක් වූ හෙයින් මැයි. පුරාණ ලංකාවේ වැවක් නොමැති ගමක් නොතිබුනු තරම්ය. ඒ හැම වැවක්ම මනා පාලනයකින් පාලිතත් විය. ලංකාවේ ගොවිතැනත් ඒ මගින් සිංහලයාගේ ජාතික ශක්තියත් රඳා තිබුන මහ බල කණුව වැව හෙයින් මෙතැන් සිට වැව සම්බන්ධයෙන් කෙටි විස්තරයක් ලියම්හ.

# වැව් සහ අමුණු

ලක්දිව වැව් කර්මාන්තයෙහි උසස් ආදිමයා පණ්ඩුකාභය රජු බව අපි දනිමු. එහෙත් එහි අතීත යෝධයා මහාසෙන් මෑත යෝධයා මහලු පැරකුම්බාහු වූහ. 4, 5 වන සියවස්වලට ඉහතදී ලියැවුණු ලේඛනයන්හි වපි වවි ආදි ශබ්දයද 5 වන සියවසේදී පමණ ලියැවුණු සමහර ලේඛනයන්හි වෙව ශබ්දයද ඉක්බිතිව වැව ශබ්දයද ශිලා ලේඛනයන්හි පෙණේ. වවි ශබ්දය වෙව වූයේ දෙමළ අනුකරණයෙනැයි සිතේ. "දනවැව" නමින් අමුණු බැම්මක් ගැන ඉසුරුමුනි සන්නසෙහි පෙනෙතත් ඒ වැව කුමක්දැයි තේරුම් ගැනීම තරමක් දුෂ්කරය. 1"දන වැවකින් මොහොල්නගුරද් සොරෙසෙරෙමැ සතර ජියනක් දියෙව් ශිඳුවූ දියකැම පහණ් මුදුන පැනෙනතාක්2, දනවැවකින් දියකඩා සිසිනැයි වදුරනු මිසැ" යනු එහි ලිපියෙහි යෙදී තිබෙන පරිදියි. කුඩා වැව්වලට දිය දෙන නාච්චදූව වැනි වැවක් හෝ කුඹුරුවලට දිය දෙන කුඩා වැවක් හෝ දන වැව යන්නෙන් ගත හැකි වුවත් දෙවනුව කී අර්ථය වඩාත් මැනවැයි හැඟේ.

---

## වැවේ අවයව

**1.** සානුකැට — වැවේ වතුර පිටවන්නේ මේ සානු කැට මගිනි. පැරණි වැව්වල සානු කැට තබන ලද්දේ වැවේ ඉතා ගැඹුරු මධ්‍යස්ථානයේ සිටය. මහ වැව්වල සානු කැට තිබුන බවට සාධක සුලභ නොවේ.

**2.** ගොඩවාන — වැවේ වැඩිවතුර බැහැර කරනු පිණිස ගොඩ පැත්තෙන් සාදා තිබෙන වාරයත් ඒ වාරයෙන් නික්මෙන ජලය බැස යන ඇළත් දෙකම ගොඩවාන නමින් හඳුන්වනු ලැබේ. "ගොඩ සොරොව්ව" යනුත් මෙය නාම නම්.

**3. දියකෑම සහණ** — වැවේ වතුර ප්‍රමාණ කරන පාෂාණය මේය. මෙහි ජල ප්‍රමාණය හඟවන ලකුණු යොදා තිබුනා විය හැකිය. නොහොත් වැවේ මැද සිට හොරොව්ව දක්වා දමූ කාණු කැට පෙළේ සොරොව්ව ලඟම තිබුන කාණුකැටේ මැදිනුත් සිදුරක් විය. ඒ සිදුර උඩ එකක් උඩින් එකක් බැගින් දියකැට තබා උසට තැනූ විම්තියක් වැනි අවයවයක් තිබෙන්නට ඇත. වැවේ ජල ප්‍රමාණය අනුව ඒ විම්තියේ ජලය රඳා තිබුනේය. දිය දෙනවිට එහින් දිය කැටයක් හෝ කීපයක් ඉවත් කිරීමක් නොදෙනවිට වසා තැබීමත් සිදුවිය. එකී එකී දියකැටයක් සම ප්‍රමාණයකින් යුක්තව සාදා තිබුනා විය හැකිය. මෙසේ දිය දීමේදී සහ දිය රැඳවීමේදී භාවිතා කළ සිදුරු සහිත ගල් කැබෙලි දිය කැට සහණ වූහයි සිතමිහ. තවත් සොයනු.

**4. සැන්නුම** — මේන් සොරොව්වටම වහරන නාමෙකි.

**5. බිසෝ කොටුව** — මෙද විචාරණය කළ යුත්තක් නිසා ශබ්දය යෙදී තිබෙන තැන් කීපයක් පළමුවලා දක්වමිහ. 1. මෝල් ගෙලතමලින් ගෙඩක් රජගමාහොල් ගෙලන බිසෝ කොටුවෙන් (ජා. ගැටපද අදිතා කොටසෙහි සාධිත ජාතකය බලනු) 2. රජමෙල් පලා තිබෙන බිසෝ කොටු වාපි මාගියදි (ජා. පොත 978 පිට) 3. දුන මැඩකින් මෝහොල් හැරදගෙසාගේ පෙරඩ සතර පියනක් දියඩ කින්ද්දූ දියකෑම සහණ (ඉසුරුමුනි සන්නස) මේ සියල්ලෙන් පෙනී යන්නේ බිසෝ කොටුව නම් සොරොව්වත් වැවත් අතර තිබෙන එක්තරා කොටුවක් බවය. වැවෙන් සොරොව්වට වදින ජලය නවතන ලෑලි හෝ කොටන් දමන ලද්දේ ඒ කොටුවෙහිය. පදී මින්නේරි ආදී වැව්වලට ගියවිට බිසෝ කොටු බැලිය හැකිය. සාමාන්‍යයෙන් ඒවා සාදා තිබෙන්නේ වෑකන්දේ ඉහළ කොටසේය.

**6. මදවම** — සොරොව්වටම රුහුණේ ව්‍යවහාර වන නාමෙකි. මෙය දෙමළ මදනු ශබ්දයෙන් ආ හැකිය. (මදනු – මදවු – මදවුව – මදවම)

7. මොහොල— මුසලප්පවෙසන කුණ්ඩලෙණ, මොහොල් පහලනවලින් හෙවත් රජමොහොල් එලන බිසෝ කොටුවෙන්; (ජා. ගැටපද සාධිත ජාතක) සොභ-මානවූ රජමෙල් පලා තිබෙන බිසෝ කොටු වාපී මායාදියෙද (ජා. පොත 978) යනාදී ප්‍රයෝගයන් අනුව සිතනවිට වතුර නවත්වනු පිණිස බිසෝ කොටුවේ හිර කරනු ලබන දූව කොටන් විශෙෂය මොහොල් නමින් හැඳින්වුනු බව පෙනී යයි. ඉසුරුමුනි සන්නසක් බැලියැ යුතුයි. "මොහොල් හැරපු මහදොර හතරකින් නමාගත් දිය වතුරක් සේ" යන පූජාවලි පාඨය (රතනසාර 388) මේ කාරණය වඩාලාක් පැහැදිලි කෙරෙයි. නමුත් මෝල් ශබ්දය මේ මුසලාර්ථයෙහි පමණක් නොව කුඩා දිය පාර හෙවත් දියබස්නාව යන අර්ථයෙහිත් වැටේ. ගොම්මෝල (කමතේ වතුර බැස යෑමට සාදන සිදුර) කමත් මෝල්කඩ (කමතේ වතුර බැස යෑමට සාදන කුඩා ඇළ) යනාදී ව්‍යවහාරයන් සහ බොජුන් හලෑ තෙලික්කක් වැඹුනා දැකෑ බොජුන්ගල තෙල මොහොල ගෙනෑ ගියේය, (හෙරණසිඛවිනිස 14 පිට) ක්‍ෂුණ්ණකං, කුණ්ඩමොහොර (විසුද්ධිමග්ගසන්න 2-280) යනාදී යෙදුමුත් නිදසුනි. ථූපවංශ (බටුවන්තුඩාවේ) 119 පිටුවත් බලනු. ධම්පියාසන්නයෙහි 131 වන පිටුව බැලීමත් ප්‍රයෝජනවත්ය.

8. යොධ ඇළ— වැවේ වතුර උවමනා තැන් කරා ගෙන යන ඇළ යොධ ඇළ නමින් ප්‍රසිද්ධය. ඇළහැර ඇළ, මිණිපේ ඇළ, ජයගඟ, කාලිඞ්ග ඇළ යනාදිය එයින් සමහරෙකි. ඒ පිළිබඳ විස්තර ආර්. ඇල්. බ්‍රෝහියර් මහතාගේ "ලඞ්කාවේ පුරාතන වැව් අමුණු" නැමැති ග්‍රන්ථයෙන් දත හැකිය.

9. රජ මොහොල— මොහොල් කීපයක් ඇති වැවක ප්‍රධාන මොහොල රජ මොහොල නම්. මේ මොහොල වනාහී දිය දොර වෙනුවට පාවිච්චි කළ දූව කොටයක් නොව වැවේ දිය බැස යන සොරොව්ව විය හැකිය. ඉසුරුමුනි සන්නසෙහි

ශ්‍රද්ධෝසෝමරු, යි පෙනේ. ඉදින් එය දූව හොටයක් නම් රජ ශබ්දයෙන් නොමෙවෙසසෙනවා ඇත. දිය ඇලු මාවත මොලපු ශබ්දයකුත් කෙළවෙහි ඇත්තේය.

**10.** රළපාණ— රළ වේගයෙන් මැටිකාන්ද සෝදා හොයනු පිණිස වැව් ඉවුරේ අල්ලනු ලබන ගල් මේ නමින් හඳුන්වනු ලැබේ. රළිපැන්නුම යනුත් මේ ගල්වලටම නමි. ඒ නම යෙදී ඇත්තේ ඒවා අල්ලනලද ක්‍රමය නිසා විය හැකිය. උසස් වැව්වල මේ ගල් අල්ලා තිබෙන්නේ ශාස්ත්‍රය-කට අනුව රළි පැන්නීමෙනි. අවුරුදු දහස් ගණනක් ගත වීත් ඒ ගල් කිසි වෙනසකට පත් නොවී තිබෙන්නේ ශාස්ත්‍රානුකූලව අල්ලා තිබෙන හෙයින්මය.

**11.** මැකාන්ද— බැලූ බැල්මට පස් ගොඩක් සේ පෙනෙනතත් මැකාන්දත් සියුම් ශාස්ත්‍රයක් අනුගමනය කොට බඳනාලදී.

**12.** සොරොව්ව— මේ ශබ්දය දෙමළ "සොරනු" ශබ්දයෙන් සෑදුනේය. ජලය නික්මෙන දොර යනු අර්ථයි. සොරොවු කීපයක් ඇති කල්හි ප්‍රධාන සොරොව්ව රජ සොරොව්ව නම් වන්නේය.

**13.** පොටාවැටිය— සාමාන්‍ය අමුණකට පොටාව, වැටිය යන නම් දෙකම ව්‍යවහාර වේ. පොටා සංඛ්‍යාත වැටිය පොටාවැටිය විය හැකිය. ගොක්කම යනුත් අමුනටම නමි.

**14.** නාවන— පොටාවැටිය ලඟින් සුඹුරට දිය වදනා වක්කඩට මේ නමි.

**16.** දියවන්නාව— මෙද ඇලුවම නමෙකි. (දිය වදනාව – දියවන්නාව) ජුවන්නා යනුත් ව්‍යවහාරයෙහි එයි. ඉතිහාසයෙහි ඇලක් ගැන ප්‍රථමයෙන්ම සටහන් වනුයේ කුටකණ්ණ රජුගේ කාලයේ දීය. (ම. ව. 34 33) ඔහු කරවූ වණ්ණක නම් රාජමාතිකාව අනාරගංගය සමීපයෙහි තිබුනු

බව මහාවංශටීකාව කියයි. අනන්තරගංගය වනාහී විනය ටීකාදියෙහිත් ප්‍රසිද්ධ අතිශය සමෘද්ධ ප්‍රදේශයක් වූ නමුත් එය කොහි තිබුණේදැයි සිතාගත නොහැකිය. ගංගා දෙකකට අතරේ තිබුනු පෙදෙසක් බව නාමය අනුව නිගමනය කළ හැකිය. දෙළ, මලදෙළ, ආර, කඩුර, මොලසුව යනාදී තවත් නොයෙක් ජල මාර්ග තිබුනේය.

**16.** **විල්**— (වැකණ්ඩිය නැති ජලාශ) පොකුණු, සොබ්, කුඩා ගල් පොකුණු) ඇළ, දෙළ, ශෙබිලි (යොධ ඇළට සම්බන්ධ කුඩා අතු ඇළවල්) යනාදී තවත් නොයෙක් ජල ස්ථාන සහ ජල මාර්ග තිබුන නමුත් ඒවා පිළිබඳ විස්තරයක් ලියනු අපට අනභිමතය.

ලංකාවේ බස්නාහිර, මධ්‍යම යන පළාත්වල ගං හෝ බොහෝය. එසේම ඒ පළාත්වලට වර්ෂාපතනයද නොඅඩුව ලැබේ. නිරිතදිග මුහුදු වෙරළ දිගේ ඉහළට නැගී නැගෙනහිර මුහුදු වෙරළ දක්වා විහිදී ගිය කඳු පඞ්ක්තිය ඊට හේතුවිය. මේ පළාත්වල වැව් අඩුවීමට හේතුවක් එයමය. ගොවියෝ වසකට දෙවරක් ලැබෙන වැස්ස පිහිට කොට ගෙන යල මහ වශයෙන් දෙවරක් කුඹුරු කළහ. උතුරු පළාතේ ගොවියාට එබඳු සම්පතක් ඇති නොවීය. ඔහු විසූ පළාත කඳු රහිත හෙයින් වැසි අල්ප හීන විය. එහෙයින් ඔහුට වසින ජල බින්දුව ආරක්ෂා කර නොගෙන බත ලබා ගත නොහැකි බැව් වැටහුනේය. ඉක්බිති හේ ජලය ආරක්ෂා කරන ක්‍රම සොයා බැලීය. වැව් සහ අමුණු පහළවීම එහි ප්‍රතිඵලය විය. ගං හෝ හරස් කොට යොධ කණ්ඩි බැඳ එයින් හගා ගත් ජලය මහ වැව්වලත්, ඒ මහ වැව්වලින් පිටාරෙ යන වතුර ක්‍රමයෙන් පහත් පහත්ව සැදූ කුඩා වැව් වලත් පූරවා ගත් බැව් පෙනේ. සියලුම වැව්වල වතුර අල්ලන ප්‍රමාණයද ගොවියෝ දැන සිටියහ. හැම ග්‍රාම ලේකම් මිටියකම ඒ ගමට අයත් වැවේ ජල ප්‍රමාණයද සටහන් විය.

වැවේ වතුර තිබීම අවුෑම් ජී තිබීම මෙතැයි ගොවියෝ සිතූහ. මේ වැව් මිනිසුන්ට පමණක් නොව වනගත සිව්පා සතුන්ට මෙන්ම නොයෙක් වර්ගවල පක්ෂි ගණයාටත් බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

---

## වැව් මාලු

ඉහතකී වැව් අමුණුවල නොයෙක් වර්ගවලට අයත් මත්ස්‍යයෝ බෙහෙවින් සිටිති. සාමාන්‍යයෙන් බෞද්ධයෝ මාලු ඇල්ලීමෙහි මැලිකමක් දක්වතත් සියල්ලෝ එසේ නොවෙති. ලඞ්කාවේ ලූලාත් රෙහෙ මසාත් දෙදෙන ඉතා ප්‍රසිද්ධ වෙති. ඔවුන්ගේ මස් බොහෝ ලෙඩවලටත් හිත කර වන්නේය. මින්නේරි වැවේ නොරොච්ච ලඟින් පමණක් කරත්ත ගණනක් මසුන් ඇල්ලිය හැකි බැව් පෙනේ. එහි පෙරලෙන පෙටියෝත් ලොකු පුවක් මලක් පමණ ඇත. ඔවුන්ගේ බඩ පැත්ත මහසෙන් රජුගේ කඩුව මෙන් දිලිසෙන ගමන් රෙහෙ මසුන්ගේ රැවුල් මහසෙන් රජුගේ උඩුරැවුල මෙන් තේජස්වී ගුණයෙන් යුක්තය. මේ වැව්වල මාලු ඇල්ලීම සියල්ලන් විසින් නොකළ හැකිය. වැව තිබෙන ගමට පිටින් ගොස් පදිංචි වන මිනිසුන්ට වැවේ මාලු ඇල්ලීම තහනම්ය. පෙර පටන් ගමේ පදිංචිකාරයන්ට උරුමයෙන්ම වාගේ වැවේ මාලු අයත් හෙයිනි. පසුගියදා පහත රටින් ගිය මුදලාලිලා දැල්හෙම සකස් කරගෙන මින්නේරි වැවේ මාලු අල්ලන්නට සූදානම් වූහ. ගම්මුන් පුරාණයේ සිට පැවැත ආ සවකීය භුක්තිය පෙන්වා සිටියෙන් මුදලාලිලාගේ ව්‍යායාමය නිශ්ඵල විය.

---

## කුඹුරු පෝර කිරීම

කුඹුරුවල ඇති පස්වී රසය බීජය අනුව වෙනස් වන බවත් ඇතැම් කුඹුරක් සරුසාරව වැවෙත්ම තවත් කුඹුරක්

නිසරුවන බවත් අපි දනිමු. පළපුරුදු ගොවියන් කුඹුරට සරිලන බීජ මෙන්ම පොහොරත් තෝරාගන්නේ එහෙයිනි. පිහිටීම හා සෘතුගුණය කුඹුරක් සරුවීමේ හෝ නිසරුවීමේ ප්‍රධාන හේතූහු වෙති. යම් කුඹුරක් නිසරු වීනම් එයට නිසි පෝර යෙදීමෙන් සාරවත් කරගත හැකිය. කුඹුරේ පස අනුව පෝර තෝරා ගත යුතු වන්නේය. පෝර යෙදීමෙන් සාරවත් කළ කුඹුරේ පඨවි රසය, ගොයම් ගස ස්වකීය මුල් නැමති අතින් උරා බී මැනවින් වැඩෙමින් අධික ඵල ප්‍රදානයෙන් ගොවියාත් සතුටු කෙරෙයි. ශස්‍ය වර්ග පමණක් නොව, මනුෂ්‍යාදී සත්වයෝද පඨවිරසය අනුව වෙනස් වන්නෝය. ඒ වෙනස සෑම මිනිස් ක්‍රියාවක් කෙරෙහිමත් බලපවත්වයි. මෙසේ ගස් ගල් සත්ව ආදී හැම දෙයක් කෙරෙහිම එකසේ බලපවත්වන පඨවි රසය ඒ ඒ නියමිත දේ කෙරෙහි යොමුකරවා ගැනීම වූකලී විශාල පළපුරුද්දක් ඇතියවුන් විසින් සිදුකළ යුත්තෙකි. මේ අතින් අතීත සිංහලයා දක්වූ ශූරත්වය ආශ්චර්යජනක වුවත් ඔහුගේ ඒ ශූරත්වය වර්තමාන සිංහලයා කරා නො ආයේය. නොහොත් පාලක පක්ෂය එන්නට ඉඩ නුදුන්නේය.

අපේ කුඩා කාලය වනවිට මාතර පළාතේ පෝර සෑදූ ගැනීම පිළිබඳවූත් පෝර යෙදීම පිළිබඳවූත් සියලුම ශාස්ත්‍රීය ක්‍රම අභාවයට ගොස් තිබුණේය. ගොවීහු පැරැණි පුරුද්ද අනුව පැඟිරි දහයියා ආදී අලු වර්ග, කැප්පිටියා වල්සූරිය-කානකාදී කොළ වර්ග අලු කොළ ගොම පිදුරු ආදීන්ගේ මිශ්‍රණ යනාදිය කුඹුරුවලට පෝර වශයෙන් යෙදූහ. කැලෑවල කුණුවී ගිය කොළ හා ගැඹවුලු පස් ගොඩගෙන ආ ජලයක් කුඹුරුවලට විශේෂයෙන් හිතවත් විය. ඉපැනැලි හෝ කුඹුරේ මැනූ පිදුරු පිච්චීමේ පටන් වප්පැන් බැඳීම දක්වා ඇති හැම ක්‍රියාවක්ම ශස්‍ය සම්බන්ධයක් රසය සහ ඕජෝ ශක්තියක් ගෙනදීමෙහි ඉවහල් වූයේය. ගොඩ පසට ගැඹවුලු පස් යම්සේද කෙතට මිශ්‍ර පෝරද එසේමය. අත්සඳ බැලීම පමණක්වා කෙතට යෝග්‍ය පොහොරක් පිළියෙළ කර ගැනීමට මේ හොඳම අවස්ථාව බැව් මතක්කරදුනු කැමැත්තෙමු.

## 3. තෙවන වග

# කුඹුරු කම්පස් කිරීම සහ වී සකස් කිරීම

කුඹුරක් වපට යෝග්‍ය කිරීම කුඹුරු කම්පස් කිරීම නම්. වරක් ගොයම් කපා පාගා ගත් කුඹුරෙහි තණකොළ ආදිය වැඩී ගිය පසු එය පුරන් කුඹුරක් වන්නේය. පුරන් කුඹුර සාමාන්‍ය තණකොළ වලින් වනාරක් ගැවසී ගත්තේ නම් වක්කඩවල් බැඳ වතුර හැරවිය යුතුය. පැලෑටි ආදියෙන් ගැවසී ගත්තේ නම් ඒවා ශුද්ධ කොට වතුර බැඳිය යුතුය. එසේ ප්‍රථමයෙන් බඳින දියට "වෙල්පෑන" යයි ගොවීයෝ කියති. වප්පැනීන් කුඹුර තෙමී ගිය කල්හි පුරන් කෙටීම හෝ සීසෑම ඇරඹෙන්නේය. පුරන් කෙටීම උදැල්ලෙනුත් සී සෑම නඟුල්ලෙනුත් සිදුකරති. උදැල්ලද පළාතේ හැටියට වෙනස් වෙයි. මාතර උදැල්ල රවුම් දික් හැඩයකුත් රත්නපුරේ උදැල්ල ලැලි කැබැල්ලක හැඩයකුත් ගනී. උදැල්ලෙන් කරන වැඩ අතර පළුමං කෙටීම දෙකඩුන් කෙටීම කැට ගැසීම වේලි බැඳීම ඇල මං පෑදීම යන මේවා ප්‍රධාන වෙයි. ප්‍රථමයෙන්ම කුඹුර කෙටීම මාතර පළාතේ පුරන් කෙටීම නමිනුත් තවත් පළාත්වල පළුමං කෙටීම නමිනුත් ප්‍රසිද්ධය. උදැවියක් එක්ව කෙටීමට කැරලි කෙටීම යයි ද කියත්. ඒ කෙටීමේදී සල්මලක රේනු තිබෙන දෙපැත්ත එක්වී තිබෙන්නා සේ උදැල්ලෙන් පෙරළෙන පිඩැල්ලේ තණකොළ තිබෙන පැත්ත යටවී සිටි 'කිඹුකැක්ක' නමින් ගොවීහු හඳුන්වන්නෝ ඒ යටවන තණ සහිත පැත්ත බැව් සැලැකිය යුතුය. මෙසේ ඈත අතීතයේ පටන් සිංහල අතට සංගල කුඹුරට ගැළපෙන සේ සකස්වූ සිංහල උදැල්ලත් අනෙක් බොහෝ දේවල් මෙන් ම සිංහලයෙන් ඉවයා දන්නට යන්නා සේ පෙනේ. අනුන්ගේ හිසරදය ඔවා

දෙහොතින් පිළිගෙන තමාගේ පාරම්පරික උරුම දෙයට නිගාදෙන සිංහල මෝඩයන්ට නින්දා වේවා. සිංහල උදැල්-ලෙන් සිංහල ගොවිතැන කළ කාලයේ ගොඩ සාදන්නා, කම්මල්කාරයා, අඟුරුබස්සන්නා, ලී කපන්නා ආදී වශයෙන් කොතෙක් දෙනා රක්ෂාව ලබාගත්තාහුද? කොතරම් මුදලක් ලංකාවේම ඉතිරිවීද? යනාදී කාරණා ගැන දැන්වත් සිතා බැලිය යුතුය. පැරණි උදැල්ල මේ කාලයට නොගැළපෙන්නම් කාලානුරූපව වෙනස් කර ගනු විනා එය සම්පූර්ණයෙන්ම ඉවතට දමා යුරෝපීය උදැල්ලට බැසීම දියුණුවන ජාතියක ලක්ෂණයක් නොවේ. මෙරට ගොවිතැන නිසරුවීමට ඇති හේතූන් අතර මේ උදැලු පලුහිලව්වත් ප්‍රධාන ස්ථානයක් ගනී. එංගලන්තවාසීන් පමණක් පෝෂණය කරනු සඳහා ඔවුන් සාදන සෑම නොවටිනා බඩුවක්ම මේ රටවල්වලට ගෙනවා මේ රටවල්වල පැවැත එන ජාතික කර්මාන්තයන් විනාශ කරලීම දැනැමි ආණ්ඩුවක සිරිත නොවේ. සිංහල-යන්ට සිංහල උදැලු තිත්ත වූයේ පාලකයන්ගේම ප්‍රචාරක ක්‍රියා නිසා බව සත්‍යයකි. නැවතත් සිංහල උදැල්ලට බසින හැටියට නිදහස් සිංහල ගොවීන්ගෙන් ඉල්ලා සිටිමි.

පුරන් කොටා සතියක් දෙකක් ඉකුත්වූ පසු අන්දන්-කෙල් ගසා (=වැලි සැස) දෙසාවූන් කොටිවක් ඉක්බිති වෙලි බැඳීමත් ඉනික්බිති කැට පෑගීමත් සිදුවන්නේය. උදැල්ලෙන් කුඹුරු කමපස් කිරීම මේ නී පරිද්ද.

ඈත අතීතයේ පටන්ම මේ දිවයිනෙන් භාවිතවූ ප්‍රධාන කෘෂි භාණ්ඩය උදැල්ල නොම නගුලය. දැනුත් උදැල්ලෙන් සකස් කරන කුඹුරුවලට වඩා නගුලෙන් සාන කුඹුරු සාරවත්ය. ගවයන්ගේ මල මූත්‍ර මිශ්‍රවීම මෙන්ම ඔවුන්ගේ කුරවලට කුඹුරු සෑරී යෑමත් එයට හේතුව විය හැකිය. කාඩුකාන්නා කන්දේ සී සෑම අනෙක් පෙදෙස්වල සී සෑමට වඩා වෙනස්ය. ඒ සඳහාම පුහුණුවූ හරකුන් සහ ගොවියෙ-කුත් එයට උවමනා වෙයි. කගුලිසේ එය ගහ බඳින්නෝත්

අමුතු විසිතුරුවය. මියගහත් ගොන් බානත් තිබියදී මිටින්මිට නගුලිස ඉශ්වරහට දිස්වන සැටිය ප්‍රතිරූපක දර්ශනයෙකි.

"නගුලේ රග දූනෙයි කුඹුරේ සාන විට
පවුලේ රග දූනෙයි දරුවන් අඬන විට"

මෙහි මුල් පදයෙහි තියෙන තේරුම දැනගන්නට නම් කඩුගන්නාව කන්දේ සී සෑමක් බැලිය යුතු වෙයි. දැන් අපි නගුල ගැන තරමක් සොයා බලමු.

## නගුල සහ එහි අවයව

නගුල සකස්වන්නේත් පලාත් අනුව හෙයින් එහිද යම්කිසි වෙනස්කමුත් ඒ වෙනස්කම් අනුව ගිය නමුත් ඇති වන්නේය. අඬන්කාලජ්ජු නගුල, කොකු නගුල, දිවත් නගුල, නිමුන්කුරුල්ලා, බඩවක නගුල යනු එයින් කීපයෙකි. සැරයකි ඉන්දියාවේ ආලම්බන නගුල නමින් නගුලක් තිබුන බව පොත් පත්හි පෙනෙතත් එය අමුතු හැඩයක නගුලක් නොව සමූහයක් හී ගාන විට පලුදුමැන්නා දක්නක නගුලට ව්‍යවහාර කළ නාමෙකැයි සිතිය හැකිය. නගුල් ශබ්දයෙන් ප්‍රධාන වශයෙන් නගුලේ තිව සාරාගෙන යන අවයවයත් අප්‍රධාන වශයෙන් සම්පූර්ණ නගුලත් කියවේ.

1. අඬස්කාලජ්ජු නගුල— මේ වනාහි හතරලියද්ද පෙදෙසේ භාවිත කරන ලොකු නගුලකි. දෙමළ නාමක උපරූව පෙනේ.

2. කොකු නගුල— මෙය ඉඩ බහුල කුඹුරු සෑම සිරිය භාවිත කෙරෙති. විනය පාලියෙහි එන "ඩොඩකක" යන් මෙය දැයි සොයනු. ගම් දරුවන් සොලිත කුඩා නගුල කැයි අටුවාව කියයි.

3. දිවක් නගුල— දිවයින් යුක්ත නගුල දිවත් නගුල විය හැකිය. ඉඩ අධික කුඹුරුවල පාවිච්චියට යොග්‍යවේ.

4. නිමුන් කුරුල්ලා— මී අගින් සාදූ නිමුනෝ ගසී-කරන කෑවිලයක් නිමුන් කුරුල්ලා නමින් හැඳින් වේ. එයින් යුක්ත නගුලක් එනමින්ම ව්‍යවහාරයට යන්නට ඇත.

5. බඩවත නගුල— මිටත් නගුලිසත් දෙකම මදක් ඇතුළට නැමුණු සේ සාදන නගුල් විශේෂයෙකි.

6. අමුතුපට්ටය— නගුලිසත් වියගසත් එකට අල්ලා බඳින ලනුවට මේ නාමය වේ.

7. කොරවක් කොණ්ඩේ— නගුලිසේ මුල, නගුලිසටත් නගුල් දතටත් අතරේ ගසන ලී කෑබැල්ල කොරවක් කොණ්ඩේ නම්. මෙයින් නගුලට අමුතු ශක්තියක් ගෙන දෙයි. කොත්මලේ, නගුලේ උඩ කොටසට මේ නම යොදත්ලු.

8. නගුලිස— බර කරත්තයක ඊරියකද මෙන් වියගහ බැඳීම පිණිස පාවිච්චි කරන - නගුලේ ප්‍රධාන කොටස නගුලිස නම්. ඉස යනුව "ඊෂා" ශබ්දයෙන් ආයේය. .

9. නගුල් මිට— සී සෑමේදී ගොවියා විසින් අල්ලා ගනු ලබන කොටස මිටය. නිමුන් මිට යනුත් මෙයටම නම්. මහ ඔසු පඬිතුමාට සේනකාදීන් නිග්‍රහ කොළේ නිමුන් මිට එලීකත ගොවියාගේ පුතා කියාය.

10. නගුල් දත— නගුලේ දතක් මෙන් සිලබන බිම සෑරී ගෙන යන අවයවය නගුල් දත නම්. වක්කැත්ත යනුත් සමහරුන්ගේ ව්‍යවහාරයි.

11. සිවැල— වක්කත්තේත් ගසනු ලබන යකඩ පටියට මේ නම්. බිම පලාගෙන යන හෙයින් ඵාල යනුත් මෙයටම නම්. පළ, වැල යන දෙශබ්දයම එයින් ආයේය. කසීභාරද්වාජ සූත්‍ර සන්නය බලනු.

12. හමනාඩ— හෙට්ටිපොල ආදී සමහර පළාත්හි වක්තැත්තෝ මැදින් සිදුරක් කොට නගුලිසේ මුල අසුවන සේ වේවැලින් බැම්මක් බඳිති. හමනාම නම් ඒය. සම්බන්ධ කරන්නා යනු අර්ථයි.

13. උඩලෙ— නගුලේ මුදුන් පැත්තට නමෙකි. කොත්මලේ කියත්ලු.

14. ඉසලම්බාණ— නගුලේ දමන වලල්ලකැයි කියති.

15. ඉහක්කිල්ල— නගුලේ ඉහල පිල්ල.

16. නාසල්ල— නගුලේ යට පැත්ත, එය කැපීමට නාව පිදීමයයි කියති.

17. පළු ඇණය— ඇදී නොයනු පිණිස නොරවක් කොටේ පසු පසැ ගසන ඇණයයි කියත්. මාතර පළාතේ නම් මේ ඇණය ගසන්නේ නගුලිසේම පසුපසෙහිය.

18. වෙන— නිමුන් කුරැල්ලා ගසන තැන.

මී හැමේදී නගුල, ගොන් ගෙය, ගොවියා, යන තෙ කොටස ප්‍රමුඛ වන බැව් අපි දනිමු. ඉහත දක්වූයේ නගුල පිළිබඳ කෙටි විස්තරයෙකි. සී සෑමක් අරඹන ගොවියා ප්‍රථමයෙන්ම කුඹුරේ වන අත්ගසා ඇල මං පාදා ගෙවැසිය සුතුය. නැකැතට වැඩ ඇල්ලීම මෙහිලා ගෙවැසීම නමින් අදහස් කරනු ලැබේ. ගමේ නැකැත්තා සිනු පරිදි නැකැතට වැඩ අල්ලා සීසාන දිනය නියම කර ගනිති. ඉක්බිති අසල්වැසි සහාය ගොවීන්ටත් දන්වා බත් බුලත් ආදී එදිනට උවමනා දෙය සකස් කරනු කුඹුර අයිතිකාර ගොවියාගේ සිරිති. නියම දිනය පැමිණිවිට නගුල්, හරක්, මල්කැරැ හෝවූ, ලනු ආදී උපකරණ රැගත් ගොවීහු එක් තැනකට රැස්ව නගුල්වල හරක් යෙදීමාදිය ඉමර කොට, ජාතියත්, ජාතික ගෞරවයත්, ජාතික කලාවනුත් රැක

දුන් ජාතික සම්මානයට පැරසෙති. අමුඩය ගසා හෝ සරුවාලය හැඳ, ලේන්සුව ඔලුවේ බැඳ, මල්හැරැ කෝට්ටුව දකුණතින් නගුල් මිට වමතින් රැගෙන කුඹුරට බසිති. ඇඟට පසඟුල්ද පයට රන්රසුද අතට පීදි කුප්පිද ගෙලට බොලු මාලයද දී ගොනුන් සරසනුය් පෙර සිරිති. පැරැණි ගියක් සියකම් කරන පූජාවලී කතෘපාදයෝ—

“නඟුලෙක, විසදලෙඬක, පිටවලෙකක, බඩවලෙකක, නිමුනෙක, කොසිල්ලෙක, අවකැමෙක, සීවැලෙක, පෙර ගිලියෙක, පසු ගිලියෙක, වියඹැයෙක, සි දඬේ දෙකක, අමුතු බාලෙණක, කෙවිටෙක, ගොන් ගෙයක, ගොවියෙකැයි යන මේ අටළොස්පදනාගේ එක්වීමෙන් යන්නාවූ ගමන සි සෑම නම් වෙයි” යි

කීහ. මේ වාක්‍යයෙහි සඳහන් බොහෝ දේ දැන් නාම මාත්‍රයෙන් පවා අසන්නට නැත්තේය.

**පිටවක සහ බඩවක**— මේ දෙව්‍යවහාරය සතර කෝරළේ අදත් පවත්නා නමුත් මූලාර්ථය සහ ගැලැපෙද්දැයි අපට නිශ්චය වශයෙන් නොකිය හැකිය. සාමාන්‍යයෙන් නගුලක් වනාහි එක කොනක් දිග, වැන්වී ගිය –ලීයකි. නගුලිස යෙදෙන්නේ ඒ වකය මැද්දෙහිය. එවිට වකය දෙකොනක් වෙයි. එයින් නගුලිසින් උඩට තිබෙන වකය පිට වකය නමිනුත් යටට ගිය වකය බඩවකය නමිනුත් ව්‍යවහාර වීයැයි සිතන්නට ඉඩ තිබේ.

**නිමුන**— නගුල් මිටේ අතට අසුවන කරිය නිමුන යයි සැලකිය හැකිය වැඩි වශයෙන් එය අමුතුවෙන් පුරුද්දන කැබෙල්ලකි. “නිමුන් මිට එලිගෙන කහ ගොවියා පුතු” යනු උමංදා පායකි. මෙයින් පෙනෙන්නේ නගුල් මිට නිමුන් මිට බවය. මෙහි සම්පූර්ණ අර්ථය අපට තවමත් තේරුම් ගත නොහැකි විය. මූන ශබ්දයෙන් යමක අවසාන කොටස කියවේ.

කොවිල්ල— නගුලෙහි මෙකී කොටසක යන කරිය කොවිල්ලදැයි සොයනු. අපට අවිනිශ්චිතය.

අඩකැටේ— සමහරවිට කොරවක්කොටි වන්නට පුළුවන. හී නගන යනවිට නැතින් තැන ඉහිරවන තණ මුසු කුඹා මැටි ගොඩක් වත්සාඩක් කාපං පසෙකින් තබන ඔඩැල්ලක් අවකැට නමින් ප්‍රසිඩය. එහෙත් එය නගුලේ අවකැටය නොවේ. කාසිභාරද්වාජ සූත්‍ර සන්නයෙහි "කිමෙක් කැට ගොන්ට බදිනා හෙය දක්වමින් පසුබැස්ස නොදී ගොවිමග ගමනුන් වළකාද" (සූත්‍ර නිපාත සන්නය 93 පිට) යන වාක්‍යයෙහි එන කැටය මේ අවකැටය විය හැකිය. ගොනුන්ට පහර දෙනු සඳහා පාච්චි කළ ගල් කැටයක් අවකැට නාමයෙන් හැඳින්වුනු බව මෙයින් සිතාගත හැකිය. කවදත් සොයනු.

පෙරගිලිය සහ පසුගිලිය— "කිමෙක් බමුණාගේ විය තෙම පෙරගිලියට බක්කෙහි වේද............ගොන්ගේ එක්මග ගමන නවකාද" යනු කාසිභාරද්වාජ සන්න පාඨයි. මේ වාක්‍යයෙහි එන පෙරගිලි ශබ්දය වෙනුවට අටුවාහි ඊෂා ශබ්දය යොදා තිබේ. මෙයින් පෙනෙනුයේ එකම නගුලිස පෙරගිලි පසුගිලි යන දෙකොටසකින් යුක්ත බවය. වියගස බඳින කොටස යොදා තිබෙන හරිය, පෙරගිලියත්- එයට මුලින් තිබෙන හරිය පසුගිලියත් විය හැකිය.

මුල්සාදු— මේ වනාහී නගුලේ අවයවයක් නොවැ නගුලෙන් කැඩී බිඳී යන මුල් ආදිය වේ. මේ වෙනුවට කාසිභාරද්වාජ සූත්‍ර අටුවාහි යොදා තිබෙන්නේ මූලසන්තාන ශබ්දයයි. එහි තේරුම ඇදී ගිය මුල් සමූහය යනු අර්ථයි. මහාවංශයෙහි ධාතුවස්ත චරිතයෙහි මූලසාල'යි පාළියට පෙරළා තිබෙන්නේ මේ "මුල්සාදු" ශබ්දය විය හැකිය.

අඹුනුබාණ— මේ වෙනුවට කාසිභාරද්වාජ සූත්‍ර සන්නයෙහි "අමන්දුබාණ" ශබ්දය පෙනේ. විය ගසේ ගොතා අල්ලා බඳින ලනුව අඹුනුබාණ නමැයි සලකමි. ඉස්සර

සී සෑමේදී එක්තරා බාණකියක් ගොනා සහ මිනිසාත් එකට සම්බන්ධවූ බවකුත් පෙනේ. මාතලේ තොත්මලේ යන පළාත්වාසී ගොවීයෝ අමුතු බාණ යන්නෙනත් ඉතා ශක්ති බාණම හඳුන්වති. අමුතු ශබ්දය අමුණුවූයේ දෙමළ උච්චාරණය අනුව යෑමෙනැයි සිතේ.

**විසමූස—** විසමූහූයක් ගැලවූ විසදඬුවක්, ඒ විස දඬුයෙහි විසමූහූය ගැලවූ සිදු, යනාදී ප්‍රයෝගයෙන් තම විභාගය නැමැති පැරණි ග්‍රන්ථයක පෙනෙන හෙයින් නගුලිසම විසමූස නමැයි සලකා ගත හැකිය. ක. හා. සූත්‍ර සන්නය බලනු.

**සිරිණ දෙක—** විය ගසන් ගොනුන් දෙදෙනා බඳින ලනු දෙක සිරිණ දෙක යයි සිතමි. "ගොන්ගේ මුඳු සිරිණ දෙක හා අඹු ගෙනාගිය කාළය හා ගෙන" යනු පූජාවලි පාඨයි. (රත්නසාර සංස්කරණය 436 පිට)

**ගොන් ගෙය—** ගොන් බාන ගෙවත් ගොන් පෝවූව ගොන් ගෙය නමැයි සලකමිහ. ගොන් කිඳෙනාට ගොන් ඇගේයයි සමහර පළාත්වල කියති. ගොන් ගෙය වූයේ ගොන් ගුහය යනුව දැයි සොයනු.

සවනී අටලොස්දෙනාගේ ගමනට සී සෑම යයි කියනුයේ සූක්ති සහිතය. එහෙත් මූලාශ්‍ර වශයෙන් බලනවිට සීය සෑම සී සෑම යයි ගත යුතුය. නගුල ගොනුන් ලවා අද්දන විට කුඹුරේ ඇතිවන පාරට පෙළ බයින් සීතා, හලසබනී යන නමුත්, හෙළෙන් "ශිවිට" යන නාමයක් යෙදෙයි. සිය යනු සීතා ශබ්දයෙන් ආයේය. (සීතා > සීත > සිය) මෙසේ ප්‍රථමයෙන්ම හාන සිය බිම්නැගුම, පුරන්බඩ යන නම්වලින්ද, දෙවන සීය දෙම්බුම නමින්ද, තෙවන සීය වප් සිය නමින්ද ගොවියෝ දනිත්. තුන් සිය සෑම කුඹුරේ අනුව සිදුවන්නක. එහිත් නොයෙක් වෙනස්කම් තිබුණේය. සමහරුන් සී සෑවිට හී පාරවල් කිසි පිළිවෙළකට නැතිව දුවිනෙන් අඹිය කරන පරදී ඇදී ගොස් තිබෙන බවත්,

සමහරුන් සී සෑවිට එසේ නොවැ හී පාරවල් ක්‍රමානුකූලව ඇදීගොස් ලක්ෂණ රටාවකින් යුත් පැදුරක් මෙන් දුටුවන් පහදවන බවත් අපට පෙනේ. හීහැම්මලැ නාමල්දගේ නව පොටේදගේ යයි ප්‍රසිද්ධ රටා දෙකක් තිබුනේය. එයින් නාමල් දගේ, ස්වරූපයෙන් නා මලකට සමාන බැව් නාමයෙන් පෙනේ. නවපොටේ දඟයක් හී පාරවල් නවයකින් යුක්ත වන්නට ඇත. මේ දෙකම තොක්මලේ හීහැම්මල ඇත්තේලු. අනෙක් පළාත්වලත් තවත් නොයෙක් විධියේ රටා තිබෙන්නට පුළුවන. හී පාර ක්‍රමානුකූලව දිගට ගෙන ගොස් නමන තැනට "නැම්ම" යනු නම්. ඇඳුනු කිපයකින් හානවිට ප්‍රථමයෙන්ම යන බාන ඉස්සරහ බාන නමුත් පස්සේ යන බාන පස්සෙ බාන නමුත් වෙති.

හීයෙන් පසුව අවකුට්ටි ගෑසීමේ වාරය එළඹෙයි. අව තැට මුලින් හඳුන්වා ඇත. සී සෑමේදී තැන් තැන්වල එකතුවන තණ මුසු පස් කුට්ටිවලට මාතර පළාතේ "අව කුඩ්ඩි" යයි කියති. (කසීභාරවාජ සූත්‍ර සන්නය) අවකුට්ටි ගෑසීමෙන් පසුව නොදිරූ තණ එකතු කරනු සිරිති. ඒ සඳහා පැරැණියෝ "අවඩ්ඩදණ්ඩකය" නම් උපකරණයක් භාවිත කළහ. එය ස්වරූපයෙන් පාරේ ගල් එකතු කරන දැති කිපයක් ඇති උපකරණය වැනිය. සමහරු එය ඇණ දත් පෝරුව නමින් හඳුන්වත්. කුඹුරේ උස් පහත් තැන් තිබේනම් පෝරුගානුත් සිරිති. ඒ සඳහා පෝරුව නම් උපකරණයක් පාවිච්චි කරනු ලැබේ. එය සාදන්නේ ශක්තිමත් ඝනකම් ලෑලිවලිනි. එහෙයින් පෝරුව යනු අන්වර්ථ නාමයි. (පදර > පුවරු > පෝරු)

ප්‍රථම හීයෙන් (අස්වැද්දුම් හීයෙන්) පසුව නියරවල් ගසා දෙවනු හීයෙන් පසුව නියරවල් බඳිනුත් සිරිති. දැන් කුඹුරක් කම්පස් කොට ඉවරය. මැඩවීමත් කුඹුරු කම්පස් කිරීමේ හොඳම ක්‍රමයකි. එයට තැපවනුයේ අගාර කුඹුරුය. මැඩවීමට මීහරකුන් සිව්දෙනෙකු එකට ඇඳගත යුතුය.

එසේ ඇඳගත් මීහරකුන් සිව්දෙනෙකුට "ගැළපුම" යයි කියත්. සී සෑමේදී වම, දකුණ, උඩ (ඉදිරියට යනු), බස (බසිනු), යි කියන්නාක් මෙන් මැඩවීමේදීත් "ඔහෝ හෝහෝ" යි කියමින් හරකුන් දක්කනු සිරිති. හරකුන් ලවා කුඹුර පෑගවීම මැඩවීම නම්. මැඩවීමේදී තරමක් ලොකු මල්කැරැ කෝටුවක් පාවිච්චි කරත්. හරක් එකට ගලපන ලනුව බාන නම්. සී සෑම් ආදියෙහිදී මෙන්, මැඩවීමෙහිදී හෝ හෝ කියනු විනා, කවි කියනු සාමාන්‍ය සිරිත නොවේ. හරකුන්ගේ ධාවනයෙන් හටගන්නා ඝෝෂාව නිසා නාදයක් නගා ගත නොහැකි හෙයින් විය හැකිය.

කුඹුරු යායක් වපුරන්නට අරඹන්නේ එහි ඉහත්තාවේ සිටය. යායක් වැපිරීමේදී මුලාදෑනීන්ගේ නියමය අනුව පලපුරුදු කලකුනා ගොවීන්ගේ මග පෙන්වීමක් ඇතිව ගොවියෝ සිය කාර්යයෙහි යෙදෙති. නියමයන්ට පිටුපා මැද්දස්ස හෝ පහත්ත ඉස්සරවෙලා වපුරන්නට ගියහොත් ඉහත්තාවේ වතුර බස්සන්නට ක්‍රමයක් නැතිව යෙයි. ඉහත්තාවේ පටන් වැපිරීම ඇරඹීමෙන් මේ දුෂ්කරතාමෝ නොඑළඹෙති. වැපිරීමත් සිරිත් පරිදි නැකතකින්ම ඇරඹිය යුතුය. ගොවියා නියම නැකැත් වෙලාවට කුඹුරට ගොස් පොල් මලක් සහ කබරල පැළයක් නියර මත සිටුවා ඒ ස්ථානයෙහි ස්වල්ප තැනක් මට්ටම්කොට වී ඉසියි. එමද ගෙවඩීමෙහි. මෙසේ පූජා කෘත්‍යයන් ඉවරවූ ඉක්බිති සිය සහාය ගොවිය-නුත් කැඳවාගෙන සෙත කාරු ආ ගොවියා වැපිරීමට පටන් ගනී. පළමුකොටම කුඹුරේ වතුර බස්සනු පිණිස ඇළවල් දමයි. ප්‍රථමයෙන්ම දමන්නේ මුඳුන් ඇළය. එය කුඹුරේ හරි කෙළින් තරමක් ලොකුවට කනිනු ලැබේ. ඉක්බිති ඒ ඒ ලියදිවලද කුඩා ඇළවල් දමති. කුඩා ඇළවල් සියල්ල මුඳුන් ඇළට සම්බන්ධය. වතුර බැස ගිය ඉක්බිති මිට ගසා ගත් ලෑලි කැබැලිවලින් හෝ පයින් ඒ ඒ අල්ලි සමකරත්. පයින් අල්ලි සමකරන සියල්ලන් අතේ ප්‍රමාණවත් කෝටුව-කුත් ඇත. එහි නාමය මම නොදනිමි. මෙසේ කුඹුරේ

සියලු අල්ලි හැමුණු විට කැබැලිවලට වෙන් කළ කිරිබත් කට්ටියක් සේ දිස්වන්නේය. වී ඉසින්නේ මේ අල්ලිවලය.

## වී සකස් කිරීම

ගොයම් කපා පාගා ගත් ඉක්බිති ඇත නොවූ හොඳ වී ප්‍රමාණයක් බිත්තර වී වශයෙන් වෙන්කොට තබති. වැපිරීම සඳහා සකස් කරන්නේ ඒ වීය. කුඹුරෙහි විස්තාර (වැනීම) කරන වී බිත්තර වී නමැයි සලකමින. (විස්තාර > විත්තර > බිත්තර) නොහොත් බිජුතර වී බිත්තර වී යි සැදෙන්කටත් පුළුවන. බිජු පිණිස තබන තර (හොඳ) වී යනු අර්ථයි. බොල් නොවූ හොඳ වීයට පැරැන්නෝ තර වී නාමය දුන්හ. (බිජුතර > බිජ්තර > බිත්තර) යනු අා ක්‍රමය විය හැකිය. ප්‍රථමකොට මේ වී බඳුන්වල දමා නියමිත වේලාවක් පොගොවා (මාතර පළාතේ නම් රැයකි) ඉක්බිති කොසෙල් කොළ උඩ තුනීකොට කොසෙල් කොළවලින් සහ පැදුරැ කබල්වලින් වසා බර තබති. මෙසේ කෙදිනක් ගිය පසු උවමනා නම් තව වරක් තෙමති. කෙසේ හෝ නියමිත දින ගණන ගිය පසු වී ඇටේ මුල් ඇදී කනු කැපෙයි. වී ඇටේ අංකුර අවස්ථාව මෝදුවීමට කනු කැපීම යයි කියති. සත් දිනක් ඇතුළතදී ඇදී ගිය මුල්වලින් ඔවුනොවුන් වෙළුඳගෙන අංකුරයෝද තරමක් උසට වැඩෙති. දැන් ඒවා වැපිරීමට සුදුසුය.

එකට සම්බන්ධවූ වීය නොවැපිරිය හැකි හෙයින් අත් ගසා ඒ සඳහා සකස් කළ කට ලොකු පෙට්ටිවලට දමති. වී ඉසීමද හොඳ පළපුරුදු ගොවියකු විසින් මිස සෙස්සන් විසින් නොකළ හැකිය. අපේ ගමේ සොංචිං මුත්තා යි ප්‍රසිද්ධ මේ ශ්‍රියාවන්ත අති දක්ෂයෙක් සිටියේය. වී ඇටය හිසකැයි සැලැකුවොත් එයින් ඇදී ගිය මුල් කීපය සොංචිංමුත්තාගේ රැවුලට අත්‍යන්තයෙන් සමානය. සොංචිං මුත්තා වී පෙට්ටිය කිසිල්ලේ තබාගෙන උඩේ සිට ඉරිමුදුන්

ජාමය වනතුරුත් එතැන් සිට හැන්දෑ වනතුරුත් මේ රාජකාරිය කොට ඇඳිරියේ ඇගත් සෝදාගෙන නව යොවුන් තරුණයකු සේ කවියකුත් කියාගෙන ගෙදර එයි. අප දකිනවිට හේ අසූ වයස් ඉක්මවා සිටි මහල්ලෙකි. ඔහු ලෙඩවී සිටිනු කිසිවිටෙකත් අප විසින් නොදක්නාලදී. වී ඉසිනවිට පස්සෙන් පස්සට මිස ඉස්සරහට නොයනුත් සිරිති. වී ඇට නොපෑගෙනුත් පියවර සටහනේ වී ඇට වැටෙනුත් සඳහා ය. මෙසේ වී ඉස ඉවරවූ පසු කුඹුර පෙනෙන්නේ තරු විසිරී ගිය නිල් අහසක් මෙනි. මේ පැල වීය සමහර කුරුල්ලන්ගේ රසවත් ආහාරයක් හෙයින් ඔවුන්ගෙන් කුඹුර ආරක්ෂා කර ගැනීමටත් වග බලා ගත යුතුය. තෙදිනක් ගතවන විට වී ඇටය සිය මුල් නැමැති අත්වලින් අලුත් පොළෝ මනමාලිය වැළඳගෙන ඉවරය. ඒ දෙදෙනාගේ සංගමයෙන් ඇතිවන අංකුර නැමැති දරුවා එක්පෙති දෙපෙති අවස්ථාවන් ඉක්මවා ක්‍රමයෙන් හිස ඔසොවා දිය නැමැති කිරි ඉල්ලමින් මෙන් ඉහළට නගියි. දරුවාට කිරි දිය යුතු වකවානුව මැණියන්ට දැනෙන්නා සේම ළදරු ගොයමට වතුර දිය යුතු කාලය දක්ෂ ගොවියාට දැනේ. හේ පළමුවලා කෙතට දිය බැඳ කෙත තෙමී ගිය ඉක්බිති දිය බස්වා හරියි. මේ දිය බැඳීමට "ඉස්නාන් තෙමීම" යයි කියත්. තෙදිනකට වරක් බැගින් තෙවරක් ඉස්නාන් තෙමා ඉක්බිති උවමනා පමණ දිය බඳියි. මේ දියවරට "වප්පෑන" යනු නමි. එය කපා හරින්නේ ගොයම පැසී ගිය පසුය.

මෙසේ ගොයම පැලපත් බවට පැමිණි තිලන කල්හි තෙලීම ඇරඹෙන්නේය. කුඹුරේ සාරය උරාගන්නා තෘණාදිය උදුරා දැමීමත් තෙලීමක් වුවද ප්‍රධාන තෙලීම එය නොවේ. පැලපත් ගොයම උගුලා අගින් කොළ කඩා දමා නැවතත් පිළිවෙළට සිටවීම මෙහිදී තෙලීම නමින් අදහස් කරනු ලැබේ. පැල සිටුවීම යනුත් එයටම නමි. වැඩි වශයෙන් තෙලීම කරනුවෝ ස්ත්‍රීහුය. ඔවුන් විසින් මොණලාක්

අතින් එක පෙළට සිටුවනු ලැබූ ගොයම් ගස් සමූහය-යුද කිමෙක පෙළපාළියකට සැරසී සමදුරින් පෙළින් පෙළට සිටිය යුද බළ මුළුවක් සේ ඈතට දිස්වෙයි. තෙලන්තියන් නගන ගීත නාදය තොරගත් කවුරුනුත් කුල්මත් කරවන සුලුය. වතුර නැතිව ගොයම් මැරෙන්නට යනොත් වතුර හිසින් ගෙනවුත් හෝ වත්කරති. යොතු කඳින් හෝ ඉසිති. ලියද්දක වැඩි වතුර ඉවත් කිරීමටත් වතුර ඇති පහත් තැනකින් උස් තැනකට වතුර දීමටත් යොතු කඳ පාවිච්චි කරනු ලැබේ.

යොතු කඳ බෙහෙවින් පාවිච්චි වන්නේ රයිගම්කෝරළේ යේය. පැත්තකින් වැසූ - මිටක් සහිත පීල්ලට හුරු අවයවය යොතුකඳ නම්. දෙපැත්තේ කත්තිරිකා දෙකක් බැඳ එහි ලීයක් දමා ලීයේ යොතු කඳ එල්වනු ලැබේ. ඉක්බිති මිටෙන් අල්ලාගෙන වතුර ඉසිති. මාතර පළාතේ මේ වෙනුවට කොළපුව සහිත කිතුල් පිත්තක් පාවිච්චි කරත්. මේ උපකරණය ප්‍රයෝජන වන්නේ ජල බහුල කුඹුරුවලට බැව් සැලැකිය යුතුය. ගොවි උපකරණයන්ගේ උවමනාවත් පාවිච්චියත් දෙකම පළාත් අනුව වෙනස් වන බව මූලදීත් කීවෙමු.

ඉන්දූ ගොයම පඳුරු දමා ඉතා සශ්‍රීකම වැවෙන්නට පටන්ගනී. එය හීන්බණ්ඩි, මහබණ්ඩි, මල්වැරැම්, පීදීම්, කිරි වැදීම්, යනාදී අවස්ථාවන් ඉක්මවා පැසී පෙරළෙන්නේය. ගොයම පැසීමට කල්යන්නේ වියේ හැටියටය. සාමාන්‍ය-යෙන් දෙමසේ සිට හත්මස දක්වා ඇති කාලය ලංකාවේ වී වගී පැසීමට ගතවන කාලය සේ සැලකෙයි. මේ කාලය ඇතුළත ගොයමට විවිධ උවදුරු ඇතිවන්නටත් එයින් ගොයම විනාශ වන්නටත් පුළුවන.

## 4. සිව්වන වග

# ගොයමේ සතුරන් සහ කෙම් විධි

ගොයමට සතුරුකම් කරන්නෝ බොහෝය. සතුන්ගේ සහ වැස්සේ අඩු වැඩිකම එයින් ප්‍රමුඛස්ථානය ගනී. සමහර පළාත්හි කොක්කනා නමින් හැඳින්වෙන ගොඩවෙල්ලා වනාහී ගොයම් පැලේ පරම සතුරෙකි. සාමාන්‍යයෙන් ඌ ඇතිවන්නේ ඉල්මහ කාලවරටය. ගොයම් පැල පමණක් නොව කුඹුරේ තිබෙන සියලුම පැළෑටිවලම මුල් සිස කා දමනු උගේ සිරිති. ගොඩවෙල්ලාගෙන් අනතුරු ලත් කුඹුර, උඳුගොවුවා බෝවුන ඔලුවක් සේ හිස්වන්නේය. ඌ සමහර කාලයන්හි බොහෝටද වැඩෙයි. එවිට විශෙෂයෙන් කැප්පිටියා ගස්වල පොතුත් කොතබා කා දමයි. කෙසේ ගොඩවෙල්ලා-ගෙන් රැක ගත්තත් කුඩුකෝඩු කුඩුමැටිය ආදියෙනුත් නොයෙක් විපත් ඉදිරිපත් විය හැකිය. එවිට "නිද්දනාය" කළ යුතු බව කසීභාරද්වාජ සූත්‍රයෙහි කියනලදී.

වල් පැළෑටි තෙලා දැමීම නිද්දනාය නම්. ඇල්කොතාක නම් මේ තෙලීමට "නෙළුම් ඇල්ලීම" යයි කියත්. ඇප්මක කටවක සෝවක ආදියෙනුත් කුඹුරු ලෙඩ වන බැව් ගොවීහු කියති. මේ සියල්ලට භාවිත කරන කෙම් ක්‍රමත් ඔවුන් අතර ඇත්තේය. එයින් සමහර ඒවා නිරර්ථක වුවද පාරම්-පරික සිරිත් හැටියට එක්මුන් ගොවියාද ක්‍රියාවෙහි යොදන බැව් පෙනේ. වී ඇටේ කිරි පිරෙන කාලයෙහි එයට මැස්සා ඇබ්බැහිවී ඒ කිර උරා බොයි. එයින් කුඹුරට "සෙතපයිකා" නම් රෝගය වැළඳෙයි. මුළු කුඹුරේ ගොයම් කරල් සුදුව හුලඟින් වැනෙනු ඒ රෝගයෙන් පීඩිතවූ කුඹුරෙහි ලක්ෂණය වන්නේය. කෙතට මෙවැනි රෝගයක් වැළඳුන විට සිදුකරන කෙම් විධි අතුරෙන් අප දන්නා කීපයක් මෙතැන් සිට දක්වනු ලැබේ.

1. අං ඇදීම— දෙවියන් ඇතැයි සම්මත ගසක් හෝ වෙන තැනකට ගොස් දෙවර්දිය (දේවාරාධනය) කොට ගම්මුන් සහ නාපුවන් එකතුව සභාවක් පවත්වා, නියමකර ගත් දිනයෙහි අං ඇදීම ආරම්භ කෙරෙති. පළමුකොට කතිරයක් සේ සිටින හැටියට දණ්ඩියම් (කොට) දෙකක් සිටුවති. එයට "ගහකඳ" යයි කියත්. එතට ඇඹිලිය හැකි සේ නැමී ගිය අතු ඇති අං දෙකක් ගෙන කඳ දෙකේ බඳිති. බඳින්නේ අගේ මුල කඳට හේත්තු වන සේය. මෙසේ හොඳින් කිරිංග දමා අං බැන්ද ඉක්බිති ගෙන කඳ දෙක එකිනෙකට ලං කොට අං අමුළුවනු ලැබේ. ඉක්බිති ගෙන කඳ දෙකේ ලනු දමා දෙදිසාවට වලි කියමින් අදිත්. යම් පිලකට අයත් අඟ කැඩී ගියේ නම් ඒ පිළ පරාජය වූයේ වෙයි. අං ඇදීමේදී දෙවියන් යැදීමාදී කොත්‍ර කාරන්නා හෑන්නාදිරාල නමින් හැඳින්වේ. අපේ කාලය වන විට අං ඇදීම නැවතී තිබුණේය. අං ඇදීමේ විස්තර ඉතා බොහෝය. ග්‍රන්ථ බාහුල්‍ය භීතිය නිසා ඒවා නොදක්වේ.

2. කුක්කා දානය— ශස්‍ය ඵල ප්‍රාර්ථනා කොට රුහුණේ දෙන දානයකි මේ. හාල් කිරි මෙහි ප්‍රමුඛස්ථානය ගනී. මෙයට කාල නියමයක් ඇති බවක් නොදනිමු. නාමයෙන් පෙනෙන්නේ බල්ලන්ට දෙන දානයක් බවය. සාන්තානු නම් බල්ලන්ට වඩා මිනිස්සුය. පෙරදී මේ දානයෙහි ප්‍රධාන ප්‍රති-ග්‍රාහකයා වන්නට ඇත්තේ කුක්කා යයි සිතේ.

3. කොම්පැලැලි දැමීම— ගොක්කොළ වලින් විශාලත් පැලැලි විශේෂයක් කුඹුරේ එල්ලීම කොම් පැලැලි දැමීම නම්. කුඹුර වටා ගොක්කොළ ඇදීම ඉතා පැරණි සිරිතක් බැව් ජාතක පාලියෙන් පෙනේ. පඹයන් බැඳීමත් වන සතුන්ගෙන් කෙත රැකීමට ඉතා ප්‍රයෝජනවත්ය.

4. ගම්මඩු නැටීම— වෙල මැද නාමනත මඩුවක් සාදා දෙවියන්ට පුද පඬුරු කැපකොට ඔවුන්ගෙන් ශස්‍ය වෘද්ධි-යක් ආයුරාරෝග්‍ය සැපයත් ඉල්ලීම මේ නැටීමේ අදහස වන්නේය. එහි නටන්නේ "ශ්‍රී ශාරාලවර්ණය". නැටුමේ අවසානයෙහි විශාල දානයෙකි.

5. ගොප්මං ඇදීම— කෙතට වන සතුන් වදින පාර බලා ඒ පාරේ ගොප් රැහැන් ඇදීමට මේ නමි. මෙද ඉතා පැරණි ක්‍රමයක් බව ජාතක පාළියෙන් දත හැකිය.

6. ගොයම්කනු ගෑසීම— සිය කුඹුරට විපත් වන් විට ගොවියා ශීඝනරාළ (ශීඝයන රාළ) කරා ගොස් තොරතුර කියා සිටී. ශීඝනරාළ යාගය කළ යුතු දිනක් එයට උවමනා උපකරණත් දන්වයි. ගොවියා උපකරණ සපයා සුදුසු තැනෙක මල් පැලකුත් සාදා තබයි. ශීඝනරාළ පත්තිනි දෙවියන්ගේ සලඹත් රැගෙන වුත් එය කහ දියරෙන් සෝදාගෙන සොලොවමින් යාතිකාව අරඹයි.

කාලානුකූලව ඔහුගේ මුවින් නික්මෙන යාතිකාවක් මෙසේය.

“තෙදවරන් පස්බාන් දහසකට සාදු සාදු සිටවැන්-දේන් හිඳ වැන්දේන් දස වැන්දේන් දැස් වැන්දේන් දෙහොත් මුදුන් තබා වැන්දේන් හුරු අත් නුහුරුකර වැන්දේන් නුහුරු අත් හුරුකර වැන්දේන් ............... බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර සමන් බොක්සැල් කතරගම විබීසන ........ සිද්ද පත්තිනි දෙවදෙව සඬාමිනි මෙගම් පැලැස්සට වඩා වැඩුණු ලසැබි ගොයමට මැසි මදුරු සණු ගොඩවෙලු ආදීන්ගෙන් සැමිණී උවදුරු අලසත දිය මෙන් විගත විද්ධවංසනයකොට රැක දෙත්වා”

මෙසේ යාතිකා කොට කුඹුරට සෙත් වඩා කෝටු කැලි කිපයක් ගොවියා අතට දෙයි ශීඝනරාළ. ගොවියා ඒවා ගෙන ගොස් කුඹුරේ සුදුසු සේ සිටුවා ලයි. මේය ගොයම් කණු ගෑසීම නම්. මේ සෙත් ශාන්තිය පිණිස ශීඝනරාළට අලුපුහුල් ව්‍යඤ්ජනය ප්‍රමුඛ නිර්මාංශාහාරයක් ගෙදර ගෙන යන්නට සිදකුත් ලැබේ. කද මනාශි වී කුරුණී එකක් හෝ දෙකක් පොල්ගෙඩි දෙකක් සාමාන්‍යයෙන් තුන් ඇමැරියක් ඇති රටහොරනවාලු කොසෙල් කැණක් අලුපුහුල් ගෙඩියක් හෝ බැයක් යන මෙතෙක් දැයින් යුක්ත වන්නේය.

ලියද්ද වැටි දලුත් පලු එල්ලීමද කෙරෙති. ලියද්දේ සිව් කොනෙන් සාරු භාජනත් හිටුවා ඒවා උඩ වතුර ඉස්ස මුංඇට දමා තබති. මුංඇට පැළවූ විට මැසි උවදුර නැතිවේය යනු ඔවුන්ගේ අදහසයි.

**7. කැටියෙ ගෑසීම**— මෙයත් අනුරාධපුර පළාතේ පාරන කෙම් ක්‍රමයකි. ප්‍රමාණවත් ලෝහාබ කැටියක් ගෙන එය ගසමින් කුඹුරට සෙත් පැතීම කැටියේ ගෑසීම නම්. කැටියට ගසන්නේ කසිල කෝටුවෙනි.

**8. දෙදෙබොල් නැටීම**— මේ නැටුම නටන්නෝ කාපුරුවෝය. පූජා සංගත්‍යයන් නිමවා මධ්‍යම යාමයෙහි පමණ නැටුම් අරඹති. කාපුරුවෝ නැටීමෙහි අදක්ෂයෝය. "හාත ඔඩුරා නැටීම" පමණක් හාස්‍ය රසය ගෙන දෙයි. එළිවන යාමයෙහි කිරි ඉතිරීම ආදිය කොට තොයිලය අවසන් කෙරෙති. පැමිණි කාටත් අලුපුහුල් ඇඹුලක් සමග දානය ලැබේ.

**9. හාවනිල්ල**— කට්ටඩියෙක් මද්දහන වේලාවන ජීවන්කළ නිල් කොළ අතු නවයක්ද, ගොක් කොළ, වෙලූ ලුණු දඹු නවයක්ද, නවරි කොසෙල් කොළ එකක්ද ගෙන ගොයි එයින් එකක් ගේ හෝ කුඹුර මධ්‍යයෙහිද, ඉතිරිවා සුදුසු තැන්හිද සිටුවයි. ඇල්කෙත්වලට අලකොළ රෝගය වැළඳුනවිට මේ කෙම වැඩි වශයෙන් සිදු කෙරෙත්. ඇල් කෙතට වතුර වැඩිවීමෙන් ගොයම් මැරී යාම අලකොළ රෝගය නම්. හාවනිල්ලෙහිත් ගොයම් කණු ගැසීමෙහිත් සැලකිය යුතු සම්බන්ධයක් තිබේ. නිල් කොළ අතු නවය නිමිතිකොට නාමය ඇතිවූ සේ පෙනේ.

**10. පස්කිරි වත්කිරීම** — රුක්අත්තන, කදුරු, දෙල්, කොස්, පොල් යන පස් කිරද, ගොක් කොළ නවය බැගින් බැඳි උණනස් නවයක්ද, තැඹිලි ගෙඩියක්ද, වී කරලක්ද, යන මේ උපකරණ පස්කිරි වත්කිරීමේදී උවමනා කෙරෙයි.



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

පළමුවලං ඇල් කෙත මධ්‍යයෙහි උණ ගසක් සිටුවා ඒ වටා සිටින සේ සෙසු උණ ගස් අවට සිටුවනු ලැබේ. ඉක්බිති පිහියෙන් කපාගත් තැඹිලි ගෙඩියට තොසින් කඩාගත් ගොයම් කරලකුත් සමග ඉහතකී පස්කිරි වත්කොට තැඹිලි ගෙඩිය, මැද උණගසේ ගසති. මෙම පස් කිරි වත්කරන සැටිය,

**11.** සැම්බුරුවේ දේව දානය— මෙය වැනි විශේෂයක් ඉර පායා ගෙන එනවිට දෙන හෙයින් නාමය අන්වර්ථවේ. ආහාර වශී ඉහතකී දේදුනයේ මෙනි. පුරාණයේ පැවැති සමගහ සසදන, පසුවගන සසදනා යන දානයෝ සමග මෙහි ඇති සම්බන්ධයක් නොපෙනෙතත් මෙවාද එකළු ශිෂ්ටාචාරයේ අවයව විය හැකිය.

**12.** පොල් ගැසීම— අං ඇදීම වැනි සාද තැන කීමක් මෙන්ම ප්‍රථමයෙන් දෙවර්දීයද, දෙවනුව ගැමියන්ගේ සබාවද, තෙවනුව උපකරණ සම්පාදනයද, කොට සිවුවනුව පොල්පිටිය අරඹති. එහින් උඩුපිලය යටිපිලයයි දෙපිලෙකි. ඒ දෙපිලේ ප්‍රධානයෝ මව්වමඩියෝ නම්හ. ගසන සය යවන පොල් "කොරපොල්" නම් වෙයි. පොල් ගසා තමය පෙරහැර යනු සිරිති. ගැමියෝ එයට "දේලියගෑම"යයි කියති. පෙරහැරේදී කියන "අපි දිනුමෝ හෝය්යා, අපි දිනුමෝ හෝය්යා" යන ජය ඝොෂායෙන් මුළු පෙදෙස එකතින් කාද වන්නේය. මේ පෙරහැරේ ආපන මුක්ත කෝලම නොවරදී. ගැමියන්ගේ සියලු විනෝදය රඳා තිබෙන්නේ මේ කෝලමෙහි යයි සිතේ. ආපන උදුරාගෙන යනවිට මුක්තාට ඇතිවන ශොකය ගල් සිතක් පවා මෘදු කෙරෙයි. කොතරම් නියඟ සමයෙකදී වුවත් පේලි යනවිට වැස්ස වසිනු නම් නිරනු-මානය. මේ කාලයෙහි මෙබඳු දේ මිථ්‍යා ව්‍යාපාරයනැයි ගණීමට පාත්‍රවුවත් අතීත ගොවියා එයින් බලාපොරොත්තු වූ අර්ථය ඔහුට සැපයුනේය. අටවන දිනයෙහි පත්තිනි දෙවියන් නමට දානය දී පොල් ගැසීම හමාර කෙරෙති. නිදහස් ලංකාව මේ ජාතික දෙයට රුකුල් දිය යුතුය.

**13.** මඩදූනෝ— ගොයම හොඳට මැඩී ඵල දරන වනු පිණිස මේ දූනය දෙනු ලැබේ. ගොයමින් නියරවල් මැඩී සහ වගාවනුව මඩදූනය දීමට සුදුසු කාලයක් සේ සලකති. කොක්මලේ පළුවෝ මැස්සන් එලවනු සඳහා යන්ත්‍ර විශේෂයක් යොදන බවත් එය "දිය හොල්මන" නමින් හැඳින්වෙන බවත් ඇසීමු.

ගොයම මැඩී සනීපයට වැඩෙ.නා.ත් එහි කොළ කපා දමනුත් සිටිති. සමහරු ගැබිනි දෙනුන්ට පිදීගෙන එන ගොයම් කපා දීමාදීමයනුත් නොම්සාම් කෙරෙති. සාරලේ කිරි පිරුණු පසු ගොයම් ගසට එය ඔසවාගෙන සිටිනු නොහැකිය. එවිට ගොයම් ගස හිම වැයිඉරයි. නමුත් ගොයම් සාරල පුරුකයෙන් කැඩිහාත් එසේ සිටියි. එවිට එහි දඟිනය ඇලයට කැඩී ලොකු ගෙන්ඩුවක් සිහිපත් කරවයි. ලැගැ වමාරා කන ගරසකු වැනියයි කියනුත් සුදුසුය. මෙසේ ගොයම් ලැග ගත් පසු එයට වතුර නුවමනාය. කල් දත් ගොවියෝ ඔස්සූන කපා හරිති. ගොයම් සාරලට පොළෝ කාන්තාවගේ මූව සිඹින්නට වඩාත් ලෙහෙසිවන්නේ එවිටය. ගොයම් පැසී රතු වෙනගන යන මේ කාලයෙහි එයට පැමිණෙන උවදුරු බොහෝය. ගිරවු රංචු රංචු අවුත් නොන වසා ගෙන ගොයම් කපාගෙන යති. පැසුනු ගොයමක ගිරවුන් වැසූ විට, ගොයම් කපන්නටත් පෙරටුව කුඹුර පුරන් වූවක් සේ ඔබට පෙනෙනවා ඇත. නොන මේ උවදුරින් වලකාගනු සඳහා කැරලිමැල් අප්පුඕලැලි ගැටලනු වන පෝරු ආදිය එල්ලා ගෙන ඒවා නිරතුරු හොලවමින් "චෝයි බොලේ චෝහෝ" "කස්යාහෝ" යි කියමින් කෑගැසිය යුතුය. මේ රාජකාරිය වැඩි වශයෙන් ගොවියාගේ දරුවන්ට අයත් වේ. රෑට ඌරන් ආදී වන සතුන්ගෙන් රකිනු සඳහා පැල් ලැග්ග යුතුය. එබැවින් ගොවියා කොමෙන් පැලක් සාදයි. පැල යම් තැනකද ගිනිගොඩත් එතැනමය. එසැ.න් සිට ගොවියාගේ රෑ කාලය ගතවන්නේ පැලෙහිය. ලංකාවේ ගමනතා නමින් ප්‍රසිද්ධ ජනකතා අනුවෙන් වැඩියෙන් මේ පැල් ලැගීම ගැ

සම්බන්ධව පවතී. නිදිමරමින් සීපද කීම පැල් රකින්නාගේ කාරිය වන්නේය. ලංකාවේ ජනකවි අතුරෙන් වැඩිහරියක් ගිලිහුණේ මේ පැල් ලගින්නාගේ මුවගැබිනි. ගොවි හිතේ ඇතිවූ විවිධ අදහස් ඉබේටම කවියට නැගී නිතැතින් පිටවනු විනා තතන තනනා කවි ගෙතීමක් ගොවියා නොදන්නේය. එහෙයින් පැල් කවිවල අර්ථමාධුර්යයට වඩා ශබ්දමාධුර්යයම විශාල වශයෙන් ගැබ්ව පවතී. නමුත් ඇතැම් කවිවල ඉතා උසස් ප්‍රණීත අර්ථයෝත් ගැබ්වෙති.

විලක් බොරවේද බොල් පිනි බැවා ට  
ගලක් දිය වේද බලලෙකු ලෙවියා ට  
මලක් පර වේද බිගු රොන් ගත්තා ට  
බැරි දේ පුළුවන්ද තොල්මිටි කැවා ට

මේ කවිය කොතරම් ප්‍රණීත අර්ථයක් වැළඳගෙන සිටීදැයි සිතා බැලිය යුතුයි.

කිරිදිවැල කඩා සක උගලා ග ත්ත  
වේපතඹුරා දෙන තද කර බැඳ ග ත්ත  
මීය මරා කතුවට හිරකර ග ත්ත  
දලුව කඩා මුල බැඳගෙන පලය ත්ත

මෙද අප කුඩා කාලයේ ඇසූ පැල් කවියකි. කිරින්දේ සිට මුල්ගිරිගලට යන පාර මෙහි ගැබ්ව පවතී. කිරින්ද, හක්මන, වේපතඹුර, දෙනගම, මීඇල්ල, කනුමුල්දෙනිය, දලුවග්ගොඩ යන ගම් පසුකර මුල්ගිරිගලට යන්ට කී සැටි කොතරම් ප්‍රශංසාහීද? මෙතැන් සිට කියවන්නාගේ විනොදය සඳහා තවත් පැල්කවි කීපයක් දක්වමිහ.

1 උපන්නාට මේ ලොව වැනෙනවා විතා  
ලොව සිරිතට අඹු දරු රකිනවා විතා  
රූපේ අරන් නාපේ ගෙවනවා විතා  
ගෙනියන දෙයක් නැත ණය ගෙවනවා විතා

2 අම්මගෙ සෙනේ උල්පත ගලනවා ව ගේ
අප්පගෙ සෙනේ අකලට වසිනවා ව ගේ
ගොල්ලගෙ සෙනේ පිරෙන් ගෑ යහුනු ව ගේ
වැලැම් මිසක් නෑයන් මොනවොද කලිඟු ගේ

3 සා වෙ ක් මම දුටිමි සසුරේ පින තවා
ගෝනෙක් මම දුටිමි පතනෙත තණ කා තවා
ළඟ රෙ ක් මම දුටිමි වානේ අල කා තවා
සී තෙ ත් මම දුටිමි පිරිමින් කිලි වෙ තවා

4 සා වා නො වෙ යි සංසාරේ ගැලවෙ තවා
ගෝනා නොවෙයි හවුහම මුනි බුදු වෙ තවා
ළඟ රා නො වෙ යි වසවතු සුදයට එ තවා
කිල්ලක් නොවෙයි සිරිමා බෝ දලු ල තවා

5 ම ල් පිපුනා ත් ගති නැරෙයි නොසැඹරූ කේ
සි ල් ගත්තත් බළලුට බයලු මූසි කේ
සා ල් කිබුනත් බලු වල්ගය උණ පුරූ කේ
සොල් පයකුත් ඇද යන්නේ නැත ඒ කේ

6 ඔබ සා දුනට ගෙනියන මස් නැටිය ලො ලා
ගොඩ තබමින් ගඟ යන මසුට ලොබ වෙ ලා
උඩ යන උකුසු අරගෙන ගිය පසු නොබ ලා
වැඩ නැති මෝඩකම් සොරැවද නෝ හිම ලා

7 වනමේ රජුට අගමෙහෙසුන් බිසෝවෙ ලා
සැලේ උපන් වැදි රජෙකුට පිරිය වෙ ලා
නැතත් ආබරණ ගහකින් එගොඩ සා ලා
මටත් වැඩිය අනුවනකම් බිසොත් සා ලා

8 මං බාලේ ඇති සාළු තලගොයි පැ වියා
මළග තනියට මිදුලේ කොළමින් සි වියා
උගෙ මරූ ඇවිත් ළඟ අරගෙන ගිය සැ වියා
තිමන් පුරේ පලයන් තලගොයි පැ වියා

9 ලක් සත හිමවතේ මාවී පැසෙ න්නේ
දුක් දෙපා අලි සතුන් පන්නා හරි න්නේ
රැක් මෙත දෙවියනේ වෙල බත් බුදි න්නේ
දුක් පත්කාව නිසයි මම පැල් රකි න්නේ

10 වෙලක මහිම බල මාවී පැසී ලා
පැලක මහිම බල බට කොළ සොයා ලා
මලක මහිම බල අතු අග පිපී ලා
ලියක මහිම බල ගෝමර ඉසී ලා

11 වෙල හොඳ මොකොද යල මහ පාලුවේ නම්
පැල හොඳ මොකොද පොද වැස්සට තෙමේ නම්
මල හොඳ මොකොද අතු අග පරව යා නම්
ලිය හොඳ මොකොද ඉසී ගෝමර මැකේ නම්

12 විදලා මරන වැදි රජෙකුත් නොවේ නම්
ඇනලා මරන කුළුමීමෙක් නොවේ නම්
විසලා දමන සිහරදෙකුත් නොවේ නම්
දුවලා වෙහෙස නොගතින් ලඳෙ බයේ නම්

13 රැන පිට රැන තුඩ රැන දී යන්
ඇදලා ඇටෙව් දුන්නෙත් අගට ඊ යන්
බලලුන් දුටුවාම බය නැද්ද මී යන්
දුටුවම බය නැද්ද රාසිංහ දෙවි යන්

14 බඹේ සාට විතර ඇත කුඹුරේ පරවෙ නී
පඹේ සේම කොතකට බැන්ද වැනි වැ නී
ඔබේ ගෙදර ඇත්නම් මෙමට පුළුව නී
ඉබේ නොදිරි ගැවෙන ලෙඩසි බඩනි නී

15 කිඳුරා ලගින්නේ ඕබඩ නැද ල්ලේ
කිඳුරී ලගින්නේ උඟගේ තුරු ල්ලේ
වැදිලා විද්දද විදමන රත් කිකි ල්ලේ
කිඳුරා ගොසින් වැටුනායි පුර ඔඩු ල්ලේ

ක්‍රමයේ හැටි කියමින් පැල් උඟීත්ම ගොයම් කපන දිනයන් ක්‍රමයෙන් ළංවන්නේය. ගොවියා ගමේ නැකැත්කාරයා ගොස් වැඩ ඇල්ලිය යුතු වේලාව, බැලිය යුතු දිශාව, ඉස්සරහට තැබිය යුතු අඩිය, යන මේවා පිළිබඳ විස්තර පුස්කොළ කෑබෙල්ලක සටහන් කරගෙන එයි. බුලත් දී අසල් වැසියන්ටත් දින සහ වේලාව දන්වයි. නියමිත වේලාවට ඔහුගේ කුඹුරෙහි ප්‍රමාණවත් ගොවි පිරිසකි. ඔවුන් සියල්ල අතේ ලියන්නාවය. ගොයම් ලියන කෙයින් දකැත්තට ලියන්නාව යනු නාමයකි. පන්සිල් ගෙන දෙයියන් බුදුන් මතක් කරගෙන ගොයම්ට වැද ලියන්නාම සුරකිනුත් බුලත්විට කටිනුත් ඇරඹෙන ප්‍රධාන ගොවියා පළමුවෙන ගොයම් කැපීම අරඹයි. සෙස්සෝ ඔහු අනුගමනී. සිංහල අතට හුරු සිංහල ලියන්නාව පන්නා හැර ඉංග්‍රීසි ලියන්නාම එතැනට පැමිණී සේ පෙනේ. එයින් පාරම්පරික සිංහල කර්මාන්තයකටත් විශාල සිංහල පිරිසකටත් වැදුනේ බලවත් පහරෙකි.

සිංහල දැකැත්ත කාලානුකූලව සකස් කොට සිංහල ගොවියා අතට දෙන්නට මේ සුදුසු කාලය බැව් සැලැකිය යුතුයි. එතරමට කපා ඔසොවා ගන්නා ගොයම් මිට "උස්සිඩ" නමින්ද එබඳු උස්සිඩු නිපයක් "මාස්සිඩ" නමින්ද මාස්සිඩු නිපයක් "කැමයාන්ද" නමින්ද හඳුන්වනු ලැබේ. ගොයම් කොළයකට සාමාන්‍යයෙන් කැට කදු තිහක් පමණ අල්ලයි. ජල බහුල ඉඩම් (අනූප) වල ගොයම් කැට කදු කරන්නේ නියරවල් මතය. වතුර පෙරෙනු පිණිස නිප දමයක් වුවද එහි තිබෙන්නටත් පුළුවන.

## අස්වැන්න නෙලීමේ නැටුම

අව් පිනි නොබලා දුක් විඳ කලක් තිස්සේ පැල්ලැගෙ රැක ගත් ගොයම කපන දිනය ගොවීන්ට ප්‍රීතිදායක බව අමුතුවෙන් කිය යුතු නොවේ. එහින් ඇතිවන ප්‍රීතිය

උමතුවන් පවා නැටවීමේ සමත්ය. මාතර පළාතේ නම් එබඳු නැටුමක් නොමැති බව කිය යුතුය. නුවර පළාතේ ගොයම් කපනවිට එක්තරා වාද්‍ය භාණ්ඩයක් තාලානුකූලව වාදනය කරන බවත් ගොවියන් ඒ තාලයට අනුව අංග චලනය කෙරෙමින් ගොයම් කපන බවත් ඇසීමි. "බුම්මැන්ඩිය" යනු ඒ වාද්‍ය භාණ්ඩයේ නාමය වේ. එය පැරණි මැටි සෝප්පයක හැඩහුරුකම ඇත්තකි. මුහුණතේ හමක් බැඳ තිබේ. සමහර ප්‍රදේශයන්හි කමතට ගෙන යනු සඳහා ගොයම් මිටි බඳිනුත් සිටිති. "කොළ බැඳීම" යනු එයට නමි. මෙසේ කපා එකතු කොට බැඳගත් ඉතිබිති ඒවාට ගොයම් මිටියයි කියත්.

---


## 5. පස්වන වගා

# කමත් සිරිත්

ඉහතකී පරිදි කපාගත් ගොයම් මිටි ඒ සඳහා සකස් කරනලද කමතක් කරා ගෙන ගොස් පැන්පත් කෙරෙති. කමතක් සකස් කිරීමත් පළපුරුදු කාරයන් විසින් ශාස්ත්‍රානු-කූලව කළ යුතු කාර්යයකි. නියම පරිදි කානු දැමීම, උස් පහත් නොව සමව තිබීම, යනාදිය කමතක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ වේ. කමතේ කපන කානුවට "ගොම්මල-කඩ" යයි සමහරු කියති. මෙසේ සකස්කළ කමත මෙත ගෙනා ගොයම් පැන්පත් කිරීමේ ක්‍රමයෝත් කීපයක් මෙහි. කමතේ දිගට ගොයම් දැමුවහොත් එයට රැනකන්ද යයිද කරල් ඇතුළට සිටින සේ රවුමට තැබුවොත් එයට වටමල්ල යයිද, ගොවියෝ කියත්. බොහෝවිට වටමල්ල සාදන්නේ මිනිසකුට ඇතුළට යා හැකි සේ ඉස්පාසුවක් තබාය. එවිට එය තරමක් කට ඇරී ගිය වළල්ලක් සේ දිස් වන්නේය. හේවාගම්කෝරළේ වැසියන් කැටකන්ද නමින් හඳුන්වන්නේ මේ වටමලුවය. මාතර පළාතේ මා දන්නා තරමින්

මෙවැන්නක් නැත. එහි තිබෙන්නේ ගොයම් කොළකෑම් හෙයිනි. මාතර පළාතේ ගොයම් කොළකැටියක් හතරැස් කොටුව නැති චෛත්‍යයක ස්වරූපය ගනී. තෝම්පිළිවුවකට සමාන යයි කීවද නිවරදය. වටමලු ගැසීමෙන් හෝ කොළ කැපි ගැසීමෙන් ඇතුළත උළණියක් සටගෙන එයින් ගොයම් තැම්බෙයි. කරලින් ඇට ගැලවීමේ පහසුව එයින් ලැබේ. එයට ගතවන කාලයද ගොවියා දනියි. ඉක්බිතිව ගොයම් මඩවන කාලය අමුස් සමා ආබව ගොවියාට දන්වයි. ගොවියා පෙර මෙන්ම නෑනැන්තාන් අසල් වැසියනුත් ළඟට ගොය් කටයුතු සූදානම් කරගනියි. ගොයම් මැඩවීමද "හරකුන් ලවා මැඩවීමය, මිනිසුන් ලවා මැඩවීම"යයි දෙපරිදිය. ප්‍රථම විධිය පිළිබඳ විස්තරය මෙසේය. පළමුකොටම සුබ මොහොතින් කමත ගොම පිරිබඩගෙන ඊමත කපක් සිටුවති. එය වටා අලුයෙන් තුන් ඉරක් අඳිති. ඒ අතරෙහි විසිතුරු මාලා-කර්මයෝය. මෙසේ අලුවලින් සිතියම් ඇඳීමට අලුකන් වැඩීමයයි සීනාකෝරළු වාසීහු කියත්. මේ අලුකන් වැඩීම වූකලී නොයෙක් පළාත්වල නොයෙක් අයුරින් සිදුකෙරෙති. අලුකන් වැඩීමේ ක්‍රමය දක්වනු සඳහා මෙහි අනිත් පිටේ චිත්‍රයක් බහාලමු. මේ වනාහි ජිරිගම වී. ජී. මඳුරසිංහ මහතාගේ ලිපියකින් ගන්නා ලද්දකි. සීනාකෝරළේ මා දුටු චිත්‍රවල මේ උපකරණ නොපෙනේ. හලුකන් වැඩූ ඉක්බිති කප සමීපයෙහි කදුරු කොළ යනක්ද ඊමත දෑකැත්තක් හෝ යකඩ කැබිල්ලක්ද තබති. කපෙහි හොඳින් කැරැකෙන වළල්ලකුත් තිබිය යුතුය. මෙසේ පූජාකෘත්‍යයන් නිමවූ පසු වටමල්ල හෝ ගොයම් කොළය කැපීමේ මොහොත එළඹෙයි. ප්‍රධාන ගොවියා වටමලුයෙන් හෝ ගොයම් කොළයෙන් ගොයම් මිඩක්ගෙන හිස තබාගෙන කප වටා පොවිටක් කැරැකී ගොයම් මිඩ කප මුල තබයි. ඉක්බිති සුදුසු පරිදි කමතේ ගොයම් එළා එකට ගළකන ලද ගවයන් ස්ඵදෙතොනුන් කපේ දැමූ වළල්ලෙහි බඳිති. මේ හරක් ගැළනුම "හරක්කැරැල්ල ගොන්කැරැල්ල මර්ගය" යනාදී නම්වලිනුත් හඳුන්වනු ලැබේ.

හරක්කැරල්ලට ගොන් තිදෙනෙක් සිටිත් නම් "ගොන් ඇගේ" යයිද දෙදෙනෙක් සිටියි නම් බානායයිද සිව්දෙනෙක් සිටිත් නම් ගැලතුම යයිද පලාත් අනුව කියත්. ගොන් කැරල්ලේ මුලා මුදුනා නමුත් සෙස්සෝ අම්බරුවෝ නමුත් වන්නාහ. කප වෙටි ගොයම් ගස් එතුනොත් "වෙණිය එකිම" යනු එයට නම්. වෙණිය එතුනොත් වලල්ල හොඳකාර



ක්‍රියා නොකෙරෙයි. හරක් ගොම ගැසුවොත් "ගෝමී සංස්කරනාවං" යනු එයට යෙදෙන නාමක් බසේ ව්‍යවහාරය වන්නේය. හරක් කැරල්ලේ අන්තිමයා "කොලකොකා" නමිනුත් හැඳින් වෙයි. කෙලනෙනි වූයේ කොලකොයාය. අන්තිමයෙහිවූ ගවයා යනු අරුති. කොලන ශබ්දයා විබන් ගත් නැති. කොල පෑගීම ඇරැඹිමේදී කැගලු පලාතේ දෙවියන්ට මාජපිඩක් වෙන්කිරීමක් උ: මැදපලාතේ ගොයම් මිටක් පිටත බැඳ දෙවියන් නමින් පසෙකින් සිටුවා තැබීමක් යනාදී තවත් නොයෙක් සිරිත් ඇත්තේය.

කොළගොත් ගැසීම — ගරකුන් ලවා ගොයම් මැඩවීම උඩරට සමහර පළාත්වල මේ නමින් හඳුන්වති. කොළගොත් ගැසීමේදී කියන නොයෙක් කවිද ඇත්තේය. දුම්බර පළාතේ කියන කවි දෙකක් ගුරුකුළු සඟරාවෙන් ගෙන මෙහි බහාලමි. එනම්:—

එගොඩ ගොඩේ දුම්බාලා දුම් බින්දූ
මෙගොඩ ගොඩේ පිනිබාලා පිනි බින්දූ
පල්ලෙ කැලේ මොරකාලා පැණි බින්දූ
දුම්බර රටේ තිබෙනව මේ කවි සින්දූ

එගොඩත් බැලිමි එගොඩත් මවුලන්ගෙ කැලේ
මෙගොඩත් බැලිමි මෙගොඩත් මවුලන්ගෙ කැලේ
දෙගොඩම බැලිමි දෙගොඩම මවුලන්ගෙ කැලේ
මවුලයි නොපට මොර ඉදිලා පල්ලෙ කැලේ

කොළ සැලීම – "මැඩුවන් බෑම" යනුත් මෙයටම නමි. පළමුවලා කමතේ එලූ ගොයම් මැනවින් පැගී ගිය පසු බැතෙන් (වීයෙන්) මැඩුවම (පිදුරු) වෙන් කිරීම කොළ සැලීම නමි. ඒ සඳහා දැතිගොය්‍යා නම් වෙකාමම උපකරණයක් උපයොග කරගනු ලැබේ. ඒ වනාහි අගින් නැමී ගිය ලී කැබෙල්ලකි. "ගොවි ලීය" යනුත් එයමැයි. තරමක් නැමී ගිය එහි අගහරිය "ගොවි කරල" නමි. ගොවි ලීයේ කරල ගොවිකරල වුනා විය හැකිය. අතිශයින් අචානුකූල නමෙකි. හත්කරු දුටු ගොවි ලීවල අග හරියටම වී කරළක සිරිය ගෙන තිබුනු බව මතකය. සිතාහෝරලේ කොබ්බෑ කොහොඹ, නිත, දෙමට, කටුපිල යන මේවායින් දැතිගොය්‍යන් පස් දෙනෙකුන් සාදති. පුරුදු කාරයන්ට දැතිගොය්‍යෙන් ගෙන් මැඩුවන් හලා බාන්නු කොළ ක්‍රීඩාවෙකි. මේ අතර සමහ ආණ්ඩු කරනුත් සිරිති. ප්‍රදේශ අනුව එහි වෙනස්කම් දැක්ක හැකිය. සිතාහෝරලේ නම් විචිත්‍රාකාරයෙන් මේ කාරිය කරනු ලැබේ. පළමුවෙන්ම ප්‍රධාන ගොයිරාළ පිදුරු ටිකක් අඹුලූමාගෙන් දැතිගොය්‍යා ආර බාබාගෙන:—

දැති දැති කුමන දැති
කොබ්බෑ කොහොම් දැති
කටුපිලඳ නිසා දෙමට දැති
පස්දෙනෙක් කොළු සලා එලති
එරජ කමතට ඉතා යහපති,

යි කියමින් කමත වටා යන්නේය. සෙසු ගොවීහු "අරග්-ගන්සොලි" යි කියමින් ඔහු පසුපස්සේ යෙති. තවත් පළාත්වල දැතිගොය්යන් පස්දෙනා කාර් කබාගත් ගොවියෝ පස්දෙනෙක් කමත වටේ ඇවිදිත්. එයින් ප්‍රධානයා මෙසේ කියයි.

"එක්සිසැමෝද, දෙසිසැමෝද, තුන්සිසැමෝද, සතර සි මඩ කලල් කොළෝද, එක්පෙති දෙපෙති තුන්පෙති සතරපෙති පස්පෙති සපෙති සත්පෙත්තෝදී එරන් කරලක් සටගෙන එරන් කරලේ වැඩකිරීමට කොබ්බෑ කොහොම් නිසා දෙමට කටුපිල ගොය්යෝ පස්දෙනෙක් පස්රුකුලෙන් කොල සලා එලති. දෙය්යෝ බට බිමිති. ගොය්යෝ වැඩකරති. ඉතා මේ කමතට යහසති" යි කියමින්ද "සොලී" යි කියමින්ද නාමා පස්සේ යන සිව්දෙනාත් සමඟ කමත වටා නෙවටක් කැරකුණු ඉක්බිති, ප්‍රධාන ගොවිරාළ දැතිගොය්යාගේ දෙපය තිබුන සිදුරැපිහා නිරි ඇති ගසක් මත තබා ඊට පසු මැඩුමත් ඉවත් කරන්නට පටන්ගනී. සමහර ප්‍රදේශයන්හි කාමක් සිදීත නමින් හැඳින්වෙන නන්වැදෑරුම් වාසගම් කියති. එයින් එක් පිරිතක් නම්:—

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

එක්වෙනි ගුරුන් වැඳ
දෙවෙනි දෙවියන් වැඳ
සිරිපා කඹුරු වැඳ
කියමි කලවිට පිරිත් පද බැඳ

"මෑස්සාද පිලවතක්, ඉස්සාද තොරවතක්, දෙකොණ සිලනු දෙනක්, බැඳබාගෙන වීයගසක්, සමනල එකල් කොකින්, ඇලි මී ගොන්බානක් යොදා, එක්සිසැරවොද, දෙසිසැරවොද, තුන්සිසැරවොද, වැලිකැට මඩ පෝරු ගෑවොද, එරන්වන් කිසරක් කොටා, තුනක්සේ බිජු වඩා, එක්පෙතිවිය, දෙපෙතිවිය, තුන්පෙතිවිය, සතරපෙතිවිය, පස්පෙතිවිය, සපෙතිවිය, සත්පෙත්වෙත්දී බටව, නව-පෙත්වෙත්දී බණ්ඩිගතපිද, කිරිවැද, සමන් දෙවිහාමුදුරුවන් ගෙන් වැලිමකුරා ඉස්සාය, සැවසාල දෙළහමුණින් අල්ලන කොක්කනම්පය්යක් උර එල්ලාගෙන දක්කනම් රබුලක් බෙල්ල බඳගෙන, කොයි ගෙයි දෙයියෙ කොයි ගෙයි දෙයියෙ කියා ඇවිදින, ගොපල්ලානම් වහන්සේම මේ ආරම්භනා කරන්නේ,

උන්වහන්සේගේ අතාවුදනම් මොනවාදැයි ඇසුවො-තින් දැති දැති, රන්දැති, රිදීදැති, කබුපිල, නිය, දෙමට, කොයඹ, කොසොන් දැති, මෙනම් දැති පසක්ගෙන පස් දෙනෙක් වට සිටිති. පස් උකුණක් ගනිති. මැඩුන කොල නෙලා එති. නොමැඩුන කොල සලා එති. ගොඩියෝ වැඩකරති. දෙවියෝ බට සිටිති. මෙරජ මේ කමතට ඉසා යහපති. සලා පොලියාට අරගෙන පොලියේ" යනුයි.

මේය කමත ආණ්ඩු කිරීම නම්.

බෝල ගොයියා–කමත අතුගානු පිණිස පඟ හෝ බබල්-වනස්සා මලින් සාදන ඉලපත වැනි උපකරණයකි. බෝල අත්ත යනු ඇතැමුන්ගේ කථාය.

පෝරු ගොයියා — බැත එකතුකිරීම සඳහා පාවිච්චි කරන ලෑලි කෑබෙල්ලකි.

මාන ගොයියා — කටුපිල අතු මිටියක් ගෙන ලනුවකින් වෙලා අග කොටස මුසුත්තක්සේ තිබෙන්නට සාදන උපකරණයෙකි. කාටුව (කුඩා පිදුරු කෑබෙලි) ඉවත්කිරීම මෙහින් කෙරෙන කාරිය වේ.

**ගොය්යා**-ගොන් කැරල්ල උකනාවිට මුදලිනාගේ වලිගයට පිදුරුත් අලුත් ටිකක් තබා පිදුරු ටිකකින් ගසාගන්නා හැටියෙකි. එය පාවර ඇරෙනතුරුම වී ගොඩේ ගසාතබති. ගොය්යා නැත්නම් බතිරවයා වී සොරකම් කරතැයි ගොවී මහත්වරු කියත්. මාතර පළාතේ නම් ගොයිගැටය ගසන්නට ගොනාගේ වලිගයට පිදුරු නොතබත්. මේ කීමේ ගමයන් ගෙන් ගොයම් පැහවීම පිළිබඳ කිසිදු මාත්‍ර විශ්වාසයකි. පසින් ගොයම් පෑගීමේදීත් ශුභනැකති සිරිත් අතුරෙන් සමහර ඒවා ක්‍රියාවක් වන්නේය. කමියට එක ගොල්ලගේ පමණ බලා දෙඅංශයේ කත්තිරික්කා දෙකක් බැඳ ඊමත පුවක්ගසක් දමා කමතේ මාගල් එලා පාවර ස්ථානය සකස් කරනු පසින් පෑගීමේදී කරන ප්‍රථම කාරිය වේ. එහිදී දැකිගොය්යා වන්නේ දෑතය. මෙසේ ගොයම් පාගා ගත් ඉක්බිති බැත බිසිවල හෝ පැදුරුවල හෝ මලුවල හෝ දමා වසා තබති. ඉක්බිති එනුයේ වී හුළං ගසන වාරයයි. මාතර පළාතේ නම් අට්ටාලයක් උඩ සිට වී පහතට හලාබාති. හුළං බඳ ලඹු විට අට්ටාලයක් නුවමනාය. අනුරාධපුරයේ මේ කාරියට සවාභාවික සුළඟක් ඕනෑ නොකෙරේ. කුල්ලෙන්ම එය උපදවා ගන්නා හෙයිනි. කිප දෙනෙකුන් විගොඩක් හුළං ගසනවා දකිනු, අනුරාධපුරයේදී නම් බෙහෙවින් විනෝදය ගෙන දෙන දර්ශනයෙකි. අතක් කුල්ලක් කටක් තාලයට ක්‍රියාවෙහි යෙදෙන සැටි දුටුවන්ගේ සිත් ගැණීමෙහි ඉතා සමත්ය. පවන්බානවා, හුළංකරනවා, වාතය අල්ලනවා කාන්දෙපාහිනවා, කාසිඝර අල්ලනවා යනාදී ව්‍යවහාරයෝ ඒ සම්බන්ධයෙන් ඇතිවූහ.

වැදුම — පිරිසක් කුඹුරේ වැඩකරන කොයි අවස්ථාවේ වුවත් වැදුන් දෙනු සිරිත වුවත් ගොයම් කාගත දෑ ගෙදන වැදුම. අනෙක් වැදුන් ජයගෙන සිටි. හිරකැන්දගෙන එන මගුල් දිනය අනෙක් මගුල් දිනයන් පරාජය කරන්නාක් මෙනි. පැමිණෙන උදවියගේ කැටියට වැදුමක් උන් පහස් වෙයි. මේ "උදම්ය" ශබ්දය "උදුවම" ශබ්දයාගේම

උච්චාරණ විශේෂයක් විය හැකිය. උදවුමට පැමිණි පිරිස යනු අවයයි. වැදුම් ශබ්දයේ ඝෝරැම තවමත් සැඟවී පවත්නා සේ පෙනේ. එය බෙහෙවින් ගෙයින් පිටදී කතුලබන්නක් යෙසින් බඳින ශබ්දයෙකින් එකින් සම්බන්ධ-යක් ඇතිවන්නට පුළුවන. එහි සාමාන්‍ය අවස්ථා තුනෙකි. පළමුවැන්නා උදේ කෑමය. එයට මාතර පළාතේ 'අළුමුසාව'යි කියති.

අලවගී, ඇගිටි, කිරිබත්, රොටි, යනාදිය ඒ සඳහා වැනි වගයෙන් සැපයෙයි. අලුත්කුරුවේ මා ඇසුරු කළ පෙදෙස්වල තම්බ කිරි රොටියක් උදේ කෑම අතර ප්‍රමුඛ ස්ථානයක් ගනියි. මාතර පළාතේ පැනියාරුම වැනි රොටි තම්බා පැණි සහ පොල්කිරි මිශ්‍රණයෙහි බහාගත් විට කිරි රොටිය වන්නේය. එය අනුභව කරන විට අතකම දෙකින්ම ඉස්ම බේරෙන හෙයින් දකින්නාන්ට පිළිකුල් උපදී. ඉඹුල් කිරිබතක් ප්‍රසිද්ධ උදේ කෑමෙකි. ‘‘ලසැඳුමකාඩිමු’’ යනු අනුරාධපුර පළාතේ කථාය. හාල්මැස්සන් හෝ පොල් පැණි හෝ මැදට දමා ඉඹුල්ගෙඩියක හැඩහුරුවට එය සාදනු ලැබේ. මාතර පළාතේ නම් ආප්පය තවමත් වෙල කාරා නොගිය සේය. පැරණි ගොවියා වනාහි උදේට කැවිලි හා යාගුව බීවේය. මේ යාගුව වනාහි දැන් මෙන් හාල් ටිකක් තම්බාගත් වතුර නොව, කිරි ගිතෙල් හා කුළුබඩු මිශ්‍ර-සමහරවිට මස් මාංශත් දැමූ-ශක්ති-ජනක පානයෙකි. බුදුන් දශ අනුසසක් වදාළේත් එහෙයිනි. අලුමුසාවෙන් පසුව එනුයේ පෙරවරු අනාවබජ්ජා යයි. අතුරුපස යනු වත්මන් නාම යි. මේ අතුරුපස දැන් නම් නැත්තා සේය. 10-11 අතර වේලාවක මේ සංග්‍රහය ලැබේ. සමහර විට එය සුලු පානයක් හෝ විය හැකිය. දැන් එනුයේ නියම වැදුම් අවස්ථාවය. “මුගබත” යනුයේ දවල් බතටම නම්. මේ වනාහි හොද්ද මැල්ලුම ආනම නියබලාව බැදුම යන මෙකෙක් දෙයින් සංග්‍රහ බතකිනුත්, කිරි පැණි කැවිලි තෙසෙල් ගෙඩි වලිනුත් සැදී ගනියි. හොඳි යනුව සාමාන්‍ය

ව්‍යඤ්ජනවාචක "සූද" ශබ්දයෙන් ආ සේ පෙනෙනහත් දැන් ව්‍යඤ්ජන විශේෂයකට රූඪව තිබේ. උඩරට 'මොලග-ඝන්නිය' මුහුදුබඩ 'මාලු හොද්ද' මාතර 'සොල්කිරි හොද්ද' සහ 'කායම් හොද්ද' පානදුරේ 'අඹ හොද්ද' යන මේවා හොදි අතර හොඳ නමක් ඇති කරගෙන ප්‍රසිද්ධියට ගිය ඒවාය. රුහුණේ 'කිරිබොඹු හොද්ද' 'කැම්බුම් හොද්ද' 'මිරිස් හොද්ද' යනාදී තවත් හොදි වර්ග කීපයක් ඇති බවද සැලකිය යුතුය. මැල්ලුම වනාහි වැඩි වශයෙන් කොස් දෙල් අටුකොස් ආදියෙන් සකස් වෙයි. ආනමක් නියඹලාවක් දෙකේ වෙනස සියුම්. නියඹලාව වූකලී වෙන්කළ හැකි ඉස්මක් නැති එකට බැඳුණු දියාරු ව්‍යඤ්ජනයකි. ආනමේ ඉස්ම උකුවුවත් වෙන්කළ හැකිය. කිත්නාකිබ්බොටු හොද්දත් ආනම් විශේෂයෙකි. ඇඹුල යනුත් ආනමටම කියන විශේෂ නාමයෙකැයි හැඟේ.

කොස් ඇට මිශ්‍ර අලුපුහුල් හොද්ද මාදන්නා ඇඹුලෙකි. උඩේ මෙන් දවාලට පැසි වර්ග ඇති බවක් වැඩි වශයෙන් නොපෙනේ. වැදම කෑ යුත්තේ කෙසෙල් කොළ ගොටුවේය යනු සිද්ධාන්තයක් තරමටම තහවුරුවී තිබේ. හොඳ කෙසෙල් කොළ ගොටුවකට හාල් මනාවක බතුත් එයට උවමනා ව්‍යඤ්ජනත් ලෙහෙසියෙන් බෙදිය හැකිය. මෙබඳු වැදමක් උයන පිටිසර මධ්‍යම ප්‍රමාණයේ ගෙයක ඇති සිරියාව වචනයෙන් විස්තර කළ නොහැකි තරම්ය. ස්ත්‍රීහු පෙළක් ව්‍යඤ්ජන කපති. පෙළක් හාල් හෝදති. පෙළක් වතුර ගෙනෙති. පෙළක් කහ මිරිස් අඹරති. පෙළක් ව්‍යඤ්ජන ඒදති. මේ සියල්ල කිසි වාද භේදයක් නොමැතිව නායිකා-වකගේ මඟ පෙන්වීම ඇතිව හෝ නැතිව තිවිසැනසිල්ලේ ඉතා ශාන්තව සිදුවන්නේය. ගොවි පුත්‍රයෝ පෙළක් බුලත් පුවක් සකස් කෙරෙති. පෙළක් කෙසෙල් කොළ ගොටු සාදති. කුඩා ළමයි පෙළක් මිදුලේ සෙල්ලම් කෙරෙති. මේ සියල්ල එක්වී පිටිසර වැදම් ගෙදර ප්‍රීතියෙන් පුරවයි. දැන් වැදම ඉවීමේ කටයුතු නමාරම්භගෙනයයි. ගොවි

හායනීංව වතුර නාං පිරිසිදුව වස්ත්‍ර ඇඳ ඔළුව පීරා දත මැද කෝතට වැදම ගෙනයනු සඳහා ලඟි ලඟියේ සැරසෙන්නීය. සමහරවිට මේ සැරසිල්ලට පැය ගණනක් ගතවන්නටත් පුළුවන. පන්සලට දානය ගෙනයනු සඳහා සැරසෙන සැදැහැවතියකගේ සැරැසිල්ල මෙනි. පවුලේ වැඩිමහලු දියණියක් මේ ගමනට එක්වනු සාමාන්‍ය සිරිති. නියමිත වේලාවට ගොවි හායනීංව ගිසින් බත් පෙට්ටියත් දකුණතින් හොදී හැලියත් ගනී. සෙය්සෝත් පුදුසු පරිදි යම් යම් දේ හැරගනිති. දැන් තරමක පෙරහැරකි. එහි නායකයා ගොවි හායනීංවක් අවසානයා බුලත් පුවක් පෙට්ටිය රැගත් ගොවි පුත්‍රයාත්ය. පෙරහැරේ දශීනය අතිශයින් වාම්ය. අතිශයින් අහිංසකය. පෙරහැර යන්නේ පාරේ තිබෙන කොළ අතු ආදිය පවා ඉවත් කෙරෙමිනි. යන එන්නන්ට කරදර නොවනු සඳහාය. ඔවුන්ගේ මෛත්‍රිය එතරම්ය.

නිතැම උසස් කානතාවක් මේ පෙරහැරේ යැම උසස් කොට සලකති. කසීභාරවාජ බමුණාගේ බැමිණිය ගෙන ගිය වැදත් පෙරහැර පිළිබඳ තොරතුරු පාලි සාහිත්‍යයෙන් සවර්ණපාලිගේ පෙරහැරෙහි තොරතුරු අපේ ඉතිහාසයෙන් සරයති. මහඔසු පණ්ඩිතුමාට අමරාවක් පණ්ඩුකාභයට සවර්ණපාලියක් හමුවූයේ මෙබඳ අවස්ථාවන්හිදීය. අණ්ඩුවේ කම්හලේත් ධනවතාගේ මත්තෙහිත් වැඩකරන කුලීකාරයන් මෙන් නොව ඇත්තටම වැඩ කොට වෙහෙසී සිටින ගොවි පිරිසට මේ පෙරහැර දැකීම පමණ ප්‍රීතියක් නැත්තේය. එබැවින් නො දැනුවත්වම වගේ ඔවුන්ගේ මුවින් කුඩුගී නැගෙන්නට පටන්ගනී. එයින් දෙකක් මෙසේය.

අපට ඇඹුල ගෙනාත් වගෙයි
අවුව බොහොම සැරත් වගෙයි
බඩගිනි දැන් වැඩිත් වගෙයි
ගොඹට යන්ට හොඳත් වගෙයි

මංගල් ගමු මේතැක එළ මූ
පෙළට ඉඳිමු පත් කොළ ග මූ
බත් බෙදවමු හොඳි බෙදව මූ
කන්ට බලමු පවන් ගති මූ

වැදන් පෙරහැර ජයා සම්පන්න ගසක්මුල හෝ වෙන සුදුසු තැනෙක නවතී. බතට පෙරාතුව අතකට සෝදකු සිංහලයාගේ චිරාගත ආර්‍යචාරිත්‍රය හෙයින් අතකට සෝදාගත් ගොවියෝ දන්ගේ කාරා යන විනීත භික්ෂූන් පෙළක් මෙන් ගොස් සුදුසු තැන්වල හිඳගනිති. හිටගෙන කෑම මෙන්ම ඔලුවේ ජටාවකිබියදී කෑමත් ගොවි චාරිත්‍රයට විරුඬය. ප්‍රධාන ගොවියා වටා පිටා සිටින කනිතකිම වැඩ කරන ගොවියනුදු සාදරයෙන් කැඳවාගෙන විනීතව කථාකොට ඔවුනුත් පෙළට හිඳුවා තෙමේ බත් පෙට්ටිය කිසිල්ලට රැගෙන හොඳ බත් අහුරු එක හෝ දෙක බැගින් බෙදාගෙන යයි. කොතරම් කෙනෙකුන් වුවත් පළමුවාරය ගොවියා විසින්ම බෙදනු ගොවි චාරිත්‍රය හෙයිනි. ප්‍රථම බත් බෙදීම් වාරයෙන් පසුව හේත් ගොටුවක් රැගෙන පසෙකින් හිඳගනී. එතැන් සිට වැදන් බෙදීමේ සියලු කාර්‍යභාරය පැවැරෙන්නේ ගොවි භාර්‍යාවත් ගොවි දූවත් වෙතය. ඒ පිරිසේ කොතරම් නොහික්මුණු අය සිටියත් පුදුමයකට මෙන් ස්ත්‍රීන් හමුයෙහි තවුසන්මෙන් හික්මෙනු ඔවුන්ගේ සිරිති. ශිෂ්ට කාන්තාවක් ඉදිරියේ නොකියැහැකි වචනයකුත් ඔවුන්ගේ කටින් පිටවනු නො ඇසේ. අත හෝ තොල ලෙවීම, හොටුගිරීම හෝ ශබ්දනගිනසේ ආහාර විකීම, වට පිට හෝ ඔවුනොවුන්ගේ ගොටු දෙස බැලීම, කථාකිරීම, ශබ්දනගා යම් යම්දේ ඉල්ලීම, ව්‍යංජන බතින් මැසීම, අහුරු අහුරු කටේ දමා ඉක්මනින් ගිලදැමීම, යනාදී ආර්‍යචාරිත්‍රයට නොගැළපෙන සියල්ල ආශිලාචාරකම් හැටියට සලකනු ලැබේ. එබැවින් ගොවිපොලකාදී ගොවීන් වෙත සිටගෙන හිතැම තවයොවුන් විනීත කාන්තාවකට පවා කෑම බෙදීම් ආදිය සිතැඟි සේ පැවැත්විය හැකිය.

ඔවුන් මෙබඳු තැන්හිදී මැදන් බෙදන්නෝ භික්ෂුවකට පිණ්ඩපාතය බෙදන කලක්මෙන් ප්‍රීතියෙන් හා භක්තියෙනි. ජාතික සංස්කෘතිය ගැන සොයා බලන්නන්ට මෙබඳු අවස්ථාවකින් ගත හැකි ප්‍රයෝජනය ඉතා විශාලය. බුද්ධාගමට අනුව හැඩගැසුණු සිංහල ගොවි සමාජයෙහි මෙබඳු ආකර්ෂණීය අවස්ථාවෝ බොහෝය. සිය කුඹුරේ වැඩ කරන පිරිස පමණක් බලාගෙන වෙලට මැදන් ගෙනයනු ගොවි භාර්යාව සලකන්නේ ලොකු මදිකමක් හැටියටය. එබැවින් අසල්වැසි ගොවියන්ගේ පැමිණීමෙන් එහි වැඩ කළවුන්ට පාඩුවක් නොවේ. පුළුටු නොගැසුණු-පැහිරි නොමිරිකුණු මුවින් යුතුව බත් බෙදෙන්නේ ගොවි පොළේදී බැවින් හිඟන්නෝද එතනට ඇදී එති. ඔවුහුද අවකැපෙන වචනයකින්වත් සංග්‍රහ නොලබා බත බුලතින් සැනසී ප්‍රීතියෙන් යන්නාහ. ගොවිපළ අයිතිකරුගේ ගොටුවෙහි ආහාර කොටසක් ඉතිරිවනුයේ සාමාන්‍ය සිරිති. ගොවි භාර්යාව උදෙසාය. ඇය එය ගෙදර ගෙන ගොස් දරුවනුත් සමග බුක්තිවිඳියි. ගෙදරින් ගිය අය කමතේදී අනුභව කරනුත් ගොවි ශිෂ්ටාචාරය නොවේ. දැන් වැදුම් වැඩවිද ඉවරය. එවිට

ඉවර කරමු
කතර කරමු
වතුර ගෙනෙමු
අත් සෝදමු

යනු ගොවි මුවින් නික්මෙනුයේ ඇසෙන්නේය. බත් කා ඉවරවුණු හැටියේම වාගේ බුලත් හපනුයේ ගොවිගතිය වෙයි. දත් නැත්තෝ බුලත් කොටීම අරඹති. එවිට ගොවියන්ගේ පරිවෙෂණය (බත් කෑතැන) බණ වරක් කියා ඉවරවූ පසු පිටියර දසම් හෙලන ශෝභාව උසුලති. උඩවේ වැදි පෙරහැරේ පිට්නාදය මෙන් බුලත් කොටීම් නාදයක් සමග සම්භාෂණ නාදයක් නිකුත් වෙයි. ක්‍රමයෙන් බත් මතක් සිඳියෙයි. බුලත් කෙළින් ඒ මේ තැනුත් රතුවෙයි,

වර්තමාන නාගරිකයා මෙන් බත්කා බුදියගැනීම ගොවි ජීවිතයෙහි අංගයක් නොවන හෙයින් යළිත් වැඩෙහි යෙදිය යුතු කාලය ඉක්මනින් ළඟාවත්ම ගොවියෝ නැගී සිටිති. ඔවුන් නැගිටින්නේ,

බුලත් ගනිමු – විටක් හපමු
දූන් නැගිටිමු – යන්ට බලමු

යන ගීයත් නැගිටුවා ගෙනය. දවල් ඇඹුලෙන් පසුව එන්නේ පස්වරු අතුරුබජ්ජක වේලාවය. එය සාමාන්‍යයෙන් තුනටත් හතරටත් අතර වේලාවක ලැබෙයි. පානයක් ප්‍රධාන කොට ඇති මේ අතුරුපසය, හාල් රොටී, අග්ගල විශෙෂ, කැවුම්, තලගුලි, තැම්බූ පුන්සහල් හෝ ඇගිටි යන මෙකී දෙයින් එකකින් සකස් වෙයි. අනාතයෙහි කිතුල් හකුරු කැබෙල්ලක් සමග බැදිහාල් වතුර කෝප්පයෙකි. බැදිහාල් දිය බඩේදෙස් දුරුකරන විශෙෂ ඔසුවක් බැව් පුරුද්දෙන් දනිමි. එසේ ම එය තේවතුරට වඩා දහස් ගුණයකින් පෝෂ්‍යදායක රසවත් සුලභ පානයෙකි. මේ පස්වරු අතුරු බජ්ජකයට කෝපිකාලයෙහි "කෝපිය" යි කිහ. දූන් තේවතුර නාමයෙන් හැඳින්වෙයි. ඉංග්‍රීසි ආණ්ඩුව කවදාවත් මේ රටේ පැවැතුනොත් හැම ගෙදරකම අතුරුපස "සුරාව" වන්නට පුළුවන. රට විපතේ හෙළා මුදල් සැපයීම ඉංග්‍රීසි ආණ්ඩුවේ සිරිත හෙයිනි. මෙසේ ගොයම් පැගු ඉක්බිති පැල් ලැගිය යුතු දෙවන වාරයක් එළඹෙයි. ධාන්‍ය ආරක්ෂා කරනු සඳහාය. පැලක් මුල් පැලට වඩා වෙනස්ය. පිදුරු සුලභ හෙයිනි. ගිනිමැලය මෙලවෙන්නේත් කාලානුර කිනි. ඉහත කී පරිදි හුලං ගසා ගත් වී තර (හොඳ) වී, ඇගිටි, බොල් නමින් තෙකොටසකි. හුලං ගැසීමේදී බොල–වත් තර වියටත් මධ්‍යයෙහි ලැබෙනුයේ ඇගිටිය. තරවියට අගින් සිටින නිසා ඒ නාමය අනුරූප්‍යය. ඇගිටියෙහිත් ඉති ඇගිටි නමින් ප්‍රභෙදයෙක් වෙයි. ගොයම් කපාගත් පසු ඉපැනැල්ලට වතුර වැපීමෙන් දෙවන ගොයමක් සැදෙයි.

එයට අපි "කිරි" යයි කියම්හ. ඒ කිරි ගොයමෙහි පැහෙන විය රසගුණයෙන් මෙන් ම සම්පූර්ණත්වයෙනුත් අඩු හෙයින් ඒවා ඇගිපි වශයෙන් පාවිච්චියට ගනු ලැබේ. "ඉකි ඇගිපි" නම් ඒවාය. බොල් සම්බන්ධයෙන් කියයුතු අමුතු විස්තරයක් නැත. බොල් යනුව "හුස" ශබ්දයෙන් ආ හැකිය. කරඹිය, බෙදන කුරු ආරක්ෂා සහිතව කාමරේම තිබේ. හැන්දෑවට වී එක්තැන් කොට කොස් හිමියාගේ හෝ ආතාමුදලාගේ අත්සන එහි තබත්. මාතර පළාතේ අලුයන් දැම්ම නමින් අදහස් කරන්නේ ඒය. අලුයෙන් තබන සඥව යන අර්ථයි. එය දෙස්තර මහතාගේ බෙහෙත් සිට්ටුව මෙන්ම කිසිවෙකුටත් තේරුම් නොගත හැකිය. දෙස්තර මහත්මයා නොතේරෙන්නට ලියන්නේ, බෙහෙත් සිට්ටුවේ බෙහෙත් වලට වඩා සිය ගුණයකින් වතුර වැඩි හෙයිනි. මහාජනයා ඒ බව තේරුම් ගත්තොත් ඔහුට ලෙඩුන් අඩුවන හෙයින් දෙස්තර මහත්මයාගේ ක්‍රියාවෙහි තේරුමක් තිබෙතත්, ගොවිමහතාගේ ක්‍රියාවෙහි තේරුමක් නැත. උදේ දූසියට (අම්මට) බානවිටත් පාවර අත්සන් තැබූ ඔහුට පෙන්විය යුතුය.

මෙසේ ප්‍රමාණවත් දින ගණනක් ගිය පසු පාවර බෙදීමේ දිනය පැමිණේ. ආයුත්තෝ කාමුරුත් එති. ගමේ මනන්නාත් එහිය. හේ අමුඩුව ගසා– ජටාව බැඳ හුම්මාර (කුරිණි) ය පුරතින් රැගෙන පසෙකින් සිටියි. මනින වේලාව එළඹේ. හේ වරුවට වැඳ දෙදතින් හිඳ ගනී. කෙණෙකක් පුරවනුවේ (මල්ලේ) කට විදහා අල්ලති. පළමු කොට "ආක්යාලය" මැන වෙන් කරනු සිරිති. මුල් වී කුරුණිය යනු එහි අර්ථයයි සිතමි. ආක්යාල පන්සලට හෝ දේවාලයට ලැබේ. පළමු කුරුණිය මැන "ලාබයි" කියාද දෙවන කුරුණිය මැන "දෙක හොඳයි" කියාද රාවය කෙරෙයි. ඔත්තේ ගණන් කියනු අසුභ සේ සැලකෙන හෙයිනි. එක මල්ලකට මාතර පළාතේ නම් දෙළොස් කුරුණියක් ;මනියි. වී මැනීමත් කාලානුකූලව තැරෙන

70

සිත් ගන්නා ක්‍රියාවෙකි. කුරුණියේ කට ළඟට වී පුරවා එය තදින් වරක් කරකවා හරියි. විය කුරුණියේ හොඳින් තැන්පත් වනු සඳහාය. මනන්නා ළඟට වී රොක්කිරීම ගොවිකම් කිරීම නමුත් වී ගොඩගැසීම වරුවරාශි කිරීම නමුත් වී මුව්ට කිරීම පුරෝනු කිරීම නමුත් වන්නේය. කොත්මලේ පළාතේ නම් බැතය පිළිබඳ හැම වැඩටම ගොවිකම් කිරීම යයි කියත්ලු. කුරුනාගල පළාතේ නම් නම නොකියන්නේ නවයට පමණකි. 9, 19, 29, 39 යනාදී නවය එන තැන් නොකියා අට හොඳුනී දහඅට හොඳුනී යනාදී විසින් කියනු එයි සිරිති.

---

## 6 වන වග

# බදු සහ වෙනත් දීමනා

ආණ්ඩුවට දියයුතු කොටස බදු නම්නුත් අනෙක් අයට දියයුතු කොටස් වෙනත් දීමනා යන්නෙනුත් අදහස් කරනු ලැබේ. ගොවියා, ගම්කාරයා, උපකාරකයෝ යන මොව්හු අනෙක් දීමනාවන්හි හිමිකාරයෝය.

**අක්කියල්ලාහ**- අක්යාළු, අක්යහළු, අක්යල්ම් යනුත් මේටම නම්. පාවරෙන් පළමුකොටම දෙවියන් හෝ බුදුන් වෙනුවෙන් මැන වෙන් කරන වී කුරුණිය අක්කියල්ලාහ නමැයි සලකාම්හ. හතර ලියද්දේ හත් පිඹින්නාට දෙන කොටසයයි කියති. කුඹුරට විපතක් වන්විට තහංචිකාරන්නා ගෙන්වා ඔහු ලවා හත් පිඹීම මෙන් කරන කෙමකුදු තිබුණේය. මේ කෙම කිරීම වෙනුවට දුන් කොටස ආක්කියල්ලාහ නමැයි ඔවුහු සලකති. අක් ශබ්දය සංඛ්‍යා ශබ්දයෙන් ආවක යනු ඔවුන්ගේ අදහසයි. මනාශ කාණ්ට බැව් කියයුතුය.

අතපැන්දිය– "ත්‍යාගයයි කියා දෙති පෙර කෑණයයි කියා දෙති පෙර කෑ අතපැන්දියයි කියා දෙති" යනු පූජාවලි පාඨයි. (රත්නසාර සංස්කරණ 330) මේ විනා මේ ශබ්ද යෙදුණු අන් තැනක් ගැන අපි නොදනිමු. ශබ්දප්‍රකාශිය අතපැන්දි, යි ගතහොත් පැන්දි ශබ්දය "බන්දි" ශබ්දයට බෙහෙවින් සමානය. නමුත් මෙහි නියම අර්ථය අපට තවමත් නොවැටහුණේය. අතමාරු වට යම්යම් අවස්ථාවන්හි ඉල්ලා ගත් ධාන්‍යාදිය වෙනුවට පොලියක් සමග දියයුතු කොටසකැයි සැකකළ හැකිය. තමන් සොයනු.

අඳේ– අඳ කුඹුරු විස්තර කළ තැන බලනු. සෑම අඳය රක්ෂා අඳය ගත් අඳය වී අඳය කියා අඳය සිව් වැදෑරුම්.

ඉරවරිය– නුවර කාලයේ දී පමණ මේ බද්ද දෙමළ ගත්පත්තුව ආදී පෙදෙස්වලින් අයකළ බැව් පෙනේ. බද්ද වශයෙන් දෙන ලද්දේ හාල් මීපැණි දුන්තෙල් යනාදියයි. වරි ශබ්දය බද්ද කියන බවට සැකයෙක් නැත. ඉර ශබ්දය තේරුම් ගැනීම දුෂ්කරය. ඉදින් එය "ඉරෙර" ශබ්දයෙන් ආයේ නම් ඉරවරි ශබ්දයෙන් හිම්බද්ද අදහස් කරන්නට ඇතැයි සිතිය හැකිය. ර, ල දෙදෙනාගේ අභෙද උච්චාරණය මේ කාලයෙහි බෙහෙවින් පැවැති හෙයින් (මුළුතැන්රාළ – මුරුතැන් රාළ යනාදිය නිදසුනි.) ඉලවරි ශබ්දය වුවත් ඉරවරි වන්නට නොබැරිය. එසේ නම් එයින් කුඩා බද්ද යන අර්ථයක් ගත හැකිය.

ඔකු– නින්දගමක තිබෙන කුඹුරක් වගා කළ විට නින්දගම්කාරයාට දෙන බිම් ආදිය ඔකු ශබ්දයෙන් මෙහිදී අදහස් කරනු ලැබේ. ඔකු ශබ්දය මෙන්ම එහි අර්ථයත් කලින් කල වෙනස්වූ බැව්ද සැලකිය යුතුය.

කාටුමානකු- ධාන්‍ය පාගාගත් පසු එහි ඉතිරිවන කුඩා බිඳුරු කෑබෙළි ඉවත් කරනු සඳහා කාටු සහිත ඉපලින් මූස්තක් සාදා එයින් වී ගොඩේ තිබෙන කාටුව ඉවත් කරනු සිරිති. ඒ කාරිය වෙනුවට දෙන කොටස කාටුමානකු නමි.

කළුකඩ- මේද පූජාවලියෙහි පෙනෙන දීමනා විශේෂයක් වුවත් කුමක් සඳහා දෙන ලද්දක් දැයි සිතාගත නො හැකිය. ගොයම් කැටකළු කළවුන්ට දුන්නාක් දැයි සොයා බැලිය යුතුයි. කුඹුරේ කෑඩී බිඳී ගිය සවල්ප වක්කඩවල් බැඳීමටත් කඩඅළු බැඳීමයයි කියති. එහෙත් මෙහිලා එය නොගැනෙන සේ පෙනේ. කරකඩය යනාදී තන්හි මෙන් මෙහිත් කඩ ශබ්දය කොටස් වාචක වේ. එහෙයින් ගොයම් ගොඩගැසීම වෙනුවට දුන් කොටසකැයි අනුමාන කළ හැකිය.

කාරුව- කටයුතු බහුල සමහර ගොවියෝ කෙත රැකීම සඳහා සමහරවිට පිට අයක් සොයා ගනිති. පැල් ලෑගීම කුරුල්ලන් එලවීමාදිය ඒ අයට අයත් කාරිය වේ. ඒ සඳහා දෙන කොටස කාරුව නමි. ගම්කාරයාගේ වියදමින් කුඹුරු වැඩ කිරීමටත් කාරුවට කුඹුරු කිරීම යයි කියති. මෙහි කාරුව නම් වැඩ කිරීමේ මහන්සිය වෙනුවෙන් දෙන ධාන්‍ය කොටස වේ.

කක්හාල්- නුවර කාලයේදී කක්හාල් රාජකාරිය නමින් රාජකාරියක් තිබුනේය. මණ්ඩියකට වරක් නියමිත වකවානුවක එක එක ගමක් වෙනුවෙන් නියමිත හාල් ප්‍රමාණයක කාදක් මහවාසලට බැඳිය යුතුවිය. කක් හාල නම් ඒය. එකී ප්‍රමාණය ප්‍රදේශය අනුවත් කාලය අනුවත් වෙනස් විය. සාමාන්‍යයෙන් සරුසාර කුඹුරු වලින් බැඳි හාල් කාදට වඩා නිසරු කුඹුරුවලින් බැඳි හාල් කාද ප්‍රමාණයෙන් අඩුවිය. එසේම සුබ කාලවලදී සාමාන්‍ය කාලවලදීට වඩා වැඩියක් අයකරන ලදී. එකී

එකී කාදකට ඇඟුලක් පිය යුතු ගාල් සහ අනෙක් බඩු සම්බන්ධයෙන් නියමිත ප්‍රමාණයකුත් තිබුණේය.

කොළගොන් ගෙනත්තන්ට දෙන කොටස— හරකුන් ලවා ගොයම් පෑගවීම කොළගොන් ගැනීම නම්. ඒ කොළගොන් ගැනීම වෙනුවෙනුත් කොටසක් වෙන් කරනු ලැබේ. වැනි වශයෙන් එකී හිමිකාරයා වන්නේ ගොවියාය. ඒ කොටසේ ප්‍රමාණය ගැන යමක් නොදත හැකිය.

දකපතිය- මෙකී දක ශබ්දයෙන් ජලයක් පති ශබ්දයෙන් කොටසක් කියැවෙන හෙයින් දිය බද්ද එයින් අදහස් කරන ලදැයි කල්පනා කෙරෙයි. ශිලාලේඛනයන්හි දකපති බොජියපති යන දෙශබ්දය බොහෝවිට එකට යෙදී තිබේ. වලගම්බා මහ රජු අභයගිරි භික්ෂූන්ට "දකපතිය" දුන් බවද සඳ මුහුණු රජුගේ දෙමළ දේවිය ඉසුරුමුනියට මණිකාර ග්‍රාමයෙහි දකපතිය දුන් බවද මහාවංශය කියයි.

දහයෙන් පංගුව— පෙරදිග රටවල පැවැති පැරැණිවූත් ප්‍රසිද්ධවූත් බද්දනම් ආණ්ඩුවට ශස්‍යයෙන් දහයෙන් පංගුව දීමය. එසේ දෙන ලද්දේ පොළොව රාජසන්තක හෙයින් බිම් අද්දය වශයෙනැයි හැඟේ. ආගමික ග්‍රන්ථයන්හි "සස්සමෙධය" නමින් හැඳින්වෙන්නේත් මේ දශයෙන් කොටස දීම මැයි. සංයුක්ත නිකායෙහි (ඔපම්ම සංයුත්තකයෙහි මුල) "දසාරහ" නම් රජුන් කොටසක් ගැන සටහන් වේ. ඔවුන්ට ඒ නාමය ලැබුණේ රාජභාගය වශයෙන් සියයට දශයක් ගත් හෙයිනැයි අටුවාහි කියන ලදී. දැන් සෙවිය යුත්තේ සාමාන්‍ය ඉඩම් හිමියෙකුට බිම් අද්ද වශයෙන් කොපමණ ගෙවුනුද යන බවය. පන්සලේ ඉඩම් වගාකළ ගිහියන් විසිනුත් ගිහියන්ගේ ඉඩම් වගාකළ පන්සල විසිනුත් බිම් අද්ද වශයෙන් දහයෙන් පංගුවක් දියයුතු බව විනයපිටකයෙහි කී හෙයින් සාමාන්‍ය ඉඩම් හිමියාටත් දහයෙන් එකක් දුන් බව පැහැදිලි වෙයි. පසු

කාලයක ගණයක් එකක් අයකළ බවටද නොයෙක් නිදසුන් ඇත්තේය. පස්වන සියවසෙහි ඉන්දියාවට ආ පාහියන් හිමිනමත් ඒ බව සඳහන් කෙරෙයි.

**නිලකද**— වගාකළ කුඹුරු වෙනුවෙන් වාසලට බැඳි කද නිලකද නමැයි සලකමිහ.

**නිලපඹුරු**— වගාකළ ඉඩම් වෙනුවෙන් රජුට දියයුතු පඹුරු නිලපඹුරු නම්. එක ගමකින් පඹුරු පස්විස්සක් අයකළ බව බදුලු ලිපියෙන් පෙනේ.

**පැල්දෙර**— පැල්ලැග්ගා වෙනුවට දෙන කොටස පැල්දෙර වේ. ඉරිඟු ආදිය වගාකළ හේනක නම් පැල හාත්පස තිබෙන හොඳ ඉරිඟුගස්පිකේ කරල් ගොවියා සතුය. කුඹුරෙහිත් පැලවටා තිබෙන ගොයම් විසා වෙනුවට වී කොටසක් ගොවියාට ලැබුනා වනැයි සලකමිහ. නම සැදී තිබෙන්නේත් ඒ අනුවය. එහෙත් එහි ප්‍රමාණය ගැන යමක් නො කියැ හැකිය.

**පිසඹුරුවන**— නිශ්ශංක මල්ල රජු අතහළ බදු අතුරෙන් මෙද එකෙකැයි ඔහුගේ ලිපිවලින් දත හැකිය. පිසඹුරු කුඹුරුවලින් අයකළ බද්ද පිසඹුරුමන නම්. පාසි බැඳීගිය නිසරු කුඹුරු පිසඹුරු කුඹුරුය.

**පෙරෙනාඩිවියම**— මෙද කුඹුරු ආදී ඉඩම්වලින් අයකළ බද්දක් බැව් පෙනේ. ඉඩමක් සඟසතු කිරීමේදී එයට දෙන නිදහස්කම් අතර පෙරෙනාච්චියමෙන් මිදවීමද එකකි. බීම් බද්දකැයි සැක කරන්නට අවකාශ තිබේ.

**බිලි බත් සහ බිලි හාල්**— මෙද ධාන්‍යයෙන් දුන් බද්දකි. රජතුමාගේ මුලාදෑනීන් ගමේ ඉඩමට (නානායමට) ආකල්හි ඔවුන්ට දෙන අඩුක්කුව බිලිබතැයිද මහවාසලටත් දිශාවලව්වටත් ගෙන ගිය හාල් කද බිලිහාල් නමැයිද සලකමිහ.

භෝජ්‍යශක්ෂ්‍ය— වගකළ ඉඩම්වලින් සහ තමං පදින්විම සිටින ඉඩම්වලින් ආණ්ඩුවට දුන් බද්දකැයි සිතේ. භොජ්‍ය යනුම භොජන සිද පෙනේ. භොජ්‍ය ශබ්දයත් ඒ රූපයෙන් සිටින්නට පුළුවන. දකපති ශබ්දය සමග බෙහෙවින් යෙදුණේය.

බොල්පසලාස— මෙහින් සම්පූර්ණ අර්ථය අපට නො වැටහේ. පී බෙදීම ශුඩ නොකොටත් සිදුකරන හෙයින් එසේ බෙදීමේදී බොල්වෙනුවට පස් ලාහක් දෙන සිරිතක් තිබුණේදැයි නොදනිමි. බොල් පොලා ලබාගන්නා වියට "බොල්පසල"යයි කොත්මලේ කියති.

මඬරන් බද්ද— මේ ශබ්දයටත් නොයෙක් පළාත්වල නොයෙක් අර්ථ දෙන හෙයින් නියම අර්ථය කෝකදැයි සිතා ගත නොහැකිය. වගාකරනු සඳහා කුඹුරක් ලබාගනු පිණිස ඉඩම් හිමියාට දෙන දීමනාව මඬබද්දයයි සමහරු සලකති. තවත් සමහරුන්ගේ මතය නම් වැවෙන් ලැබෙන දිය වෙනු-වෙන් දෙන බද්දක් බවය. පොළොන්නරු කාලයෙහි උතු මැදි පැසි යන කුඹුරුවලින් ක්‍රමයෙන් රන්හය රන්හතර රන්තුන බැගින් අයකළ අයුරු නිශශඞකමල්ල ශිලා ලිපි වලින් දතහැකිය. පී බද්ද හැම කුඹුරකින්ම අයකළ නමුත් මඬරන් බද්ද වැව් දියෙන් වගාකළ කුඹුරුවලින් පමණක් අයකළා විය හැකිය. මේ බද්ද මුදලින්ම අයකරන ලදී. කුඹුර වෙනුවෙන් කුඹුර අයිතිකාරයාට දෙන රන මඬරන නමැයි සලකමිහ.

මහවර— මෙද ශිලාලිපි ගණනකම දක්නා ලැබෙන බදු වාචක ශබ්දයෙකි. මෙයට මුලින් බොහෝ විට සුවර් ශබ්දයක් යෙදී තිබීමත් එය සුළුවර ශබ්දයාගේම යොමු කිරීමකැයි සිතීමක් නිසා මහවර ශබ්දයෙන් මහබද්ද කියැවෙන්නේයයි ඓතිහාසිකයෝ කල්පනා කෙරෙති. එහෙත් "මහ" නමින් වෙනමම බද්දකුදු තිබුණේය. ඒ වනාහි පන්සල් සහ දානශාලාවලට දියයුතුසේ නියමකර තිබුන ධාන්‍ය කොටසක්

බැව් සැලකිය යුතුය. "මඟ" යනු පූජාර්ථයෙහි වැටෙන හෙයින් පූජාකාරය හෙවත් පූජාබද්ද යන අර්ථය එයින් ගත හැකිය.

**වාලකනය**— මාතර පළාතේ වලහන් කියාද ගාලු-ගඟබඩ පත්තුවේ වලකොළහන් කියාද වලල්ලාවිටි කෝරළයේ වාලකන කියාද ව්‍යවහාරයට ගොස් තිබෙන්නේ එනම "වාලකන" ශබ්දය සේ පෙනේ. එහෙත් වලකොලහන් යනුව තවත් කල්පනා කළ යුතුය. "වලකොලහන් ඇරල ගොවියාට වී අමුණු දෙකක් තිබුනා" යන ව්‍යවහාරයෙහි වලකොළහන් නමින් අදහස් කරන ලද්දේ සියලු කාර්‍යයන් සඳහා ගෙවියයුතු දේ ගෙවා යන අර්ථය වේ. දැන්නම් වලහන් ශබ්දය පාගන කුලිය වශයෙන් දෙන ධාන්‍ය කොටස පමණක් කියයි. මාතර පළාතේ නම් මුල් බිජුවලින් හතෙන් එකක් වලහන වශයෙන් වෙන්කරනු ලැබේ.

**වැරියන්**— මෙහි වැරි යනුව දෙමළ "වරි" ශබ්දයෙන් ආවා චින්තනට පුළුවන. එහෙත් දෙමළ වරි ශබ්දය සාමාන්‍ය බද්දමුත් විශෙෂ බද්දක් නොකියයි. වැරියන් වනාහි ධාන්‍ය වලින් අයකළ විශෙෂ බද්දක් හෙයින් ධාන්‍ය වාචක වාරම් ශබ්දය වැරි ශබ්දයේ මූලයවියයි සලකනුත් යුක්ති සහිතය. කල්පනා කොට සුදුසු අර්ථයක් ගත යුතුය. මෙල්වාරම් යනුවෙන් ගොවියා විසින් ගම්කාරයාට දියයුතු කොටස අදහස් කෙරේ.

**වී බද්ද**— දෙලොස්වන සියවසේ පැවැති වී බද්ද පිළිබඳ තොරතුරු නිශ්ශඞ්කමල්ල ලිපිවලින් දත හැකිය. උත්තේ අමුණට එකාමුණු තුන්පැලක්ද මැද්දේ අමුණට එකාමුණු දෙපැලක්ද පැස්සේ අමුණට එකාමුණු එක්පැලක්ද අයකරන ලදී. ඒ කාලයෙහි උත්තේ කුඹුරක සාමාන්‍යයෙන් එකට විස්ස තිහ පැසෙන්නට ඇත. එහෙයින් මේ බද්දෙහි අන්‍යායෙක් නොපෙනේ. ගොවියා උකසඳුවනුයේ මේ ක්‍රමය අනුව මිස දැන් තිබෙන ක්‍රමය අනුව නොවේ.

**වී ඡේදය**—මුලින් පැවැති වී බද්දම පසු කාලෙන මේ නාමයෙනුත් ප්‍රසිද්ධියයි සිතන්නට අවකාශ තිබේ. රා ඡේදය තොටුපල් ඡේදය යනාදී ව්‍යවහාරයන් බලාගෙන විය හැකිය. මේ ඡේදය අයකරනු සඳහා විශාල නිලධාරි මණ්ඩලයකුත් විය. එසේ අයකළ වී තැන්පත් කළ ගබඩාවෝ "පත්තායම්" නමින් දන්නා ලදහ. තංගල්ලේ තිබුන වී පත්තායමේ ප්‍රධාන ලේකම් ධූරය සුප්‍රසිද්ධ කවීන්ද්‍රයකුවූ ජාන්ට් ද සිල්වා සමරජීව පඬිතුමා විසින් උසුලන ලදී. පත්තායම් යනු මලයාලම් වචනයෙකි. ලොකු ලෑලි පෙට්ටිය යනු අර්ථයි.

**සාරමාරු**— ඉඩමක් වගාකරනු පිණිස බාරගන්නා මුල් දිනයෙහි ඉඩම් හිමියාට ගෙවන මුදලට සාරමාරුවයයි මාතලේ පළාතේ කියති.

**සම්බා**— ගොවිතැනෙහන් රජුට දියයුතු කොටස කොත්මලේ මේ නමින් හැඳින් වේ. සම්බසහිණ්ඩය ඉතා ප්‍රසිද්ධය. එහි නියුක්තයන්ට සම්බසයින්ඩෙ මුලාදෑනිහුයයි කියත්.

**සලාකිස්**— වෙල්විදානෙට දෙන කොටස සමහර පළාත්හි මේ නාමයෙන් හඳුන්වනු ලැබේ. සලාකිස් බද්ද සියයට එකකැයිද කියත්. කුරුනාගල පළාතේ අමුණට ලාස් එකකි.

**සුවර්**— මෙයින් සුලුබද්ද අදහස් කරන ලදැයිද සුලුවර යනුම සුවර් වූයේයයිද කියත්.

**සිවල් අඬේ**— මෙය රුහුණේ නමමත් පවත්නා බව පෙනේ. ඉඩම් හිමියා තුන් හිය භාවා දුන් විට කුඹුරේ අස්වනුවලින් තුනෙහන් දෙකක් ඔහුට දියයුතුලු. සිවල් වූයේ සිවැල් යනුව මැයි. ගත් අඳය මෙය නොවේ.

**හුවන්දිරම**— "සුමිත් කුමාරයන්ට විද්‍යාචක්‍රවර්ති පණ්ඩිතයන් විසින් ඔවුනු පළඳවා සියලු හුවන්දිරම් ඇතුළුව ගම් නම් තනතුරු සහ වරප්‍රසාද ලදින්" (මාතලේ කඩයිම්පොත)

2. මහලු පරාක්‍රමබාහු රජ රාජශෙඛර පණ්ඩිතයන් විසින් ඔවුනු පළඳවා එරජුගෙන් සියලු සුමන්දිරම් හා ගල්වැම් පිහිටුවා . . . . (මාතලේ කාඩයිම්පොත) 3. වලංගු රිදියෙන් එකසිය තිස්පහකුත් සුවන්දිරම් පහමාරකුත් උසිතාන්දම් තංගමකුත් මෙම මුදල තිග නැතිව එකසිය හතළිස් එකක් ගැන සමන්නා දෙමින් (පැරණි භූමිපත්‍රයක) 4. රන් රිදී කඩ මිලෙන් පනහකුත් සුවන්දිරම් පණහමාරකුත් ගැන සමන්නා දෙමින් (යද්දිගම ඔප්පුව) 5. සිංහාසනය තැනූ-වන්ට පරකොට වැල්ල ඇල්දෙනිය හා ගම් නම් දෙවා නොයෙක් සුවන්දිරම් ලැබී (විජයනීතිය) මේ දැක්වූයේ සුවන් දිරම් ශබ්දය යෙදී තිබෙන තැන් කීපයෙකි. මේ සියල්ලෙන් පෙනෙනුයේ සුවන්දිරම් නමින් කාශි විශෙෂයකුත් බදු විශෙෂයකුත් පැවැති බවය. සවර්ණ කාශි කියැවෙන සුවන් දිරම් ශබ්දයෙහි දිරම් යනුව ඉන්දියානු ලිපිවල 'ද්‍රම' යි පෙනේ. නිශ්ශඞ්කමල්ල ලිපිවල තිබෙන "රිදීකිරම්" යනුව සමගත් සසඳා බැලිය යුතුය.

වගාකළ ඉඩම්වලින් ගත් "සෙවණ් ආදායම්" නමින් හැඳින්වුනු බද්දකුත් විය. මාතර පළාතේ "හුවන්දිරම්" නමින් ප්‍රසිඬ බද්ද දූත් විදානෙන් විසින් අයකරනු ලැබේ. එයට ලැබෙන්නේ සියයෙන් එකකි. මේ හුවන්දිරම් ශබ්දය, දෙමළෙහි ලැබෙන සුතන්දිරම් ශබ්දයට සමාන වේ. සං. සවතන්ත්‍ර යනුයි. සුතන්දිරම් ශබ්දය මුලදී යොදන ලද්දේ වීයලි ධාන්‍ය වපුරන ඉඩම්වලින් ලැබුනු අමතර ලාභයක් කියනු සඳහාය. පසුව එහි අර්ථය වෙනස් විය.

වරකුල— සීසෑම් මැඩිපීම්, ආදිය වෙනුවට ගොවියාට ලැබුනු ධාන්‍ය කොටසකි.

තවක් දීමනා— ඉන්දියාවේ ඉතා සමෘඬව තිබුන ලිච්ඡ-වීන්ගේ ආණ්ඩුව විසින් නුවරට ගෙනයන ධාන්‍යයෙන් කොටසක් කරය වශයෙන් අයකළ බව පව්ති පොතෙන් පෙනේ. අනුරාධපුර නුවරට ගෙන ගිය ධාන්‍ය ගෝනියකින්

ඥතක් මහා පාලි දන ශාලාවේ දනය පිණිස අයකළ බව සෑරුණි දළදා මාළිගය ළඟ තිබෙන ගල් ඔරුවේ ලිපියෙන් පැහැදිලි වෙයි. මේ අයකිරීම් දෙකේ සමාන මුහුණුවරක් පෙනෙන්නට තිබේ. අප නොදන්නා තවත් දීමනා විශෙෂ තිබෙන්නට ඇත. පැරණි ගමක් වූකලී ගමට උවමනා සියලු අයගෙන් යුක්තවිය. ඇපිල්ලීම, බෙර ගැසීම, අවි ආයුධ තැනීම, තැනැක්කීම, වෙදකම් කිරීම, තොවිල් කිරීම, කුලු වට්ටි තැනීම, වළන් තැනීම, රෙදි විවීම, ඉගැන්වීම, උඟලියං වැඩ කිරීම යනාදී නොයෙක් කාර්‍යයන්හි නියුක්ත ප්‍රමාණවත් පවුල් ගණනක් ඉස්සර සෑම ගමකම පදිංචිව සිටියහ.

ඔවුන්ටද සුදුසු පරිදි ධාන්‍ය කොටසක් දියයුතු විය. මේ සියලු දීමනාවනුත් දී තමාටත් සුවසේ ජීවත්වන්නට තරම් ධාන්‍ය ප්‍රමාණයක් පැරණි ගොවියාට ඉතිරිවිය. එහෙයින් ඔහුට මනුෂ්‍යයකු හැටියට සමාජයේ තැනක් තිබුණේය. අද ගොවියා වනාහි සියලු යුතුකම් ඉක්මවූවෙකි. යටත් පිරිසෙයින් හේ පින් වී කුරුණියමත් වෙන් නොකරයි. එහෙයින් හේ සදාකාලික හිඟක්නෙකි. ඔහුට සමාජයේ කිසිම තැනක් නැත්තේය. ඔහුට පාවෙරන් ගෙදර යන්නට වන්නේ ඉඩම් හිමියාටත් පොලීකාරන්නන්ටත් මැද පුදා ඉතිරි ණය ලබන අවුරුද්දේ ගෙවන බව කියාය. අවුරුද්ද මුළුදුම ධනවතාගේ වැඩ පනිවිඩ කොට එක දිනක් බැරි උණොත් අපේ ගොවියා තමාගේ ගෙපැලට පවා අසවාමිකයෙක් වන්නේය. පරම්පරාගතව වැඩ කරගෙන කෑ කුඹුරු කෑබැල්ලත් වෙන කෙනෙකුට යයි. මේ ජාතික ප්‍රශ්නය අනෙක් හැම [illegible]ශ්නයක්ම අබිබවාගෙන සිටී. මේ වනාහි විදෙශීය ආව තොවුණු යටත්වීමේ දරුණු විපාකයෙකි. තිමෙන් ව[illegible]න් විපොතු [illegible]ළට නිදහසක් නැත. ගොවීන්ගේ නිප්ලවය[illegible]යකි.

# වී අටු නැංවීම

වී අටුව පළාතක් අනුවත් වී ප්‍රමාණය අනුවත් නොයෙක් වෙස් ගනී. ප්‍රභූ ගෙමල්වලත් ධනවත් ආරාමයන්හිත් ගල් කුළුණු පිට නැංවූ විශාල ලෑලි පෙට්ටියක් වී අටුව හැටියට පාවිච්චි කරති. තවත් සමහරු සෙත්කුඹක හැඩය ගත් භාණ්ඩයක් වැල් ආදියෙන් තනා එහි මැටි ගා... එයට පිදුරු වලින් හොඳ පියස්සකුදු සාදා එහි වී තැන්පත් කෙරෙති. වරුව නමින් හැඳිනෙන්නේ එයයි. මාතර පළාතේ නම් වී ගෝනි හෝ මලුවල දමා කොටුවේ තබනු සාමාන්‍ය සිරිති. මේ කොයිතැන වුවත් වී තැන්පත් කරන්නේ නැනැතක් අකුව ය. ගොවියා නමතෙන් ගෙනයන්නේ ශෝකයක් සන්තාපයක් හෙයින් වී අටුනැංවීමක් ඔහුට නැතහොත් ගම වසන මුලාදැනියාටත් ගිනි පොලී කන ධනවතාටත් අටු නැංවීමට ඕනෑතරම් වී තිබේ. ඔවුන්ගේ ගෙමල්වල කසිදරාබාද් මාලිගයේ මුදල් මෙන් හැම මුල්ලකම වී ය. අටු නැංවන අවස්ථාවෙහි හෝ ඊට තරමක් පෙර පසුව බුඩ පූජාව, දෙව පූජාව, සංඝභෝජනය යනාදිය පවත්වනුත් සිරිති. සමහර ගම්වල නියමිත දිනෙක සියලු දෙනාම එකතු වී අලුත් සාල් බුඩ පූජාව විශාල ලෙස සිදු කෙරෙති. දඹදිව වැස්සන් එක ශෂ්‍ය වාරයකින් නවවර පස්වර ආදී වශයෙන් දන් දුන් බවත් පොත පතේ සඳහන් වෙයි. මෙසේ මේ පූජා කෘත්‍ය යන්ගේ අවසානයෙහි පැරණි පිටිසර ගොවියා අලුත් බත් කන්නට සැරසුනේය.

**අලුත් බත් කෑම**— එක ශෂ්‍ය වාරයෙක වීයෙන් පළමු කොටම බත් කෑම අලුත් බත් කෑම බව අපි දනිමු. අලුත් බත් දිනයක් පිටිසරට නම් තරමක මඟුල දිනයෙකි. එදාට කුලදෙවුවන් සහ කුලුපග අසල්වැසියන් කැඳවා ඔවුන්ට සඹුහ සිරීමටද ගොවියා ලොකු සා...පචිත්‍යක් දක්වයි. අලුත් බත ඉඳුල් සිරිමත් ඉතා ...ධාන්‍ය ... යෙයි. ඒ සඳහා ගමේම සිටින ඉතා... පමුණුවා

ගනිත්. කොතරම් අදි මදි වුවත් දමුකොඩයක් සමග සැලියේ ප්‍රමාණවත් කොටසක් ඉතිරි කරනුත් අලුත් බත් කෑමේ අඞගයකි. මෙසේ අලුත් බත් කෑ ඉක්බිති ඇඟ වී තිබෙනම් දිනපතා හෝ සති පතා එයින් ප්‍රමාණවත් කොටසක් ගෙන සහල් භාර ගැනීම සිරිති. මෙතැන් සිට ආහාර සැපයීම සම්බන්ධයෙන් කෙරෙන සැම කටයුත්තකදීම වාගේ ප්‍රමුඛවන්නී ස්වාමිදුවය.

වී කෙටීම— සිංහල කාන්තාවගේ වී කෙටීමද විනෝද දායක කාර්යයකි. එය දැකීමත් ඇය දැකීම මෙන්ම ප්‍රියය උපදවයි. සිංහල ගෘහයක වී කෙටීම සඳහාම වෙන් ශාලාවකුත් විය. “වටහල් ගෙය” යනු එයට නමි. කරත් ගම, වංගෙඩිය, කුල්ල, මෝල යන මේවා වී කෙටීම පිණිස අවශ්‍යයෙන්ම උවමනා දේය. කොළමෝල, පිලිමෝල ඈ වශයෙන් මෝලෙහි ප්‍රභේදයෝත් වූහ. වඩා උසකැති ක්‍රීඩා මෝල කොළ මෝල නමි. පිළි මෝල වඩාත් ප්‍රයෝජනවත් වනුයේ හාල් පැහීමේ දීය. මෝල් හෙළීම සහ එසවීම, විසිවන වී පයින් වී ගොඩට දැමීම, අඞගවලනය, ගී ගැයීම යනාදී සියල්ල නියමිත තාලයකට අනුව පවත්වමින් දක්ෂණට කැරැකීම වී කෙටීම නමි. ක්‍රමානුකූලව සකස් කළ හොත් මෙය උසස් ජාතික නෘත්‍යයක් කළ හැකිය. හැව නමක් රඟපෑකිරීමෙහි සමත් වූ පැරැණි වී කොටුම් කවි දෙකකක පාලි ජායාව සංයුක්ත අටුවාහි පෙනේ. එහි වර්තමාන සිංහල ජායාව මෙසේය.

1. මැලමුණු සම්බෑනි - මේ කය පෙරෙන් මිරිකි
මරණින් බිඳී ගොස් - මරුහට අහර වන්නෙය

2. අසුචි බඳනක් බඳු - පණුවන්ට ගෙසකුඳු වූ
කුණු පිරුණු මේ කය - කෙතෙසල් සඳකට සමවේ

වී ප්‍රමාණවත්ව කොටුනු පසු කුලුවල දමා පොලනු සිරිති. වී හාල් වලින් විපොතු වෙන් කිරීම එයින් අදහස් කෙරෙත්.

පෙළීමෙත් තාලයක් අනුව සිදුවන්නකි. කුල්ල ඔසොවන වරක් පාසාම සිව් ඇඟිල්ලකින් එයට පහරක් වදී. තානාන වන් තීප දෙනෙකුන් වී පොළන විට එකවිට නගින ශබ්දය කුල්ලක් එකවිට වදින ඇඟිලි පහරත් නිසා මනොඥ ගීත යක් සහ නාදයක් එකිනූ ඇතිවන්නේය. පෙළීමෙන් පසුව එන්නේ පූකිරීම් වාරය වේ. වීයෙන් සහල වෙන් කිරීම පූ (පක) කිරීම නම්. එය පෙළීමට වඩා වෙනස්ය. එක්තරා කාලයකට කුල්ල සෙලවීමෙන් වීයෙන් සහල වෙන්වෙයි. එසේ වෙන්වී කුල්ලේ අගට යන හාල "අගස්ස" නම්. ඉක්බිති හාල් පාගින වාරය පැමිණේ. හාල් වනාන දමා පිළිමෝලෙන් පහර දෙනවිට හාල් ඇඹියෙන් කුඩ්ඩ වෙන් වෙයි. පැහිම නම් මේය. දැන් හාල ශුඩවී ඉඳිරය. නොකැඩුනු හාලට මුල් සාල් යනුද, දෙකට කැඩීගිය හාලට කැඩි හාල් යනුද සුණුවූ සාලට සුන්සාල් යයිද නම්. මුල් සාල සහ කැඩි සාල බත් කැඳ ආදිය ඉවීමට ද සුන්සහල කැවිලි ආදිය සෑදීම ටද කුඩ්ඩ හරකුන්ට දීමටද පොත්තා මැටිබඳුන් සුඹුල් කිරීමට සහ කුඹුරු පොර කිරීමටද යොදනු ලැබේ. ගොවියාට අටුවෙන් වීත්, කොටුවෙන් එළවලු සහ මිරිස් ආදියත්, දෙන ගෙන් කිරිත්, වත්තෙන් කෙසෙල්ගෙඩි දෙළුම් අන්නාසි ආදියත්, සැපයෙන හෙයින් ඔහුට කඩෙන් ගන්නට තිබෙන ප්‍රධාන දෙය නම් ලුණුය. කුඹුර කොටා ඇලෙන් නහා ගෙදර එන ගොවියා ඉහතකී දැසින් සකස්වුණු ආහාරය වළඳ, දුඹුල් වතුර බී ඇස්පල වකින් ගුත් බුලත් විටක් කපයි. ශරීර ශක්තිය, නිරෝගීභාවය, නුවණ, ඉවසීම යනාදී සෑම උතුම් ගුණයක්ම ආහාරයත් සමගම ඔහුගේ ශරීර ගතවෙයි. ජාතිය ඔසොවන්නට නම් ජාතියට ජාතික ආහාර පුරුදුකළ යුතුය. උසස් තැනින් ඇරඹෙන විට පහත් තැන් කරාත් යනවා ඇත. චිතීමාන ජාතික ආහාර ක්‍රමය වෙනස් කරන්නට මේ ඉතා සුදුසු කාලය වේ.

# 7 වන වග
# කුඹුරු කරන කාල

වසකට වරකුත් දෙවරකුත් තෙවරකුත් වැඩකළ කුඹුරු තිබුණේය. වසකට වරක් වැඩකළ කුඹුරු වඩාත් සාරවිය. වැඩිපුර තිබුණේත් ඒ වගීයට අයත් කුඹුරු බැව් පෙනේ. වසකට දෙවරක් වැඩකළ කුඹුරු ඊළඟට වැඩිවිය. තෙවන වගීයට අයත් කුඹුරු තිබුණේ කලාතුරෙකින්ය. දෙකුන් මයින් පැසෙන බාල වී වගී එහි වපුරන ලදී. දඹදිව කිටාගිරි නුවර කුඹුරු තෙවරක් වපුරන බව විනය පිටකයෙන් දතහැකිය. ලංකාවේ කුඹුරු තෙවරක් වැපිරූ බවට නිදසුන් සුලභ නොවේ. පූජාවලී ආදියෙහි කියන පරිදි යල මාහ දෙමෝසම විනා අනෙක් ප්‍රසිඬ ශස්‍ය වාරයක් මේ දිවයිනේ නොපැවැත්තේය. සිව්වන සිය වසට අයත් තෝනිගල දෙවන ලිපියෙහි පිටදඩහස අකාලහස මෙදහස යයි තොහසක් ගැන සටහන් වෙයි. මාහ යල සහ ඒ දෙකට අතර ශස්‍ය කාලයක් ඒ වචන වලින් කියවෙන්නේයයි ආචාර්ය පරණවිතාන මහතා කියයි. ඒ පිළිබඳ අපේ අදහස පසුව පහළ වන්නේය.

මාහ— ලංකාවේ ප්‍රධාන ශස්‍ය වාරය මේය. පැරණීයන් මාහ වපුළේ වප් මාසයේදීය. "අස්සයුජ" මාසය වප් මුයේ එහෙයිනි. ජූලයි, අගෝස්තු යන මාස්වලදී උඩරැටියෝ කුඹුරු වපුළහ, සි නොක්ස් මහතා කියයි. මාතර පළාතේ දැන් පවත්නා සාමාන්‍ය සිරිත නම් සැප්තැම්බර් ඔක්තෝම්බර් වලදී මාහ වැපිරීමය. මෙයින් පෙනෙනුයේ ප්‍රදේශයන් අනුව වපුරන වනවාතුව තරමක් වෙනස් වූ බවය. මාස් මෝසමේදී ඊශාන දිගින් සුළං හමයි. මේ කාලයෙහි ලංකාවේ උතුරු, උතුරු මැද, නැගෙනහිර යන පළාත් වලට වැස්ස ලැබේ. අවුරුද්දේ ප්‍රථමයෙන් ම කරන ගොවිතැන මාස් ගොවිතැන නමින් දන්නා ලද්දේ එය ප්‍රධාන ගොවිතැන නිසාය. මාස් යනු "මහා සස්ස" ශබ්දයෙන් ආහැකිය. (මහාසස්ස > මහසස් > මහස්

මාස්) යනු ආසැටියයි සිතමි. මේ ගොවිතැන බෙනෙවින් කැපෙනුයේ මාඝ (නවම්) මාසයේදීය. දෙමළෙහි මාඝ යනු මාග, හී සිටියි. මෙසේ නවම් (මාඝ) මාසයේදී කපා ගන්නා ශස්‍ය වාරය මාඝ නමින් ප්‍රසිද්ධියට ගියේ යයි සිතනුත් කරුණු සහිතය.

යල— මේ වනාහී අවුරුද්දේ දෙවන වරට වපුරන ශස්‍ය වාරයට නමි. බොහෝ ගොවියෝ යල වපුරා ඉවර කර මඩ සෝදා ගෙන සිංහල අවුරුදු කන්නට වාඩි වෙති. යල ශබ්දය දෙවන, ඉක්බිති, නැවත, යන අරුත් පවසයි. අවුරුද්දේ දෙවන වාරයෙහි කරන ගොවිතැන ගෙයින් නාමය අනුරුක්සේ පෙනේ. යල යනුව "අකාල" ශබ්දයෙන් ආවකැයිද එහෙයින්ම අකාලයෙහි කරන ගොවිතැන යල් ගොවිතැන නමැයිද සමහරු කරුණු නොවිමසා කියති. යල් යනුව අකාශ ශබ්දයෙන් නොව "කාල" ශබ්දයෙනුත් ආහැකිය. "යල් පැනපු ගොයම" යනාදී කන්හි ඒ පෙනේ. යල අකාලයක් නම් ඒ අකාලයෙහි ප්‍රසිද්ධ වශයෙනුත් බහුල වශයෙනුත් ගොවිතැන් කරන්නෝ ඇයි දැයි අපි අසමු. යල ශබ්දය සැදුනේ යයි කියන අයල ශබ්දයන් මෙහිදී තරමක් සොයා බලනු සුදුසුය. 1. අයල් සිවුරු දස දවසක් ඉකුම්බා නම් (සික්වළඳ) 2. එයින් උත්තරයෙහි අයලින් මදනා සොරුන් නැති වන බැවින් (අමාවතුර ආලවක දමන) 3. දද ලෝ අයල පහණෙන් (කව්සිළුමිණ) 4. "දීපශාලා භිජ්ජන්ති ශොච උප්පජ්ජන්ති ශොච දීඝා," පෙර උපන් වැව් ජල නස්න සේහසි අයල වැව් ජල උපජනසේ බලා (ධම්පියා අටුවා සන්නය 170) 5. අයල සිතුවම් වේ (සියබස්ලකර 90) 6. අයලින් බුන් සාතයෙන් පහරී නම් (යෝගාර්ණව 162) මේ සියල්ල හොඳින්තොට බලන විට අයල ශබ්දය අකාලය පමණක් නොව පිටත ආදී තවත් අර්ථයන් කීපයක් කියන බව සිතාගත හැකිය. "අයාළින් බුදුගුණෙහි පරිචය කළ දරුවා පියේ" (මූ. ධම්පියා අටුවා සන්න 251) යන පාඨය අයල ශබ්දයෙහි අර්ථය තේරුම් ගැනීමට ඉතා ප්‍රයෝජනවත්ය,

එහි "අහළින්" යි කීයේ පසුව යන අර්ථය දෙනු සඳහාය. සිව්වන මිහිඳුගේ දෙව්රම් ලිපියක් බලනු .මේ කරුණු අනුව වර්ෂයෙහි දෙවැනි වරට වපුරණ ශෂ්‍යවාරය යළ නමින් දන්නා ලද්දේ පසුව වපුරන නිසා යයි අපි කියම්හ.

මාස්සස්ස— පෙරමාහ මහමාහ යන නම් වලින් ප්‍රධාන මාස් කන්නත්, මාස්පස්ස යන්නෙන් පසුමාහ හෙවත් කුඩා මාහත් කියැවෙන්නේය. එනම් යායේ කුඹුරු වැපුරුම සමහරවිට පෙර පසු වියහැකිය. යමෙකුගේ කුඹුරක් පෙර මාහට වැඩකර ගත නොහැකි වුවහොත්, පෙර මාසේ ගොයම් කපන කාලයේදීම කපාගත හැකි-බාල වියක් එහි වපුරනු ලැබේ. මාස්කන්න පසුව වපුරන හෙයින් මාස්පස්ස යයි එයට කියත්. රයිගම්කෝරළයේ මේ ව්‍යවහාරය තිබේ.

කුණු පිදුරු දියක්ක— යළ කපා පාගාගත් ඉක්බිති බිණරමාසයේදී වැසි වැස දියෙන් කුඹුරු යටවෙයි. පැරණි පාවරවල්වල තිබෙන කුණු පිදුරුත් උල්පවාගෙන ගලන හෙයින් ඒ ජලයට ඒ නාමය අනුරූප්වන්නේය. කුඹුරු, මාස් ගොවිතැනට යොග්‍ය කරන්නේ මේ කුණු පිදුරු දියක්ක විසිනි. මේ රටේ බිණරමාසය කුඹුරු නොවැපිරියැ යුතු මාසයක් හැටියට සම්මතවී තිබෙන්නේ මේ ජල බාහුල්‍යය නිසා විය යුතුය.

බක්කිඩවරය— වප්මාසයෙහි ලැබෙන දසදිනක් හෝ පසළොස් දිනක් මේ නාමයෙන් හඳුන්වනු ලැබේ. මේ කාලයෙහි හොඳින් ඉඬෝරය පවතී. එය කුඹුරු වැපිරීමට ලැබෙන ලොකු අනුබලයෙකි. කුඹුරු වපුරන ඉඬෝරය යනු ශබ්දයෙහි අර්ථය විය හැකිය. වාරය, කරාය, මෝසම, කන්න යනාදී නමුත් සෂ්‍යවාරය හඟවයි. උතුරු පළාතේ මාස් කන්නට "කාලපොහම්" කියාත් යල්කන්නට "අකාල-පොහම්" කියාත් ව්‍යවහාර කරත්ලු. පොහම් යනු භොග ශබ්දයෙන් ආයේය. කාලභොගය අකාලභොගය යනු අර්ථයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

**හමස්කාලය**— පොල්පලදාව අඩු කාලයට අපි විශේෂ යෙන් හමස්කාලයයි කියමු. ඒ කාලයෙහි පොල්පලදාම පමණක් නොව අනෙක් පලදාවෝත් අඩුවෙති. කුඹුරු සම්බන්ධයෙනුත් මේ කාරණය මෙසේමැයි. හමස් කුරක්කන් හමස් මෑ යනාදී තන්හි හමස් ශබ්දයෙන් සමය කියවේ. හමස් පෙට්ටිය යන ව්‍යවහාරයකුදු තිබේ. ශේවකයන්ට හමසකට වරක් පඩිදෙනු පැරණි සිරිත විය. ඒ ෂම්මාසික වෙතනය දෙනු සඳහා මුදල් තැන්පත්කර තිබුනු පෙට්ටිය හමස් පෙට්ටිය විය. දැන් අර්ථය වෙනස්වී තිබේ.

**පිඩදඩහස-අකලහස-මණ්දහස**— මේ වනාහී තෝනිගල දෙවන ලිපිය නමින් හැඳින්වෙන කිත්සිරිමෙවන්ගේ කාලයට අයත් ශිලාලිපියෙහි පෙනෙන වචන තුනෙකි. මෙයින් ශෂ්‍යකරන වාරතුනක් අදහස් කරනලදැයි කියති. පිටදඩහස යන්නෙන් මාස්කාලයෙහි ශෂ්‍යයත් අකලහස යන්නෙන් යල්කාලයෙහි ශෂ්‍යයත් මදෙහස යන්නෙන් එකී දෙකාලට අතර කාලයෙහි ශෂ්‍යයත් ගතයුතුයයි කියනත් එයට නිදසුන් නැත්තේය. මාස්මෝසමට පිටදඩ නාමය යෙදුනු බවට කිසිම නිදසුනක් සොයාගත නොහැකිය. එසේම ලංකාවේ කුඹුරු සාමාන්‍යයෙන් තෙවරක් වැපුරූ බවටද නිදසුන් ඉතා අඩුය. කාරුණු මෙසේ හෙයින් උතුමැදි පැසි යනා කුඹුරු විශේෂත්‍රය මෙයින් අදහස් කළා වන්නට පුළුවනැයිද අපට සිතේ. ඉස්සර ලංකාවේ ඉඩම්-විශේෂයෙන් කුඹුරු භාරප්‍රමාණය අනුව තෙකොටසකට බෙදා තිබුණේය. ඒ භාගකොටසින් බදු ගැනීමෙහි වෙනස්කම් ඇතිවිය. පිටදඩ යන නාම දඩ ශබ්දය කර්මාන්ත භූමිය කියයි. පිටදඩය නම් පැයි කුඹුරු නමින් හැඳින්වෙන අසාර පිට්ටනි කුඹුරුය. අකල ශබ්දය අකාල ශබ්දයෙන් මෙන්ම අගාර ශබ්දයෙනුත් ආහැකි හෙයින් මඩ බහුල එරෙන කුඹුරු එනමින් අදහස් කළා විය හැකිය. ඒවා ඉතා සාරවත් විය. මෙකී කුඹුරුවගී දෙකට අතරේ තිබුනු සාරත්වයෙන් මධ්‍යම කුඹුරු මදෙ කුඹුරුය. ඒ පිටදඩ, අකල, මදෙ, යන කොටුදෑරුම් කුඹුරුවල ශෂ්‍ය පිට දඩහස,

අහලුහස මදෙහස තමුන් එසින් ගත් පොලිය පිට දඩහස වෙබ අහලුහස වෙස් මදෙහස වෙස තමුන් විය. මෙය නවත් සොයා බැලිය යුත්තක් බව කියමු.

---

## 8. වන වග

## වී වර්ග

1 අකුරම්බඩවී
2 අඟුරුළු
3 අතකුරු
4 අසුරම්බඩ
5 ඇත්හෝරුවී
6 ඇත්දෙවරැද්දිරි
7 ඇස්මාහැල්ල
8 ඇදඇල්
9 ඇදිගම්
10 ඇදිගම් ඇල්
11 ඇඹලඇල්
12 ඉඳඇල්
13 ඉදිපස් ඇල්
14 ඉලං (සාලි) සැලි
15 ඉලංගමවිටන්
16 ඉලංගුකොච්චල්
17 උඩරටමාවී
18 උඟරුවී
19 උඟරුඇල්
20 ඒජන්තවී
21 කච්චිපොට
22 කඹුරුඇල්
23 කම්බිලිවී
24 කරයල්
25 කරෝපු
26 කලම්බුඇල්
27 කවුඹුඇල්
28 කහඇල්
29 කහව
30 කහටඇල්
31 කහටකුණ්ඩ
32 කහටම්බා
33 කහටමා
34 කහටහත්දිරම්
35 කහටපත්ඇල්
36 කහමා
37 කහරමනා
38 කළුවී
39 අළුඇල්
40 කළුකැදවී
41 කළුතරඇල්
42 කළුකුණ්ඩ
43 කළුකුන්දන්
44 කළුකුමාර
45 කළුකුරු
46 කළුකොත්විල

47 කළුකොස්ඇට
48 කළුදෑනහලා
49 කළුදූරු
50 කළුපත්කැටි
51 කළුබෝරඇල්
52 කළුමා
53 කළුමාණික්කන්
54 කළුමූරුංගා
55 කළුවිරලුඇල්
56 කළුහන්දිරම්
57 කළුහීනටි
58 කළුවැලිවී
59 කැලිඇල්
60 කිතුල්කොටඇල්
61 කිතුල්පත්
62 කිතුල්පත්ඇල්
63 කිරිකාර
64 කිරිකුණ්ඩ
65 කිරිකුඹ
66 කිරිකුරුම්බ
67 කිරිකුරුම්බඇල්
68 කිරිනාරන්
69 කිරිබරුඇල්
70 කුඩාකරලිනා
71 කුදුඇල්
72 කුරු
73 කුරුමා
74 කුරුවිපත්ඇල්
75 කුරුලුඇල්
76 කුරුලුහුඹු
77 කුරුලුපිහාටු
78 කොච්චිනාරන්
79 කොච්චියාරන්
80 කොස්ඇල්
81 කොත්තමල්ලි
82 කොමඩුඇල්
83 කොරසෝරියාව
84 කොලො
85 කොහු
86 කොහුමා
87 කොහුදෙමැරැද්දිරි
88 කොහුහොරණමාල
89 ගතකුඹුඇල්
90 ගම්බොඩහිකැටි
91 ගල්පා
92 ගල්බඩඇල්
93 ගල්බඩකැලි
94 ගල්හොරණමාල
95 ගාලුසුලැති
96 ගිනිමා
97 ගිනිරත්ත
98 ගිරාකුඹුඇල්
99 ගිරාපත්ඇල්
100 ගිරාකුරුම්බ
101 ගිරිස්
102 ගුරුළුඇල්
103 ගොඩමා
104 ගොඩහොරණවාලු
105 තටුඇල්
106 තඹුපත්ඇල්
107 තනඇල්
108 තඹලිංගම්ඇල්
109 තනමල්ඇල්
110 තඹාලු

11 තැල්
12 තිසලාහැලි
13 තුලුංග
14 තුලුනුඇල්
15 දඹුමාර
16 දම්පොට
17 දළුදෑවී
18 දැක්
19 දික්
19 දෙත
20 දෙල්පත්ඇල්
21 දෙමරුද්දිරි
22 දෙහිලින්පත්ඇල්
23 දෙවරාජඇල්
24 දෙළුම්ඇල්
25 දෙවටුඇල්
26 දෙදුඇල්
27 දෙදුබටුමාඇල්
28 නාත්බුදිග
29 නාත්බුසුදු
30 නලාඇල්
31 නලාහැලි
32 නලංමල්හැලි
33 නාරන්ඇලි
34 නැහුතැටි
35 නිවුඹුරම
36 නුගපත් ඇල්
37 පකිරිපතත්
38 පත්ඇල්
39 පතු
30 පන්තැටි
141 පතාන්හැලියන්
142 පයසුරු
143 පලාඇල්
144 පාලසිදුරි
145 පින්තඇල්
146 පිහිඇල්
147 පියාඇල්
148 පිසුම්ඇල්
149 පුවක්මල්ඇල්
150 පුස්පසම්බා
151 පිතාටු
152 පුලුක්සම්බත්
153 පුවාලු
154 පෙලැල්
155 පොටැස්
156 පොහි
157 පොහිකුඹර
158 පොහිකුරුවිපත්ඇල්
159 පොහිරට
160 පොහිසායං
161 පොහිහාතිලි
162 පොහිහිතැටි
163 පොත්ඇල්
164 පොලිස්කොටයල්
165 පොල්ඇල්
166 පොල
167 පොසොන්ඇල්
168 බටුඇල්
169 බටුකිරිඇල්
170 බටුදැල්
171 බරපොත්ඇලි
172 බරුඇල්
173 බරුකොටමන්
174 බාලමා

175 බාලමිපත්ඇලි
176 බාලරත්කුණ්ඩ
177 බළල්වාන
178 බඩඇල්
179 බඩකිරිඇල්
180 බඩතවාලු
181 බඩහිනැටි
182 බාලකාර
183 බෙලිකාඟ
184 මදුරුකලුවී
185 මලමරියන්
186 මලවාරිය
187 මහඇටි (ඉසුරුමුණි සන්නස)
188 මහකරලිනා
189 මහකළු
190 මහකළුදුරු
191 මහකිරියල්
192 මහකුරු
193 මහදැවී
194 මහදික්කි
195 මහනාරන්
196 මහදෙවරැද්දිරි
197 මහමා
198 මහමුක්තැස්
199 මහහොරණෑවාල
200 මාවී
201 මාඇල්
202 මාඇලි
203 මාකරවී
204 මාදෙල්වී
205 මාදෙලුවා
206 මාපත්ඇල්
207 මාලමාරියන්
208 මිපත්ඇල්
209 මිප්ඇල්
210 මිපත්හැලි
211 මුඩුහැල්
212 මුක්තැස්
213 මුතුකිරිඇල්
214 මුතුසම්බ
215 මුදලිවී
216 මුප්පංගං
217 මුරුංගා
218 මුරුනා
219 මුලරතුවී
220 මුහන්දිරම්වී
221 මුදුකිරිඇල්
222 මුහලඇල්
223 මේසවී
224 මොනරඇල්
225 මොලගසම්බ
226 මෝපත්ඇල්
227 රටඇල්
228 රටදෙවරැද්දිරි
229 රත්ඇල්
230 රත්කරඇල්
231 රත්කරමා
232 රත්කුණ්ඩ
233 රත්කුණ්ඩමා
234 රත්තවුඇල්
235 රත්කුම්බ
236 රත්නදුමා
237 රත්පත්ඇල්
238 රත්පත්ඇලි

239 රත්හන්දිරම්
240 රතුමා
241 රතුමාණික්කන්
242 රතුවීපත්ඇල්
243 රතුහාතිලි
244 රත්දල්
245 රදූඇල්
246 රාජඇල්
247 රායතාඇල්
248 රාමතඇල්
249 රුවන්ඇල්
250 ලේතඇල්
251 ලොමඩුඇල්
252 වගුඇල්
253 වටුමාඇල්
254 වතුහාන්දෙවි
255 වඳුරුහැල්
256 වැලිහන්දිරම්
257 මෙල්ලොක්කිරම්
258 මෙහොළු
259 සක්කුණ්ඩඇල්
260 සමන්ඇල්
261 සැවැන්තමහතේරු
262 සාතිඇල්
263 සිගෙයැදූවීර්
264 සිඹුරුවී
265 සියදූඇල්
266 සුදුඇල්
267 සුදුකිරිඇල්
268 සුදුකුමාර
269 සුදුකොට්ටියාරම්
270 සුදුහොන්විල්
271 සුදුකොස්ඇට
272 සුදුදූතඇල්
273 සුදුදුරු
274 සුදුපොඩිඇල්
275 සුදුපන්නැටි
276 සුදුමඩඇල්
277 සුදුමලවරියන්
278 සුදුමා
279 සුදුමීපත්ඇල්
280 සුදුමාණික්කන්
281 සුදුමුත්තැස්
282 සුදුමුරුංගා
283 සුදුහන්දිරම්
284 සුදුහාතිලි
285 සුදුහැල්
286 සුදුසිනැටි
287 සුරුමතියන්
288 සුලයි
289 සුලුමීජ
290 සුවඳඇල්
291 සුවන්දිරම්
292 සූරසම්බ
293 හතියල්
294 හන්දිරම්
295 හන්පින්ඇල්
296 හපුදෙව
297 හම්බා
298 හාල්
299 හාල්ඇල්
300 හාල්ඇලි
301 හාවිඇල්
302 හාතිලි

303 හාල්ඇළිය
304 හාල්සුදු
305 හාලිසුදුඇල්
306 හැටද
307 හැටපදුරුවී
308 හිඟුල්ඇල්
309 හීනැටි
310 හීන්ඇල්
311 හීන්දික්කි
312 හීන්කාරබ්ඇල්
313 හුනු
314 හොරණමාලු

වී පිළිබඳ මේ නාම මාලාව වූකලී පැරණි ලියවිලි කීපයකුත් ව්‍යවහාරයත් ඇසුරු කොට සපයන ලදී. එහෙත් ලංකාවේ වී වර්ග සියල්ලම මේ ලේඛනයට අයත් යයි නොසිතිය යුතුය. මෙතරම් වී වර්ග සංඛ්‍යාවක් තිබීමෙන් තේරුම්ගත යුතු ප්‍රධාන කාරණය නම් ලංකාවේ වී ගොවිතැන කොතරම් සමෘද්ධව කොතරම් ව්‍යාප්තව තිබුණේද යන බවයි. වැවුණු පෙදෙස, ප්‍රචාරය කළ පුද්ගලයා, වීයේ වර්ණය, සාදෘශ්‍යය, වැපිරිය යුතු කාලය, වීයේ ප්‍රමාණය, ගෙනා ප්‍රදේශය, රසය යනාදී කරුණු නිමිති කොට වීවලට නම් වැටුන බව සාමාන්‍ය යෙන් පෙනේ. ඉලංකාලි, ඉලංගමට්ටල්, ඉලංකොට්ටල් යනාදී නම් සැලකිල්ලට භාජන කළ යුතුය. මේ රටේ පදිංචි යට ආ උතුරු ඉන්දියානු ආර්යයනුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩයනුත් ඉන්දියාවට ගිය සිංහලයනුත් මෙහි බෝ කරන්නට නොයෙක් වී වර්ග ගෙනෙන්නට ඇත. ඒවාත් මේ රටේ තිබුණු වී වර්ගත් සමග මිශ්‍රවූ නමුත් විදෙශීය නාම එසේම පැවැත්තේය. ඉලංකාලි ආදී වී වර්ග ලංකාවේම ඇතිවූ ඒවා බැව් පෙනෙතත් නාම ද්‍රවිඩාශ්‍රයෙන් ඇති විය. ඒ වී වර්ග මේ රටින් ඉන්දියාවට ගෙන ගොස් පසුව ඉන්දියා වෙන් මේ රටට ගෙන ඊමේ විපාකයක් විය හැකිය. තමලිංගම් ඇල් තාම්‍රලිංගම් ප්‍රදේශයෙනුත් දෙලුවා කණ්ඨ යෙනුත් තච්චිපොට මාණික්කන් ආනවාලු යනාදී වී වර්ග බොහොමයක් දකුණු ඉන්දියාවෙනුත් ගෙනෙන්නට ඇත. මාතර කොට්ටියාරම් ගල්පා යනාදී වී වර්ග එකී ප්‍රදේශවලින් විහිදී ගියා විය හැකිය. මෙහි පෙනෙන ගල්පාය වනාහි පල්ලෙබැද්ද නම් ග්‍රාමයෙහි පිහිටි ශංඛපාල විහාරයට නුදුරුව පෙනෙන විශාල වනයෙහි.

එය පැරණි ගොඩනැගිලි වලට අයත් තාන් අයුරු සුන් බුන් වලින් ගහනව පවතී. පෙර ඉතා සමෘධව පැවැති මේ ප්‍රදේශයෙන් මේ වී වර්ගය පැතිරී ගියේ යයි සිතනු යුක්ති සහිතය. දෙවරැද්දිරි යනු "දෙවරාජවිරීහී" ශබ්දය සම්බන්ධ උච්චාරණ විශෙෂයෙකි. දැනට මාතර පළාතේ මල්වාරන් නමින් ව්‍යවහාරයට ගොස් තිබෙන්නේ පැරණි මාලවරීයන් වී මැයි. හීන්දික් වී මහදික් වී යනුව හීන්දික්කි සහ මහදික්කි විය. සුරුමණියන් වූයේ සිරුමණිකාන් ශබ්දයයි. සිරු සුරු යන දෙ ශබ්දයම කුඩා අර්ථය කියයි. ඉහත කී වී වර්ග අතුරෙන් සමහර ඒවා කුඹුරුවලත් සමහර ඒවා හේන් වලත් වපුරන ලදී. එසේම සමහර වී වර්ග පැලකොටත් සමහර වර්ග නොපැල කොටත් ඉසින බැව් දනිමු. පැල නොකොට ඉසින වී වැස්සට අසුවුවොත් පැලවෙයි. වැසි නොලැබුනොත් වදවෙයි. ඉස්සර නියම කාලයට වැසි වැටුණු හෙයින් හේන් පාලු වී ගියේ කලාතුරකිනි. ඉන්දියාවේ සමහරුන්ට භූතයන්ගෙනුත් වැසි වසින නොවසින කාලයන් දත හැකි විය. කාලි රෙකබිතියගේ කථාව එයට නිදසුනි. ශාක්‍ය කෝලිය දෙරට වැසියන්ගේ යුද්ධයෙන් පෙනීයන්නේ වතුර කොතරම් අගයකොට සැලකුවාහුද යන බවයි. ලංකාව සම්බන්ධයෙනුත් මේ කරුණු මෙසේම ය.

---

## 9 වන වග

# කෘෂිකර්ම නිලධාරීන් සහ සේවකයෝ

ඈත අතීතයෙහිත් ඉන්දියාව ලංකාව ආදී පෙරදිග රටවල කෘෂිකර්මය සඳහාම වෙන්වූ නිලධාරි මණ්ඩලයක් සිටියේය. එහෙත් මෙකී කෘෂිකර්මය යන්නෙන් කුඹුරු ගොවිතැන පමණක් නොව සියලුම ගොවිතැන් ජාති අදහස්

කරනු ලැබේ. කෘෂිකර්මය පිළිබඳ ප්‍රධාන ඇමැතිවරයා ඒ කාලයෙහි "සීතාධ්‍යක්ෂ" නමින් හඳුන්වනු ලැබීය. කෙතෙහි කළ සියලු කටයුතු මේ "සීතා" ශබ්දයෙන් කියැවෙන බැව් සැලකිය යුතුයි. සීතාධ්‍යක්ෂ පිළිබඳ වැඩි විස්තර කෞටිල්‍ය නීතියෙහි 24 වන අධ්‍යාය බැලීමෙන් දතහැකිය. අපේ ඉතිහාසයෙහි හෝ අන්‍ය ග්‍රන්ථයක කෘෂිකර්ම නිලධාරීන් ගැන සැලකියයුතු විස්තරයක් නොපෙනේ. මධ්‍යකාලීන ශිලා ලිපි කීපයක පමණක් කෘෂිකර්ම නිලධාරීන් කීප දෙනෙකුන් ගැන සටහන්ව තිබීම ඉතා ප්‍රයෝජනවත්ය. මෙතැන් සිට ඔවුන් සම්බන්ධයෙන් කෙටි විස්තරයක් ලියම්හ.

**ආකාමුදලා**— ඉඩම් හිමියා වෙනුවෙන් ඔහුගේ ගොවිතැන් පිළිබඳ කටයුතු සොයා බලන්නා ආකාමුදලාය. පසෙක්කාරයා යනුත් මොහුටම නමි. ඇස්ලදවුකාරයා ආකාමුදලාද හි සොයන්නා. ආකාමුද බාලයන් ගැනත් සිතිය යුතුය.

**අනතරංගඇමැති**— දෙලොස්වන සියවසේදී ආණ්ඩු ක්‍රමය මෙන්ම කෘෂිකර්මයත් අලුත් පණක් ලද්දේය. මීට ඉහතින් ලඞ්කාවේ නොතිබුණේ යයි සිතිය හැකි අනතරංග ඇමැති ධුරය ඇතිවූයේ එහෙයිනි. සමුද්‍රතීර (මුහුදුබඩ) රට, රත්නාකර (සබරගමු) රට, මලය රට සහ තද්න්‍ය රටවලක් සාරවත් පෙදෙස් වෙන් කොට ඒවා අනතරබඟ ඇමැතියාගේ පාලනයට යටත් කරන ලදී. හේ ඒ සියලු තැන් මැනවින් වගා කොළේය. කොටුසර යනාදිය එසේ වෙන්කළ සාර තැන් හැටියට සලකනු යුතුයි සඝිතය. අනතරබඟ ඇමැතියා යටතේ පාලනය වූයේ වීගොවිතැන පමණක් නොවේ. අනෙක් ගොවිතැනුත් ඔහු යටතේම පාලනය විය.

**අමුණෙරාල**— දියාලුනිලමේගේ දෙවැන්නා මේය. මොහු විසින් අමුණ ආරක්‍ෂා කරන ලදී.

**අමුණුමහේරාල**— අමුණේ ජලප්‍රමාණය පරීක්‍ෂා කිරීම මොහුගේ විශේෂ රාජකාර්ය වී යයි කියති. අමුණු මෙහෙයෙහි රාල අමුණු මහේරාල නමි.

**කාංකාණම**— රාජකීය මුත්තෙට්ටුවල අද අස්වනු ගෙනාවුත් අටුකැංවීමක් මුත්තෙට්ටුවලට වතුර බැඳීමත් මොහුගේ රාජකාරිය විය.

**කෝට්ඨාසෙ රාළහාමි**— එක්තරා නියමිත කුඹුරු ප්‍රමාණයක අංකඩුවට අයත් වී එකතුකොට අංකඩුවට භාර දීම මොහු විසින් කරවන ලදී.

**කොළදින්රාළ**— ගොයම් කපන අවස්ථාවේදී අංකඩුව වෙනුවෙන් මේ රාළ පෙනී සිටියි. පාගනු සඳහා කමතට ගොයම් බාන්නාත් මේ නාමයෙන් හැඳින්වේ.

**කොළවෙල්ලු**— කොළවෙලිවල නියුක්තයෝ කොළ වෙල්ලු නමිහ. වගාකළ ඉඩම් කොළවෙල් ඉඩම් නමින් හඳුන්වනු ලැබේ. එහෙත් මෙංතවා වගාකළ ඉඩම් කොළවෙල් ඉඩම්ද යනු තවත් සොයා බැලිය යුතුය. ගලපාත ලිපියෙහි සහ අමාවතුරෙහි පෙනෙන වාක්‍ය කීපයක් මේ කාරණය තේරුම් ගැනීමෙහි ලා තරමක් ප්‍රයෝජනවත් විය හැකි හෙයින් ඒ වාක්‍ය කීපය මෙහි බහාලම්හ. **1. කුඹුලුපත් ඇල්ල ඇතුළුවූ තැන කුඹුරු හා මෙහි සොල් පුවක් ඇතුළුවූ කොළවෙල් අය කුසලාන් කොට, 2. නම් සම්පිහින්දුවූ පොල්වතු භාගයෙහි විහි මහසිම් කොට ගම් අතුරෙහි කොළවෙල් හා මෙහි බඳ කුඹුරු හා** (ගලපාත ලිපිය) **3. "යම් කෙනෙක කොළ බිජු කෙනෙක් නැගී වැඩැ විපුලවන්නාහු . . . ."** (අමාවතුර, මහානාම 139) කොළවෙල් වනාහි වගාකළ ගොඩ ඉඩමක් බැව් ගලපාත ලිපි පාඨයන්ගෙන් පෙනේ. අමාවතුරු පාඨයෙහි එන කොළ යනුව "වපුළ" කියා සමහරු වෙනස් කෙරෙති. පැපිලියාන විහාරයට කොළවෙල්ලු දෙදොළොස් දෙනෙක් සිටියහ. විහාර සන්තක ගොඩ ඉඩම් වගා කිරීමෙහි නියුක්ත පිරිසකැයි හැඟේ.

**ගම්බාරෙ**— මෙතෙම වනාහි ගොවියාටත් ඉඩම් හිමියාටත් අතර සිටියි. ඉඩම් හිමියාගෙන් ඉඩම් බාරගෙන

ගොවීන් ලවා ඒවා වගා කරවා වගාවෙන් කොටස ගැනීම මොහුගේ සිරිතය. ගොවියාගේ සතුරෙක්වූ මෙතෙම වහාම ඉවත්කළ යුත්තෙකි. තිසසමහාරාම පළාතේ නම් ගොවීන්ට හිස ඔසොවන්නට නොදෙන්නා මේය.

**ගොවිකිල සහ ගොවිදූන්**— මේ දේවතා දේවිකාවන් ගැන ගලපාත පැපිලියාන යන ලේඛනයන්හි සටහන් වන්නේය. විහාරය සතු කුඹුරු සහ හේන් වගාකළ ගොවියන් සහ ඔවුන්ගේ භාර්යාවන් මේ දෙනමින් අදහස් කළා වන්නට පුළුවන. පැපිලියානා විහාරයට ගොවිකිල සහ ගොවිදූන් විසිදෙනෙක් සිටියෝය.

**දියබෙදන්නා**— එක අමුණකින් කුඹුරු කීපයකට වතුර බෙදා දියයුතු අවස්ථාව පැමිණි විට දිය බෙදන්නා ඉදිරිපත් වෙයි. එක කුඹුරකට හෝ කුඹුරු යායකට දියයුතු දිය ප්‍රමාණය දුන්විට ඒ ද්වාරය වසා ඉතිරි කුඹුරුවලට දිය වදින ද්වාරය විවර කෙරෙයි. වතුර හිඟ කාලවලදී මොහුට බිහිසුනු අවස්ථාවනට මුහුණ පාන්නට සිදුවන්නේය.

**දියාළුකිලමේ**— මේ නිලධාරියා ගැන අසන්නට ලැබෙන්නේ වන්නියෙනි. කුඹුරුවලට දිය සපයන්නා හෙවත් නොනතිකයා දියාළුවා නමි. හේ වනාහි දියබෙදන්නාවන් කීපයකට අධිපතියා වෙයි. දිය බෙදන්නන් තරහා අනට යුතු ආදිය ගොවියෝ ඔහුට පැමිණිලි කෙරෙති. හේ ඒවා විභාගකර බලා සුදුසු ලෙස දඬුවමුත් පමුණුවයි.

**නිලකාරයෝ**— මහගබඩාවට අයත් මුත්තෙට්ටු වැසූරු වාහු මොවුහුය. ගම්කාරයෝ යනු නිලකාර ශබ්දයෙහි අර්ථය වේ.

**පැහිඳුන්රාළ**— අඹුවෙන් ගෙන යන ආහාර වර්ග පැහිඳුම් නමින් දන්නා ලැබේ. ආණ්ඩුවේ කුඹුරු පිළිබඳ කටයුතු සඳහා එන උසස් නිලධාරින්ට පැහිඳුම් සපයන්නා පැහිඳුම් රාළ නමැයි සළකනමග. (සහාධක-පැහිඳුන්)

බඩගෑලමයා— මහවාසල ධාන්‍ය ගබඩාව බඩගැල නම්. එහි සේවකයෝ බඩගැලමයෝ නමිත.

මනන්නා— මනන්නෝ බොහෝ වූහ. ගමේ මනන්නා, වලව්වේ මනන්නා, වාහල මනන්නා යනාදී වශයෙනි. බදු වශයෙන් ගෙනෙන ධාන්‍ය ගබඩා කිරීමේදී මැන බලන්නෝ මොවුහුය. "ද්‍රෝණ මාපක මහා මඩුව" නාමයෙන් ආගමික ග්‍රන්ථයන්හි පෙනෙන්නේ මේ මනන්නන්ගේ නායක ඇමැතියා විය යුතුය. රාජ්‍යය සතු සෑම ගබඩාවල්වලම තිබෙන ධාන්‍ය ප්‍රමාණය සේ හොඳින් දනිති.

මද්දනාරාළ— ගොයම් මැඩවීමෙහිත් ශාස්ත්‍රයක් තිබේ. එයට විරුද්ධව ක්‍රියාකළ විට නිසියේ කරලින් ඇට නොගැළවෙයි. එබැවින් එයටත් පළපුරුදු කාරයෙක් සොයාගත යුතුය. මද්දනාරාළ නම් හේය.

රජ්ජුගාහකයෝ— කුඹුරු බෙදා වෙන්කරන මිනින්දෝරුවරු මොවුහුය. මොවුහු කෙත් පමණක් නොව අනෙක් ඉඩමුත් බෙදූහ. එහෙත් වැඩි වශයෙන් කෙත් බෙදූ හෙයින් ඔවුන්ට කෙත්බෙදන්නෝ යන නාමයත් යෙදේ. යටුවම්ගසන්නෝ, ඇහැන්ගසන්නෝ, යනුත් නාමාන්තරයි. ඔවුන්ගේ ප්‍රධානයා යටුවම්ගසන ඇමැතියා ය. "යව ශ ක්ෂෙත්‍රයක් බෙදන්නූයේ" යනු ජාතක ගැටපද පාඨයි. (කුරුධම් ජාතකය බලනු.)

වටම්ගෑනු— මහවාසල, වලව්ව, දේවාලය, විහාරය යනාදී තන්හි වී කොටූ ස්ත්‍රීහු වටම් ගෑනුය. මිහින්තලා ලිපියෙහි "වටම්නි" නමින් හඳුන්වනු ලැබුවාහුත් මොවුහු මැයි.

විහාරදෑම— රාජකීය මුත්තෙට්ටුවලට වතුර සපයන අමුණු බැඳවීම, ඇළවල් ශුද්ධකරවීම, මුත්තෙට්ටුවල අස්වනු පරීක්ෂාකොට ගණන් ලියා තැබීම සමහරවිට අස්වනු කොටූ ලෑබීම යනාදී නඩත්තු කාර්‍යම විහාරෑමගේ රාජකාරිය විය.

ශ්‍රීපාද නිලධාරීන් අතරත් විකාරුමෙක් සිටියේය. පැරණි ලේඛනයන්හි "වෑදෑරුම්" නමින්ද මෙතෙම හඳුන්වන ලදී. විචාරණය කරන්නා යනු ශබ්දාර්ථයි.

විදානෙ— බෑලූ බැල්මට නම් විහාරුමක් විදානෙත් අතර වෙනසක් නැත්තාසේ පෙනේ. එහෙත් විදානෙ වනාහි විහාරුමට වඩා වැඩිසිටි නිලධාරියෙකි. ඉස්සර විදානෙතාම ඉතා සැලකියයුතු තනතුරක්ව තිබුණේය. ඇළ අමුණු බැඳවීම, ඇළවල් ශුද්ධකරවීම, මිනිසුන් පාරවල් වශයෙන් පාවිච්චි කරන ලොකු වේලි බඳිනු සඳහා ඒ ඒ ගොවීන්ට බෙදාදීම, කුඹුරු සම්බන්ධයෙන් ඇතිවන සුළු ආරාවුල් සංසිඳුවා ගොවීන්ට යුක්තිය ඉටුකරවා දීම, වරද කරන ගොවීන් නීතියට අසුකරදීම, හවුල් කාරයන් කීප දෙනකුන් සිටින කුඹුරු නිසි පරිදි බෙදාදීම, ආලෝපාලු නාස්තේරු කිරීම යනාදී කුදු මහත් කටයුතු රාශියක් විදානේ කෙනකුන් විසින් පාලනය කරන ලදී. ඉදින් ලොකු වේල්ලක් බැඳීමට හෝ ඇළක් ශුද්ධ කිරීමට හෝ තිබේනම් එය බඹ වශයෙන් මැන, එක එක ගොවියාට වැටෙන කොටස ගොවියාගේ නමත් සමග කඩදාසියක සලකුණු කොට, ලී නැබෙල්ලක සවිකොට නියමිත තැන සිටුවා තැබීමටද විදානේ වගබලාගත යුතුය. උඩුව ආදී සමහර පෙදෙස්වල ගම්රාළ නමින් හැඳින්වෙන්නාත් වෙල් විදානෙ කෙනෙකුට අයත් වැඩ කෙරෙයි. කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදීත් හේ ප්‍රමුඛ වන්නේය. මේ සේවය සඳහා සමහර විදානවරුන්ට කුඹුරුවල ඇළපත් සහ කුරුළුපාලු අයත් විය. ඇතැම්විට ඒවා වගාකරදීමත් ගොවීන් පිටම පැවැරෙන්නේය. විදානෙට ලැබෙන ප්‍රධාන කොටස "සලාරිස්" නමින් ප්‍රසිද්ධය. සමහරවිට හේම හුවන්දිරමුත් අය කෙරෙයි. කෙසේ නමුත් කුඹුරේ අස්වනුවලින් සියයට එකක් විදානේට අයත්ය.

මාතර පළාතේ මා දූනුකිටිය වෙල් විදානෙලා අතුරෙන් වැඩිකරිය ජීව වඩා උසස් මූලාදෑනීන්ගේ නියම දෑගෙයිය.

**විබද්දෙ ආරච්චි**— ආණ්ඩුවට අයත් වී බද්ද අයකිරීමාදිය මොහුගේ මෙහෙය විය. ගම්, කෝරළ, දිස්ත්‍රික්ක වශයෙනුත් ඔවුහු සිටියෝය. වී බදු වසම වනාහි මුදලි මුහන්දිරම් ලේකම්, විදානෙ ආරච්චි, කංකානම් යන නිලධාරීන් සමූහයකින් සැදීගත් එකකි.

**වෙලෑයුක් සස්දෙනා**— මේ වචනය මින්නේරි ලිපිය ආදී මධ්‍ය කාලීන ලිපි කීපයකම දක්නා ලැබේ. කුඹුරු කාර්යයෙහි නියුක්ත පස්දෙනා යනු අර්ථයි. මේ කාලයෙහි ලංකාවේ කොමිටි ක්‍රමය පැවැති බැව් පෙනේ. ගම්හි යුක් අවදෙනා අඩවියෑ යුක් අවදෙනා යනාදී විසින් අවදෙනාගේ කොමිටි ගැන සුප්‍රසිද්ධ බදුලු ලිපියෙහි සටහන් වෙයි. ලංකාවේ කොමිටි ක්‍රමයට ඉන්දියානු කොමිටි ක්‍රමය ගුරුවී යයි සිතන්නටද ඉඩ තිබේ. කළුණිවාරියම්, සංවත්සරවාරියම් එරිවාරියම්, ඌර්වාරියම්, ගණවාරියම්, මණ්රාඩිවාරියම් යනු ඉන්දියානු කොමිටි කීපයක නම්වේ. මෙහිලා වාරියම් ශබ්දයෙන් සභාව අදහස් කරනු ලැබේ. කළුණිවාරියම නම් වගාකළ ඉඩම් පාලනයෙහි නියුක්ත සභාවෙකි.

**වෙල්කෑමි**— කුඹුරු වගාකරන්නන් ලවා නිසිපරිදි ඒ කටයුතු කරවූවෝ වෙල්කෑමියෝය. මිහින්තලාලිපිය කීප වරක් කියවීමෙන් කෑමි ශබ්දයාගේ අර්ථය තේරුම්ගත හැකිය. ලෙකම්, කාර්මිකයන් ලවා වැඩකරවන්නා හෙවත් කංකාණම් යන අර්ථයෙහි එය වැටේ.

**වෙල් වැසි**— ගොවිපළේම නැවති සිටගෙන ඒවා වගා කළ ගොවිජනයා මෙයින් අදහස් කළා වන්නට පුළුවනැයි සිතිය හැකි වුවත් බුඩන්නෙහෙල ශිලා ලිපියෙහි "වෙල් වැස්සන් නොවද්නා ඉසා" යන පාඨය එයට තරමක් බාධකව සිටී. කාන්තාරුගම්හි වෙට්‍යස කිරීමට නොවද්නා සේ අණ ලැබූ අයගෙන් වෙල් වැස්සෝද කොටසෙකි. ගෙදරුවන් වැසි, කමිතැන්වැසි, වෙඩෙසර්වැසි, වෙද්හල්වැසි යන ශබ්දයන් සමඟ සමකාර බැලීමේදී වෙල්වැසියා ගොවියාමද

යන සැකය උපදනේය. කරුණු මෙසේ හෙයින් හුඹුරු පිළිබඳ සැලැකියයුතු සේවකයෙක් වෙල්වැස්සා නම් වියයි සිතමු.

**වෙල්බැදි**— මෙද සිව්වන කාසුබ් රජුගේ මොරගොඩ ලිපියෙහි එන ශබ්දයෙකි. එහෙත් එහි සම්පූර්ණ තේරුම නවමත් සැඟවී තිබේ. වෙල්බද්දෙහි නියුක්තකා වූවෝ වෙල්බැදියෝයයි සිතන්නට අවකාශ ඇත්තේය.

**සැරහුන්රාළ**— සිතියම් ඇඳ කමත් සරසනු පැරණි සිරිති. නාගදරණය, සස්මුල්ල, වංගගිරිය, අඹමගලා, ඉසාළළාස්මගලා යනු එයින් කීපයෙකි. සිතියම් ඇඳීම නැමදෙනා විසින් නොකළ හැකි හෙයින් ඒ සඳහා සිටිය පළපුරුදු කාරයා සැරහුන් රාළ නමින් දන්නා ලදී.

**සාරාමාරුවේ සම්බා පණ්ඩුවේ නිලධාරීහු**— මහ වාසලේ දිනපතා වියදම පිණිස සම්බා හාල් සම්පාදනය සඳහා වෙනමම කායයි මණ්ඩලයෙක් විය. ඒ වනාහී ලේකම්, මුදලි, මුහන්දිරම්, ආරච්චිල, ගම්රාළ, කංකාණම, විදානෙ, දුරයා යන නිලධාරීන්ගෙන් යුක්තවූ බැව් පෙනේ. මේ සම්බා පනිවිඩේ නිලධාරීන්ගේ වෙනසක් ඇතිවූවොත් ඒ වෙනුවෙන් කටයුතු කරනු සඳහා පත්කරනු ලැබ සිටිය නිලධාරීහු සාරමාරුවේ සම්බා පසින්ඩේ නිලධාරීහු නම වෙති. නුවර කාලයෙහි පමණ ලියැවුනු බොහෝ ලියවිලි වලැ මේ සාරාමාරු ශබ්දය දක්නා ලැබේ. 1. "මෙක්කට සාරාමාරුවක් රාජකාරියක් නැතිව නිරවුල් ලෙස ප්‍රයෝජන ගැනීමට" 2. "සාරාමාරුනැතිව ප්‍රවේණි සැලැස්මට" යනු එබඳු තැන් දෙපළකි. මෙයින් පෙනෙනුයේ අනිසපිර – මාරුවීම යන අඩියන් සලකා සාරාමාරු ශබ්දය යෙදූබවය. "හුඩමාරු" ශබ්දය සමග සාරාමාරු ශබ්දය කොතරම් දුරට ගැළපී සිටීදැයි සොයනුත් සුදුසුය.

# 10 වන වග

# ධාන්‍යමාන විධි

ධාන්‍යමානය, කිරීමෙන් සහ මැනීමෙන් සිදුකරන ලදී. කිරුම් ක්‍රමය වැඩියෙන් එනුයේ වෛද්‍යශාස්ත්‍රයෙහිය. මිනුමෙන් නොයෙක් අවස්ථා තිබුන නමුත් පතට වඩා කුඩා මැනීම් සම්බන්ධයෙන් යමක් කීම අපේ අදහස නොවේ. ලංකාවේ ධාන්‍යමාන ක්‍රමය නොයෙක් දෙශාන්තර ක්‍රමයන් හා මුසුව පවත්නා හෙයින් ඒ පිළිබඳ නියම තීරණයකට බැස ගැනීමක් සමහරවිට ඉතා දුෂ්කර වන්නේය. මතු කියවෙන මාන විධීන් සම්බන්ධයෙනුත් එසේම කියයුතුය.

අඩමනාව— මේ වනාහි මිහින්තලා ලිපිය ආදී මධ්‍ය කාලීන ලිපි කීපයකම වාගේ දක්නා ලැබෙන වචනයෙකි. එහෙත් එහි අර්ථය තවමත් නොපැහැදිලිය. අඩමනාව වූකලී අඩක් අධිකකොට ඇති මනාවද නැතහොත් මනාවෙන් අඩක්ද යනුත් සම්පූර්ණයෙන් වටහාගත නොහැකිය. නමුත් මාකෂයන් අර්ථය අඩ මනාව යයි සලකනු වඩාත් සුදුසු සේ පෙනේ. දැන් ශබ්දය යෙදී තිබෙන තැන් කීපයක් දක්වාලීම මැනවැයි සිතේ. 1. "සාල් සැළියක් මනාවකටත් පිදකිදි නැත." (සද්ධර්මරත්නාවලී ජයතිලක 740 පිට) 2. ආළ්හකමත්තං මනාවක් මතු (ධම්පියා අටුවා සන්‍ය 237 පිට) 3. ආළ්හකමත්තං දෙනැළියක් පමණ වූවාහු-දෙමනහ පමණඑව් (ජා: ගැටපද ජයතිලක, 99) 4. "මානකානිහි අට්ඨන්නං නාළීනං නාමං, චතුන්නං අඩ්ඪමානං" (ජාතකපාළි හේ. වි. 392) 5. "අපගේ ගෙයි වරා මනාවක් හා උදලු කොටියක් ඇත." (සද්ධර්මරත්නාවලී ජය තිලක 281) 6. අඩ්ඪනාළිමත්තං "අඩනැළියක් මතු-දෙ අඩමනාක්මතුයැයි සේයි" (ධම්පියා අටුවා සන්‍යය 100) 7. උළුහැඳක් පිසම් නම් මනාම මනංව දෙවේලනට ඇත. (ස. රත්නාවලී 778) මේ සියල්ල විමසා බලන විට, සද්ධර්ම-රත්නාවලිකාරයන් සේරු බාගයද, ජාතක ගැටපද කාරයන්

සේරුවද, ධම්පියා අටුවා සන්‍යකාරයන් නැළි ඒකාහමාරද මනාංව වශයෙන් පිළිගත් බැව් පෙනේ. මේ පැටලිල්ලට හේතුවී තිබෙන්නේ නාළි, ආළ්හක යන දෙශබ්දය සම්බන්ධයෙන් ඇතිවූ මතභෙදයයි හැඟේ. සමහරුන් නාළි ශබ්දයට නැළිය (සේරුව) කියාත් ආළ්හක ශබ්දයට කුරුණිය කියාත් අර්ථ කීයද්දී තවත් සමහරු නාළි ශබ්දයට කුරුණිය කියාත් ආළ්හක ශබ්දයට සේරුව කියාත් අර්ථ කීහ. අපි සිව් නැළිය අඩමනාව යයි කියමින.

අම්මණ— "එකා දසදෝණා තු අම්මණං," යි නිඝණ්ඩුයෙහි කී හෙයින් එකොළොස් ද්‍රෝණයක් අම්මණක් නම් වන්නේය. එවිට අම්මණකට කුරුණි සුසාළිසකි. දැන් සමහර පළාත්වල කුරුණි 64 කුත් තවත් සමහර පළාත්හි කුරුණි 48 කුත් අම්මණ මෙන් සලකත්. අම්මණ (බැටිය) මරුව, බාල්දිය යන අර්ථයන්හිත් අම්මණ ශබ්දය වැටෙයි.

අවලිය— මෙයින් කාල හෙවත් හුණ්ඩුව කියැවෙන බැව් පෙනේ. පත, උලක්කුව, පාදය, කුඩුබ, මානිකා, අඤ්ජලි යනුත් අවලිය කියනා නාමයෝය.

කිරිය— හෙළයෙහි කිරි ශබ්ද දෙකක් තිබේ. එකක් ඛාරි ශබ්දයෙනුත් අනෙක කරීස ශබ්දයෙනුත් ආයේය. ඛාරි ශබ්දයෙන් ආ කිරි ශබ්දය අම්මණක් කරීස ශබ්දයෙන් ආ කිරි ශබ්දය සිවු අම්මණක වපසරියක් කියයි.

කුම්භය— දස අම්මණක් කුම්භයෙකි.

කුරුණිය— සමහර පළාතක සේරු තුනක්ද සමහර පළාත සේරු හතරක්ද කුරුණි එකක් හැටියට සලකනු ලැබේ. කුරුණි සඳ දෙමළ බසට තක් සමවේ.

ගණ්ලාස්ස— මේ වකාහී සුප්‍රසිද්ධ බදුලු ලිපියෙහි එන වචනයෙකි. "ගණ්ලහස්සෙන් මිසැ සෙසු ලහසියෙන් නොමනනු ඉසා" යනු එහි පෙනෙණනා පරිදියි. ගණ ශබ්ද ඉයකී හොනෙක් අර්ථ ඇතත් මෙහිලා එයින් ගම් යනාමු

අඳුගස් කරන ලදැයි සිතේ. ඉන්දියාවෙයිත් ගණමාපියමක් තිබුණේය. ගණය හෙවත් ගම් සභාව විසින් සම්මත කරන ලද ලාස්ස ගණලාස්ස නමැයි කාරණය පැහැදිලි වනතුරු අපි සලකම්හ.

කුන්කාල— ප්‍රසිද්ධය. මුන්කාල යනුත් මෙයටම නමි. මුන්කාල වූයේ මුන්රුකාල් යනුව මැයි.

ද්‍රෝණය— සිවුකුරුණිය ද්‍රෝණය නමි. සේරු කොළොසකි.

නැළිය— පත හතරක් නැළි එකකි. මගධ නැළිය, දෙමළ නැළිය, සිංහල නැළියයි තුන් නැළියක් ගැන ටීකෝ පිටකයෙහි සඳහන් වෙයි. මගධ නැළියට පලම් තෙළෙස සැයි අඩක අටුවාහි කී බව සමන්තපාසාදිකාහි එයි. දෙමළ නැළිය කුඩා එකක්ලු, මගධ නැළියෙන් නැළි එකක මාරක් සිංහල නැළි එකකැයි මහ අටුවාහි එන බව සමන්ත පාසාදිකාව කියයි. එවිට සිංහල නැළියකට පලම් දහතුනය කමාරක් විත්තේය. පාලියෙහි "කුඩුව" නාමයෙන් නැළිය කැඳින්වේ. පාරාජිකා පාලියෙහි මනාවත් හඳුන්වයි. (අරියවංස 236)

පත— මුලින් කී අවිලියටම නමෙකි. "පසත" ශබ්දයෙන් ආයේය.

පැස— "ද්විසද්දපිටකං" යනුවට වී පැසක්, සි ධම්පියා අටුවා සන්නයෙහි අර්ථ කියනලදී. පැස යනුව පච්ඡි ශබ්දයෙන් ආයේය. මේ අර්ථයෙහිම යෙදුන පැළ ශබ්දයකුදු හෙළුයෙහි ඉතා ප්‍රසිද්ධය. එය පිටක ශබ්දයෙන් ආවෙකි. (පිටක > පෙසකඩ > පෙයළ > පයළ > පැළ) යනු ආක්‍රමය වේ. මාතර පළාතේ වී කුරුණි දෙළොසෙක් පැළ නමි. තවත් සමහර පළාත්වලැ දස කුරුණිය පැළ නමින් හැඳින් වේ.

තුඹ— පාලි නිඝණ්ඩුයෙයි "ආළ්හකානිච්චියං තුම්බො" කිද විසුද්ධිමග්ග ටීකායෙහි "තුම්බො නාම ආළ්හකං" කිද

ජාතක අටුවාහි "චතසොවනාලිමයො තුමෙබානාම" යිදු කී හෙයින් තිඹ යනු කුරුණියටම නමෙකි. තුම්බ ශබ්දයෙන් සම්මය තෙල් බඳුන, ජල ප්‍රණාලිකාව යනා අර්ථ ගනුදු කියවේ.

භණ්ඩාරනැළිය— නුවර කාලයෙහි පමණ ලියවුණු බොහෝ ලිපිවල මේ වචනය දක්නා ලැබේ. මාළිගාවේ සහ සමහර පන්සල්වලත් තිබුන නැළි විශේෂයකට මේ නමි. රාජකීය නැළිය යනු අර්ථය සේ පෙනේ. භණ්ඩාර අටුව යනාදිය සමගත් සමකාර බලනු.

මල්ල — මාතර පළාතේ දෙළොස් කුරුණියේ (පැලෙහි) මල්ල සොළොස් කුරුණියේ (මානිකාවේ) මල්ල යයි වී මලු දෙවගෙකි.

බිළාලපාදය— මේ වනාහි මැති වගයෙන් මෙවැනි ග්‍රන්ථයන්හි එන ප්‍රමාණ වාචක ශබ්දයෙකි. එහෙත් ඉඳහිට ධාන්‍ය ප්‍රමාණයකුත් මෙයින් කියැවෙන හෙයින් මෙහි සඳහන් කොළෙමු. ඇඟිලි තුනට ගන්නට පුළුවන් ධාන්‍ය ප්‍රමාණය බිළාල පාදය වෙයි.

බුසල— කුරුණි හතක් බුසල් එකකි.

බෙරය— කුරුණි හයක් බෙර එකකි.

මනාව— අඩමනාව බලනු. යේරු බාගය මනාව නමි.

මානිකාව— සිව් මඩුණයක් හෙවත් කුරුණි සොළසක් එක් මානිකාවෙකි.

යාළ— විසි අමුණක් යාළ නමි. සකට යනු ශාලිකාමයයි. එයින් ආ "සකට" ශබ්දය තෝනිගල දෙමළ ලිපියෙහි පෙනේ. එහෙම යාළ කියා සැනැසෙන්නට පුළුවන. (සකට > සගළ > යගළ > යාළ) යනු ආ ක්‍රමය මේ කල්පනා කෙරෙයි. භාජනවාචක යලා ශබ්දයක් මිහින්තලා ලිපියෙහි දක්නා ලැබේ. "ඛාෂ" යනුත් යාළටම නමි.

**ලාස්ස**— ජාතක අටුවා ගැටපදයෙහි (අසම්පදාන ජාතක) පාලි ශබ්දයක් ලාසු ශබ්දයක් ඒකාර්ථයයි යොදා තිබේ. අනෙක් සෑම ග්‍රන්ථයකම වාගේ නැළි සතරකට ලාස්ස යයි කියන ලදී. එබැවින් ජාතක ගැටපද කර්තෘවරයාගේ කථාව නොපිළිගත හැකිය. මෙහිදී විශේෂ සැලකිල්ලට භාජනකළ යුත්තේ මෙය නොව ලාස්සත් කුරුණියත් දෙකම එකක්මද යන බවය. දැන් ව්‍යවහාරය අනුව නම් එසේය. පැරණි ව්‍යවහාරයෙහි හැටියට නම් සිව්ලාස්සෙක් කුරුණියක් වෙයි. එවිට කුරිණි යනුත් ද්‍රෝණයටම නමෙකි. රූපසිද්ධි සන්නයෙහි (ධම්මරතන 169 පිට) විද්‍රෝණන යනුවට ද්‍රෝණවයකින් හෙවත් අටලාස්සෙකැයි කියන ලද දෙකුරුණියක් දී, යි අර්ථ කියන ලදී. මෙය පරීක්ෂා කළයුතු තැනෙකි. අඩමනා හතරේ ලාස්ස නමිනුත් ලාස්සක් තිබුණේය.

**වරයාල**— මෙද ජේතවන ලිපියෙහි එන ධාන්‍ය ප්‍රමාණයෙකි. යාල ශබ්දයෙන් කුරුණිය අදහස් කරන ලදැයි සිතේ. යාලගොප්යා යනු නමින් බිස අනුව කුරුණියටම නමි. ආණ්ඩුවේ කුරුණිය හෙවත් ආණ්ඩුව විසින් සම්මත කළ කුරුණිය වරයාල යයි සැකකළ හැකිය. නොයෙක්වා.

**තිස්බර**— මේ වචනය වැඩිවශයෙන් දක්නා ලැබෙන්නේ ශ්‍රීපාද ලේඛනම් මිටියේය. වරකට තිසින් ගෙන යා හැකි සාමාන්‍ය බර ප්‍රමාණය තිස් බර නමි.

## මාන භාජන

පත,(හුන්ඩුව) මනාව, නැළිය (සේරුව) ලාස්ස, කුරුණිය, බෙරය, පැළ, බුසල යනු විසින් මාන භාජනක් කීපයක් තිබුණේය. ලාස්ස වනාහි ලීයෙන් කැනූ පැහැලි බඳුන් විසෙසකි. නුවර කවුතෙහි ලාස්සක් තිබේ. සවරූපයෙන බුරුම පාත්‍ර පියනකට තරමක් හුරුය. පිටිසර පළාත්වල මැටියෙන් සාදන ගිනි සාබල හැම අතින්ම ලාස්සට සමානය.

කුරුණිය වනාහී මැල්වලින් ගොතා හෝ ලීවලින් ලියවා හෝ සාදනු ලබන තම්මැට්ටමට හුරු භාණ්ඩයෙකි. තම්මැට්ටමේ කම බැඳ තිබෙන්නේ තම්මැට්ටම් කුරුණියේය. මං දුටු බෙරයක් මැල්වලින් වියූවකි. "මිකානි හුම දුකබාණි ඥදමණ්ඩි සිවකොසීච" යි පෙතවත්ථුප්පකරණයෙහි පෙනෙන හෙයින් පිටකයකුත් තිබුන බව සිතාගත හැකිය. දම්පියා අටුවා ගැටපදයෙහි පැස යයි කියේත් පිටකයට මැයි. පිටකය ලොකු කූඩයක් විය හැකිය. පිටකයක් මට දකින්නට නොලැබුණේය. බාරිය (අමුණ) කූත් තිබුනා විය හැකි වුවද එයට පෙන්විය හැකි නිදසුන් සුලභ නොවේ.

---

# 11. වන වග

## ගොඩ ගොවිතැන

හෙළයා මඩ ගොවිතැනෙහි මෙන්ම ගොඩ ගොවිතැනෙහිත් දක්ෂයෙකි. ඔහුගේ ඒ දක්ෂතාම වරක් ජාතික විමුක්තිය පිණිස පැමැත්තේය. ගොඩ ගොවිතැන කරනු ලද්දේ හේන්වල බව අපි දනිමු. හේනක් එක්වරක් වගා කළ පසු යළිත් ඒ හේන වගාවකට සුදුසු වන්නේ පස්වසක් වත් ගිය පසුය. එබැවින් සිංහල ගොවියෙකුට යටත් පිරිසෙයින් බිම් අක්කර පසක්වත් උවමනාය. මේ හේන්වල වැඩී වශයෙන් වපුරන ලද්දනු ගෝනබරු, සුවඳැල්, කිකිලිඇල්, කුදු ඇල්, හින්බිබිලි ඇල්, දහයැල්, පොලිස් කොටයල් යනාදී වී වර්ගයෝය. සාමාන්‍යයෙන් මඩ කුඹුරු තිබූ පළාත්වල මේ ගොවිතැන කළ නමුත් කුඹුරු බහුල පෙදෙස්හි හේන්වල කාවූසර හෝග වපුරන ලදී. ඒවා පිළිබඳ විස්තරයක් පසුව එන්නේය. මෙසේ ගොවියාගේ ශ්‍රම ශක්තියෙන් ජාතියක් යැපෙද්දී මෙහි අං තෙමත සතුරු ජාතිය වන ඉංග්‍රීසිනු මුඩු බිම් පණත නමින් වචනයෙන් විස්තර නොකළ හැකි තරම් අසාධාරණ අමනුෂ්‍ය නීතියක් පණවා සිංහල ගොවීන්-

යේ ඉඩකඩම් විශාල රාජසන්තක කොට සුද්දන්ට විකුණා දැම්මෝය. මෙසේ සිංහල ගොවියාගේ හේන පමණක් නොව ගෙපැල සාදාගෙන සිටිය කුඩා ඉඩම් කෑබැල්ලත් තේ රබර් වලින් වැසීයත්ම ගේ කුඹුරු කෑබැල්ල ගොඩකර ගෙපැල සාදාගත්තෝය. මෙසේ ජාතික ජීවිතය අඩපණ විය. ආර්ථික තත්ත්වයෙන් හොඳටම පහත වැටුණු ජාතියකින් සදාචාරයක් බලාපොරොත්තු නොවිය යුතුය. අපේ ජාතික විපතේ මුල ජාතික ගොවිජීවිතය කඩාකප්පල්කර දැමීම බැව් රහසක් නොවේ. නිදහස් ආණ්ඩුවේ ප්‍රතිකාරය උවමනා කරන රෝගය තිබෙන්නේ මෙතන බැව් ඒ ආණ්ඩුව තරමක් අවබෝධකරගත් සේ පෙනේ.

හේන් ශබ්දය සහ හේන් වර්ග— හේන යනුව ඡේදන ශබ්දයෙන් ආ සියන සදින් නිපදුනේ යයි සමහරු කියති. එසේ නම් හේන විය යුත්තේ පියස්සය. හේන යනු "සානු" ශබ්දයෙන් ආයේ යයි ගත් විට එවැනි දෝෂයෙක් ඉතා ලංවේ. මල්ඔට, ගොඩමල්ඔට යනුත් හේනටම නම්. දෙමළ "වෙනා" ශබ්දයත් අපේ හේන් ශබ්දයෙන්ම සෑදුනෙකි. හේන්වලත් ප්‍රභේද කීපයක් තිබුනේය. මෙතැන් සිට ඒ පිළිබඳ ලුහුඬු විස්තරයක් ලියනු ලැබේ.

අත්දෙඬුඹා හේන්— මේ හේන් වනීය හතර කෝරළයේ ඇත්තේය. හේනක් සාමාන්‍ය අත් දණ්ඩක් පමණ මහතැති ගස්වලින් ගැවැසී ගත් විට ඒ හේනට අත්දඬු (අත්දෙඬු) හේනයයි නම් පළාත්වාසීහු කියති. අරමින් දෙලුව දෙලුගල යනාදී නම්හි තිබෙන දෙලු ශබ්දය ගැනත් සිතා බැලිය යුතුය. දලුවම (=තෙරාගිය කෑබැල්ල) දෙලු වන්නට පුළුවන.

ඇසැල හේන්— මේවා ඌව පළාතේ බෙහෙවින් තිබේ. හේනට මේ නාමය යෙදුනේ එහි වගාකළ බටු මිරිස් ආදිය තොලාගත් ඉක්කිතිය. ඇසැල නම් පැලෑටි විශේෂය බහුල කොට ඇති හේන්වලටත් ඒ නාමය යෙදිය හැකි

වුවත් එල රහිත හේන ඇපැල (අඵල) හේන යයි ගැනී මෙහිත් වරදෙක් නොපෙනේ.

**ඝානකු—** ගොඩමඩවල තැනින් තැන තිබෙන කුඩා පැලැට්වලින් යුක්ත ඉඩම් කැබැලි වලට මේ නම් ඝානකු යනුම "ඝාණකාණක" ශබ්දයෙන් ආගැසී වුවත් කතාට් ශබ්දය හා එහි සම්බන්ධය පෙනේ. එය මුලින් විස්තර කෙළෙමු.

**නවදිලි හේන්—** ඇසළ නිකිණි මාස්වලදී ගුඩාකොට මස් ඉල්වලදී කුරක්කන් වපුරන හේන්වර්ගය නවදිලි නම්. මේ උඩරට පැවැති සිරිත වුවද මාතර පළාතේ නම් වැඩි වශයෙන් කුරක්කන් වපුරන්නේ බිණර කාළමරවය. හේන් ගිනිලා වැඩිකල් නොයාදී වපුරන හෙයින් නාමය අනුරූපය. නවදිලිවූයේ නවදලි යන්න යැයි.

**මූකලන් හේන්—** කපු, කුරක්කන්, මිරිස් ආදී මිශ්‍ර භෝග වගා කරන හේන් වර්ගයෙකි. කුරක්කන් සහ මිරිස් වෙන්කර ගත් පසු කපුගස කුරක්කන් ඉපනැල්ලේ පොහොරත් ලැබ නාදින් වැඩෙන්නේය. මෝරාගිය වනයට අපි මූකලාන යයි කියමු. (මුහුකළ + වන) යනුම මූකලාන විය. "ආයතන" ශබ්දයෙන් ආ ආන ශබ්දයකුත් ධම්පියා අටුවා සන්නයෙහි එයි. (ආයතන > ආයයන > ආයන > ආන) යනු ආක්‍රමයයි. මූකලාන ශබ්දයෙහි තිබෙන "මූ" යනුම මුහු ශබ්දයෙන් වුවත් ආගැකිය. එවිට මිහ කැලෑව යන අර්ථය එයින් ලැබේ. වලාන ශබ්දය බලාගෙන කැලෑන ශබ්දයකුත් නිපදවා ගත්තා විය හැකිය. එය මූ ශබ්දය සමග යෝගයෙන් කලාන බවට පත්විය. එහෙත් මෙහි ලැබෙන මූකල ශබ්දය ඒ දෙඅර්ථයෙහිම නොව මිශ්‍රාර්ථයෙහිම යෙදුනේයයි සිතනු යුක්ති සහිත සේ පෙනේ. මිශ්‍ර භෝග වගාකළ හේන යනු අර්ථයි. සෙවිය යුතුයි.

**බිසර හේන්—** මේ හේන්වල වෙසක් පොසොන්වලදී මිනේරි වපුරා ඇසළ නිකිනිවලදී ඒවා කපා ගන්නාබවක්

ඉක්බිති බිණරමල දී නැවතත් කුරහන් වපුරන බවත් කියති. කියර ශබ්දයේ නිෂ්පත්තිය අපට අවිනිශ්චිතය. ගාල්ලේ කියාර නමින් පෙදෙසක් තිබෙන බව නම් දනිමු.

කවක් හේන් වගී— වපුරන ධාන්‍යයේ හැටියට ද හේන් වගී බෙදී තිබුන බැව් පෙනේ. කුඹුරු සම්බන්ධයෙනුත් කාරණය එසේය. "අමුයන" (අමු වපුරන හේන) යනු එබඳු නාමයෙකි. මුං වපුරන බිම මුගයින මුවාක් මෙනි.

කාවුසර භෝග— ඉහතකී හේන්වල ඇල්වී වගී වලටත් වඩා උඳු, මුං, තල, කොල්ලු, කුරක්කන්, මිනේරි, තන, අමු, ඉරිඟු, යව, තිරිඟු, මෑ, හීන්තන, මාරතු යනාදී කාවුසර භෝග වගීත් බතල මඤ්ඤොක්කා ආදී අල වගීන් වගා කරන ලදී. ලංකාවේ උඳු වගාව අනෙක් කාවුසර වගාවන් පැරණි දැයි මාස් පෙනේ. ලාංකේය ගොවියා කොතරම් උඳු වගා කෙළේද යනු මාගසිර (දෙසැම්බර්-ජනවාරි) මාසය උඳුවප් නමින් ව්‍යවහාරයට යෑමෙන්ම පෙනේ. මේ වගීය ආහාරයක් වශයෙන් ශරීරයට ඉතා හිතවත් හෙයින්ම නිපදවීමත් දියුණු විය. "උඳු මද මඩසි, ගුරුය, විට්බෙහෙව, වා නසයි, උෂ්ණ වීර්යයි ඇත්තේය." යනු යෝගාර්ණව පායයි. මාතර පළාතේ තලපට කැඳ උඳු හොද්ද මහත්වන විටත් රස දෙනේ. සිංහල ජාතිය ශක්ති සම්පන්න කරන්නට නම් නැවතත් උඳු පාවිච්චිය ඔවුන්ට පුරුදු කළ යුතුය.

අමු— වැදගත් ධාන්‍ය විශේෂයක් නොවේ. කෑමත් මත් කරන සුලුය. බෙහෙනිත් අම්හිරි රසයෙක් ඇත්තේය. සාමාන්‍ය ශබ්දයෙන් අමු, හී ආහැකිය. බොඩහමු ඇ විසින් එහි ප්‍රභේද තිබුනේය.

අමුදරණය— අමු වපුරන කාලයට ගොවීන් කියන නාමයෙකි. වප්මසට පසළොස් දිනකට හෝ මසකට ප්‍රථම යෙන් අමුදරණය එයි.

ඉරිඟු— රසවත් ශක්ති සම්පන්න ආහාරයෙකි. ආහාර විද්‍යායෙන් කීප ක්‍රමයකටම සකස්කරනු ලැබේ,

**කුරහන්**— කුරක්කන් යනුත් නමි. දෙශබඳයම දෙමළෙන් ආයේය. මහකුරහන්, ගල්මොර, බාලකිරි යි කුරක්කනෙහි තුන් කොටසෙකි. මහකුරහනට හෙවත් දඬු කුරහනට සමසකුත් ගල්මොරවලට සිව් මසකුත් බාලකිරි වලට තෙමසකුත් ගතවෙතැයි ගොවියෝ කියත්. මාතර පළාතේ නම් කුරක්කන් මපුරනුගේ බිණර කාළවරටය. බත හැරුණුවිට සිංහලයාගේ ප්‍රධාන ආහාරය කුරක්කන් බැව් අපි දනිමු. ආහාරයක් මෙන්ම දියවැඩියා ආදී රොගයන්ට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වශයෙනුත් කුරහනේ අගය ඉතා බෙහෙවි. තලප පිට්ටු යන දෙවර්ගය කුරක්කනෙන් හදන ආහාර අතර ප්‍රමුඛස්ථානය ගනී. තලප ආහාරයට ගන්නේ ගුලි වශයෙනි. ඒවාට මාතර පළාතේ සන්නිවශ්‍රෂාමේ ගුලියයිද කියත්. හොද්ද හොඳ වුනු තරමට මැඩ විත්ද හැකිය. පිට්ටුව බාගත් පසු ජටාවක් සහිත ද්‍රවිඩයෙකුගේ ඔලුවක් මෙන් පෙනේ. බලමාලු, පොල්, මීකිරි ආදිය සමග අනුභව කෙරෙති. මාරතු (මහරතු) නමින් තවත් ධාන්‍ය විශෙෂයක් විය. කැඳට ඉතා ප්‍රසිද්ධය. මිනේරි වැදගත් ආහාරයක් නොවන හෙයිනුත් පිළියෙළ කිරීම දුෂ්කර හෙයිනුත් සිංහල ගොවියෝ එයට එතරම් ආදරයක් නොදක්වති. පාණ බෙහෙතක් වශයෙන් උතුම් කොට සලකාත්. නොයෙක් අමාරුවලට පාණ කැඳ ප්‍රසිද්ධ ඖෂධයෙකි. "එයා මල්‍රාට මොකොද තණ හාලේ කැඳත් දුන්නා" යනු ඒ නිසාම ඇතිවූ පිරුළෙකි. තවත් නොයෙක් ධාන්‍ය වර්ගයන් සම්බන්ධයෙන් කියයුතු දේ ඇතත් ග්‍රන්ථබාහුල්‍ය භීතියෙන් මෙහින් නවත්වම්හ.

**හේන් රැකා දෙන්නෙක්**— හැඩයා හෙවත් හැඩකිරි අප්පා නැමැති යකෙක් හේන් රකින්නේ යයි සමහර පළාත් වල විශ්වාසයක් තිබේ. හේ පිටරැටියන්ට කරදර කරන් තෙක්ලු. එහෙත් පුදදී යාලු කරගත් විට හේන් රැකා දෙන හොඳ මිත්‍රයෙක්ලු.

මෙසේ පෝත් ගොවිතැනින් සිංහලයා ධාන්‍ය, අලවර්ග, දූරු, මිරිස්, අබ ආදී කුළු බඩු යන මේවා ලබාගෙන ආහාරය සඳහා නිසිවෙනුවන් අත නොපා දෙසවරිව විදූ තමුන් අද ඔහුට සිදුවී තිබෙන්නේ උපකාරිතර අතීත ශිෂ්ටාචාරයක් ඇතිව සිටි - අනෙක් කිසිම ජාතියකට සිදු නොවූ කරම දේය. මෙයට ප්‍රතිකාර් යොදනොහැක් සිංහලය හඳුනන්නන් විසින් සිංහලයෙන්ම සෙවිය යුතුය. මෙතෙක් ඉංග්‍රීසියෙන් ගෙන්ව සෑම ප්‍රතිකර්මයකින්ම විෂම ඵල ලැබුන හෙයිනි.

## ගොවිබස

ගොවිබස පළාත් අනුව මෙනස් වෙයි. සමන් දෙවියන්ගේ රටේදී මෙන්ම තොට්දීත් කාට වරද්ද හැනි මෙන් අතිෂට ඵල ඇතිවන්නේයයි ගොවීහු සලකති. ගොවීන් විසින් පරපුරෙන් පරපුරට පවත්වාගෙන එන ගොවි බසෙහි සමහරවිට ඉතා අගනා වාග් ව්‍යවහාරයෝ දක්නා ලැබෙති. කවි සම්බන්ධයෙනුත් එසේම කිය යුතුය. පාළි සංස්කෘතාදියෙන් නොබිඳී ආ- මේ දිවයිනේම නිපන් සිංහල වචන ගොවි බසෙහි බහුලව ලැබේ. පිදුරුකාවෙට, කාලූම, පෙහ, යනාදී වචන නිපයක් දෙමළු මුහුණුවරින් යුක්තය. උගත් පී. බී. කොතෙහල්ගමුවේ මහතා විසින් කලකට පෙර සිළුමිණ අතිරේකයකට සපයනලද තොයිමල් ගොවි බස මාතෘකාකොන්විත ලිපියක් මේ කොටස සකස් කිරීමෙහි ලා අපට අතිශයින් ඉවහල්වූ බව කෘතඥතා පූර්වකව ප්‍රකාශ කරමු. සමහර වචන පත්‍රයේ තිබුන හැටියටම ලියූ හෙයින වැරදි තිබෙන්නටත් පුළුවන.

අකවකාවා– තාදකාරකාවා
ආක්කිසොල– ජාවරෙන් පලුඹිකොටම දෙවියන්ට මතීන කුරුණිය
අහලකුම– යරකාගේ අංවල බඳින ලනුව
අගස්– අක්කිසාල බලපු
අකුරන්නා– පැදුර

අතුල්පත- කුඩා මට්ටි විශේෂයක්

අතුල්පත්පෙට්ටිය- බත් කෑමට පාවිච්චි කරන පෙට්ටි විශේෂයක්

අතුවැල- කරල් පැසෙන තැන්වලට අදින ලනුවක්

අගාවත- දුක්කලහ

අත්දඬුකෙබිය- අත්දණ්ඩ

අක්දන්තලේ- වේල්ලේ අංශය

අඹයා- මිනිහා

අඹරාදූත්ත- වේලි විශේෂයක්

අප්පිඹිලැල්ල- කුරුල්ලන් එළවීමට පාවිච්චි කරන උපකරණයක්

අමුතුපට්ටය- වියගහ කඟුලේ බඳින පට්ටය

අමුතුලනුව- වෙළුනොකැඩූ ලනුව

අරක්ගල- අරක්වලේ තබන රවුම් ගලක්

අරක්බෙල්ලා- අරක්වලේ තබන බෙල්ලෙක්

අරක්මුත්ත- ගල

අරක්වල- කමතේ ආරක්ෂාව සඳහා සාදන රවුම් වළක්

අරටිය- පිට්ටාව

අලුවඩනවා- අලුවලින් කමතේ සිතියම් අඳිනවා

අම්බරුවෝ- මිනුන්

අලුසාල්- අලුත්සාල්

අවුල්බිඳීම- මඩවන ගොයම් ඇදීම

අස්වැන්න- වී

අහබඩ- අද්දර

අලුහන්- අලුවලින් වීගොඩේ කරන අත්සන

ආගිරිගහනවා- කරක් කැගහනවා

ඇටතාලුවගහනවා- වී ඇට තරක්වී තාලුවණියක් ඇතිවෙනවා

ඇතුල්කාන්ද- කලවිට ඇතුළේ කොටස

ඇස්පෙනවා- පැලවෙනවා

ඇහිපෙට්ටිය- පැලමුල් තබන පෙට්ටිය

ඇහුපැටිකා- සම්මාන්ය

ඇඳුන්න– එකට ඇඳු හරක් ජෝඩුව
ඇඳනවා– හරක් එකට ගළපනවා
ඉපැනැල්ල– කරල් කපාගත් ගොයමේ ඉතිරිවන හරිය
ඉපැල්බානවා– ඉපලෙන් ගහනවා
ඉදිකටුමෙනවා– ඉදිකටුවක් සේ ඉතා සියුම්ව පැලය නික්–
මෙනවා
ඉඳේ– හරකුන්ට අමතන පදයක්
ඉස්ගෙඩියෝ– හරක්
ඉස්තාන් කදවෙනවා– වතුර මදිවෙනවා
ඉහඳසී– අතිසි
ඉංවේල්ල– සීමාවේල්ල
ඉඹදනවා– වීකරල් තැම්බෙනවා
උකුණුගහ– පිදුරු ඉවත්කරණ උපකරණයක්
උකුණුතැල්ල– උකුණුගහේ අගට යොදන යකඩ ඵල
උඩාවත– ලියද්දේ උඩපැත්ත
උදලුතැල්ල– උදලුතලේ
උදලුසාය– උදැල්ලේ මිට සවිකරන තැන
එක්අමුතුව– ලනුපිල බඳින පට්ටය
එලවිස්සා– සුදුවස්සා
ඕරංකරනවා– රවනවා
ඕපස දානවා– කෑගසනවා
ඔහෝ– ඇළු ළග
කටුසන්මල්ල– ගෝනිය
කඩාඹු– වේල්ලේ කැඩිගිය තැන්
කඳුවැඩීම– පිදුරු කන්දක්සේ ගොඩගැසීම
කඳේගහනවා– වීකරල් ලියන ගහනවා
කනුතැපෙනවා– වී ඇටේ පැලය මෝදුවෙන කොණේ
පොත්ත පැලෙනවා
කන්දත්ත– පිදුරු සහ කරල් ගොඩ ගැසූ තැන
කන්ද මාරු කිරීම– වැඹුනු පිදුරු සහ නොවැඹුනු පිදුරු
වෙන් කිරීම
කමල්– බත්

කපාදූත්ත– දූත්ත සෑස බැඳීම
කමත්මෝල්කඩ– කමතට කරකුන් ගන්නා මාරය
කමත් වහල්කඩ– එම
කම්මුතුවැත්ත– කම්මුතු වැඩය
කාය්‍ය– කායසීය
කරකොටේ– කරකුන්ගේ කමර් එල්ලන ලී කැබැල්ලක්
කරාත– අන්තිම
කරනගිනවා– කරමහත්වෙනවා
කරබැඳීම– කරට කර බැඳීම
කරවැත්ත ඇල්ලීම– වැණි කරල් කාලවිට වඩේ තැබීම
කරවියගෑම– ප්‍රථමයෙන් කරකුන්ගේ කමර් වියගහ ගෑම
කැරලිවැල්– වකපෝරු
කරල්කඩ– කරලේ ඉතිරිවන වී
කරුඅදේ– කවුලේ ගත් කොටස– දෙදෙනෙකුගේ අයිතිය
කාලවිටි පැල– කාලවිටේ සාදන පැල
කලාතෙ– ගොයම් ගොඩේ බැවුම
කහඇඟිලි ගහ– අරක්වලේ තබන ඇඟිලි කහකින් යුත් කහ කෑල්ල
කාටුව– කුඩා පිදුරු කැබැලි
කීරට නැමෙනවා– වී ඇටේ කිරි පිරී ගොයම් ගස නැමෙනවා
කිරිවදිනවා– තරමක් මෝරනවා
කුඩුබෝය– පැල
කිරිවන්ගොයම– කිරිවැදුන ගොයම
කුරුපස්දමනවා– කරක් බිම පහුරුගානවා
කොළය– ගොයම් කොළකැටිය
කොළදීක්ගහනවා– ගොයම් පාගනවා
කොළදීම– ගොයම් කැපීම සහ ඇදීම
කොටාබානවා– කනවා
කොළ බැඳීම– කමතට ගෙනයනු පිණිස ගොයම් බැඳීම
කොළ වැඩ– ගොයම් වැඩ
කොළ මැත්ත– වියෙන් පිදුරු වෙන් කිරීම
කොළබෙරිය– කමතේ පිදුරු ඉවත් කිරීම

කොළම්පිය- ගොයම් මිටිය
කොළඳඬනවා- ප්‍රථමයෙන් කමතේ ගොයම් තබනවා
කොළතුරැල්ල- ගොයම් තුරැල්ල
කොළේ බේරනවා- පිදුරු අහක්කරනවා
කොළේ මුදුන් කරනවා- පිදුරු කඳු ගසනවා
කොහොඹ පෝරුව- අරක්වළේ තබන කොහොඹ ලීකෑල්ල
ගණුල- වතුර
ගණුලු බානවා- වැස්ස වසිනවා
ගල්තුබේ- ගල්ගොඩ
ගවතල්ලුවෙනවා- හරක් කුරවලට පොළොව තදවෙනවා
ගෙනිරින්නා- මැසි විශේෂයක්
ගෙවඩනවා- කටයුතු ආරම්භකරනවා- නැකැතට
ගොන් අග- හරක් අඟ- කමතේ හැඹීමට ගනිති
ගොන් පස්- හරක්බෙටි
ගොන් කෝටුව- කෙවිට
ගොම්සාලුවෙනවා- කිරිවැදී පැසෙනවා
ගොම්මෝල- කමතේ වතුර බැසයෑමට සාදන සිදුර
ගොන්පාඩිට- කමතේ වතුර බැසයන මාගීය
ගොයම් වටවෙනවා- ගොයම ලොකුවෙනවා
ගොයම් පොලු- කෝටු
ගොසිකම- බැත පිළිබඳ වැඩ
ගොසී පෝරුව- වී එකතුකරන ලෑල්ල නොහොත් කාකුල
ගොසිගානවා- ලියැදි සමතලා කරනවා
ජක- කෙළින් යනු
ගොසිලෑල්ල- ලියදි සමතලා කරන ලෑල්ල
තච්චුකෝය- කූඹි
තස්සෙක්- කුරැල්ලන් එලවීමේදී කගසන නාදයක්
තරකරනවා- ගලනවා
තොප්පුල- හරක් බඳින කණුව
තොළුන්දිරීම- තෙව්වුවීම
තොළුබෝ- අරක්වලේ තැබීමට ගනිති
දරුණාකටිය- කුඹා ලියද්ද

දූත්ත- වේල්ල
දූති ඇඹිම- වේල්ල තදකිරීම
දියමලන්කනවා- වැඩි වතුර නිසා ගොයම කොට්ටුවෙනවා
දියකාච්චිය- අමුඩලේන්සුව
දිය මාන්නය- දියගලා එන ස්ථානය
දෙපාවක්කඩ- ලොකු වක්කඩ
දෙපා ඇළි- ලොකු ඇළි
දෙමෝරුකනවා- වේල්ල තදකරනවා
දෙළුවෙනවා- කොටසක් පැසී කොටසක් නොපැසී තිබෙනවා
නාය- කඩාඩු යෑම
නැඹුල් ආරනවා- නැවතත් පැළ ගහනවා
පනිගුපෙරළීම- හොවූ කොටස වැසීම
පැහැ- පෙට්ටිය
පැලමුල්- වීපැලේ මුල්
පැලතිල්ල- පැලේ තිල්පාට
පැගීම- බොල් ඉවත්කිරීම
පැලමල- විපුරන ද හිටුවන පොල් හෝ පුවක් මල
පැළිසි වැටෙනවා- සමහර තැන් නොසැවී තිබෙනවා
පැලැගිගානවා- පැලැස්ස කොටනවා
පැළපොත- පැලබමට ගිය ගොයම
පාර්කනවා- නමයෝ නොනමන නිසා වී අල්ලනවා
පිදුරුවෙණිය- පිදුරු වැටිය
පිදුරු කන්ද- පිදුරුගොඩ
පිළිආන- හරකාගේ පිටිපස්ස
පිඩැලි ගහනවා- කොටිස් වශයෙන් කපනවා
පිටේලුම- දිනපතා හරකුන් ලවා සී සෑම
පිදුරු කට්ටෙ- පිදුරු මිටිය
පිපිගහ ඉහිනවා- නොපැලවුණු තැන්වල නැවත වී ඉසිනවා
පිට නාමත්වෙනවා- වී නාමයින් පිටතට වැටීම
පිටලෙ- පිට කොටස
පුරවන්නා- මල්ල
පූදිනවා- කරල් හටගන්නවා- කරල් බිහිවෙනවා

පූරාසිටීම– වැඩ පටන් ගැනීම
පුබ්බරුන්– බත්
පුබ්බරුන් සොටාබානවා– බත් කනවා
පුබ්බෝරුවා– බත් කොටස
පප්පැල– පේකරන ලද වී
පෝරු අත– පෝරුවේ ඉත
පෝරු ගානවා– පෝරුවෙන් කුඹුර සමකරනවා
පෝයන් කරනවා– මරනවා
පොලු වැස්ස– ගොනුන් කරඅඹන උපකරණය
පොරය– වැඩේ
පෝරු වක්කඩ– පෝරුවෙන් කළ වක්කඩ
පෝරු ඇළ– පෝරුවෙන් සාදන ඇළ
පෝයන්වීම– හමයෑම
බරැ– වී සහිත ගොයම
බඩලෙ– යට කොටස
බඩවිට– අද්දර
බණ්ඩි– ගර්භනීවූ ගොයම
බහ– පහළට පලයන්
බරැ පතුල්ලීම– වී පෑගීම
බජ්ගම් බැඳීම– වියසිඳුරෙන් බැඳීම
බාන්ගැටේ– ලනු දෙකක් එකට ගැට ගැසූ ගැටය
බාක් වැල– වැල්වලින් ඇඹරූ ලනුව
බැත ගැපීම– වී මැනීමට පිරීම
බැත යාල්ලනවා– වී මනිනවා
බැත පෑහීම– වී බොල් වලින් වෙන්කරනවා
බැත අකුර– වී මැනීම
බිස්ස– පිදුරෙන් සෑදූ වී දමන බිස්ස
බුසේ– පිදුරෙන් සෑදූ වෙණිය
බුලත් කෙලුම– බුලත් දී කෙළීම
බුලත් දෙනවා– කාය්‍යට එනු පිණිස ආරාධනා කරනවා
බුලත් හුරුල්ල– බුලත් 40– බුලත් යොත්ත
බෝඹුරු අදිනවා– කාලවිට ගුඩ කරනවා

බෝගාව– කලඅත්ත
බෝසි– නැහැ
බෝල අත්ත– වී එකතු කරන ඉදල
බෝල තියනවා– කෑටුව අස්කරනවා
බෝලා– යකා
බෝසිගෙඩියෝ– ඝරක්
බොල් පහළ– බොල් පොලා ගත් වී
මරාල– රාශිය
මඟ– මාසය
මහරවුලා– පඹඅත්ත
මැඩිල්ල– කමතේ ගොයම් තබන ස්ථානය
මැඟැල්ලංබෝය– බොල්
මූරබදිනවා– වතුර බදිනවා
මුක්කා– අරක්වලේ තබන උපකරණයක්
මෝල්හම්බානවා– වී පොඩිවෙනවා
යකුණ්ඩ– අළු
යතුර– කුල්ල
යාය– කොටස– රාශිය
යැදුම– දෙවියන්ට යාච්ඤා කිරීම
යාන් කිරීම– නවාන් කිරීම
යාන්ලනවා– මනිනවා
යාන් වැන්න ඇතිකිරීම– කරල් එන පැත්තකට සිටිනසේ වැනීම
යාල්ලනවා– මනිනවා
යාව– ළඟ
යාල– ලඟ
යාල ගොය්යා– කුරුණිය
රත්තා– ගින්දර
රන්කරල– වී කරල
රාඩිකරනවා– මැඩුමන් ඉමක් කරනවා
රාළු– මහත්මයා
රැළ– සමූහය

රූනකාන්ද– වී ගොඩ කිරීම
රාශි කිරීම– එකතු කිරීම
ලකෝලිය– පඹ අත්ත
ලනුපිල– හරකාගේ කර වියගහේ බඳින ලනුව
වප් තාඩනවා– පෑගී තදවී ගිය පිදුරු අවුස්සනවා
වට්ටන් දැමීම– කාලමිට අමට පිදුරු දැමීම
වනායනවා– කමාට අයත් ලියද්ද කොටස ගෙවනවා
වක්කාන්ජා– නාගුලේ ඇදය
වල්ලෙග වකිනවා– නාගුට ගහනවා
වගල– බැවුම
වැතුරුම් වැටෙනවා– පැහුණු ගොයම් වැටෙනවා
වැන්න වැඩ කරනවා– කොටස වැඩකරනවා
වී යාන– වී පැලවෙන්නට දැමූ ස්ථානය
විය කුණ්ඩුව– වියගහේ කොණ
වියණ්ඩුව– වී බූව
වියදමනවා– වියගහ කරින් අස්කරනවා
වැකිතලනවා– මැස්සෙන් අකකුරු ඇතිවෙනවා
වැටිපෙරළනවා– කැපූ කොටස් පෙරළනවා
වියපුහුල– වියගහේ මැද
වෙනිය– පිදුරු වැටිය
වහු දරුවෝ– හරක් පැටව්
මැකිපස්සෙ– වැදූ හරකා
වී පෝරුව– වී එකතු කරන ලෑල්ල
වැකිකොලේ වැපීම– කරල් ගොඩගැසීම
වී හැනපීම– වී නැවතීම
හක පෝරුව– වී පෝරුම– කොනහොඹ ලෑල්ල
හසාඩු– ශණ්ඩයන් සම්බාධ ස්ථාන
හී මූරය– හාන දිනය
හී පාලුව– නිමුන කැඩීම
හී ගෙවඩනවා– හීය සටන් ගන්නවා
හූරා– මස්සිනා
හදීරම– හරකුන් යන මග

කතප්පනවා- නොපැහැ නතර කරනවා
හේගානවා- එලවනවා
කොමරි- අලසකම

## ගොවි ශිෂ්ටාචාරය

මිනිසාගේ උතුම් පරිණතිය ශිෂ්ටාචාරය නම් වන්නේය. වෙනස්වීම් සඞ්ඛ්‍යාත පරිණතිය, හේතු ප්‍රත්‍යයන් අනුව සිදු වෙයි. පරිණතියට ගොදුරුවූ සමහර දෙයක් ක්‍රමයෙන් වෙනස් වෙමින් ගොස් විනාශයටත් තවත් සමහර දෙයක් වෘද්ධියටත් පත්වන බැව් අපට පෙනේ. මුලදී ඉතා සුලු වශයෙන් ඇරැඹුණු රථය ක්‍රමානුකූලව හැඩ ගැසෙමින් අවුත් අහස් යාත්‍රාවක් විය. මිනිසා සම්බන්ධයෙනුත් කාරණය මෙසේය. නොදියුණු මුල් කාලයෙහි පැවැති පහත් පැවැතුම් දුරුකෙරෙමින්, නුවණින් නිපදවාලිය හැකි ශිල්ප ශාස්ත්‍රයන් වර්ධනය කෙරෙමින් උසස් සමාජයට සුදුසු සේ සකස්වුනු මිනිසාට අපි ශිෂ්ටාචාර සම්පන්න මිනිසායයි කියමු. ඔහුගේ නිපදවීම් ගති පැවැතුම් ආදී සියල්ල ශිෂ්ටාචාරයේ අවයව වශයෙන් සලකනු ලැබේ. ගොවිතැන නිසා ඇතිවූ අමුතු නිපදවීමුත් ගති පැවැතුමුත් ගොවි ශිෂ්ටාචාරය නම්. සිංහලයාගේ වර්තමාන ශිෂ්ටාචාරය, ගොවිතැනින් ඇරැඹී බුදුබණින් ඔප් නැගී පරාධීනත්වයෙන් කිලිටිවී ගොස් තිබේ. සිංහල වර්ගයා පරාධීන වන්නට පෙරාතුව නම් ගොවිතැනින් ඇරැඹුනු ඔවුන්ගේ ශිෂ්ටාචාරයෙහි අවසාන ඵලය වශයෙන් සලකන ලද්දේ ආත්ම දමනය වේ. ශිෂ්ටාචාරයන්ගේ ගැටීමෙන් හොඳ ප්‍රතිඵල මෙන්ම නරක ප්‍රතිඵලයෝත් ඇතිවන්නාහ. මුලදී සහස්‍රවර්ෂයක් පමණ කාලයක් තිස්සේ උතුරු ඉන්දියානු ආර්‍ය ශිෂ්ටාචාරයත් ඉක්බිති නවවන සියවසේ පමණ සිට දකුණු ඉන්දියානු ද්‍රවිඩ ශිෂ්ටාචාරයත් සමග සිංහල ශිෂ්ටාචාරය ගැටුනේය. ද්‍රවිඩ ශිෂ්ටාචාරයේ උෂ්ණය මුල් කාලවලදීත් මෙහි ලංගාවූ නමුත් ආර්‍ය ශිෂ්ටාචාරය විසින් එය යටපත් කරන ලදී. මේ ශිෂ්ටාචාර ඝට්ටනයෙන් සිංහල ශිෂ්ටාචාරයට යහපතක් මුත්

අයහපතක් සිදු නොවීය. ඒවාත් ගොවිතැනින් පැනනැගුනු ශිෂ්ටාචාරයන් හෙයිනි. ඉක්බිති අපේ ශිෂ්ටාචාරය ගැටුනේ පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි යන ශිෂ්ටාචාරයන් සමගය. ඒවා අමුතුම දෙශගුණ ඇති රටවල නිපන් කාර්මික ශිෂ්ටාචාරයන් හෙයින්ද සිංහල වර්ගයා පිරිහීමේ කෙළවරට ගිය කාලයක මෙහි ගොඩබට හෙයින්ද ඒ ශිෂ්ටාචාරයන් සමග ගැටීමෙන් සිංහල ශිෂ්ටාචාරය කිලිටිවී අඩපණ විය. නැවතත් සිංහල ශිෂ්ටාචාරය හුවන්නට නම් පැරණි සිංහල ශිෂ්ටාචාරයත් එය දියුණුවට ගෙන ගිය කරුණුත් තේරුම්ගෙන ඊට සරිලන ක්‍රියා පිළිවෙළක් ඇරඹීම ඉක්මනින් කළයුතුය. දැන් අපි අපේ පැරණි ගොවි ශිෂ්ටාචාරයත් එහි දියුණුවට හේතුවුණු කරුණුත් ගැන සිතා බලමු. මුලින් මේ දිවයිනට බට ආර්යයෝ අනුරාධපුරය ආශ්‍රිත ප්‍රදෙශය සිය වාසස්ථානය බවට පමුණුවා ගත්හ. දිවයිනේ මුල් පදිංචිකාරයන්ගේ ප්‍රධාන වාසස්ථානය රොහණය විය. පසුව අනුරාධපුරයෙහි මුල් බැසගත් ශාක්‍යවංශික රාජ පරම්පරාව රොහණයෙහිත් ව්‍යාප්ත විය. ඒ නිසා කතරගම අගනුවර කරගෙන වර්තමාන නැගෙනහිර පළාත ආදී විශාල ප්‍රදෙශයක් පාලනය කෙරෙමින් යසසින් විසූ ගාමනී සහ පරුමක වරුන්ගේ විනාශය සිදුවිය. මෙසේ ලංකාවේ වැඩිහරියක් ආර්යබලයට යටත්වූ පසු නොයෙක් ගොත්‍ර වලට අයත් සවදෙශීයයෝ සතුරු පීඩාවලින් මිදී සිටිය හැකි, ගමන් පහසුව අඩු- දුර්ගයන්ගෙන් ගැවසීගත් කඳුකර පළාත් ඇසුරු කළහ. අනුරාධපුරය සහ රොහණය කඳු නොමැති සමභූමින්ගෙන් ගැවසීගත් හෙයින් ඒ පෙදෙස් වැසියන්ට වැසිඑල සුලභ නොවූයෙන් ඔවුන්ට වතුරේ ඇති අගය ක්‍රමයෙන් වැටහෙන්නට පටන්ගත්තේය. ගොවිජනතාවක් අනෙක් සියල්ලටම වඩා වතුර අගය කරන හෙයින් ඔවුහු කඳුකරට පතිතව මුහුදට ගලායන ජලසඤ්චය නවතා ගැනීමේ ක්‍රම සෙවූහ. ගං ඔයි ආදිය හරස්කොට බඳනාලද ඇළහැර බැම්ම ආදී ගණන් නැති අමුණුත් මින්නේරිය ආදී මහා වැවුත් ඇළහැර, ජයගඟ, මිනිපේ ආදී පුදුම ඇළවලුත් ඇතිවූයේ එහි ප්‍රතිඵල වශයෙනි. මෙසේ උත්සාහයෙන් ඇතිකර ගත් ජල

සුලභත්වය නිසා ඔවුන්ගේ ගොවිතැන සපිරවිය. ගොවිතැනට උවමනා ගවයන් බෝකිරීමෙන් පස්ගෝරසය සුලභ විය. වරක් ගොවිතැන් කිරීමෙන් දිගුකලකට සෑහෙන ධාන්‍ය රාශියක් සැපැයුණු හෙයිනුත් රට සමෘද්ධනයෙන් පැවැති හෙයිනුත් විවේකයට මං පෑදුනේය. සිංහල සාලේ බතුත් පස්ගෝරසයත් වැළඳීමෙන් ජාතිය නිරෝගත් ශක්ති සම්පන්නත් විය. ඔවුන්ගේ ආගමයත්, ඔවුන්ගේ කලාවනුත්, ඔවුන්ගේ භාෂා ශාස්ත්‍රාදියත් දියුණුවෙන් දියුණුවට පමුණුවා ලන්නට ඔවුන්ට පුළුවන් වූයේ එහෙයිනි.

## ගොවිතැන සහ කර්මාන්ත

සිංහලයා ජාතියක් වශයෙන් නොයෙක් කර්මාන්තයන්හි නිපුණ වුවත් ඔහුගේ වැඩි නිපුණත්වය පැවැත්තේ වැව් කර්මාන්තය කෙරෙහිය. සේ පළමුකොටම කඳු දෙකක් අතරේ පිහිටි තැනිතලාවක් මත්තේ යොධ බැමි බැඳ වතුර හිරකරගෙන එයින් ප්‍රයෝජන ලැබීමේ ක්‍රමයක් ඉක්බිති එයින් ලත් අභ්‍යාසය නිසා ගං හෝ හරස් කොට යොධ බැමි බැඳ ඇළවල්වල මාර්ගයෙන් නිසරු ප්‍රදෙශයන් කරා වතුර ගෙන ගොස් කුඹුරු කිරීමේ ක්‍රමයත් ඉගෙන ගත්හ. ඔවුන්ගේ මේ ඉගෙනීම මින්නේරිය ආදී මහ වැව් බැඳීම පිණිස අතිශයින් ප්‍රයෝජනවත් විය. වැවක වතුර අල්ලන ප්‍රමාණය, වැව් කණ්ඩියක් ගෙන යා යුතු ක්‍රමය, භූමියේ උස් පහත්කම, වැවක වතුරෙන් වගාකළ හැකි භූමි ප්‍රමාණය, සොරොව් සහ බිසෝ කොටු තනන ක්‍රමය, ජලපාන ඇල්ලීමේ ක්‍රමය, යනාදී ජලකර්මාන්ත පිළිබඳ සෑම විධිමත් ක්‍රමයක්ම මැනවින් ඉගෙන ගත් සිංහලයා වැසි කාලයෙහි වැවෙන් පිටවාක් වන වතුර පිණ පවා රඳවා ගැනීමට සකස් පෙදෙස් බලා වැව් පෙළක්ම තැනීය. එසේම එක ඇළකින් වැව් කීපයකුත් එකට සම්බන්ධ කොළේය. කලා වැවෙන් නික්මුණු ජයගඟ, තිසාවැව, අභයවැව යන වැව්වලට ජලය ගෙනවුත් ඒ තුන් වැව එකට ගැළපීය. ඇළහැර ඇළ පැරකුම් සහුරක් මින්නේරියක් සම්බන්ධ කෙළේය. මහවැලි

ගඟ මැද්දේ තිබෙන "යකූදුඹ" නම් තැනකින් අරඹා උතුරට ගෙනගිය මිණිපේ ඇළ අදත් ජලකර්මාන්තයෙහි ශූරයන් මවිත කොට පවතී. මේ විශ්මය ජනක ජලකර්මාන්තයන් නිසා භූමිමානක දූරදර්ශක ආදී යන්ත්‍ර විශේෂයන් සමගම භූමියේ උස්මිටිකම් දක්වන නොයෙක් ක්‍රමත් සිංහලයන් දැන සිටිය බැව් සලකා ගත හැකිය. චෛත්‍ය කර්මාන්තය, ගෘහ කර්මාන්තය, කැටයම් කර්මාන්තය, ශෛල කර්මාන්තය, ලෝහ කර්මාන්තය යනාදී ශිල්ප ජාතීන්ට උපමා කරන සෑම කර්මාන්තයක්ම මේ දිවයිනේ උසස් තත්ත්වයට නගන ලද්දේ ගොවිතැනේ අනුහසිනැයි කිය යුතුය. චෛත්‍යයේ මුල් අවස්ථාව හැම අතින්ම ගොයම් කොළ කැටියකට සමානය. සිංහලයා සෑය සාදන්නට මුලින් ඉගෙන ගත්තේ ගොයම් කොළය අනුව යෑමෙනි. එහෙයින් ගොයම් කොළයේ ස්වරූපය ආදී චෛත්‍යයට ගුරු නොවූයේ යයි නොකිය හැකිය. චෛත්‍යය වීගොඩන ගැඹුරුව ගත් අයුරුත් මේ නයින්ම සැලැකිය යුතුය.

ගොවිතැන සහ සමූපකාරය- ගොවි ජීවිතයෙන් පැන නැගුණු ශ්‍රේෂ්ඨ ගුණාංගයන් අතර සමූපකාර ක්‍රමය ප්‍රමුඛ ස්ථානයක් ගන්නේය. එය අදත් පිටිසර වැසියන් අතර මනුලෝකයකින් ප්‍රකටව පවත්නා බැව් පෙනේ. පැරණි සිංහල ගොවියා සිය කෙත වගා කොළේත් ගෙය සාද-ගැනීමාදිය කළේත් බොහෝවිට අන්‍යෝන්‍ය උපකාරය උඩ ය. මොහත් වැඩ සඳහා මුදල් ගෙවීමක් ගේ නොදනී. ඔහු විසින් ඒ සඳහා සම්පාදනය කරන ලද්දේ බත් බුලත් පමණකි. සීසෑමේ පටන් අලුත් බත් කෑම දක්වා ඇති සෑම අවස්ථාවකදී අසල්වැසියාට මෙන්ම ආගන්තුකයාටත් බත බුලතින් සංග්‍රහ කරනු ගොවි චාරිත්‍රය වෙයි. ගොවියා ගොවීන්ගේත් ගොවි භාර්‍යාව ගොවි භාර්‍යාවන්ගේත් සහාය සොඳුරු මේ අන්‍යෝන්‍ය සහායත්වය නිසා ගොවි ජීවිතය ප්‍රණීත විය වඩුවා නගුල් ආදියත් කම්මල්කාරයා කැති, පිහියා, උදලු සිවැල් ආදියත්, වලන් සාදනා මලදූත්, කුලුපොත්තා

වට්ටි පෙට්ටි ආදියත්, වියන්නා මාගල් මලු ආදියත් ගොවියාට සැපයූහ. වෙදමහතා, නැකැත්තා, යක්දෙස්සා යනාදීහු සිය යුතුකම් ඉටුකළහ. ගොවියා ඒ සියල්ලටම ධාන්‍ය කොටස බැගින් දුන්නේය. එබැවින් ගැමි ජීවිතය එකට බැඳී විනෝදයෙන්- සුවයෙන්- පිරී ගියේය.

**ගොවිතැන සහ සෞඛ්‍යය-** කාය වෙහෙසා කළයුතු කර්මාන්තයන් අතර ගොවිතැන ප්‍රධාන වන බැව් අපි දනිමු. කාය වෙහෙසන්නා විසින් හොඳ ආහාරයක් ලැබිය යුතුය. එසේම නියමිත වේලාවට ආහාර ගැනීමත් ඔහුගේ සාමාන්‍ය සිරිත වන්නේය. මෙසේ ගොවිතැන නිසා දෙකොළට නොගිය මධ්‍යම ප්‍රමාණයේ කායික ශ්‍රමයක්ද කෙත සශ්‍රීකව වැවෙනු දැකීමාදියෙන් චිත්ත ප්‍රීතියක්ද ලැබෙන හෙයින් ගොවිතැන ශරීර සෞඛ්‍යයට අතිශයින් ඉවහල් වන බැව් සැලකිය යුතුයි. ජාතික සෞඛ්‍යය ප්‍රාර්ථනා කරතොත් ගොවිතැනට පණදිය යුතුය.

**ගොවිතැන සහ චිත්‍රකර්මය-** සිංහලයා පළමුකොටම සිතියම් ඇන්දේ කමතේය. වඩකතිරිය, තයිදරණය, අටමගල යනාදිය ඇඳ දෙවියන් යැද බහිරවයාගෙන් වී රැක දෙන සේ කන්නලව් කරනු සාමාන්‍ය සිරිති. හී හාන හරකාගේ ඇගේ පසඟුල් ඇඳීම කාරක ගොවියාගේ සිරිත විය. එය සමහරවිට ලංකාවෙහිත් තිබෙන්නට ඇත. හී හැමත් නොයෙක් වගීවලට අයත් සිතියම් සැදෙන සේ කරන ලදී. කමතෙන් ඇරඹුනු චිත්‍රකලාව ක්‍රමයෙන් මුහුකුරා ගොස් සිංහල සිත්තරා සීගිරි අප්සරාවන් ඇඳීමෙහිත් සමත් කළබැව් පෙනේ. ග්‍රීක් ක්‍රමය, ඉන්දියානු ක්‍රමය, ස්වදේශීය ක්‍රමය යි සිංහල චිත්‍ර කලාවේ අවස්ථා තුනෙකි. දෙගල් දොරුව මුල්ගිරිගල යනාදී තැන්වල පෙනෙන චිත්‍රයෝ ස්වදේශීය ක්‍රමයේ මෑත යුගය සිහිපත් කරවති. මේ සිතියම්වල ඇති ජීවමාන ගතිය සැබවින්ම පුදුම සහිතය.

**ගොවිතැන සහ නාට්‍යය-** ගොවිතැනේ සෑම කෘත්‍යයක්ම වාගේ එක්තරා තාලයක් අනුව සිදුකරන ලදී.

උපාසිකාවන්ගේ වී කොටුමන් දර්ශනීය නෘත්‍යයෙකි. අදත් සමහර පළාත්වල ගොයම් කපන්නෝ ගීත තාලයට අනුව වෙ. ඒ සඳහාම වයනු ලබන "බුම්මණ්ඩිය" නම් වාද්‍ය භාණ්ඩයකුදු වෙයි. තාලානුකූල අඞ්ග චලනය ගොවි නෘත්‍යයේ විශෙෂ ස්ථානයක් ගනී. උඩරට නෘත්‍යයේ ප්‍රධානාඞ්ගය වනුයේත් අඞ්ගචලනය මැයි. සමහරවිට එය ගොවි නෘත්‍යය නිසාම දියුණු වූවකැයි සිතන්නට අවකාශ තිබේ. සිංහලයන්ගේ තාල ශාස්ත්‍රයට ගොවි ගීතයෙන් ලැබුණු අනුග්‍රහය ඉතා විශාලය. නැටුම, ගීතය, වාදිතය යන තුන එකතුවූ විට එයට සංගීතයයි කියනු ලැබේ. කෘෂිකර්මය පිළිබඳ බොහෝ අවස්ථාවන්හිදීත් මේ තුනේ සම්‍යොගය පැනේ. එය ගොවි සංගීතය නමින් හැඳින්විය හැකිය.

**ගොවිතැන සහ සාහිත්‍යය—** යමකු විසින් කී දෙය සාහිත්‍යය නම් එය ග්‍රන්ථාරූඪවූ පසුත් ඒ නමින්ම ව්‍යවහාර විය අර්ථාන්විත හේතු යුක්ති සහිත සිලිටු වචනයටත් සාහිත්‍යයයි කියනු ලැබේ. ගොවීන් විසින් කියූ දෙය ගොවි සාහිත්‍යය නම් වන්නේය. පැල් කවි, කෙලුම් කවි, දෙවස්තොත්‍ර, යාදිනි ආදිය එයින් ගැනේ. සිංහල බසින් ප්‍රචාරයවූ සාහිත්‍යයට එයින් ලැබුනු අනුබලය බෙහෙවි. ගොවි සාහිත්‍යයෙන් උපුටාගත් සමහර දේ ග්‍රන්ථාරූඪවත් දක්නා ලැබේ.

වැබැඳ හසයා, ගෙන හුදල්ල සාමී න්නා
අකුරු සැසයා, දූවවැඩු උයන් වි න්නා
කිසිති විසයා, මෙවග මේ තෙළිම් න්නා
එකි සමි සයා, මෙපොළොහු බැවින් මි න්නා

යන පද්‍යය එබන්දකි. මේ වනාගී මිණිරිළු වෘත්තයට නිදසුනක් වශයෙන් එළුසඳස් ලකුණෙහි දක්වන ලදී. ගොවිතැන නිසා ගොවීන්ගේ සිතෙහි හටගන්නා චෛතසික ගති, කුමණ, ලබ්ධිවිශෙෂ, නීති රීති, සිරිත් විරිත්, පලපුරුදු-

කම් ආදී සියල්ලක් ගොවි ශිෂ්ටාචාරයේ අංග හැටියට ගණන් ගත හැකිය. මෙසේ සලකා බලන විට ගොවිතැනින් සිංහලයාට ලැබුනු විශිෂ්ට ශිෂ්ටාචාර දායාදය ඉතා මහත් බැව් පෙණෙන්.

**ගොවිතැන සහ සන්ථාගාරය–** පෙරදිග හැම රාජ්‍යයකම වාගේ සන්ථාගාරයක් තිබුනේය. විශේෂයෙන් සමූහාණ්ඩු පැවැති රටවලට සන්ථාගාරයක් උවමනාය. පසුව නොයෙක් දේ සඳහා යොදා ගනු ලැබූ සන්ථාගාරය මුලදී ගොවීන්ගේ රැස්වීම් ශාලාව විය. ඔවුහු එහි රැස්ව සීසෑම්, වැපිරීම්, ආදිය කරන කාල සීමාවන් නියම කරගත්හ.

**ගොවිතැන සහ බෙහෙත්–** පැරණි පෙරදිග වැස්සෝ නොයෙක් ධාන්‍ය වර්ගයන් නොයෙක් ලෙඩවලට බෙහෙත් වශයෙන් භාවිත කළහ. “ලෙඩා මැරුනාට මොකොද තණ හාලෙන් කැඳකුත් දුන්නා” යනු පිටිසර ව්‍යවහාරයෙකි. වෙද පොත් බැලීමෙන් කාරණය තේරුම් ගත හැකිය. හිවැලේ අලුණු මඩ ඉතාබෙහෙත් කැවුණු අයට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් විය. “සිතාලෙංලි” යනු එයට නම්. බුදුන් විසිනුත් පිළිගැණුනු බෙහෙතකි.

## ගොවිතැන හා ගම්බද ක්‍රීඩා

ඉපැනැල්ලේ සුවඳ වැදෙත්ම ගමේ ගව රැළ මෙන්ම කොලු රැළද කුලප්පු වන්නේය. දම්වැල්වලින් බැඳ තැබුවද කෙතට නොයාදී ඔවුන් නොරැකිය හැකිය. අලුත් ඉපනැල්ලට බට ගවයන් මෙන්ම ගැමිදරුවෝද නොයෙක් ක්‍රීඩාවන්හි යෙදෙත්. සිංහල ක්‍රීඩාවන්ට පණ පෙවෙන්නේ ඉපනැල්ලේදීය. ඉරිපැනීම, බුහුගැනීම, වග්ගුඩු ගැසීම, හම්බන්බුහු ගැහීම, එලුවා ඇල්ලීම, හැංගිමුත්තන් කෙළීමාදී නොයෙක් ගම්බද ක්‍රීඩාවෝ සමහරවිට එකම තැනෙකදී දක්නා හැකි වෙති. දෙපිළ සෑදීමට ළමයින් තෝරාගැනීමේ ක්‍රමය අතිශයින් සාධාරණ වන්නේය. හැංගිමුත්තං කෙළීමේදී ව්‍යවහාර කරන වාක්‍යය හාස්‍ය ජනකය,

"ආසම ගම්සම සුංගං කොච්චි අඩක්ෂං ආම් බාං බූකිසංබුඃ" යනු ඒ වාක්‍යයයි. ගම්බද ක්‍රීඩාවලදී කියනු ලබන මෙබඳු වාක්‍යයෝ බොහෝය. ගම්බද ක්‍රීඩා අතුරෙන් සමහර ඒවා විදේශයන්ගෙන් පැමිණි බැව් පෙනෙතත් දැන් නම් ඒ සියල්ල සිංහල වී ඉවරය. ඉංග්‍රීසි යුගයේදී සමහර සිංහල ක්‍රීඩාවලට ඉංග්‍රීසි වාක්‍යයෝත් එකතුවූහ. කුඩා කාලයෙහි අප ගිය ඉංග්‍රීසි ඉස්කෝලයෙහි, වග්ගුඩු ගැසීමේදී ගැමි ළමයින් ව්‍යවහාර කළ "ගුඩුගුඩු" යන්න වෙනුවට "වයිට් මැන් ඔන් ද බ්ලැක් මැන් ඩවුන්" යි කියන්නට අපේ ඉංග්‍රීසි මහත්මයා අපට නියම කළේය. කිසිවක් නොදැන අපි ගුඩු ගුඩු යනුව අතහැර අලුත් වාක්‍යයට පුරුදුවීමු. සුදු මිනිහා උසස් බවත් කළු මිනිහා පහත් බවත් කියමින් සෙල්ලම් කරන්නට අපට සිදුවිය. අපේ අධ්‍යාපනයට නිසඳ වෙච්චා.

## ගොවිතැන දියුණුකළ යුතු හැටි.

ගොවිතැන දියුණු වීමෙන් රට සමෘද්ධිමත් ආණ්ඩුවේ භාණ්ඩාගාරය තරවීමත් රටවැසියාගේ ගුණ නුවණ දියුණුවීමත් එකවිට සැලසෙන්නේය. මේ බැව් දැනගත් පැරැණි භාරතීය රජවරු ගොවීන්ට උවමනා කරන සෑම දෙයක්ම නො අඩුවක් නොමිලයේත් සපයාදුන් බව මහා විජිත රජුගේ චරිතයෙන් පෙනේ. නිශ්ශංක මල්ල රජුගේ ශිලාලේඛන යන්හි ඔහු ගොවීන්ට කළ සංග්‍රහ ගැන නිතරම සටහන් වේ. එහෙත් ඒවා ඔහුගේම සංග්‍රහයන් හැටියට පෙන්වන්නට ගත් උත්සාහය පිළිකුල්දායකය. ඔහුට ඉස්සර විසූ උසස් සිංහල රජවරුන් ගොවි සංග්‍රහය ඔහුට වඩා හොඳින් කළහ. ඒ කියන දීමනාවන් පැරැණි සිංහල රජුන් විසින් පවත්වා ගෙන ආ ඒවා බැව් විශේෂයෙන් සැලකිය යුතුය. කාරණ මෙසේ හෙයින්, ජාතිය දුබලකොට පාලන පහසුව ඇතිකර ගැනීමේ චේතනාවෙන් ආණ්ඩුව විසින් මෙතෙක් පාගාගෙන සිටිය ගොවියා නැගිට්ටවන්නට නම් ඔහුගේ උවමනාවන් ක්‍රියාවෙන් ඉටුකළ යුතු බැව් නිදහස් ආණ්ඩුව විසින් සිතිය යුතුය.

වර්තමාන ඉඩම් හිමියාට ඔහුගේ කුඹුර උවමනා විටෙක උවමනා කෙනෙකුට දියහැකිය. මේ වනාහී කුඹුරු අසාර වීමේ ප්‍රධාන හේතුවකි. පැරණි නීතියේ හැටියට කුඹුරක් ගොවියෙකුට බාරදුන් පසු ඉඩම්හිමියාට සිතුවක් නොකළ හැකිය. කුඹුර වැඩකරගෙන ආ ගොවියාගේ පරපුරේ කුඹුර වගාකළ හැකි කෙනෙකුන් සිටියදී සවා ඉඩම්හිමියාට සිය කුඹුර උවමනා පරිදි වෙනස් කළ නොහැකිය. එහෙයින් ගොවියා කුඹුර සශ්‍රීක කරගන්නට වෑයම් කෙළේය. ඉස්සර ගොවියාට ධාන්‍යයෙන් වැඩිකොටසකුත් ලැබුණේය. පැල්දෙර කටුමාතතු ආදී ගොවියා විසින්ම ලැබිය යුතු කොටස් ඔහුට කැතිව ගියෙන් දුන් ඔහුට සිදුවී තිබෙන්නේ මහන්සියක් වී වියදමුත් කොට තමා බඩගින්නේ සිටගෙන පොහොසතාම පොෂණය කිරීමටය. එබැවින් දෙවනුව කළ යුත්තේ ගොවිතැන ගොවියාටත් යැපිය හැකි රක්ෂාවක් බවට පෙරළීම වේ. ගවසම්පත හීනවීමත් ගොවිතැනට ලොකුම බාධාවෙකි. එබැවින් තණබිම් ඇතිකිරීමාදියෙන් ගව සම්පත දියුණු කළ යුතුය. උදලුවලින් කරන ගොවිතැනට වඩා හීගෑමෙන් කරන ගොවිතැන සඵල බැව් පුරුද්දෙන් දනිමු. හරකාගේ මලමූත්‍ර කුඹුරට අතිශයින් හිතකරවෙයි. පැල සිටවීමාදියත් හොඳ වැඩ නමුත් ඒවාට මේ කාලයෙහි ගොවියා උනන්දු කළ නොහැකිය. ණයවී කුඹුර වපුරා ඉක්බිති පැල සිටුවන්නටත් ගොස් අමාරුවේ වැටෙන හෙයිනි.

## මිශ්‍ර ගොවිතැන

වරක් වී වපුරා අස්වනු නෙලාගත් ඉක්බිති කුඹුරේ උඳු මුං ආදිය වපුරනු මිශ්‍ර ගොවිතැන නම් වන්නේය. මේ ගොවිතැන සමහර කුඹුරුවලට අහිත නමුත් සමහර කුඹුරුවලට හිතවත්ය. කුඹුරේ වීත් නියරවල මුං ආදියත් වවනු රොකණයේ සාමාන්‍ය සිරිති. ඉසුරුමුනියට අයත් කුඹුරුවල මිශ්‍ර ගොවිතැන කහනම්වා තිබුනු බව ඉසුරුමුනි සන්නසින් දත හැකිය.

# ගොවිතැන සහ ජනකථා

ගමකථා නමින් හැඳින්වෙන සිංහල ජනකථා අතුරෙන් වැඩිහරියක් ගොවිතැන නිසාම නිපන් බැව් කිය යුතුය. ශෘංගාරැස නොවූවත් මේ ගම කථාවන්හි ගැබ්වැ පවත්නා උපදෙස්, පිරුළු, උපහාස, චරිත, ඉතිහාස ප්‍රවෘත්ති යනාදී වැදගත් දේ බොහෝය. එසේම එයින් ගැමි ජීවිතයට ලැබුනු විනෝදය අනන්තය. ගොවි පිරුළු අතුරෙන් සමහර ඒවා අපේ පොත්පත් වලට බෙහෙවින් වැදගෙන තිබේ. "වරුවෙ හීනාන්න ආ මිනිහාට හරකුන්ගෙ දත් බැලීමෙන් වැඩක් නැත" යනු සාමාන්‍ය පිරුළෙකි. ආගන්තුකවූ පිටින් ගිය කෙනෙකුන් අභ්‍යන්තර දේවලැ ඇඟිලි නොගැසිය යුතු බව මේ සමාසෝක්තියෙන් කියයි. "මොකොද මෙහෙ වැදුන් පලක් නැහැ" යනාදී තවත් පිරුළු බොහෝය. "කුලී කුරක්කනට ගිය මිනිහට මොන ඉංගංද" යනු රුහුනේ ප්‍රචාරිත පිරුළෙකි. "තෙල්ලෙගෙ පින් කුලුඹුල්ලෙ" යනාදිය ගැනත් සැලැකිය යුතුයි. කරුණු මෙසේ හෙයින් සිංහල සභ්‍යත්වයෙහි ගොවිතැන හා නොබැඳුනු කිසිම අංශයක් නොමැති සේ පෙනේ.

## සිංහල ගොවිතැන දියුණු වේවා!

# ආශ්‍රිත ග්‍රන්ථ


අමාවතුර
උමංදාව
ඌවේ පැරණි ලිපි
කව්සිළුමිණ
කර්ම විභාගය
කාසිභාරද්වාජ සූත්‍ර සන්නය
කෑගල්ලෙ වංශාව
ජාතකපොත
ජාතක ගැටපදය
ථූපවංශය
දක්ෂිණ භාරතීය ශිලාලිපි
දශජාතකය
දෙමළ ශබ්දකෝෂ
ධම්පියා සන්නය
ධම්පියා අටුවා සන්නය
නීති නිඝණ්ඩුව
පත්තිනි පොත
පැරණිගම
පූජාවලිය
මහාවංශය
මාතලේ කඩඉම් පොත
යද්දිගම ඔප්පුව
ශාසන ඉතිහාසය
රසවාහිනී
රූපසිද්ධි සන්නය
ලංකා ශිලාලිපි
ලංකාවේ පුරාතන වැව් අමුණු
විජය නීතිය
විභඞ්ග අටුවාව
විනය අටුවාව
විනය පිටකාව
විසුද්ධිමග්ග සන්නය
සබරගමුවේ පැරණි ලිපි
සද්ධර්මරත්නාවලි
සද්ධර්මාලඞ්කාරය
සංයුක්ත සඟිය
සංයුක්ත අටුවාව
සියබස් ලකර
සිඛවලඳ
සිළුමිණ ආදී පත්‍ර සඟරා
සූත්‍රනිපාත සන්නය
හෙරණ සිඛ විනිස
ශ්‍රීපාද ලේකම් මිටිය

# විෂයානුක්‍රමණිකා


| | පිට |
|---|---|
| අකරඝ කුඹුරු | 3 |
| අක්කියල්ලාග | 70 |
| අගම් පඩි කුඹුරු | 3 |
| අගස්ස | 82 |
| අග්‍රහාර | 3 |
| අගාර කුඹුරු | 3 |
| අටවරල | 4 |
| අටඨදනානක | 41 |
| අඩක්කලප්පු නගුල | 35 |
| අඩුබෙරිය | 21 |
| අතපැන්දිය | 71 |
| අත්මග | 24 |
| අඳ කුඹුරු | 4 |
| අඳේ | 71 |
| අනඹු | 5 |
| අන්දන්කමල් | 34 |
| අනතර බජ්ජක | 63 |
| අනතරගංගය | 30 |
| අබ කොද්ද | 64 |
| අමන්දුබාන | 39 |
| අමුතුබාහ | 39 |
| අමුතුපට්ටය | 36 |
| අම්බරුවෙව් | 58 |
| අරග්ගන්පොලි | 60 |
| අලකොළ රෝගය | 49 |
| අලුත්බත් කෑම | 80 |
| අලුමූසාව | 63 |
| අවකුම්ට | 41 |

| | පිට |
|---|---|
| අවකැටේ | 39 |
| අස්වැද්දුම් | 5 |
| අසසයුජ් | 83 |
| අංගය | 22 |
| ( ආ ) | |
| ආලම්බක නගුල | 35 |
| ආනම | 64 |
| ආත්තප්පඩුවු ඉඩම් | 5 |
| ඇලපත | 22 |
| ඇඹුල | 64 |
| ( ඉ ) | |
| ඉනිඇගිට | 69 |
| ඉයලම්බාන | 37 |
| ඉරමලු | 5 |
| ඉරවරිය | 71 |
| ඉස්තන්තෙම්ම | 44 |
| ඉස්සරහබාන | 41 |
| ඉහත්තිල්ල | 37 |
| ඉං වේල්ල | 24 |
| ( ඊ ) | |
| ඊසා | 36 |
| ( උ ) | |
| උඩලෙ | 37 |
| උඩාවත | 24 |
| උතු කුඹුරු | 5 |
| උදවිය | 62 |
| උප්පිඩි | 55 |

| | පිට |
|---|---|
| ( ඌ ) | |
| ඌරුබිම් | 6 |
| ( ඔ ) | |
| ඔකු | 71 |
| ඔලගම් | 6 |
| ඔවිලාන් | 7 |
| ( ඕ ) | |
| ඕතෙර කුඹුරු | 7 |
| ( ක ) | |
| කට්ටකාඩුව | 7 |
| කච්ඡී | 22 |
| කටුමංකඩු | 72 |
| කස්තාල් | 73 |
| කඳුකඩ | 72 |
| කතපිය | 22 |
| කන්දූති කුඹුරු | 7 |
| කමත | 22 |
| කමත් පිරිත | 56 |
| කරමාරු කුඹුරු | 8 |
| කරුව | 72 |
| කාණුකැට | 26 |
| කායම් තොද්ද | 64 |
| කැටකාන්ද | 55 |
| කැකිහාල් | 82 |
| කැරලිකෙටීම | 83 |
| කැලෑලි කුඹුරු | 8 |
| කිණිගම් | 8 |
| කිරිමා කළු කුඹුරු | 8 |
| කුක්කදෙන | 47 |
| කුණුපිදුරු දිසක්ක | 86 |
| කුඹුරුපාවිට | 22 |
| කුරප්පය | 23 |
| කුරුලුපාළු | 23 |
| කුසලෑන් | 9 |
| කොක්කාම | 29 |
| කොම්පැලලී | 47 |
| කොවිල්ල | 39 |
| කොළුතොයා | 68 |
| කොකුනගුල | 35 |
| කොන්තමැරවැගිය කුඹුරු | 9 |
| කොරවක්කොටෙ | 36 |
| කොළුගොන් ගැසීම | 59 |
| කොළුගොන්ගහන්නට | |
| මදකකොවස | 73 |
| කොළු බැඳීම | 56 |
| කොළු වෙළි | 9 |
| කොළු සෑදීම | 69 |
| ( ග ) | |
| ගහේකුඹුරු | 10 |
| ගම් කොටුව | 10 |
| ගම් පංගුව | 10 |
| ගම් පැලැස්ස | 10 |
| ගම් මුදල | 10 |
| ගම්මඩු හැවීම | 47 |
| ගැලකුම | 58 |
| ගැනුම්ගන්න ඉඩම් | 10 |
| ගීගනරාළු | 48 |
| ගොබවාන | 28 |
| ගොන්ගෙය | 40 |
| ගොප්මං ඇදීම | 48 |
| ගොම්පස්කාරනවා | 57 |
| ගොම්මලකඩ | 58 |

| | පිට |
|---|---|
| ගොයම්කනුගැසීම | 48 |
| ගොය්‍යා | 62 |
| ගොම්කරල | 59 |
| ගොවිලිය | 59 |
| ( ත ) | |
| තට්ටුමාරු | 8 |
| තරවිණකත | 11 |
| තාවළු | 11 |
| තැටියෙ ගැසීම | 49 |
| තිබ්බොටු ගොද්ද | 64 |
| තෙනය | 11 |
| ( දූ ) | |
| දූකපකිය | 73 |
| දන්වරුපෙත් | 11 |
| දරාඹු | 11 |
| දරාඩ ආරුව | 24 |
| දරුකනටි | 24 |
| දළුපත් | 23 |
| දසාරත | 73 |
| දගයෙන් පංගුව | 73 |
| දූකිගොය්‍යා | 59 |
| දූත්ත | 24 |
| දියමාත්ත | 25 |
| දියකැටපසණ | 27 |
| දියමන්තාව | 29 |
| දියකොල්මත | 51 |
| දිමත් කගුල | 35 |
| දිවෙල් | 12 |
| දූක්ගත්තා කුඹුරු | 12 |
| දූහුරුබිම් | 12 |
| දෙනි | 13 |
| දෙදූරු | 12 |

| | පිට |
|---|---|
| දෙපාඇල | 23 |
| දෙපාවක්කඹ | 24 |
| දෙමළු කැබෙලි | 13 |
| දෙමඩුව | 40 |
| දෙවොල් කැටීම | 49 |
| දෙහෙලාත් | 13 |
| ( න ) | |
| නගුලිස | 36 |
| නගුල්මිට | 36 |
| නගුල්දත | 36 |
| නවත | 29 |
| නවතිල්ල | 49 |
| නාපල්ල | 37 |
| නාවත | 25 |
| නැම්ම | 41 |
| නිද්දකය | 46 |
| නිමූත | 38 |
| නිමූත්කුරුල්ලා | 36 |
| නිසැ ඉඩම් | 13 |
| නියඹලාව | 64 |
| නිරි | 69 |
| නිලකඳ | 76 |
| නිලපඹුරු | 44 |
| නිලපාලු | 13 |
| නෙළුම් ඇල්ලීම | 46 |
| ( ප ) | |
| පමුණු | 14 |
| පස්සේ බාන | 41 |
| පස්කීරිවත්කිරීම | 49 |
| පසන් මකාව | 25 |
| පලුඇණය | 37 |

| | පිට |
|---|---|
| පලුම්ං කෙටීම | 33 |
| පැන්නුම | 27 |
| පැස්සේ කුඹුරු | 14 |
| පැල්දෙර | 74 |
| පැච් ඉරට දෙන දූනය | 50 |
| පටවන සහ බඹවන | 38 |
| පිටවාන | 23 |
| පිටදඹසස...... | 86 |
| පිදුම් | 14 |
| පිලෑද්ස | 14 |
| පිල්ලෑව | 24 |
| පිසඹුරු සුඹුරු | 14 |
| පිසඹුරු වන | 14 |
| පුරන් කෙටීම | 33 |
| පුරඳ කුඹුරු | 15 |
| පෙද කොට්ටු | 63 |
| පෙරගිලිය සහ පසුගිලිය | 39 |
| පෙරමාස් කුඹුරු | 15 |
| පෙරේතාට්ටියම | 74 |
| පොටාමැටිය | 24 |
| පොලිම්බේ | 24 |
| පොල්ගැසීම | 50 |
| පොල්කිරි හොද්ද | 64 |
| පෝරුගොය්යා | 61 |
| ( බ ) | |
| බඹවැනිලි | 15 |
| බඹවන හාලුල | 36 |
| බත්ගම් | 15 |
| බදුකුඹුරු | 51 |
| බිම්කැඟුම | 40 |
| බිම්තැන්න | 33 |

| | පිට |
|---|---|
| බිලිබත් සහ බිලිසාල් | 74 |
| බිසෝකොටුව | 27 |
| බිසෝපස්කුම | 15 |
| බුම්මැන්නිය | 56 |
| බොජිය පකිය | 75 |
| බෝල ගොය්යා | 61 |
| ගොගගම් | 16 |
| (ම) | |
| මඩරන් බද්ද | 75 |
| මඩදූනෙ | 51 |
| මදූවව | 27 |
| මහබන | 63 |
| මහවර | 75 |
| මලපාලු | 16 |
| මානගොය්යා | 61 |
| මාප්පිඩ | 56 |
| මාස්පස්ස | 85 |
| මාලු හොද්ද | 64 |
| මැඩුවන්බෑම | 59 |
| මැද්දේකුඹුරු | 16 |
| මැල්ලුම | 64 |
| මිරිස් හොද්ද | 64 |
| මීගහ අංගය | 22 |
| මුගයින් | 16 |
| මුක්හැස්කුඹුරු | 17 |
| මුක්සොට්ටු | 17 |
| මුක්යය | 17 |
| මුදුනා | 68 |
| මුලන් | 18 |
| මුල්බිජු කුඹුරු | 18 |
| මුල්සාලු | 39 |

| | පිට |
|---|---|
| මූල්හාල් | 82 |
| මොණකාල | 28 |
| මොලගහකන්ඩිය | 64 |
| ( ය ) | |
| යල | 84 |
| යාගුව | 63 |
| යාය | 20 |
| යොතුකඳ | 45 |
| යොධඇල | 28 |
| ( ර ) | |
| රජමොහොල | 28 |
| රත්මාසර කුඹුරු | 18 |
| රලුපාණ | 28 |
| රැලිපැන්නුම | 29 |
| රැකානකන්ද | 66 |
| ( ල ) | |
| ලියැදි | 24 |
| ලියන්තාව | 65 |
| ( ව ) | |
| වක්කැත්ත | 36 |
| වක්කිඹවරය | 85 |
| වටහල්ගෙය | 81 |
| වටමල්ල | 56 |
| වතුරාන | 24 |
| වතාන | 24 |
| වප්පෑහ | 51 |
| වරකුල | 78 |
| වරුව | 80 |
| වරුපෙත් | 19 |
| වල්පිට | 24 |
| වාලසතය | 76 |
| වැරියන් | 76 |
| වැවගම | 19 |
| වැහැර | 19 |

| | පිට |
|---|---|
| වෑකන්ද | 29 |
| වෑඳුම | 62 |
| වියමැය | 40 |
| විල් | 30 |
| වීගොපිම | 81 |
| වී බද්ද | 76 |
| වී රේන්දුය | 77 |
| වී වගා | 87 |
| වෙණීය එනීම | 58 |
| වෙනා | 37 |
| ( ස ) | |
| සුඤ්ඤාගාරය | 126 |
| සම්භොග ගම් | 20 |
| සම්බා | 77 |
| සංගත්තාර් | 20 |
| සලාපිස් | 77 |
| සාරමාරු කුඹුම් | 19 |
| සාරමාරු | 77 |
| සිකාලොලි | 126 |
| සිරුණ දෙක | 40 |
| සිවැල | 36 |
| සුන්සාල් | 82 |
| සුවර් | 77 |
| සොරොම්බ | 29 |
| සවණ්ණ ආදායම් | 78 |
| ( හ ) | |
| හම්ස්තාලය | 86 |
| හම්ස්පෙට්ටිය | 47 |
| හැන්කදිරාලු | 47 |
| හැල්පත් | 25 |
| හිවල්අදේ | 77 |
| හීවිට | 40 |
| හුවන්දිරම් | 77 |
| හෙනකඳ | 47 |